

# සුරකිමු

## ඔබ අගයන දේ

වාර්ෂික වාර්තාව | 2017

ශ්‍රී ලංකා
රක්ෂණ
නියාමන
කොමිෂන් සභාව

# පටුන


| | |
|---|---|
| වසරේ වැදගත් සිදුවීම් | 4 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 7 |
| අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය | 9 |
| කොමිෂන් සභාවේ සාමාජිකයින් | 14 |
| කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව | 15 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 17 |
| කාර්ය මණ්ඩලය | 18 |
| සමාලෝචන | |
| පොදු සමාලෝචනය | 22 |
| සංඛ්‍යානමය සමාලෝචනය | 28 |
| මෙහෙයුම් සමාලෝචනය | |
| - අධීක්ෂණ සමාලෝචනය | 62 |
| - නියාමන සමාලෝචනය | 65 |
| - විමර්ශන සමාලෝචනය | 69 |
| - වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය | 74 |
| - පරිපාලනමය සමාලෝචනය | 78 |
| - මූල්‍ය සමාලෝචනය | 79 |
| මූල්‍ය තොරතුරු | |
| - මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 82 |
| - මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය | 83 |
| - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 84 |
| - රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 85 |
| - ගිණුම්කරණ ප්‍රතිපත්ති | 86 |
| - මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 88 |
| විගණකාධිපති වාර්තාව | 95 |
| විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම | 110 |
| පරිශිෂ්ඨය I | 127 |
| පරිශිෂ්ඨය II | 128 |
| පාරිභාෂික ශබ්ද මාලාව | 130 |



ඔබව රැකගනිමින්
තහවුරු කරන්නෙමු
ඔබ මහත්සේ වටිනා බව

# දැක්ම

ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ බවට පත්වීම.



# මෙහෙවර



රක්ෂණ කර්මාන්තය
නියාමනය කිරීම, අධීක්ෂණය
කිරීම සහ අභිවෘද්ධිය සඳහා
පහසුකම් සැලසීම
සිදුකරලමින් රක්ෂණ ඔප්පු
හිමියන්ගේ යහපත සුරැකීම.

# වසරේ වැදගත් සිදුවීම්

- රක්ෂණ සමාගම් - 28
- රක්ෂණ තැරැව්කාර සමාගම් - 60
- රක්ෂණ සමාගම් නියෝජනය කරන රක්ෂණ නියෝජිතයින් - 45,228
- රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින් - 419
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10ක ග්‍රාම නිලධාරී කොට්ඨාස 796ක් වෙත ලබා දුන් රක්ෂණ දැනුවත්භාවය

## රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

| | 2017 | 2016 | වෙනස % |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන) | 164,623 | 143,067 | 15.07% |
| මුළු වත්කම් (රු. මිලියන) | 582,417 | 525,329 | 10.87% |
| දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස ව්‍යාප්තිය | 1.24 | 1.20 | 3.33% |
| රක්ෂණ ඝනත්වය (රු.) | 7,677 | 6,747 | 13.78% |

## රක්ෂණ කොමිසමේ කාර්යසාධනය

| | 2017 | 2016 | වෙනස % |
|---|---|---|---|
| ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රු. මිලියන) | 4,110 | 3.291 | 24.89% |
| සෙස් ආදායම (රු. මිලියන) | 418,235 | 408,179 | 2.46% |
| වාර්ෂික ගාස්තුව (රු. මිලියන) | 142,175 | 125,489 | 13.30% |

**රු. මිලියන** 582,417
රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්

**රු. මිලියන** 164,623
රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරික ආදායම



# කළමනාකරණ තොරතුරු



"වසර 2017 දී, ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය වාරික සහ වත්කම් යන අංශ ද්විත්වයෙන්ම සුබවාදී වර්ධනයක් වාර්තා කිරීමට සමත් වී ඇත. සාමාන්‍ය රක්ෂණ සහ දිගු කාලීන රක්ෂණ වාරික පිළිවෙලින් 17% ක සහ 12.65% ක වසරින් වසර වර්ධනයක් අත්පත් කරගනු ලැබූ අතර, ක්ෂේත්‍රයේ මුළු වත්කම් 10.87% ක සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කර ඇත."

# සභාපතිතුමාගේ පණිවිඩය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි, 106 වගන්තියෙහි කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත භාරදීමට නියමිත, වසර 2017 සඳහා වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (කොමිෂන් සභාව) වාර්ෂික වාර්තාව මවිසින් මෙසේ ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

වසර 2017 දී, ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය වාරික සහ වත්කම් යන අංශ ද්විත්වයෙන්ම සුබවාදී වර්ධනයක් වාර්තා කිරීමට සමත් වී ඇත. සාමාන්‍ය රක්ෂණ සහ දිගු කාලීන රක්ෂණ වාරික පිළිවෙලින් 17% ක සහ 12.65% ක වසරින් වසර වර්ධනයක් අත්පත් කරගනු ලැබූ අතර, ක්ෂේත්‍රයේ මුළු වත්කම් 10.87% ක සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කර ඇත. වාරික වල වර්ධනය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මෝටර් රථවාහන සහ සෞඛ්‍ය යන උප කාණ්ඩයන් කැපී පෙනෙන අයුරින් දායක වී ඇත. රක්ෂණ ක්ෂේත්‍රයේ ඒකාබද්ධ වත්කම්, ප්‍රමුඛ මූල්‍ය ආයතනයන්හි මුළු වත්කම් වලින් 3.4% ක නියෝජනයක් වාර්තා කර ඇත.

මෙම වසර තුළ රක්ෂණ සමාගම් නව එමෙන්ම නව්‍යත්වයෙන් යුතු සැලසුම් සහ මිලකරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් ප්‍රබල ආකාරයෙන් අලෙවි ක්‍රියාකාරකම් වල නිරත වී ඇත. කෙසේවෙතත්, සමස්ත දළ වාරිකයන්හි වාර්තා වූ වර්ධනය හමුවේ වුවද, දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස දළ වාරික ඔස්සේ පිළිබිඹු වන (2017 දී 1.27% සහ 2016 දී 1.20%) ශ්‍රී ලංකාවේ රක්ෂණ සේවා ව්‍යාප්තිය, ආසියානු කලාපයේ බොහොමයක් රටවල් සමග සැසඳීමේදී සැළකිය යුතු පහළ අගයක් වාර්තා කර ඇත. තවද, සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් ජීවිත රක්ෂණාවරණ සංඛ්‍යාව වසර 2017 දී 14.3% ක් වශයෙන් වාර්තා වූ අතර, ශ්‍රී ලාංකේය ප්‍රජාවගෙන් බහුතරයක් සඳහා ජීවිත රක්ෂණාවරණයක් නොපවතින බව ඉන් විදහා දක්වා ඇත. එමනිසා, මාගේ දැක්ම අනුව ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය තුළ වර්ධනය සඳහා ඉමහත් වූ ඉඩහසරක් පවතින බව පැහැදිලි කරුණකි.

ශ්‍රී ලංකාව තුළ රක්ෂණ සේවා සඳහා වන ඉල්ලුම ගනුදෙනුකරුවන්ගේ අතිරික්ත වශයෙන් වියදම් කළ හැකි ආදායම මත රඳා පවතී. එමනිසා, රක්ෂණයේ වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය මඳ වීම සහ රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකෙරෙන සමාජ ආරක්ෂණ සැලසුම්, අතිරික්ත වශයෙන් වියදම් කළ හැකි ආදායම් තත්වයේ මඳ බව සමග එක්ව ගත් කල, ශ්‍රී ලංකාවේ රක්ෂණ සේවා ව්‍යාප්තිය ඉහළ නැංවීම සඳහා වන බාධාකාරී සාධකයන් වශයෙන් හඳුනාගත හැකි වේ. ආර්ථික අනාවැකි මගින් දැක්වෙන පරිදි ශ්‍රී ලංකාව 'ඉහළ මධ්‍යම ආදායම් මට්ටමේ' රටක් බවට පත්වීමට අපේක්ෂිත බවත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් අතිරික්ත වශයෙන් වියදම් කළ හැකි ආදායම ඉහළ ගොස් රක්ෂණ සේවා ව්‍යාප්තියද වර්ධනය වනු ඇති බවට ප්‍රකාශිතය. මෙසේ අතිරික්ත වශයෙන් වියදම් කළ හැකි ආදායම ඉහළ යාමත් සමග අනාගතයේදී මෙරට තුළ ඉල්ලුම මත මෙහෙයවෙන රක්ෂණ ක්ෂේත්‍රයක් නිර්මාණය වනු නොඅනුමානය.

2018 අප්‍රේල් මස ක්‍රියාවට නැංවුනු බදුකරණ නීතිරීති වෙත සංශෝධනයන් මගින්, දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයන්හි නිරත රක්ෂණ සමාගම් වල කොටස් හිමිකරුවන් සහ රක්ෂණාවරණ හිමියන් වෙත අතිරික්තය බෙදාහැරීම, බදු වලට අදාළ ලාභ ගණනය කිරීම වැනි කරුණු කෙරෙහි සැළකිය යුතු බලපෑමක් එල්ල විය. මෙහිදී ඉහත සඳහන් කල අතිරික්තය කොටස් හිමිකරුවන්ගේ අරමුදල වෙත මාරු කොට එය සීමාකාරී සංචිතයක් වශයෙන් පවත්වා ගෙන යාම සඳහා ක්ෂේත්‍රය මගින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අනුමැතිය ඉල්ලා සිටින ලදී. ඒ අනුව, පත් කරන ලද ආයුගණකයන්ගේ නිර්දේශය පරිදි ජීවිත රක්ෂණ සමාගම් කිහිපයක් විසින් අදාළ අතිරික්තයන් ජීවිත රක්ෂණ අරමුදලෙහි සිට කොටස් හිමිකරුවන්ගේ අරමුදල වෙත මාරු කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 වසර සඳහා ලාභ කැපී පෙනෙන අයුරින් ඉහළ නැංවිණි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, ආසියානු සංවර්ධන බැංකුවේ (Asian Development Bank) ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වැඩසටහන (Capital Market Development Programme) සහ ලෝක බැංකුවේ (World Bank) මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතිය (Financial Sector Modernization Project) යන විදේශ අරමුදල් සම්පාදන ව්‍යාපෘතීන් දෙකක ප්‍රතිලාභී ආයතනයකි. මෙහිදී ආසියානු සංවර්ධන බැංකුව මගින් රක්ෂණ සැලසුම් සම්බන්ධ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපනික ක්‍රමෝපායක් හා ක්‍රියාකාරී සැලසුමක් සැකසීම උදෙසා සහ ජාත්‍යන්තර යහ ක්‍රියාකාරකම් වලට අනුකූලව අංග සම්පූර්ණ ආරවුල් නිරාකරණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙනු ලැබේ. ලෝක බැංකු ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි නියාමන හැකියාව සවිමත් කිරීමට සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යමය සහයෝගය පිරිනමනු ලැබේ. ඉහත සඳහන් කරන ලද ප්‍රතිසංස්කරණ, රක්ෂණ ක්ෂේත්‍රය වෙත වඩාත් ක්‍රියාකාරී නියාමන වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා සුබවාදී ආකාරයෙන් දායක වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, රජය මගින් සෑම වසරකම සැප්තැම්බර් මස 01 වැනි දින ''ජාතික රක්ෂණ දිනය'' වශයෙන් නම් කරන ලද අතර, එමගින් ජාතික ආර්ථිකය සහ සමාජ සුබසාධනය උදෙසා රක්ෂණ ක්ෂේත්‍රය මගින් ඉටු කරන ලද ප්‍රශංසනීය කාර්යභාරය ඇගයුමට ලක් කෙරිණි. මේ අවස්ථාව සමරමින් 2017 ජාතික රක්ෂණ දිනයේදී, තැපැල්, තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් වෙත විශේෂ සමරු මුද්දරයක් සහ මුල් දින කවරයක් පිළිගන්වන ලදී. මෙය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රකෂණ කරුවන්ගේ සංගමය විසින් එක්ව දරන ලද ප්‍රයත්නයක මල්ඵල ගැන්වීමකි. මෙසේ සැප්තැම්බර් මස 01 වැනි දින ජාතික රක්ෂණ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සහ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ මාසය (සැප්තැම්බර්) තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රකෂණ කරුවන්ගේ සංගමය මගින් දියත් කරන ලද ප්‍රවර්ධන ව්‍යාපෘතීන්, රක්ෂණයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා බෙහෙවින් ඉවහල් විය.

කොමිෂන් සභාව රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමය (International Association of Insurance Supervisors) සහ ආසියානු රක්ෂණ නියාමකයින්ගේ සංසදය (Asian Forum of Insurance Regulators) සමග ඵලදායී සබඳතාවයක් ගොඩනංවා ගැනීමේ කටයුතු වලදී ක්‍රියාකාරීව නිරතව සිටී. කොමිෂන් සභාව විසින් සවිමත් වූ නියාමන හා අධීක්ෂණ ආකෘතික රාමුවක් අනුගමනය කරනු ලබයි. එය දේශීය වෙළඳපොල තත්ත්වයන් සහ ක්ෂේත්‍රයේ සාමාජිකයන් සඳහා අතිශය යෝග්‍ය ආකාරයෙන් ක්‍රියා කරන අතර එමගින් රක්ෂණ වෙළඳපොලෙහි අභිවෘද්ධිය උදෙසා පහසුකම් සලසමින් සේවා කාර්යක්ෂමතාව සහ වෙළඳපොල ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරනු ලබයි.

මා විසින් 2018 අප්‍රේල් මස ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි සභාපති ධුරයේ කාර්යයන් භාරගනු ලැබූ අතර ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2018 මැයි මස කොමිෂන් සභාව වෙත නව සාමාජිකයින් පත් කරන ලදී. 2017 වසරේදී ඉටු කරන ලද ගෞරවනීය සේවාව වෙනුවෙන් කොමිෂන් සභාවෙහි හිටපු සභාපතිනී ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය සහ හිටපු සාමාජිකයින් වෙත මාගේ ප්‍රණාමය හිමි වේ.

අවසාන වශයෙන්, කොමිෂන් සභාවෙහි සාමාජිකයින්, සියළුම ලියාපදිංචි රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම්, අනුමත අතරමැදි සමාගම්, ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කාර සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සහ රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා ඇතුළු ක්ෂේත්‍රයේ සියළුම පාර්ශ්වකරුවන් වෙත ඔවුන් විසින් දක්වන ලද මහඟු සහයෝගය සහ තවදුරටත් ඔවුන් විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමග පවත්වා ගෙන යනු ලබන සවිමත් සහයෝගීතාවය උදෙසා මාගේ හෘදයාංගම ප්‍රණාමය පුද කරන අතර, කොමිෂන් සභාවෙහි තීරණ ක්‍රියාවට නැංවීමේදී දක්වන ලද කැපවීම සහ නම්‍යශීලීත්වය වෙනුවෙන් කොමිෂන් සභාවෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් සහ සමස්ත කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ස්තූතිය පිරිනමමි.



**මනෝ තිත්තවැල්ල**
සභාපති

# අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය



"ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් මූල්‍ය ක්ෂේත්‍රය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිරි වසර පහ තුළ ක්‍රියාවට නැංවීම සඳහා නියාමන සහ අධීක්ෂණ ප්‍රතිසංස්කරණ රැසක් හඳුනාගනු ලැබ ඇත. එසේ හඳුනාගනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් අතර, රක්ෂණ අධීක්‍ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය මගින් නිකුත් කරන ලද මූලික රක්ෂණ මූලධර්ම වලට සමගාමීව රක්ෂණ නීතිය ප්‍රතිසැකසීම, ක්ෂුද්‍ර රක්ෂණය සඳහා නියාමන ආකෘතික රාමුවක් නිර්මාණය කිරීම, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති අංක 17 (IFRS 17) කෙරෙහි අවධානය යොමුකරමින් අවදානම් පාදක ප්‍රාග්ධන නීති සමාලෝචනය කිරීම, තොරතුරු තාක්ෂණ ඒකාබද්ධකරණයක් සහිතව අවදානම මත පදනම් වූ අධීක්ෂණය වෙත පූර්ණ වශයෙන් ගමන් කිරීම සහ ව්‍යාපාර හැසිරීම පිළිබඳ නීති වැඩිදියුණු කිරීම වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් පාරිභෝගික හිමිකම් හැසිරවීමේ ක්‍රියාවලිය අනුකූලනය සහ රක්ෂණ ලියකියවිලි සම්බන්ධ දැනුවත්භාවය වර්ධනය කිරීම කෙරෙහිද අවධානය යොමු කෙරිණි."

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වසර 2017 දී ලද ජයග්‍රහනයන් දෙස ආපසු හැරී බලමින්, එම වසර තුළ රක්ෂණ ක්ෂේත්‍රයෙහි කාර්යසාධනය පිළිබඳව සමාලෝචනය කිරීමට මම කැමැත්තෙමි. රක්ෂණ ඔප්පු හිමියන් වෙත වැඩි සුරක්ෂිතතාවක් සැලසීමේ අරමුණින් සිදුකරන ලද නිසි අධීක්ෂණය සම්බන්ධව නියාමන අධිකාරිය වෙත අභියෝග රැසක් එල්ල වූ 2017 වසර, සැබැවින්ම සුවිශේෂී වූවකි.

## ප්‍රධාන නියාමන ඇරඹුම්

වසර 2017 දී රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනත වෙත බොහෝ කලක් තිස්සේ අපේක්ෂා කළ සංශෝධනයක් බලාත්මක වීම සිදුවිය. මෙම සංශෝධනය මගින් නියාමන අධිකාරියෙහි නාමය වෙනස් කිරීම සඳහා විධිවිධාන සැලසුනු අතර, ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වශයෙන් පැවති නාමය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යනුවෙන් වෙනස්වීමකට භාජනය විය. එමෙන්ම, මෙම සංශෝධනය මගින් 2011 සංශෝධනයේ අනිවාර්ය ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සම්බන්ධ විධිවිධාන සැපයිනි. එමෙන්ම, එමගින් පෙර පැවති සීමාවන් ඉවත් කරමින්, රක්ෂණ නියෝජිතයන් හට එක් ජීවිත රක්ෂණ සමාගමක සහ එක් සාමාන්‍ය රක්ෂණ සමාගමක අතරමැදියන් වශයෙන් කටයුතු කිරීමේ අවස්ථාව උදා වේ. මෙම සංශෝධනය මගින් රක්ෂණ නියෝජිතයින් හට වියුක්ත රක්ෂණ සමාගම් වල අතරමැදියන් වශයෙන් කටයුතු කිරීමේ අවස්ථාවද හිමි වේ.

වසර තුළදී අභ්‍යන්තර වශයෙන් ප්‍රමාණවත් ආයුගණන සහායක් නොමැතිව අවදානම් පාදක ප්‍රාග්ධන වැඩපිළිවෙල ක්‍රියාවට නැංවීමෙන් පසු අභියෝගයන් ඉස්මතු විය. විශේෂයෙන්ම, ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලින් කොටස් හිමිකරුවන්ගේ අරමුදල වෙත අතිරික්ත මාරු කිරීම් මත බදු ගාස්තු හඳුන්වාදෙන ලද නව බදුකරණ නීති සම්බන්ධයෙන් සළකා බලන කල මෙය අදාළ වේ. නව බදු ක්‍රමය බලාත්මක දිනයට පෙරාතුව, රක්ෂණ සමාගම් මගින් සහභාගී නොවන ව්‍යාපාරයන් තුළ පවත්වා ගෙන ගිය සමුච්චිත අතිරේක ස්වාරක්ෂකයන්, අදාළ කොටස් හිමිකාර අරමුදල් වෙත මාරු කරන ලදී. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයන් පවත්වාගෙන යනු ලබන රක්ෂකයින් විසින්, වසර 2016 දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් හඳුන්වාදෙන ලද ප්‍රාග්ධන ප්‍රමාණවත්භාව නීති පරිවර්තනය වීම හේතුවෙන් දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයෙන් ගොඩනැංවෙන අතිරික්තය කොටස් හිමිකරුවන්ගේ අරමුදල් වෙත මාරුකිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිර්දේශය විමසන ලදී. මෙයට පෙර අදාළ අතිරික්තය ජීවිත රක්ෂණ හිමියන්ගේ අරමුදල් වල රඳවාගැනීම අවශ්‍ය බවට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නිර්දේශ කර තිබිණි. එමනිසා, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් කොටස් හිමියන්ගේ අරමුදල් තුළ හුවමාරු වන හා නඩත්තු වන ලෙස ඉහත කී අතිරික්ත ගණනය කිරීම පිළිබඳව උපදෙස් නිකුත් කිරීම අවශ්‍ය විය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ආයුගණක සහයෝගය ලබාදීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාගැනීමට බාහිර ආයුගණන උපදේශන සමාගමක් යොදාගැනුනි. අදාළ මාර්ගෝපදේශයන් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු බැවින්, ඒ සම්බන්ධයෙන් පළ කරන ලද අදහස් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන් වෙත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රණාමය හිමි වේ. නිසි කලට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම හේතුවෙන් ඉහත දක්වන ලද බදු නීති හඳුන්වාදීමට බොහෝ කලකට පෙර එක්රැස් වූ එකී අතිරික්ත මාරුකිරීමේ අවස්ථාව අදාළ සමාගම් වෙත උදා විය.

ඇතැම් ක්‍රියාවලීන් අනුකූලනය කිරීම සඳහා ක්ෂේත්‍රය වෙත නීතිරීති හා නියෝග නිකුත් කිරීමෙහිද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නිරත විය. ඒවායින් සමහරක් නම්, අලාභ ගලපන්නන්ගේ නීති ලියාපදිංචි කිරීම, නිශ්චිත කාල පරාසයන් ඇතුළත රක්ෂණ ඔප්පු රක්ෂණ ඔප්පු හිමියන් වෙත බෙදාහැරීම සහ දිගු කාලීන රක්ෂණ සැලසුම් සඳහා අවලංගු කිරීමේ කාලසීමාව සම්මතකරණය දැක්විය හැක.

වැඩි දියුණු කරන ලද තවත් අංශයක් නම්, සිය වගකීම් පැහැදිලිව වෙන්කර හඳුනාගැනීම සඳහා රක්ෂකයාගේ ප්‍රධාන නිලධාරීවරයාගේ සහ නිශ්චිත

නිලධාරීවරයාගේ භූමිකාව සහ වගකීම සම්බන්ධයෙන් නියෝග නිකුත් කිරීමයි.

ක්ෂේත්‍රයේ ඉල්ලීම් මත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් දිගු කාලීන රක්ෂණ අරමුදලේ සහ තාක්ෂණික සංචිතයේ ආයෝජන පරාමිතීන් සංශෝධනය කිරීම සිදුවිය. මෙම සංශෝධනයන් මගින් ප්‍රධාන වශයෙන් සමාගම් විසින් ආයෝජන සම්බන්ධයෙන් මුහුණපාන ප්‍රායෝගික ගැටළු මැඩ පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරිණි. සංශෝධන මගින් මෙයට ඉහත අවශ්‍යතාවක්ව නොපැවති සමස්ත සමාගම් සහ සමූහයේ පැවතිය හැකි ආයෝජන සීමාවන් ද ඇතුළත් කෙරිණි.

ස්වකීය කළමනාකාරීත්වය යටතේ පවතින අරමුදල් විනිවිදභාවයකින් යුතුව, ඵලදායී සහ විචක්ෂණශීලී අයුරින් ආයෝජනය කිරීම සම්බන්ධයෙන්ද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂකයින් වෙත මාර්ගෝපදේශයන් නිකුත් කලේය.

විදේශ සෞඛ්‍ය රක්ෂණ සැලසුම් අලෙවිය පිළිබඳ මාර්ගෝපදේශයන් නිකුත් කරනු ලැබීමෙන් අනතුරුව, රක්ෂණ තැරැව්කරුවන් හට වඩාත් නිසි ආකාරයකින් අමතර ආදායමක් උපයා ගැනීමේ අවස්ථාවක් උදා වූ බව මෙහිදී සඳහන් කිරීම වැදගත් වේ. රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතීන් සුරැකීම සම්බන්ධයෙන් සුබවාදී පියවරක් වශයෙන්, පිළිගනු නොලැබූ ව්‍යාපාර අංශය තුළ නිසි නියාමනයකට ලක් නොවූ පුද්ගලයින් අතරමැදියන් වශයෙන් කටයුතු කිරීම තහනම් වීම හා ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වීම නතර කිරීම දැක්විය හැක.

රක්ෂණ සැලසුම් පිළිබඳව වන අංක 38 සහ 39 දරන චක්‍රලේඛ නිකුත් කිරීමත් සමග, රක්ෂණ සමාගම් වෙත නව සැලසුම් හඳුන්වාදීමේදී සහ පවතින සැලසුම් සංශෝධනය කිරීමේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත අදාළ ලියකියවිලි භාරදීම සඳහා කාල පරාසයන් ලබාදීම සිදුවිය. මෙමගින් රක්ෂණ ඔප්පු හිමියන් සුරැකීම උදෙසා අදාළ සැලසුම් හඳුන්වාදීමට පෙරාතුව විශේෂතා සම්බන්ධයෙන් මැදිහත් වීමේ අවස්ථාව නියාමන අධිකාරිය වෙත හිමි වේ.

අදාළ නියාමන ආකෘතික රාමුව වෙත වඩාත් අනුකූලනය කරන ලද සහ අන්තර්ග්‍රහනය කරනු ලද එළඹුමක් තහවුරු කිරීමේ අරමුණින් යුතුව, අප විසින් ප්‍රතිරක්ෂණ ආවරණ අවශ්‍යතාවන් ද සංශෝධනය කෙරිණි. මෙයට ප්‍රතිරක්ෂණ සංසදයන් සමඟ ස්ථානගත කිරීම සඳහා වැඩි සුරක්ෂිතතාවක් සැපයීම සහ සිය ප්‍රතිරක්ෂණ වැඩසටහන් වල කවර හෝ සැළකිය යුතු වෙනසක් සිදුකිරීමේදී රක්ෂණ සමාගම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමේ අවශ්‍යතාවයද ඇතුළත් වේ.


මෙහිදී සිදුකරන ලද තවත් ප්‍රතිසංස්කරණයක් වූයේ, සම්බන්ධිත දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයන් මත පවාරන අගය ගෙවීම සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් වෙත පනවා තිබුනු සීමාවන් ඉවත් කිරීමයි. රක්ෂණ ඔප්පුව අඛණ්ඩව වසර තුනක කාලයක් සක්‍රීයව නොපැවතියහොත් රක්ෂණ ඔප්පු හිමියන් වෙත පවාරන අගය ගෙවීම රක්ෂණ සමාගම් වලට නීතියෙන් ඉහතදී වළක්වන ලදී. කෙසේවුවද, රක්ෂණ සමාගම් වලට සිය අභිමතය පරිදි වසර තුනට අඩු කාලසීමාවක් තීරණය කිරීමේ අවසර ලබාදෙමින් මෙම විධිවිධානය ලිහිල් කරන ලදී.

කොමිෂන් සභාව විසින් මෙහෙයුම් වියදම්වල ඉහළයාම හේතුකොට ගෙන අවම ප්‍රකාශිත ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් මිලියන 2.5 ක් දක්වා ඉහළ නංවන ලදී.

## රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යසාධනය

### දළ ලිඛිත වාරික ආදායම

රටට බලපෑ ස්වභාවික ව්‍යසනයන් හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතය 4.5% (2016) සිට 3.1% (2017) දක්වා පහල ගොස් ආර්ථිකය ඍණාත්මක ප්‍රවණතාවක් පිළිබිඹු කළ අතර, රක්ෂණ ව්‍යාපාරයද විශේෂයෙන්ම ජීවිත රක්ෂණ ව්‍යාපාරය 18% (2016) සිට 12.6% (2017) දක්වා මන්දගාමී වර්ධනයක් වාර්තා කලේය. මෙය, පසුගිය වසර වල පැවති





වර්ධනීය තත්ත්වයෙන් කැපී පෙනෙන පහළ යාමකි.

මෙම මන්දගාමීත්වය සමස්ත වර්ධන අනුපාතය 16.35% (2016) සිට 15.07% දක්වා පහත වැටීම කෙරෙහි බලපෑවේය. ස්විස් රී. සිග්මා වාර්තාවට අනුව, ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයට අදාළව දියුණු වෙළඳපොල වලද මෙම මන්දගාමීත්වය දක්නට ලැබිණි. මෙයට ප්‍රතිවිරුද්ධ අයුරින්, සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය පසුගිය වසර පහක කාලය තුළ ඉහළම වර්ධන අනුපාතය වාර්තා කරමින් 14% (2016) සිට 17% දක්වා ඉහළ අගයක් වාර්තා කලේය. කෙසේවුවද, ඉහත වගුවේ දැක්වෙන පරිදි, රක්ෂණය සම්බන්ධ ඉල්ලුමෙහි ඉහළ යාමක් පිළිබිඹු කරමින් වසරින් වසර නිරපේක්ෂ වටිනාකම ඉහළ ගොස් ඇත.

වසර 2015 සිට ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ මන්දගාමී වර්ධනය, ඍණාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කළ නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාවෙන් පිළිබිඹු වේ.

2015 වසර සමග සැසඳීමේදී 2017




නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාවෙහි පහත වැටීම 104,355 පමණ වේ. මෙයට ප්‍රතිවිරුද්ධව, සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයෙහි දළ ලිඛිත වාරික ආදායමෙහි මෙන්ම, නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාවෙහිද වර්ධනයක් දක්නට ලැබිණි. 2016 වර්ෂය සමග සැසඳීමේදී නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාවෙහි ඉහළ යාම 219,845 කි.

## රක්ෂණ ව්‍යාප්තිය හා ඝනත්වය


වර්ධනය ආශ්‍රිතව සුබවාදී ප්‍රවණතාවක් දක්නට ලැබුනද, රක්ෂණ ව්‍යාප්තිය සහ ඝනත්වය සම්බන්ධයෙන් නැගී එන ආසියානු රටවල් හමුවේ ශ්‍රී ලංකාව බොහෝ පසුපසින් පසුවේ. දිගු කාලීන ව්‍යාපාරයන්හි 0.54% ක් හා සාමාන්‍ය

රක්ෂණ ව්‍යාපාරයන්හි 0.70% වශයෙන් රක්ෂණ ගහනය 1.24%ක පහළ මට්ටමක පැවතිනි. කෙසේවුවද, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අධීක්ෂණ සහ නියාමන විෂය පථය තුළට අයත් නොවන බැවින්, ගහන අනුපාතය ගණනය කිරීමේදී අදාළ ආයතන දෙකෙහි දළ ලිඛිත වාරික ආදායම සළකා නොබැලේ. ඒ අයුරින්ම, නියාමනයට ලක් නොවූ ක්ෂුද්‍ර රක්ෂණ ආයතන මගින් උත්පාදනය කරන ලද රක්ෂණ වාරිකද, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මගින් ණය ආරක්‍ෂණ ආවරණ මත අය කරන ලද වාරිකද ගහන අනුපාතය ගණනය කිරීමේදී සැළකිල්ලට නොගැනේ. ඒක පුද්ගල දළ ලිඛිත වාරික ආදායම විසින් නියෝජනය කරනු ලබන රක්ෂණ ඝනත්වය රු.6,747 සිට රු.7,677 දක්වා 14% කින් ඉහළ ගියේය.

## රක්ෂණ වත්කම්

රක්ෂණ සමාගම් විසින් වාර්තා කරන ලද වත්කම් වල වටිනාකම 2016 පැවති රු. මිලියන 525,329 සිට 2017 දී රු. මිලියන 582,417 දක්වා ඉහළ ගොස් තිබිණි.

කෙසේවුවද, 2017 දී වර්ධන අනුපාතය





12.61% සිට 10.87% දක්වා පහළ ගොස් තිබිණි. ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් වල වර්ධන අනුපාතය 13.5% ක් වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ එම අනුපාතය 6.77% ක් විය.

## ක්ෂේත්‍රයේ ලාභදායීත්වය

72% ක බදු වලට පෙර ලාභයක් සමඟින් දිගු කාලීන රක්ෂණ සමාගම් වසර අවසානයේදී සැළකිය යුතු ලාභයක් වාර්තා කලේය. ප්‍රාග්ධන ප්‍රමාණවත්භාව අනුපාතයන්හි වෙනස්වීම හේතුවෙන් ගොඩනැංවුනු අතිරික්තය රු. මිලියන 15,867 ක් වීම සමඟින්, ලාභ රු. මිලියන 39,268 දක්වා ඉහළ ගියේය.

මෙයට ප්‍රතිවිරුද්ධ අයුරින්, 2016 වසර හා සැසඳීමේදී සාමාන්‍ය රක්ෂණ





ව්‍යාපාරයේ ලාභදායීත්වය පහළ ගිය අතර, වසර අවසානයේදී රු. මිලියන 8,543ක් වශයෙන් වාර්තා විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 2016 දී සැළකිය යුතු කල් පසු වූ ලාභාංශ අදායමක් ලබාගැනීම හමුවේ මෙම පහළ යාම සිදුවිය. සමාගම් හතරක් අලාභ වාර්තා කළ වසර 2016 සමග සැසඳීමේදී, එක් සමාගමක් හැරුනු විට අන් සියළුම සාමාන්‍ය රක්ෂණ සමාගම් ලාභ වාර්තා කිරීමට සමත් විය.


## නුබුන්වත්භාවය

අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන නීතිරීති මගින් රක්ෂකයින් විසින් මුළු පවතින ප්‍රාග්ධනය වශයෙන් රු. මිලියන 500 ක අවමයක් සහ 120% ක ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

## නුබුන්වත්භාවය-දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර

MBSL රක්ෂණ සමාගම හැර, දිගු









කාලීන රක්ෂණ ව්‍යාපාර සිදුකරනු ලබන සමාගම් වසර 2016 සහ 2017 සඳහා රු මිලියන 500 ක මුළු පවතින ප්‍රාග්ධන අවමය සපුරාලීමට සමත් විය. සමස්ත මුළු පවතින ප්‍රාග්ධනය වසර 2017 දී 9.17% කින් ඉහළ ගිය අතර එය රු. මිලියන 191,175 ක් වශයෙන් වාර්තා විය. වසර 2016 සහ 2017 සඳහා 160% ක් වශයෙන් සකසනු ලැබ ඇති ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය සම්බන්ධයෙන් සළකන කල, වසර 2016 දී බලපැවැත්වෙන මට්ටම අත්පත් කර ගැනීමට අපොහොසත් වූ MBSL රක්ෂණ සමාගම හැර සියළුම සමාගම් විසින් ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය සම්බන්ධ බලපැවැත්වෙන මට්ටම අත්පත් කරගන්නා ලදී. කෙසේවුවද, ඔවුන්ගේ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය අවශ්‍ය අවම මට්ටමට වඩා ඉහළ අගයක පැවතිනි. 2017 දී ක්ෂේත්‍රය සඳහා ප්‍රාග්ධන අනුපාතය 302% සිට 317% දක්වා වර්ධනය විය.

## නුබුන්වත්භාවය-සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

MBSL රක්ෂණ සමාගම සහ සණස රක්ෂණ සමාගම හැර, සියළුම සමාගම් මුළු පවතින ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලීමට සමත් විය. සණස රක්ෂණ සමාගම සංයුක්ත සමාගමක් වූ අතර, ඔවුන් විසින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය මාරු කිරීම සඳහා සංස්ථාපිත පරිපාලිත සමාගමක අර්ධ වශයෙන් ආයෝජනය කරනු ලැබ තිබිණි. සමස්ත මුළු පවතින ප්‍රාග්ධනය රු. මිලියන 47,160 සිට රු. මිලියන 52,142 දක්වා 10.5% කින් වර්ධනය විය. මෙහිදී ෆෙයාෆස්ට් රක්ෂණ සමාගම මගින් 329% ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරන ලද බව සැලකිය යුතු කරුණක් වේ.

ප්‍රාග්ධන ප්‍රමාණවත්භාව අනුපාතය




සම්බන්ධයෙන් සළකන කල, MBSL රක්ෂණ සමාගම හැර සියළුම සමාගම් 120% ක් වූ අවම ප්‍රාග්ධන ප්‍රමාණවත්භාව අනුපාතය අත්පත් කරගැනීමට සමත් විය. කෙසේවුවද, බලාත්මක ප්‍රාග්ධන ප්‍රමාණවත්භාව අනුපාතය වන 160%ට පහළ අගයක් වාර්තා කළ සමාගම් කිහිපයක් පැවති අතර, එවැනි සමාගම් දැඩි අවධානයකින් යුතුව අධීක්ෂණය විය. සාමාන්‍ය ප්‍රාග්ධන ප්‍රමාණවත්භාව අනුපාත වසර 2016 සහ 2017 දී 177%ක් වශයෙන් නොවෙනස්ව පැවතිණි.

## තැරැව්කාර ව්‍යාපාරයේ කාර්යසාධනය

2016 සමග සැසඳීමේදී තැරැව්කරුවන්ගේ දළ ලිඛිත වාරික ආදායම 26.11% ක කැපීපෙනෙන වර්ධනයක් වාර්තා කලේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමස්ත දළ ලිඛිත වාරික ආදායම වෙත දායකත්වයද 2016 දී පැවති 12.43% සිට 2017 දී 13.62% දක්වා වර්ධනය විය. මෙම දායකත්වය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සහ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර උත්පාදිත වාරික ආදායම එකතුවීමෙන් සෑදී ඇත. එය පිළිවෙලින් 98.48% සහ 1.52% කි.




## අනාගත ක්‍රමෝපාය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් මූල්‍ය ක්ෂේත්‍රය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිරි වසර පහ තුළ ක්‍රියාවට නැංවීම සඳහා නියාමන සහ අධීක්ෂණ ප්‍රතිසංස්කරණ රැසක් හඳුනාගනු ලැබ ඇත. එසේ හඳුනාගනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් අතර, රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය මගින් නිකුත් කරන ලද මූලික රක්ෂණ මූලධර්ම වලට සමගාමීව රක්ෂණ නීතිය ප්‍රතිසැකසීම, ක්ෂුද්‍ර රක්ෂණය සඳහා නියාමන ආකෘතික රාමුවක් නිර්මාණය කිරීම, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති අංක 17 (IFRS 17) කෙරෙහි අවධානය යොමුකරමින් අවදානම් පාදක ප්‍රාග්ධන නීති සමාලෝචනය කිරීම, තොරතුරු තාක්ෂණ ඒකාබද්ධකරණයක් සහිතව අවදානම මත පදනම් වූ අධීක්ෂණය වෙත පූර්ණ වශයෙන් ගමන් කිරීම සහ ව්‍යාපාර හැසිරීම පිළිබඳ නීති වැඩිදියුණු කිරීම වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් පාරිභෝගික හිමිකම් හැසිරවීමේ ක්‍රියාවලිය අනුකූලනය සහ රක්ෂණ ලියකියවිලි සම්බන්ධ දැනුවත්භාවය වර්ධනය කිරීම කෙරෙහිද අවධානය යොමු කෙරිණි.

## ප්‍රණාමය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් සාර්ථකව පවත්වාගෙන යාමට කොමිෂන් සභාව මගින්, මා වෙත සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත සපයන ලද මාර්ගෝපදේශකත්වය හා සහයෝගය වෙනුවෙන් මාගේ ප්‍රණාමය හිමි වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත දක්වන ලද සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය යන ආයතනයන්හි සභාපතිවරුන් සහ නිලධාරී මණ්ඩල වෙතද, සියළුම රක්ෂණ සමාගම් සහ තැරැව්කාර සමාගම් වෙතද මාගේ කෘතඥතාවය පළ කරමි. අවසාන වශයෙන්, වසර සඳහා වූ ඉලක්ක සපුරාගැනීම සඳහා මා වෙත සහයෝගය දක්වන ලද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ සමස්ත කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ස්තූතිය පුද කරමි.



**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජනරාල්



# කළමනාකරණ තොරතුරු

# කොමිෂන් සභාවේ සාමාජිකයින්




[1] මනෝ තිත්තවැල්ල මහතා - සභාපති
[2] සී. ජේ. පී. සිරිවර්ධන මහතා
[3] උපුල් දේශප්‍රිය මහතා
[4] ඒ. ආර්. දේසප්‍රිය මහතා
[5] වයි. කනගසබේ මහතා
[6] ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා
[7] එරල් පෙරේරා මහතා

# කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව

## (1) මනෝ තිත්තවැල්ල මහතා සභාපති

මනෝ තිත්තවැල්ල මහතා ශ්‍රී ලංකාවේ සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ මහ ලේකම්වරයා වේ.

හෙතෙම ගරු මුදල් අමාත්‍යවරයාගේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයා වශයෙන්ද කටයුතු කරයි.

තිත්තවැල්ල මහතා 2003 අගෝස්තු මස සිට 2005 නොවැම්බර් මස දක්වා ආර්ථික කටයුතු සම්බන්ධ ජ්‍යෙෂ්ඨ ජනාධිපති උපදේශකවරයා සහ ජනාධිපති කාර්යාල ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන්ද ක්‍රියා කලේය. හෙතෙම ක්‍රමෝපායික ව්‍යවසාය කළමනාකරණ ඒජන්සියේ (SEMA) ප්‍රථම සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය ව්‍යවසායන්හි වගවීම, යහ පාලනය සහ කාර්යසාධනය වර්ධනය කිරීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කලේය. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණයේ උත්තරීතර ආයතනය වන ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික කවුන්සිලයේ (NCED) අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු වශයෙන් සේවය කිරීමට අමතරව ඒ මහතා, මෙරට පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිසාධනය සඳහා ස්ථාපනය කරන ලද ජාතිය යළි ගොඩනැංවීම සඳහා වන කාර්ය බලකායේ (TAFREN) සභාපතිවරයා වශයෙන් ද කටයුතු කලේය.

තිත්තවැල්ල මහතා එවකට ශ්‍රී ලංකා රජයේ පෞද්ගලීකරණ නියෝජිත ආයතනය වූ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමෙහි (PERC) අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුවේ සභාපති සහ ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වැනි රජයේ ඉහළ තනතුරු රැසක් හොබවා ඇත. පෞද්ගලික අංශයේද වසර 35 කට අධික අත්දැකීම් ඒ මහතා සතු වේ.

වර්ෂ 1960 මැයි මස 08 වන දින උපත ලද තිත්තවැල්ල මහතා කොළඹ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ අතර එඩින්බර්ග් සරසවියේ ප්‍රාග්ධන වෙළඳපොල සහ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි. හෙතෙම බ්‍රිතාන්‍ය විවෘත විශ්ව විද්‍යාලයේ මානව පරිගනක අන්තර් ක්‍රියාකාරීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකුද වේ. ඒ මහතා වසර 2000 සිට 2003 දක්වා ජාත්‍යන්තර භාරකාරත්ව මණ්ඩලයේ සහ එක්සත් රාජධානි වරලත් අලෙවිකරුවන්ගේ සංගමයේ සාමාජිකයකු වශයෙන්ද කටයුතු කලේය.

## (2) සී.ජේ.පී. සිරිවර්ධන මහතා

සී.ජේ.පී. සිරිවර්ධන මහතා 2017 අගෝස්තු මස සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා වශයෙන් කටයුතු කරයි. ඒ මහතා මහ බැංකුවේ මූල්‍ය ක්ෂේත්‍ර නියාමන සහ අධීක්ෂණ සාමූහිකය භාරව ක්‍රියා කරයි. මහ බැංකුවේ වසර 31 කට අධික අත්දැකීම් සහිත සිරිවර්ධන මහතා ආර්ථික හා මිල ස්ථාවරකරණ, මූල්‍ය පද්ධති ස්ථාවරකරණ සහ බැංකුව මගින් සිදුකරන ලබන වෙනත් ඒජන්සි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විශේෂඥභාවයක් උසුලයි. නියෝජ්‍ය අධිපතිවරයා වශයෙන් පත්වීමට ප්‍රථම හෙතෙම රාජ්‍ය ණය, තොරතුරු තාක්ෂණ, නීති හා අනුකූලතා, සාර්වවිචක්ෂණතා අධ්‍යයන, මානව සම්පත්, ප්‍රතිපත්ති සමාලෝචන සහ අධීක්ෂණ, ගෙවීම් සහ පියවීම් සහ අවදානම් කළමනාකරණ අංශයන් භාර සහකාර අධිපතිවරයා වශයෙන් සේවය කලේය.

එක්සත් රාජධානියේ වොවික් සරසවියේ ප්‍රමාණාත්මක සංවර්ධන ආර්ථිකය සම්බන්ධ විද්‍යාපති උපාධියක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සිරිවර්ධන මහතා සතු වේ. ඒ මහතා රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිධරයෙකි. හෙතෙම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන්ද සේවය කලේය. ඒ මහතා මේ වන විට ණය තොරතුරු කාර්යාංශයේ සභාපතිවරයා වශයෙන්ද, කළම්බු ඩොක්යාඩ් පීඑල්සී හි අධ්‍යක්ෂකවරයකු වශයෙන්ද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙහි කමිටු සාමාජිකයකු වශයෙන්ද, ජාතික ගෙවීම් කවුන්සිලයේ සභාපතිවරයා වශයෙන්ද කටයුතු කරයි.

## (3) ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා

ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිධාරයෙකු සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ උපාධිධාරියෙකු වේ. එසේම ඒ මහතා එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණය සහ බුද්ධිමය දේපල විෂයයන් සමගින් ජාත්‍යන්තර ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් නීතිය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකු වේ. වෘත්තියෙන් නීතිඥවරයෙකු වන ඒ මහතා 1988 දී සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සේවයට එක් වන අතර දැනට වසර 31 කට අධික කාලයක් මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන ඒ මහතා වර්තමානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ලෙස රාජකාරි කරනු ලබයි. ඒ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයෙහි, ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් අධීක්ෂණ මණ්ඩලයෙහි සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙහි නිලබලයෙන් සාමාජිකයෙකු වේ.

### (4) ඒ. ආර්. දේසප්‍රිය මහතා

රාජ්‍ය අංශය තුළ වසර 30කට අධික අත්දැකීම් දේසප්‍රිය මහතා සතු වේ. හෙතෙම මේ වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.

මෙම කාලසීමාව තුළ ඒ මහතා රාජ්‍ය අංශයේ විවිධ තනතුරු වල සේවය කොට ඇති අතර, මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂක හා අතිරේක අධ්‍යක්ෂක ජනරාල් ඇතුළු විවිධ නිලතල හොබවා ඇත.

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වශයෙන් වර්තමාන ධූරයේ වැඩ භාරගැනීමට ප්‍රථම ඒ මහතා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා වශයෙන් කටයුතු කලේය. හෙතෙම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂකවරයකු හා එහි සුබසාධන ප්‍රතිලාභ මණ්ඩල සාමාජිකයකු වශයෙන්ද ක්‍රියාකරයි.

ශ්‍රී ලංකා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිධරයකු වන ඒ මහතා ස්ලෝවේනියාවේ ලුබ්ලිජානා විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධිධරයකු ද වේ.

### (5) වයි. කනගසබේ මහතා

2018 පෙබරවාරි 1 වැනි දින සිට විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂකවරයකු වශයෙන් කටයුතු කරන කනගසබේ මහතා, විගණන කමිටුවේ සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුවේ සභාපතිවරයාද, පාරිශ්‍රමික හා ප්‍රතිලාභ කමිටුවේ සාමාජිකයකුද වේ.

හෙතෙම ලංකා දුම්කොළ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ සභාපතිවරයා වශයෙන්ද, මිලේනියම් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගමෙහි, සීමාසහිත කාර්ගිල්ස් ෆුඩ් සමාගමෙහි, සීමාසහිත හන්ටර්ස් පීඑල්සී සහ ලංකා කැනරීස් සමාගමෙහි විධායක අධ්‍යක්ෂකවරයකු සහ අධ්‍යක්ෂක මණ්ඩලය සාමාජිකයකු වශයෙන්ද කටයුතු කරයි.

හෙතෙම 2016 අගෝස්තු මස සිට 2018 දෙසැම්බර් 31 දින තෙක් යුනියන් බැංකුව පීඑල්සී (ටෙක්සාස් පැසිෆික් සමූහයේ අනුබද්ධ ආයතනයකි) විගණන කමිටු සභාපතිවරයා වශයෙන්ද, වසර 2006 දී ප්‍රයිස්වොටර්හවුස්කූපර්ස් හි ජ්‍යෙෂ්ඨ හවුල්කරු/ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන්ද සේවය කලේය. ඒ මහතා 2017 මාර්තු මස 31 වැනි දින සේවයෙන් විශ්‍රාම ලැබීය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයෙහි සාමාජිකයකු වන හෙතෙම ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් ආරම්භයේ පටන් සේවය කලේය.

වසර 1981 දී එම ආයතනයේ සේවයට එක් වූ ඒ මහතා 2006 දී ජ්‍යෙෂ්ඨ හවුල්කරු/ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් පත්වීමට ප්‍රථම එහි වගකිව යුතු තනතුරු රැසක් දැරීය. 2017 මාර්තු මස 31 වැනි දින සේවයෙන් විශ්‍රාම ලද ඒ මහතා එම ආයතනයේ ශ්‍රී ලංකා සහ මාලදිවයින් ශාඛාවන්හි ප්‍රගමනය උදෙසා කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කලේය. එහිදී යෝග්‍ය වූ ප්‍රමිතීන් සහ අදාළ යහ ක්‍රියාකාරකම් ඔස්සේ අඛණ්ඩවම උසස් තත්ත්වයේ සේවාවන් ගනුදෙනුකරුවන් වෙත ලබාදීම සඳහා අවශ්‍ය පසුබිම ඒ මහතා විසින් සකසන ලදී. සාර්ථක කළමනාකරණ සහ ක්‍රියාවට නැංවීමේ සේවා ඉතිහාසයක් සහිත සදාචාර සම්පන්න ව්‍යාපාරික නියමුවකු වශයෙන් සැළකෙන ඒ මහතා සතුව වර්තමාන ආර්ථික, සමාජයීය සහ නියාමන ගැටළු සම්බන්ධ පෘථුල දැනුමක් පවතී.

### (6) එරල් පෙරේරා මහතා

එරල් පෙරේරා මහතා එංගලන්තය, මැලේසියාව සහ ශ්‍රී ලංකාව යන රටවල විවිධ වර්ගයේ ව්‍යාපාරික අංශයන්හි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හොබවන ලද පරිනත වෘත්තිකයෙකි. පෙරළා ශ්‍රී ලංකාවට පැමිණීමෙන් අනතුරුව හෙතෙම විදේශ ආයෝජන සහ තාක්ෂණික හුවමාරු සහිත හවුල් ව්‍යාපාර ව්‍යාපෘතීන් ප්‍රවර්ධනය කෙරෙහි සිය අවධානය යොමු කලේය. ඒ මහතා දුරකථන නාමාවලි ප්‍රකාශනය, ජේ ෆෝන් සහ ජේජර් හවුල් ව්‍යාපාර ව්‍යාපෘතීන් සඳහා පුරෝගාමී තත්ත්වයේ ආයෝජන මණ්ඩල අනුමැතිය ලබාගැනීමට සමත් විය. කොමර්ෂල් බැංකුව සහ විදේශීය සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ වෙන්චර් කැපිටල් සහ ඒකක භාර ඇරඹුම් ව්‍යාපෘතීන් දියත් කිරීම උදෙසාද හෙතෙම ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කලේය. වසර 1990 දී සභාපතිවරයාගේ ජාත්‍යන්තර කුසලානය (මේ වන විට Verizon USA නමින් හැඳින්වෙන) දිනාගත් සාඩම්බර ජයග්‍රාහකයා වූයේද පෙරේරා මහතාය. වසර 1995 දී ඔහුගේ ප්‍රමුඛත්වයෙන් යුතුව, දුරකථන නාමාවලි ප්‍රකාශන කණ්ඩායම විසින් එදාමෙදා තුර ශ්‍රී ලංකාවේ ප්‍රථම තත්ත්ව සම්මානය දිනාගැනීමට සමත් විය. ඒ මහතා ඇමරිකානු වාණිජ මණ්ඩලයේ ආරම්භක සාමාජිකයෙකි. හෙතෙම මේ වන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික සමාගම් කිහිපයක ස්වාධීන අධ්‍යක්ෂකවරයකු වශයෙන් කටයුතු කරයි.

### (7) උපුල් දේශප්‍රිය මහතා

වෘත්තියෙන් නීතිඥවරයකු වන දේශප්‍රිය මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ එල්එල්බී (ගෞරව) උපාධිධරයෙකි. හෙතෙම 2015 සිට 2018 දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයකු වශයෙන්ද 2014 සිට 2016 දක්වා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු භාණ්ඩාගාරිකවරයා වශයෙන්ද කටයුතු කලේය.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම




[1] දමයන්ති ප්‍රනාන්දු මහත්මිය (අධ්‍යක්ෂ ජනරාල්)
[2] චමරී ඒකනායක මහත්මිය (අධ්‍යක්ෂ - අධීක්ෂණ)
[3] රනිල් අඟුණවෙල මහතා (අධ්‍යක්ෂ - නීති)
[4] සුධීර සේනාරත්න මහතා (අධ්‍යක්ෂ - විමර්ශන)
[5] රාජන් නිරූබසිංහම් මහතා (සහකාර අධ්‍යක්ෂ - නීති)
[6] බිම්සර විජේසිංහ මහතා (සහකාර අධ්‍යක්ෂ - වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා)
[7] සාරිකා වත්තුහේවා මහත්මිය (සහකාර අධ්‍යක්ෂ - අධීක්ෂණ)

# කාර්ය මණ්ඩලය




[1] ලක්ෂ්මන් විජේසිංහ මහතා
[2] කෝකිලා සිරිවර්ධන මහත්මිය
[3] මෙරීනා ඩයස් මහත්මිය
[4] චන්දිමා කඹුරුගමුව මහත්මිය
[5] ශානිකා නානායක්කාර මහත්මිය
[6] ලසන්ති තොටහේවා මහත්මිය
[7] රොෂාන් ද කොස්තා මහතා
[8] උපලක්ෂි රණසිංහ මෙනවිය
[9] සනත් උදයංග මහතා
[10] මල්හාරි වික්‍රමසිංහ මහත්මිය
[11] චරිත වික්‍රමසිංහ මහතා
[12] නිරෝෂා මධුෂානි මෙනවිය
[13] එතිර්රාජ් ශ්‍රීකාන්තන් මහතා
[14] ඩෙසිකා රත්නායක මහත්මිය
[15] උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය
[16] රුවිනි ලියනගේ මහත්මිය
[17] ඩී.ඩබ්ලිව්.එස්.එස්. සුපුලි මහත්මිය
[18] චමින්ද ලාල් කුමාර මහතා

# කාර්ය මණ්ඩලය




[19] සමන් සේනාධීර මහතා
[20] ප්‍රියංගි ද සිල්වා මහත්මිය
[21] වින්ද්‍යානි තුලපිටිය මහත්මිය
[22] ෂශිනි ප්‍රේමලාල් මහත්මිය
[23] අචිනි සේරසිංහ මෙනවිය
[24] පවිත්‍රා පුංචිහේවා මහත්මිය
[25] ලක්මිණ පතිරාජ මහතා
[26] කෞශාලි දයාරත්න මහත්මිය
[27] අනුෂ්ක බණ්ඩාර මහතා
[28] සුජීවා රණසිංහ මහත්මිය
[29] නයන රවින්ද්‍ර මහතා
[30] ඩිලාන් මිහිරංග මහතා
[31] තුෂාරි විජේගුණවර්ධන මහත්මිය
[32] නිලංකා වලිසුන්දර මහත්මිය
[33] වීණා සෙනෙවිරත්න මහත්මිය
[34] තිළිණි වාකිෂ්ඨ මහත්මිය
[35] ශ්‍යාමලී අත්තනායක මහත්මිය
[36] නලින් තලගල මහතා



# සමාලෝචන


පොදු සමාලෝචනය 22
සංඛ්‍යානමය සමාලෝචනය 28
මෙහෙයුම් සමාලෝචනය 62

# පොදු සමාලෝචනය

**පනත ක්‍රියාත්මක කිරීම සහ නියාමන ප්‍රතිසංස්කරණ**

**නීති සම්පාදනය**

රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සද්භාවයෙන්ද වෘත්තිමය හා විචක්ෂණභාවයෙන්ද යුතුව කරගෙන යනු ලබන බවට සහතික කිරීම (මෙහි මින් මතු කොමිෂන් සභාව යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පරමාර්ථය හා වගකීම වේ.

රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම්, රක්ෂණ නියෝජිතයන් හා අලාභ ගලපන්නන් නියාමනය හා අධීක්ෂණය සඳහා අවශ්‍ය නෛතික රාමුව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙහි මින්මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් සලසා ඇත.

මෙම පනත 2007 අංක 27, 2011 අංක 3 සහ 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් වලින් සංශෝධනය වී ඇත.

**උප නීති සම්පාදනය**

පනත යටතේ වර්ෂය තුල නිකුත් කරන ලද උප නීති පහත නියාමන ප්‍රතිසංස්කරණ යටතේ දක්වා ඇත.

**නියාමන ප්‍රතිසංස්කරණ**

පනත් සංශෝධනයේ වෙනත් කරුණු අතරතුර ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ලෙස වූ ශ්‍රී ලංකා රක්ෂණ නියාමකගේ නාමය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙසට වෙනස් කිරීම, ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කිරීම ආදි කරුණු

2017 අංක 23 දරන සංශෝධන පනත මගින් පහත සඳහන් වෙනස්කම් පනතට සිදුකරන ලදි.

**(1) ආයතන නාමය වෙනස් කිරීම.**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය නාමයෙහි "මණ්ඩලය" යන වදන "කොමිෂන් සභාව" යන්නෙන් ප්‍රතිස්ථාපනය කර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙස හැඳින්වීමට නිර්දේශ කරන ලදි.

**(2) ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කිරීම**

පහත දැක්වෙන කාණ්ඩයන් අයත් රක්ෂණ සමාගම් වලට පනතේ ප්‍රතිපාදන ප්‍රකාර අනිවාර්ය ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කිරීම සඳහා අයැදුම් කළ හැකිය.

i දේශීය පාලිත රක්ෂණ සමාගමේ කොටස් වලින් අවම වශයෙන් සියයට අසූ පහක් විදේශීය පාලක සමාගමක් දරනු ලබන විට සහ එම පාලක සමාගම කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විදේශීය ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක (එනම් කොටස් වෙළඳපොලක) ලැයිස්තුගත කර ඇති විටක එම දේශීය පාලිත රක්ෂණ සමාගමේ ගිණුම් විදේශීය පාලක සමාගමේ සමූහ ව්‍යාපාර ඒකාබද්ධ ගිණුම් වලට ඇතුළත් කර ඇති බවට; සහ දේශීය පාලිත රක්ෂණ සමාගමේ ගිණුම් වලට අදාළ නියමයන් ඇතුළු එම විදේශීය පාලක සමාගම ලැයිස්තුගත කර ඇති විදේශීය ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සියලු විධිමත් කිරීමේ නියමයන්ට සමූහ ව්‍යාපාර මට්ටමින් අනුකූල වන බවට සහතික විය යුතු බවට එම විදේශීය ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය මගින් එම විදේශීය සමාගමට නිත්‍යානුකූලව නියම කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වීමෙන් පසු එබඳු දේශීය පාලිත රක්ෂණ සමාගමක් (පනතේ 15 ආ වගන්තිය)

ii යම් දේශීය පාලිත රක්ෂණ සමාගමක් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලබා ඇති ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති සමාගමක් විසින් දරනු ලබන විට එබඳු පාලිත රක්ෂණ සමාගමක්: (පනතේ 15 ඇ (2) වගන්තිය)

ඉහත සඳහන් කල කාණ්ඩ දෙක හැරුණු විට ජාතික රක්ෂණ භාර අරමුදල, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හෝ සමාගම් දෙකක් බවට වෙන් කරනු ලැබීමෙන් පසු පිහිටුවන ලද යම් රක්ෂණ සමාගම් එකී අනිවාර්ය ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කරනු ලැබේ. එනමුත් එම නිදහස් කිරීම වලංගු වන්නේ එකී ආයතන වල හිමිකාරිත්වය ශ්‍රී ලංකා ආණ්ඩුව දරන තාක් පමණකි. (පනතේ 15 ඇ (1) සහ (3) වගන්ති)

පනතේ 15 ඇ වගන්තිය මගින් තවදුරටත් දැක්වෙන්නේ ලැයිස්තුගත කිරීමෙන් නිදහස හිමි වන රක්ෂණ සමාගම් විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි වලට අනුකූල විය යුතු බවයි.

**(3) රක්ෂණ නියෝජිත.**

පනතේ 78 (5) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්ති ආදේශ කර ඇත:

i) යම් තැනැත්තකු තැරැව්කරුවකුගේ හෝ රක්ෂණකරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස දැනටමත් ලියාපදිංචි වී ඇත්නම් එම තැනැත්තා තැරැව්කරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස පත් කරනු ලැබීමට නුසුදුස්සකු වන්නේය;

ii) යම් තැනැත්තකු තැරැව්කරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස දැනටමත් ලියාපදිංචි වී ඇත්නම් එම තැනැත්තා රක්ෂණකරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස පත් කරනු ලැබීමට නුසුදුස්සකු වන්නේය;

iii) යම් තැනැත්තකු රක්ෂණ ව්‍යාපාරයේ යම් විශේෂිත පන්තියක් සඳහා රක්ෂණකරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස දැනටමත් ලියාපදිංචි වී ඇත්නම් එම තැනැත්තා රක්ෂණ ව්‍යාපාරයේ එම පන්තිය සඳහා රක්ෂණකරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස පත් කරනු ලැබීමට නුසුදුස්සකු වන්නේය.

## නියාමන ප්‍රතිසංස්කරණ රීති

**අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රීති.**

2017 ජූලි මස 05 දිනැති අංක 2026/27 දරන ගැසට් පත්‍රය මගින් අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රීති හඳුන්වා දෙන ලදි.

යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි සහතිකයක් නොදරමින් පනතේ 114 (1) වගන්තියේ අර්ථ නිරූපනය කර ඇති පරිදි අලාභ ගැලපුම්කරුවකු ලෙස පෙනී සිටීම හෝ ක්‍රියා කිරීම පනතට ගෙන එන ලද 2011 අංක 3 දරන සංශෝධන පනත මගින් තහනම් කරන ලදි.

මෙකී ලියාපදිංචි වීමේ අවශ්‍යතාවයට තිබෙන සීමිත ව්‍යතිරේක අවස්ථාවක් පිළිබඳව 89 අ (2) වගන්තිය මගින් දැක්වේ.

පනතේ 89 ආ වගන්තිය මගින් අලාභ ගැලපුම්කරුවකු ලෙස පනත යටතේ ලියාපදිංචි වීම සඳහා අයැදුම් කිරීමට යම් තැනැත්තකු සතුව තිබිය යුතු සුදුසුකම් සහ පළපුරුද්ද නිශ්චය කරමින් රීති සෑදීමට කොමිෂන් සභාවට බලය හිමි වී ඇත. එමෙන්ම, එවැනි අයදුම්කරුවකු විසින් ලියාපදිංචි කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිශ්චිත යම් ලේඛණ, තොරතුරු සහ ගාස්තු කවරේද යන වග නියම කරමින් රීති සෑදීමේ බලයද පනතේ 89 ඇ (1) වගන්තිය අනුව කොමිෂන් සභාව සතුවේ.

එමනිසා, යම් තැනැත්තකුට පනත යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීමට අවශ්‍ය සුදුසුකම් සහ / හෝ පළපුරුද්ද මොනවාද යන්න නිරූපනය කරමින් ඉහත සඳහන් රීති අප විසින් ප්‍රකාශයට පත් කර ඇත.

**පනතේ 96 අ වගන්තිය යටතේ නිකුත් කළ විධාන.**

**I. අංක 9 දරන විධානයට අනුකූලව ක්‍රියා කිරීමට කාල සීමා දිගුවක් ඉල්ලා සිටීම.**

පනතේ 96 අ වගන්තිය යටතේ නිකුත් කළ අංක 9 දරන විධානයට අනුව වර්ෂ 2017 මැයි 12 වන දින වන විට රක්ෂණ සමාගමක හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධරයා එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා සහ / හෝ කළමණාකාර අධ්‍යක්ෂවරයා සහ / හෝ එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධාන ක්‍රියාවට නැංවීමෙහි ලා වගකීම දරන තැනැත්තා හෝ විය යුතු වේ.

කර්මාන්තයෙන් ලද ඉල්ලීම් කිහිපයක් සලකා බැලීමෙන් අනතුරුව ඉහත විධානයට අනුකූලව ක්‍රියා කිරීම සඳහා රක්ෂකයන්ට හා රක්ෂණ තැරැව්කරුවන්ට වර්ෂ 2017 සැප්තැම්බර් 30 දක්වා කාල සීමා දිගුවක් කොමිෂන් සභාව විසින් ලබා දෙන ලදී.

**ii. විධාන අංක 10**

**රක්ෂණ තැරැව්කරුවන් විසින් සපයනු ලබන අනුයාත මූල්‍ය සේවා**

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය විසින් ඉදිරිපත් කල කරුණු ද සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව විසින් මෙම විධානය නිකුත් කරන ලදි. ඒ අනුව පනතේ අර්ථ නිරූපනය කර ඇති පරිදි රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර නොවන වෙනත් අනුයාත මූල්‍ය සේවාවක් සැපයීමට අදහස් කරන රක්ෂණ තැරැව්කරුවන් විසින් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

**iii.විධාන අංක 11**

**විදේශීය සෞඛ්‍ය රක්ෂණ**

යම් රක්ෂණ තැරැව්කරුවකු වෙනුවෙන් යම් විදේශීය රක්ෂණ ඔප්පුවක් ලබාදීම පිණිස අලෙවිකරණයේ යෙදීම සහ / හෝ විකිණීම සඳහා ප්‍රවර්ධනය සිදුකිරීම සහ / හෝ ඔවුන්ගේ උපනියෝජිතයකු ලෙස කටයුතු කිරීම තහනම් කරමින් සියලු රක්ෂණ තැරැව්කරුවන් වෙත කොමිෂන් සභාව විසින් මෙම විධානය පනවන ලදි.

**iv. විධාන අංක 12**

**සියළුම රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම්**

පෙරදී නිකුත් කරන ලද විධාන අංක 9 ට අමතරව කොමිෂන් සභාවේ දැනුමට බඳුන් වු තවත් කරුණක් වුයේ කොමිෂන් සභාව හා ප්‍රධාන නිලධරයන් අතර හුවමාරු වු සන්නිවේදනයන් අදාල රක්ෂකයන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කර නොමැති බවයි.

එබැවින්, කොමිෂන් සභාව සහ තම සමාගම අතර හුවමාරු වන සියලු සන්නිවේදනයන් සමාගමේ ප්‍රධාන නිලධරයන් විසින් හැකි ඉක්මනින් තම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කළ යුතු බවට පනතේ 96 අ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඉහත විධානය නිකුත් කරන ලදි.

**V.විධාන අංක 13**

**නිශ්චිත නිලධරයකුගේ කාර්ය භාරය හා වගකීම**

පනතේ 32 වගන්තිය අනුව, රක්ෂණ කටයුතු කරගෙන යන සෑම රක්ෂණකරුවකු විසින්ම, වරලත් රක්ෂණ ආයතනයේ සාංගමික සුදුසුකම හෝ මණ්ඩලයට පිළිගත හැකි සමාන සුදුසුකමක් ඇත්තා වූද, කළමනාකරණ මට්ටමින් යටත් පිරිසෙයින් අවුරුදු පහක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ඇත්තා වූද, යටත් පිරිසෙයින් එක් තැනැත්තකු නිශ්චිත නිලධරයෙකු වශයෙන් සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතුය.

එනමුත්, නිශ්චිත නිලධරයකුගේ කාර්ය භාරය හා වගකීම පනතේ නිර්වචනය කර නොමැත. එබැවින්, ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ නිරීක්ෂණ විමර්ශනය කිරීමෙන් අනතුරුව සහ නිශ්චිත නිලධරයකු විසින් සම්ප්‍රදායක් ලෙස රක්ෂණ සමාගමක තාක්ෂණිකමය වු කාර්ය භාරයක් ඉටුකිරිම යන කරුණු ද සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව විසින් පහත සඳහන්

නිර්ණායකයන් නිශ්චිත නිලධරයකු සතු කාර්යභාරය හා වගකීම් ලෙසට දක්වමින් එකී විධානය නිකුත් කරන ලදි.

### රක්ෂණ සමාගමක නිශ්චිත නිලධරයකු:

1. රක්ෂකයකුගේ තාක්ෂණික අංශයේ ප්‍රධානියා විය යුතු අතර ප්‍රධාන නිලධරයාට කෙළින්ම වාර්තා කළ යුතුය.
2. සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධරයා, ජීව ගණිතඥ, ආයෝජන අංශය සහ ආයතනයේ වෙනත් අදාළ නිලධාරීන් සමග රෙගුලාසි සම්බන්ධයෙන් පැන නැගිය හැකි ඕනෑම ගැටළුවක් විමර්ශනය කිරීමට සහ පැහැදිලි කර ගැනීමට මෙන්ම රෙගුලාසි වලට අනුකූලව වාර වාර්තා අත්සන් කිරීමට අවශ්‍ය අධිකාරි බලය තිබිය යුතුය.
3. ප්‍රාරක්ෂණය, අවදානම් කළමනාකරණය, ප්‍රතිරක්ෂණය හා සම්බන්ධිත මාර්ගෝපදේශන, කාර්ය පටිපාටිය හා ක්‍රියා පටිපාටිය සහ වන්දි හිමිකම් කළමනාකරණය යනාදී තාක්ෂණික කටයුතු විසඳීමෙහිලා රක්ෂණ සමාගම විසින් ප්‍රමාණවත් ලෙස පියවර ගෙන තිබීම හේතුවෙන් රක්ෂණ ව්‍යාපාරයට සහ රක්ෂණ සහතික දරන්නන්ට සාධාරණයක් ඉෂ්ට වන බවටත් ප්‍රධාන නිලධාරයාට, අධ්‍යක්ෂ මණ්ඩලයට සහ රක්ෂණ සභාවට සහතික වීමේ වගකීම දැරිය යුතුය.
4. පනතේ අඩංගු වන තාක්ෂණික ප්‍රතිපාදන උල්ලංඝනය වීමක් තිබේනම් ඒ පිළිබඳව ප්‍රධාන නිලධරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.

### අංක 14 සහ 15 දරන නිශ්චයන්ට සිදුකල සංශෝධන

අංක 14 දරන නිශ්චයට ආපදා තක්සේරු වාර්තාවක් එකතු කිරීම මගින් අංක 14 සහ 15 දරන නිශ්චයන්හි ආකෘති පත්‍ර (එහි අන්තර්ගතය වෙනස් කිරීමකින් තොරව) නැවත සකස් කිරීමකට ලක් කරන ලදි.

## වෙළඳ පොල ව්‍යුහය


### රක්ෂණ සමාගම්

පනතේ 12 වන වගන්තියට අනුව, පනතේ විධිවිධාන වලට යටත්ව, යම් තැනැත්තෙකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙන යාමට මේ පනත යටතේ තත් කාලයේ ලියාපදිංචි වී ඇත්නම් හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙන යනු නොලැබිය යුතුය.

පනතේ 13 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන්නට උනන්දුවක් දක්වන තැනැත්තෙකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් සංස්ථාපනය විය යුතු අතර පනතෙන් නිශ්චිතව දක්වා ඇති අනෙකුත් සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව පනත යටතේ ලියාපදිංචි වී රක්ෂකයෙක් වශයෙන් බලපත්‍රය ලබා ගත යුතුය.

වසර අවසාන වන විට සමාගම් 28 ක් රක්ෂකයන් ලෙස ක්‍රියාකාරීව පැවැතුණි. දීර්ඝකාලීන සහ සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ ව්‍යාපාර ගෙන ගිය සීමාසහිත එම් බී එස් එල් (MBSL) රක්ෂණ සමාගමේ ලියාපදිංචිය වර්ෂ 2017 ජූනි මස 28 වන දින සිට අත්හිටුවන ලදි. තවද, ශ්‍රී ලංකාවෙන් බැහැර වීමේ ක්‍රියාවලියේ නියුතුව සිටින සීමාසහිත ඒ අයි ජී (AIG) රක්ෂණ සමාගම තවදුරටත් නව රක්ෂණ ව්‍යාපාර කටයුතු භාර ගැනීම නවතා ඇත.

රූප සටහන 1
රක්ෂණ සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්





රක්ෂණ ව්‍යාපාර සමාගම් මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් රූප සටහන, මගින් දැක්වේ. ක්‍රියාකාරීව පවතින සමාගම් 28න් 03 ක් දිගුකාලීන හා සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ කටයුතු සිදු කරන අතර මීට MBSL රක්ෂණ සමාගමද ඇතුලත් වේ. සමාගම් 12 ක් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයද සමාගම් 13 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබයි. රක්ෂණ සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්

### රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කරුවන් යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි යෙදීම සඳහා පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වේ. රක්ෂණ තැරැව්කරුවන් යනු තැරැව්කාර ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමග හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණ සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරන්නන් අදහස් කෙරේ.

වසර අවසානයේදී සමාගම් 60ක් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී තිබුණි. එම සමාගම් අතරින් සමාගම් 41ක් දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර යන දෙකෙහිම ලියාපදිංචි වී සිටි අතර සමාගම් 19ක් සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කටයුතුවල පමණක් යෙදී සිටියේය. පහත 2 වන රූප සටහන මගින් රක්ෂණ තැරැව්කාර සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් දැක්වේ.

රූපසටහන 2
රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්තීන්




### රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමග


ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාව ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයන් වේ. එලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇත.

පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයින් රක්ෂණ සමාගම්වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකක් වේ.

රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව, වසර තුළදී රක්ෂණ නියෝජිතයින් වශයෙන් බඳවාගෙන ඇති මුළු තනි පුද්ගලයින් සංඛ්‍යාව 14,595ක් පමණ වන අතර එය පසුගිය වසරේ (13,390) ට වඩා 8.99% ක ඉහළ යාමකි. වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිත සංඛ්‍යාව 45,228ක් පමණ වූ අතර එය පසුගිය වසරේ 43,816 සිට 3.22%ක ඉහළ යාමකි.

3 වන රූප සටහනින් රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි වී සිටින රක්ෂණ නියෝජිතයින් සංඛ්‍යාව නිරූපනය වේ.

රූපසටහන 3
2017.12.31 දිනට මුළු රක්ෂණ නියෝජිතයන්





පසුගිය වසර තුළදී ආසන්න වශයෙන් තනි පුද්ගල රක්ෂණ නියෝජිතයින් 419ක් පමණ රක්ෂණ තැරැව්කාර සමාගම් සමඟ ලියාපදිංචි වී ඇත.

### සමාගම්වල තත්ත්වය සහ ප්‍රාග්ධන වෙනස්කම්

රක්ෂණ සමාගම් අතරින් රක්ෂණ සමාගම් 9ක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කොට ඇත. නම් වශයෙන් ඒවා ඒ අයි ඒ ඉන්ෂුවරන්ස් ලංකා පී එල් සී, යූනියන් ඇෂුවරන්ස් පී එල් සී, සොෆ්ට් ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පී එල් සී, එච්එන්බී ඇෂුවරන්ස් පී එල්සී, අමානා තකාෆුල් පී එල් සී, අමානා තකාෆුල් ලයිෆ් පී එල් සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පී එල් සී, ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පී එල් සී සහ පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්. සී. වේ.

ලයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 වන රූප සටහනේ දැක්වේ.

රූපසටහන 4
ලැයිස්තුගත කරන ලද/ලැයිස්තුගත නොකරන ලද රක්ෂණ සමාගම්වල තත්ත්වය




2011 අංක 03 දරන සංශෝධිත පනතින්, රක්ෂණ සමාගම්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය කරයි. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තු ගත කිරීමට ද අවශ්‍ය වේ.

2011 අංක 3 දරන සංශෝධිත පනත බලාත්මකවුවායින් පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක්, කොමිෂන් සභාව මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව වසර තුනක කාලයක් ඇතුලත දී, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට දක්වා ඇත.

2011 ජූනි මාසයට පෙරාතුව ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම්, 2015 පෙබරවාරි මාසය වන විට හෝ එදිනට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රු.මිලියන 500ක අවමයක් දක්වා වැඩි කළ යුතු බවට මණ්ඩලය නියම කර ඇත.

2011 ජූනි මාසයට පසුව ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්වලට රු. මිලියන 500කට නොඅඩු ගෙවා නිමි ප්‍රාග්ධනයක් ඇත.

### රක්ෂණ සමාගම්වලින් සෙස් බද්දක් අයකිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අයකිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මගින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.2% ක්ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.4% ක්ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කල යුතු බවට පැහැදිලි කොට ඇත.

රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2017 වසරේ එසේ එකතු කරන ලද මුදල රු. මිලියන 418 කි. වගුව 1 මගින් සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ගැන දැක්වේ.

### ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

පනතේ 103 වන වගන්තිය ප්‍රකාර ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ. වර්තමාන මෙන්ම අනාගත ඔප්පු

හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.


අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේදීත්, රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීමේ කටයුතුවලදීත් සිදුවන වියදම් පියවාලීම සහ

ආ) කොමිෂන් සභාව එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේදී දරනු ලබන වියදම් පියවා ගැනීම

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කෙරේ.

2017 දෙසැම්බර 31 දිනට එම අරමුදලේ සංචිතය රු.මිලියන 4,110 ක් විය. මෙය පසුගිය වසරට වඩා (රුපියල් මිලියන 3,292) 24.85% ක වර්ධනයකි.

වගුව 1
සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල




## රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නැත. 2002, 2005 හා 2007 යන වර්ෂවල ජනවාරි 1 වැනි දින සිට අනු පිළිවෙලින් ක්‍රියාත්වක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය සහ කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

## පනතේ බලපෑමෙන් නිදහස්වීම

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ පනත මගින් ස්ථාපනය කරන ලද කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයනය ණය රක්ෂණ සංස්ථාව සහ 1996 අංක 17 දරන සමාජ රක්ෂණ මණ්ඩලය පනත යටතේ ස්ථාපනය කල සමාජ රක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12 (3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැනවෙන නීති රීති අදාළ නොවේ.

## ජාතික රක්ෂණ භාර අරමුදල : (NITF)

2006 අංක 28 දරන ජාතික රක්ෂණභාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණභාර අරමුදල, පනතට කරන ලද සංශෝධනයක් මගින් කොමිෂන් සභාවේ විෂයපථය තුළට ග්‍රහනය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණභාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය විසින් පවත්වාගෙන යනුලබන වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අරමුදල් ජාතික රක්ෂණභාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණභාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම් අයකර ගන්නා වාරික ජාතික රක්ෂණභාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරණ සංශෝධිත පණත අනුව සියලු ලියාපදිංචි රක්ෂණ සමාගම්, ගැසට්පත්‍රයේ පලකරන ලද, අමාත්‍යවරයාගේ නියෝගය ප්‍රකාර ව, සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50% නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණභාර අරමුදලට ලබාදිය යුතුය. අංක 1791/4 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව, සියළු රක්ෂණ සමාගම් 2013 ජනවාරි 01 වැනි දින සිට සියලුම සාමාන්‍ය ප්‍රතිරක්ෂණ ඔප්පු වලින් පැන නගින සම්පූර්ණ වගකීමෙන් 30% ක ප්‍රතිශතයක් ජාතික රක්ෂණභාර අරමුදලට දායක කළ යුතු බවට දන්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය.

## අනෙකුත් අදාළ කරුණු

## මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථ වාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන අමාත්‍යංශයේ විෂයපථය යටතේ පවතී. මෝටර් රථ වාහන රක්ෂණ ආවරණය ලබා දෙන රක්ෂකයින් සෑම කෙනෙකුම තෙවන පාර්ශ්ව රක්ෂණ ආවරණයකින් 1% ක් මාර්ග ආරක්ෂණ අරමුදලට දායක කළ යුතුය. මෙම ජාතික සභාවේ පාලක සභාවෙහිද කොමිෂන් සභාවට නියෝජනයක් ඇත.

හදිසි අනතුරකදී පීඩාවට පත්වන වින්දිතයින් හට වන්දි ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත.

## සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

## Financial Sector Oversight Council (FSOC)

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද අන්තර් නියාමන ආයතන සභාව "Financial Sector Oversight Council" ලෙස නැවත නම්කරනු ලැබ ඇත. ඉහළ මට්ටමේ කමිටුවක් වන මෙය පිහිටුවීමේ අරමුණ වූයේ මූල්‍ය වෙළෙඳාමෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ත මූල්‍ය පද්ධතියේම අභිවෘද්ධිය උදෙසා සියලු නියාමන නියෝජිතයින් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීමයි. කොමිෂන් සභාව අන්තර් නියාමන සභාවේ ද නියෝජනය වෙයි.

## ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989 දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකටම ලබා ගත හැකිය.

සියලුම රක්ෂණ සමාගම්හී ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව සමස්ථ කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

- ජීවිත රක්ෂණ සංසදය
- සාමාන්‍ය රක්ෂණ සංසදය
- මූල්‍ය තාක්ෂණ අනු කමිටුව
- නීති උපදේශන සංසදය
- මානව සම්පත් අනුකමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනුකමිටුව
- අලෙවිකරණය හා විකුණුම් සංසදය
- ජීවගණක අනුකමිටුව

යන කමිටු විසින් විධායක කමිටුවට සහය වෙමින් ස්වකීය වගකීම් හා අදාළ වන්නා වූ විෂය ක්ෂේත්‍ර පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

### ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ප්‍රධාන අරමුණ

1. රක්ෂණය වන ජනතාව හා රක්ෂකයන්ගේ පොදු යහපත හා සුබසාධනය උදෙසා උපදෙස් සැපයීමටත්, සහයෝගීතාවටත් අවස්ථාව සලසනු වස් ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නිරතව සිටින සියලු රක්ෂකයන් එකමුතු කිරීම.
2. රක්ෂණ ව්‍යාපාරය තුළ ඒකාකාරී යහපත් ක්‍රියා පිළිවෙතක් සහ උසස් සදාචාරාත්මක මට්ටමක් පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම මගින් රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ රක්ෂණය වන ජනතාවගේ විශ්වාසය වර්ධනය කිරීම.
3. සාමාන්‍ය ජනතාව අතර රක්ෂණ අවශ්‍යතා හා වටිනාකම් පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම.
4. ව්‍යවස්ථාදායක හා නියාමන අවශ්‍යතා නිරීක්ෂණය තුළින් රක්ෂණ කර්මාන්තයේ ස්ථායිථාවය හා වර්ධනය සඳහා අදාළ බලධාරීන් වෙත කරුණු ඉදිරිපත් කිරීම.
5. වෙනත් රටවල රක්ෂණ ක්‍රමවේද හා තාක්ෂණ උපක්‍රම පරීක්ෂා කිරීම හා පුනරීක්ෂණය කිරීම මගින් වඩාත් සුදුසු ක්‍රමවේදය ශ්‍රී ලංකා වෙළෙඳ පොලට යොදා ගැනීම.
6. අධ්‍යාපන හා පුහුණු වැඩමුළු ඔස්සේ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීයභාවය ප්‍රවර්ධනය දිරි ගැන්වීම සහ ඊට සක්‍රියව සහය වීම. ඒ සඳහා පන්ති, සම්මන්ත්‍රණ, වැඩමුළු, සංවාද, උපදේශන, රැස්වීම් පැවැත්වීම.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්තවන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම් වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල් වලිනි.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ ප්‍රධාන අරමුණු

1. රක්ෂණ ක්ෂේත්‍රයේ නියුතු අයගේ පොදු සංවර්ධනය, ප්‍රගතිය, හා කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා අවශ්‍ය මධ්‍යම සංවිධානයක් ලෙස කටයුතු කිරීම හා ඔවුන්ගේ යහපත පිණිස මෙන්ම රක්ෂණ ව්‍යාපාරය වඩාත් කාර්යක්ෂම කිරීම හා කර්මාන්තය පිළිබඳව වෘත්තීකත්වය ලබාදීම;
2. රක්ෂණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් වර්ධනය කරවීමට ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම තුළින් රක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම;
3. ඕනෑම පිළිගත් අධ්‍යාපන ආයතනයක් හරහා රක්ෂණ ක්ෂේත්‍රයේ ඕනෑම අංශයක විෂයයන් වෘත්තීය මට්ටමින් හැදෑරීම සඳහා සහය දැක්වීමටත්, උනන්දු කිරීමටත් විභාග පැවැත්වීම;
4. වෘත්තීය කරුණු පිළිබඳ සාකච්ඡා සම්මන්ත්‍රණ හෝ රැස්වීම් පැවැත්වීමටත්, පර්යේෂණ පත්‍රිකා, දේශන ආදිය ඉදිරිපත් කිරීමටත් සමාජිකයන්ට වැදගත් වන්නා වූ සිදුවීම්, වාර්තා හෝ ලැයිස්තු වැනි දේ සංස්කරණයටත් ඉඩ සැලසීම; සහ
5. ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීමටත් ඔවුන්ගේ ප්‍රවර්ධනය පුළුල් කිරීමට මෙන්ම පොදුවේ ගත් කළ රක්ෂණ නිලධාරීන්ගේත්. ආයතනික සාමාජිකයන්ගේත් තත්ත්වයන් ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය වෘත්තීමය අධීක්ෂණය හා පාලනය ඇති කිරීම.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ කර්මාන්තයෙහි නියලෙන්නන් සඳහා සංගමය විසින් කෙටි කාලීන රක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වනු ලැබේ.

රක්ෂණ නියෝජිතයන් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවාගැනීම් පරීක්ෂණ සිදු කිරීමේ වගකීම කොමිෂන් සභාව විසින් මෙම ආයතනයට පවරා ඇත. රක්ෂණ ක්ෂේත්‍රයෙහි සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පන්ති දෙවර්ගය සඳහාම ආයතනය විසින් පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ පවත්වනු ලැබේ.

### රක්ෂණ ඔම්බුඩ්ස්මන්

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් 2005 ජනවාරි මස, රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා ලෙස ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා පත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව රක්ෂණ ඔප්පු හිමියන් විසින් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආරාවුල් නිරාකරණය හා සමථ කිරීම සඳහා එකී පාර්ශ්වයන් දෙක විසින් තමන්ගේ උපරිමයෙන් කටයුතු කරනු ලැබේ.

### රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙක් වශයෙන් ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්ෂණ ක්‍රියාපිළිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු නිතිපතා කොමිෂන් සභාවට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන සමහර ප්‍රධාන රක්ෂණ ක්‍රියා පිළිවෙත් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්ෂණය කරනු හා මෙහෙයවනු පිණිස කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්

| | රක්ෂණකරු සහ එහි මව් සමාගමෙහි සම්පූර්ණ නම | වාර්ෂික වාර්තා අරමුණ සඳහා සමාගම් ලේබලය |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | ඒඅයිඒ ලයිෆ් |
| 2 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඒඅයිජී |
| 3 | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | අලියානස් ජෙනරල් |
| 4 | අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | අලියාන්ස් ලයිෆ් |
| 5 | අමානා තකාෆුල් පීඑල්සී | අමානා ජෙනරල් |
| 6 | අමානා තකාෆුල් ලයිෆ් ලිමිටඩ් | අමානා ලයිෆ් |
| 7 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | ආර්පිකෝ |
| 8 | සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී | සොෆ්ට්ලොජික් ලයිෆ් |
| 9 | ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ෆෙයාෆස්ට් |
| 10 | සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සෙලින්කෝ ජෙනරල් |
| 11 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සෙලින්කෝ ලයිෆ් |
| 12 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | කොන්ටිනෙන්ටල් |
| 13 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | කෝපරේටිව් ජෙනරල් |
| 14 | කෝප්ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | කෝප්ලයිෆ් |
| 15 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | එච්එන්බී ලයිෆ් |
| 16 | එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | එච්එන්බී ජෙනරල් |
| 17 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | ජනශක්ති ලයිෆ් |
| 18 | ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ජනශක්ති ජෙනරල් |
| 19 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | එල්අයිසී |
| 20 | එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | එල්ඕඑල්සී ජෙනරල් |
| 21 | එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ් | එල්ඕඑල්සී ලයිෆ් |
| 22 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | එම්බීඑස්එල් |
| 23 | ජාතික රක්ෂණ භාර අරමුදල | එන්අයිටීඑෆ් |
| 24 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඔරියන්ට් |
| 25 | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | පීපල්ස් |
| 26 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | සණස |
| 27 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | එස්එල්අයිසී |
| 28 | යුනියන් ඇෂුවරන්ස් ජෙනරල් ලිමිටඩ් | යුනියන් ජෙනරල් |
| 29 | යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී | යුනියන් ලයිෆ් |

### සංඛ්‍යානමය සමාලෝචනයෙහි වගු සහ සටහන් අර්ථ දැක්වීමේදී සැලකිල්ලට ගතයුතු සටහන්

1. මෙම වාර්තාවේ දැක්වෙන වගු සහ රූප සටහන් රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් දෙන ලද සංඛ්‍යා ලේඛන මත පදනම් වේ.
2. ඒඅයිඒ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් 2016 දී ඒකාබද්ධ කර ඇති අතර,"ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" ලෙස හැඳින්වේ.
3. සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී 2016ට පෙර ඒෂියන් එලයන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී ලෙසින් හැඳින්විණි.
4. 2015 වසරේදී ෆෙයාෆැක්ස් ඒෂියා ලිමිටඩ් විසින් ඒෂියන් එලයන්ස් ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අත්පත් කරගන්නා ලද අතර ඉන්පසු එය ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් ලෙස හඳුන්වන ලදී.
5. 2017 වසරේ පෙබරවාරි 28වන දින සිට බලපැවැත්වෙන පරිදි යුනියන් ජෙනරල් ලිමිටඩ්, ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සමඟින් ඒකාබද්ධ කර ඇති අතර පසුව එය ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් නමින් හඳුන්වන ලදී.
6. ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් වෙතින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට අවදානම් පාදක ප්‍රාග්ධන වාර්තා බාරදීමට අවශ්‍ය නොවේ.

7. ලාභදායිත්වය හා අවදානම් පාදක ප්‍රාග්ධනය සම්බන්ධව ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ඉදිරිපත් කල දත්ත, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් විවිධ වර්ගයේ රක්ෂණ යෝජනා ක්‍රම පවත්වා ගන්නා බැවින් තුලනාත්මකභාවය පවත්වා ගැනීම පිණිස සලකා බලා නොමැත.
8. ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය තුළ වාර්තාකළ සංඛ්‍යා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ඉදිරිපත්කළ වාර්ෂික වාර්තා මත පදනම් වේ.
9. ජාතික රක්ෂණ භාර අරමුදලේ වගා හා ණය ආරක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය දත්ත, එකී මෙහෙයුම රක්ෂණය ලෙස සලකා නොබලන බැවින් 2014 සිට ඉදිරියට සංඛ්‍යාලේඛන වලින් ඉවත් කර ඇත.
10. සමහර වගුවල සංඛ්‍යා ආසන්න අවසන් අංකයට වටයා ඇත. එබැවින්, පෙන්වා දෙනු ලබන මුළු ගණන සහ එහි සංරචකවල එකතුව අතර වෙනසක් තිබිය හැකිය.
11. පෙර ප්‍රකාශයට පත්කළ සංඛ්‍යා සමඟ සැසඳීමේදී වෙනස්වීම පසුකාලීන සමාලෝචන අනුව සිදුකර ඇත.
12. වරහන් යෙදූ කොටස තුළ දැක්වෙන සංඛ්‍යා ඍණ අගයන් වේ.
13. පහත සඳහන් සංකේත වාර්තාව තුළ භාවිතා කොට ඇත :-


(අ) = ප්‍රතිශ්ඨාපිත විගණිත සංඛ්‍යා
(ආ) = තාවකාලික සංඛ්‍යා
- = ශූන්‍ය

## රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය

### ගෝලීය රක්ෂණ වෙළඳපොළ දෙස බැලීම

ගෝලීය රක්ෂණ වෙළඳපොල 2017 වර්ෂය තුල තව දුරටත් වර්ධනය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය වාරික ආදායම 3%කින් වර්ධනය විය. ස්විස් රී පබ්ලිකේෂන් අනුව, නැගී එන ආසියාතික රටවල ඉතුරුම් පාදක රක්ෂණ යෝජනා ක්‍රමවල අලවිය වර්ධනය මඟින් ජීවිත රක්ෂණ වාරික වර්ධනය වූ අතර අපේක්ෂිත මිල වැඩිවීම්වල ප්‍රමාණාත්මතාවය පදනම්ව සාමාන්‍ය රක්ෂණ වාරිකයන්හි වර්ධනය රැදි පවති. 2017 වසර තුළ මුහුණ දුන් ගෝලීය, ආර්ථික, දේශපාලනික සහ නියාමන අභියෝග කිහිපය අතර, හාර්වේ, ඉර්මා මේරියා වැනි විශාල ස්වභාවික විපත් මෙන්ම බ්‍රෙක්සිට් හා 2021 දී ක්‍රියාත්මක වීමට නියමිත ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති IFRS 17 වැනි සිදුවීම් ද ගෝලීය රක්ෂණ වෙළඳපොලට දැඩි ලෙස බලපා ඇත. උසස් තාක්ෂණික ආයතන සමඟ සහයෝගීත්වයෙන් රක්ෂකයන් විසින් ලෝකය පුරා "InsurTech" විසඳුම්වල ප්‍රතිලාභ මත බර තැබීමේ ප්‍රවනතාව දක්නට ලැබුණු අතර, සයිබර් රක්ෂණ විසඳුම් කරා ඉල්ලුමද සයිබර් තර්ජන සමඟ තවදුරටත් වර්ධනය විය.

**රූප සටහන 01**
**රක්ෂණ කර්මාන්තයෙහි වාරික ආදායම සහ වර්ධන වේගය**




* මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව 2017

## ශ්‍රී ලාංකීය ආර්ථිකය දෙස බැලීම

ශ්‍රී ලාංකීය ආර්ථිකයට 2017 වසර අභියෝගාත්මක වසරක් වූ අතර, ස්වාභාවික ආපදා, ඉහළ උද්ධමනය සහ සංකීර්ණ දේශපාලන වාතාවරණයත් සමඟ වසර 16ක් තුළ වාර්තා වූ අවම මට්ටම වන 3.1% දක්වා ආර්ථික වර්ධන අනුපාතය පහත වැටුණි. අහිතකර කාලගුණික තත්වයන් කෘෂිකාර්මික වර්ධනයට ඍණාත්මකව බලපෑමත් සමඟ, මෙරට දළ දේශීය නිෂ්පාදිතය (GDP) රුපියල් බිලියන 13,289ක් විය. කර්මාන්ත හා සේවා අංශ ද 2016 වසරට සාපේක්ෂව ඉතා සුළු අගයකින් වර්ධනය විය.

වසර තුළ, රටතුළ පැවති අභියෝගාත්මක සාර්ව - ආර්ථික තත්වයන් හමුවේ වුවත්, මූල්‍ය අංශය වර්ධිත කාර්යසාධනයක් පෙන්වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් බැංකු අංශය සහ අනෙකුත් තැන්පතු ලබාගන්නා මූල්‍ය ආයතන සහ ගිවිසුම්ගත ඉතුරුම් ආයතන හේතු විය. ගිවිසුම්ගත ඉතුරුම් ආයතන වර්ගීකරණය තුළ දායකයෙක් වශයෙන් රක්ෂණ කර්මාන්තය 2017 වසර තුළ ධනාත්මකව කටයුතු කරන ලදී.

(මූලාශ්‍රය - මහා බැංකු වාර්තාව 2017)

## ශ්‍රී ලංකා රක්ෂණ වෙළඳපොල

සමස්තයක් ලෙස, රක්ෂණ කර්මාන්තය නියාමන ඉල්ලුම, උසස් තාක්ෂණය සහ ඉහළ පාරිභෝගික අපේක්ෂාවන් සමඟ මුහුණ පෑ අභියෝග නොසලකා ඉහළ

**වගුව 01**
**වාරික ආදායම සහ ව්‍යාප්තිය**

| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
|---|---|---|---|---|---|
| වාරික ආදායම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය (රු. මිලියන) | 41,676 | 44,596 | 53,691 | 63,477 | 71,504 |
| වාරික ආදායම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (රු. මිලියන) | 58,284 | 61,202 | 69,271 | 79,590 | 93,119 |
| සමස්ත වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාරය (රු. මිලියන) | 99,960 | 105,798 | 122,962 | 143,067 | 164,623 |
| මුළු වාරික ආදායම් වර්ධන අනුපාතය - රක්ෂණ ව්‍යාපාරය (%) | 10.22 | 5.84 | 16.22 | 16.35 | 15.07 |
| ප්‍රතිරක්ෂණ වාරික ආදායම (රු. මිලියන) | 1,042 | 2,041 | 1,738 | 2,397 | 3,683 |
| ප්‍රවර්තන වෙළඳපල මිළට දළ දේශීය නිෂ්පාදනය (රු. මිලියන) | 9,592 | 10,448 | 10,952 | 11,907 | 13,289 |
| දළ දේශීය නිෂ්පාදන වර්ධන අනුපාතය% * | 3.40 | 4.90 | 4.84 | 4.50 | 3.10 |
| ව්‍යාප්තිය% (ද.දේ.නි. % ලෙස රක්ෂණ ව්‍යාපාරවල මුළු වාරිකය) | 1.04 | 1.01 | 1.12 | 1.20 | 1.24 |
| ව්‍යාප්තිය% (ද.දේ.නි. % ලෙස දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වාරික) | 0.43 | 0.43 | 0.49 | 0.53 | 0.54 |
| ව්‍යාප්තිය% (ද.දේ.නි. % ලෙස සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාරික*) | 0.61 | 0.59 | 0.63 | 0.67 | 0.70 |
| රක්ෂණ ඝනත්වය - (මුළු වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාර/ජනගහනය) (රුපියල්) | 4,857 | 5,094 | 5,865 | 6,747 | 7,677 |
| ජනගහනය '000 (මධ්‍ය වාර්ෂික) * | 20,579 | 20,771 | 20,966 | 21,203 | 21,444 |

* මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
**ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිරක්ෂණ වාරිකවල අනිවාර්ය පවරාදීම ප්‍රතිරක්ෂණ වාරික ආදායමෙන් නියෝජනය කරයි.

අලෙවිය සහ ලාභදායිත්වය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

රක්ෂණ කර්මාන්තයේ මුළු දළ ලිඛිත වාරිකය (GWP) රුපියල් මිලියන 164,623 (2016 : රුපියල් මිලියන 143,067) දක්වා 15.07%කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් වාරික වර්ධනය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය දායක වූ අතර, රථ වාහන සහ සෞඛ්‍ය උප රක්ෂණ පන්ති ඒ සඳහා වැඩි දායකත්වයක් ලබා දෙන ලදී. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරිකය 17%ක වර්ධනයක් පිළිබිඹු කරමින් 2016 දී පැවති රුපියල් මිලියන 79,590ට සාපේක්ෂව 2017 වසරේදී රුපියල් මිලියන 93,119ක් විය. ජීවිත රක්ෂණ කර්මාන්තයද 12.65%ක වර්ධන අනුපාතයක් වාර්තා කරමින් වාරික ආදායමට ධනාත්මකව දායක විය. ආයෝජන ඝනයේ නිෂ්පාදන අලෙවිය සහ අවරෝහණ කාලීන රක්ෂණ නිෂ්පාදන 2016ට සාපේක්ෂව 2017 දී ජීවිත රක්ෂණ වාරිකවල වර්ධනයකට හේතු විය.

ඒ අනුව, ජීවිත රක්ෂණ සමාගම් 2017 වසර තුළ රුපියල් මිලියන 71,504ක (2016 : රුපියල් මිලියන 63,477) මුළු දළ ලිඛිත වාරිකයක් වාර්තා කළේය. පසුගිය වසර පහ තුළ රක්ෂණ කර්මාන්තයේ වාරික ආදායම සහ වර්ධන අනුපාතය 1 වැනි රූප සටහනින් පැහැදිලි කරයි.

දළ ලිඛිත වාරිකවල වර්ධනයක් වාර්තා කරනු ලැබූ අතර, සමස්ත රක්ෂණ ව්‍යාප්තිය 2017 දී 1.24%ක්ව පැවතුණ අතර එයට දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පිළිවෙලින් 0.54% සහ 0.70% කින් දායක විය. කෙසේවුවත්, දැනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ නොමැති කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, සමාජ ආරක්ෂණ මණ්ඩලය, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ ප්‍රජා පදනම් සංවිධාන වැනි ආයතන විසින් නිකුත් කළ රක්ෂණ සහ ක්ෂුද්‍ර රක්ෂණ ඔප්පුවල වාරික ආදායම මෙම ගණනය කිරීම තුළින් පිළිබිඹු නොවේ.

ශ්‍රී ලංකාව තුල රක්ෂණය සඳහා ඇති ඉල්ලුම පරිභෝගිකයින්ගේ වැයකළ හැකි ආදායම් මට්ටම මත සාපේක්ෂව රඳා පවතී. දැනුවත් වීමේ අඩුකම, රක්ෂණ ඔප්පු කළමනාකරණය තුළ අකාර්යක්ෂමතා, රටතුළ පවතින සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහ ප්‍රජා සමිති පැවතීම නිසා ව්‍යාප්තිය ධනාත්මකව වර්ධනය වී නොමැති අතර, පසුගිය දශකය තුළ 1%ක ස්ථාවර මට්ටමේ පැවතිණි. රක්ෂණ ඝනත්වය මුළු ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස මුළු දළ වාරික ආදායම තුළින් ප්‍රකාශ කෙරේ. 2017 දී, රක්ෂණ ඝනත්වය 2016 දී වාර්තා කළ රුපියල් 6,747ට සාපේක්ෂව රුපියල් 7,677 දක්වා සුළු වශයෙන් වර්ධනය වී ඇත. පසුගිය වසර පහ තුළ දළ වාරික ආදායම, රක්ෂණ ව්‍යාප්තිය සහ ඝනත්වය 1 වැනි වගුවෙන් පැහැදිලි කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයට නිශ්චිත සමහර ප්‍රවනතා, අවස්ථා සහ නියාමන වෙනස්වීම් පැවති අතර, ඒවා පහත ලැයිස්තු ගත කෙරේ.

මධ්‍ය කාලයේ සිට දිගුකාලීනව, මෙරට ඉහළ මධ්‍යම ආදායම් මට්ටමකට පියවර තබන බැවින් සහ මේ අනුව වර්ධනය වන බැහැරකළ හැකි ආදායම රක්ෂණ ව්‍යාප්තියට හේතුවන බැවින් ආර්ථික අනාවැකි මගින් රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධ හිතකර සංඥාවක් පෙන්වා ඇත. තවද, අඩු ආදායම් සහිත ජනතාවගේ අවශ්‍යතා ඉලක්ක කරමින් ක්ෂුද්‍ර රක්ෂණය සම්බන්ධව මධ්‍ය කාලීනව අපේක්ෂිත දියුණුව කරා යොමු කිරීම රටතුළ රක්ෂණ ව්‍යාප්ති මට්ටම වැඩි කිරීමට හේතු විය හැක.

ශ්‍රී ලංකාව තුළ ජනවිකාශ සංක්‍රාන්තියෙන් වයස්ගත ජනගහනයේ වැඩිවීමක් අපේක්ෂා කරන අතර, ඒ අනුව සෑම පුද්ගලයින් හතර දෙනෙකුට එක් පුද්ගලයෙක් ඉදිරි දශක දෙකක කාලය තුළ වයස්ගත පුද්ගලයෙක් බවට පත්වේ. මෙය විශේෂයෙන් සෞඛ්‍ය සහ විශ්‍රාම වැටුප් පිළිබඳ රක්ෂණ නිෂ්පාදන සඳහා ඉල්ලුම වැඩිවීමකට හේතු වේ.

**වගුව 02**

**රක්ෂණ සමාගම්වල වත්කම්**

| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (අ) |
|---|---|---|---|---|---|
| දිගු කාලීන රක්ෂණය (රුපියල් මිලියන) | 216,275 | 247,061 | 312,713 | 345,589 | 392,400 |
| සාමාන්‍ය රක්ෂණය (රුපියල් මිලියන) | 155,636 | 174,588 | 151,177 | 173,985 | 185,767 |
| ප්‍රතිරක්ෂණය (රුපියල් මිලියන) | 1,453 | 3,065 | 3,417 | 5,755 | 4,250 |
| **එකතුව** | ***365,760** | ***422,031** | ***466,519** | **525,329** | **582,417** |

* අන්තර් කොටස් ගනුදෙනු ඉවත් කර ඇත.

එමෙන්ම, මධ්‍ය කාලය තුළ බලාත්මක වන අපේක්ෂිත ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 17 තුළින් රක්ෂකයින්ගේ, ක්‍රමෝපාය, ප්‍රාග්ධනය, අවදානම් කළමනාකරණය යනාදිය මත සාකල්‍ය වෙනස්වීම් ඇතිවිය හැක. විචක්ෂණ සැලසුම් සහිත රක්ෂකයින්ට වෙළඳපොල තුළ කාර්යක්ෂමතාව ඇති කල හැකි අතර තම හැකියාවන් වර්ධනය තුලින් ලාභදායීත්වය වැඩි කර ගත හැක.

2018 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන බදුකරණ නීති සංශෝධන මඟින් ජීවිත රක්ෂකයින්ගේ අතිරික්තය කොටස් හිමියන්ට බෙදාහැරීම, බදුකළහැකි ලාභය ගණනය කිරීම යනාදී යම් ක්ෂේත්‍රයන් තුළ සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. ඒ අනුව, වසර තුළ, යම් ජීවිත රක්ෂකයින් ඔවුන් විසින් පත්කළ ආයුගණකඥයින්ගේ නිර්දේශ සමඟ ජීවිත රක්ෂණ අරමුදලෙන් කොටස්හිමියන්ගේ අරමුදලට අදාළ අතිරික්ත මාරු කොට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසර සඳහා ලාභය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

මෑත කාලීනව, ශ්‍රී ලංකාවේ රක්ෂකයින් විසින් නිෂ්පාදන සංවර්ධනය, බෙදාහැරීම, පාර්භෝගික සේවා යනාදිය ඇතුළුව රක්ෂණයේ ජීවන චක්‍රය තුළ විවිධ ආකාරයෙන් උසස් තාක්ෂණයේ ප්‍රතිලාභ අත්විඳීමට නැඹුරු වී ඇත. රක්ෂණ සමාගම් කිහිපයක් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් කිහිපයක් රක්ෂණ සේවාවේ භූ දර්ශණය පුළුල් කිරීම සඳහා සන්නිවේදන සපයන්නන් සමඟ කටයුතු කොට ඇත.

වසර තුළ, රක්ෂකයින් විසින් විශේෂයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල දිවයින තුළ සමහර දිස්ත්‍රික්කවලට බලපෑ ගංවතුර සහ නායයාම් මඟින් ඇතිකළ දැඩි වර්ෂාව ඇතුළුව ස්වභාවික ආපදා හේතු කොට ගෙන ඇති වූ අභියෝගවලට මුහුණ දුනි.

## රක්ෂණ සමාගම්වල මුළු වත්කම්


පොලී අනුපාතයේ ඉහළ අස්ථාවරත්වය, උද්ධමනය හා නියාමන අනුකූලතා අවශ්‍යතා සපුරාලීම වැනි සාර්ව ආර්ථික සාධක රක්ෂකයින්ට ඔවුන්ගේ වත්කම් සහ වගකීම් කළමනාකරණය කිරීමේදී අභියෝගයන් විය. රක්ෂකයින් විසින් වාර්තාකළ මුළු වත්කම් 2017 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 582,417ක් වූ අතර, 2016 දී පැවති 12.61%ක වර්ධන වේගයට සාපේක්ෂව 10.87%ක මධ්‍යස්ථ වර්ධන වේගයක් පවත්වා ගෙන ඇත. පසුගිය වසර පහ තුළ රක්ෂණ කර්මාන්තයේ මුළු දළ වත්කම්වලට අදාළ විස්තර 2 වැනි වගුව සහ 2 වැනි රූප සටහනින් පෙන්නුම් කරයි. පොදුවේ, ජීවිත රක්ෂකයින්ගේ වගකීම දිගුකාලීන වන අතර, මේ නිසාම දිගුකාලීන වත්කම්වල ඒවා ආයෝජනය කිරීමට සලස්වමින් මුදල් ප්‍රවාහ අර්ථවත් අයුරින් ඇස්තමේන්තු කළ හැක. ජීවිත රක්ෂකයින් විසින් වාර්තා කළ මුළු වත්කම් 2017 දී රුපියල් මිලියන 392,400 ක් විය. එයට වෙනස්ව, සාමාන්‍ය රක්ෂකයින් ඔප්පුව නිකුත් කළ දිනයේ සිට හිමිකම්පෑම් අත්දැක ඇති බැවින් සැලකියයුතු ද්‍රවශීල වත්කම් පවත්වා ගැනීමට නැඹුරු වේ. සාමාන්‍ය රක්ෂකයින් විසින් වාර්තා කළ මුළු වත්කම් 2017 දී රුපියල් මිලියන 185,767ක් විය.

එස්එල්අයිසී, සෙලින්කෝ ලයිෆ්, ඒඅයිඒ ලයිෆ් සහ යුනියන් ලයිෆ් වත්කම් කළඹ සඳහා ප්‍රධාන දායකයින් වේ.

ජාතික ප්‍රතිරක්ෂකයා වන, ජාතික රක්ෂණ භාර අරමුදල ඔවුන්ගේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාළව රුපියල් මිලියන 4,250ක් වූ වත්කම් දරයි. එසේවුවත්, ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ වත්කම් කළඹ පසුගිය වසරට සාපේක්ෂව 2017 වසර තුළ 26.15%කින් පහත වැටුණි. එමෙන්ම, ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට

**රූප සටහන 02**

**රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් සහ වත්කම්වල වර්ධන අනුපාතය**



වගුව 03

ප්‍රධාන මූල්‍ය අංශයන් හි මුළු වත්කම් බෙදීයාම

| මූල්‍ය අංශය | වත්කම් බෙදීයාම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | | 2014 | | 2015 | | 2016 | | 2017 | |
| | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % |
| බැංකු ක්ෂේත්‍රය | 7,187.5 | 69.6 | 8,442.0 | 70.3 | 9,503.7 | 68.7 | 10,575.8 | 69.5 | 11,897.4 | 69.7 |
| තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන | 756.4 | 7.3 | 857 | 7.1 | 1044.2 | 7.5 | 1246.7 | 8.2 | 1370.4 | 8.0 |
| විශේෂිත මූල්‍ය ආයතන | 378 | 3.7 | 441 | 3.7 | 557.8 | 4.0 | 335.4 | 2.2 | 388.9 | 2.3 |
| ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන | 1,632.5 | 15.8 | 1,853.6 | 15.4 | 2,257.5 | 16.3 | 2,536.6 | 16.7 | 2,836.50 | 16.6 |
| රක්ෂණ සමාගම්* | 365.8 | 3.6 | 421.1 | 3.5 | 466.7 | 3.4 | 525.2(අ) | 3.4 | 582.4(ආ) | 3.4 |
| එකතුව | **10,320.2** | **100** | **12,015.0** | **100.0** | **13,830.8** | **100.0** | **15,223.4** | **100.0** | **17,075.6** | **100.0** |

මූලාශය : ශ්‍රී ලංකා මහ බැංකු

* රක්ෂණ සමාගම්වලින් ලද දත්ත මත පදනම් වී රක්ෂණ සමාගම්වල වත්කම් පුනස්ථාපනය කරන ලදී.

අදාළ මූල්‍ය ආයෝජන තුළ සැලකිය යුතු අඩුවීමක් පැවතිණ.

## ප්‍රධාන මූල්‍ය අංශයන් හී මුළු වත්කම් බෙදීයාම

3 වැනි වගුවෙන් හා 3 වැනි රූප සටහනින් පෙන්වා දෙන පරිදි 2016 දී රුපියල් බිලියන 15,220ක් වූ මුළු වත්කම් ප්‍රමාණය 2017 දී රුපියල් බිලියන 17,076 දක්වා 12.19% කින් වර්ධනය වූ අතර එය ආර්ථිකයට ධනාත්මකව දායක වී ඇත.

බැංකු ක්ෂේත්‍රය මුළු වත්කම්වලින් 69.7%ක් නියෝජනය කරන අතර, 2017 දී 12.50%ක වර්ධන වේගයක් වාර්තා කරමින් මූල්‍ය ක්ෂේත්‍රය තුළ වාර්තා කළ වර්ධනයෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයකට දායක වී ඇත. විශේෂිත මූල්‍ය ආයතනවල වත්කම් ප්‍රමාණය 2017 දී 15.95%ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 388.9 (2016 :රුපියල් බිලියන 335.4) දක්වා වැඩි වීමක් දක්නට ඇත. එමෙන්ම ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන ද 2017 දි 11.82% ක වර්ධන අනුපාතයකින් හා රුපියල් බිලියන 2,837ක වත්කම් වටිනාකමක් වාර්තා කරමින් වර්ධිත කාර්යසාධනයක් වාර්තා කළේය. මෙම අංශය මූල්‍ය ක්ෂේත්‍රයේ මුළු වත්කම්වලින් 16.6%කට දායක වී ඇත.

පසුගිය වසර මෙන්ම, රක්ෂණ සමාගම් 2017 වසරේදී ද මූල්‍ය ක්ෂේත්‍රයේ මුළු වත්කම්වලින් 3.4%ක් දරන ලදී.

## එකෝචිත අතිරික්තය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2016 වසර තුළ අවදානම් පාදක ප්‍රාග්ධන පාලනය ක්‍රියාත්මක කිරීමෙන් පසු, රක්ෂණ බැරකම් ඔප්පු ඇගයීමේ ක්‍රමවේදය වෙනස් වීම තුළින් ඇතැම් දිගුකාලීන රක්ෂකයින්ගේ අතිරික්තය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වූ අතර රක්ෂණ බැරකම් ඔප්පු අඩුවීමකට හේතු විය. එකී අතිරික්තය “එකෝචිත අතිරික්තය” ලෙස හැඳින් වූ අතර එය ජීවිත අරමුදල තුළ තබාගැනීමට නිර්දේශ කරන ලදී.


එසේවුවත්, ජීවිත රක්ෂණ අංශය සම්බන්ධයෙන් බදුකරණ නීතිවල සංශෝධන සමඟ, රක්ෂණ කර්මාන්තය විසින් එකී අතිරික්ත, කොටස්හිමි අරමුදලට මාරු කිරීමට සහ සීමිත සංචිතයක් ලෙස පවත්වා ගැනීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් අනුමැතිය ඉල්ලා සිටින ලදී. එහිදී එකෝචිත අතිරික්තය හඳුනා ගැනීම සඳහා 16 වැනි විධානය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා හෝ විධානයේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලවන දිනයෙන් පසු දිනයක සහභාගිත්ව ව්‍යාපාර නොවන දිගුකාලීන රක්ෂකයින්ට අයත් එකෝචිත අතිරික්තය කොටස්හිමියන් වෙත මාරු කිරීමට අවසර දෙන ලදී. තවද, කොටස්හිමි අරමුදල තුළ “සීමිත නියාමන සංචිතය” ලෙස මෙම අතිරික්තය පවත්වා ගැනීමට රක්ෂකයින්ට උපදෙස් දෙන ලදී.

සහභාගිත්ව ව්‍යාපාරයට අදාළ එකෝචිත අතිරික්තය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් එම අතිරික්තය වෙන්නොකළ අතිරික්තයේ කොටසක් ලෙස සහභාගිත්ව අරමුදල තුළ තබාගැනීමට සහ රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 38 වගන්තියට අනුකූලව

රූප සටහන 03

2017 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම



වගුව 04

රක්ෂණ සමාගම්වල ලාභදායිත්වය

| රක්ෂකයා | 2016 (අ) | | | 2017(ආ) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දීර්ඝ කාලීන රක්ෂණය (රු.'000) | සාමාන්‍ය රක්ෂණය (රු.'000) | එකතුව (රු.'000) | දීර්ඝ කාලීන රක්ෂණය (රු.'000) | | සමාන්‍ය රක්ෂණය (රු.'000) | එකතුව (රු.'000) |
| | | | | ඒකෝපිත අතිරික්තය මාරු කිරීමට පෙර | ඒකෝපිත අතිරික්තය මාරු කිරීමෙන් පසු | | |
| ඒඅයිඒ ලයිෆ් | 793,250 | | 793,250 | 7,597,099 | 13,677,947 | | 13,677,947 |
| ඒඅයිජී | | (64,384) | (64,384) | | | (40,526) | (40,526) |
| අලියාන්ස් ජෙනරල් | | 37,636 | 37,636 | | | 193,318 | 193,318 |
| අලියාන්ස් ලයිෆ් | 25,959 | | 25,959 | 104,051 | 104,051 | | 104,051 |
| අමානා ජෙනරල් | | (139,172) | (139,172) | | | 61,144 | 61,144 |
| අමානා ලයිෆ් | 35,691 | | 35,691 | 52,207 | 52,207 | | 52,207 |
| ආර්පිකෝ | 107,888 | | 107,888 | 49,033 | 49,033 | | 49,033 |
| සෙලින්කෝ ජෙනරල් | | 1,381,126 | 1,381,126 | | | 1,702,653 | 1,702,653 |
| සෙලින්කෝ ලයිෆ් | 3,743,726 | | 3,743,726 | 6,351,351 | 9,807,535 | | 9,807,535 |
| කොන්ටිනෙන්ටල් | | 191,276 | 191,276 | | | 291,386 | 291,386 |
| කෝපරේටිව් ජෙනරල් | | 189,142 | 189,142 | | | 429,954 | 429,954 |
| කෝප්ලයිෆ් | (7,266) | | (7,266) | 53,774 | 53,774 | | 53,774 |
| ෆෙයාෆස්ට් | | (485,083) | (485,083) | | | 720,450 | 720,450 |
| එච්එන්බී ලයිෆ් | 656,641 | | 656,641 | 725,665 | 725,665 | | 725,665 |
| එච්එන්බී ජෙනරල් | | 48,879 | 48,879 | | | 201,722 | 201,722 |
| ජනශක්ති ලයිෆ් | 953,017 | | 953,017 | (104,193) | 1,691,635 | | 1,691,635 |
| ජනශක්ති ජෙනරල් | | 1,277,445 | 1,277,445 | | | 1,242,429 | 1,242,429 |
| එල්අයිසී | 3,394 | | 3,394 | 24,645 | 24,645 | | 24,645 |
| එල්ඕඑල්සී ජෙනරල් | | 313,297 | 313,297 | | | 272,157 | 272,157 |
| එල්ඕඑල්සී ලයිෆ් | 320,534 | | 320,534 | 144,595 | 400,730 | | 400,730 |
| එම්බීඑස්එල් | | (220,526) | (220,525) | | | (46,437) | (46,437) |
| ඔරියන්ට් | | 30,565 | 30,565 | | | 65,877 | 65,877 |
| පීපල්ස් | | 733,010 | 733,010 | | | 866,691 | 866,691 |
| සණස | 176,591 | (68,497) | 108,094 | 77,914 | 77,914 | 6,838 | 84,752 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 877,443 | | 877,443 | 1,106,517 | 1,904,521 | | 1,904,521 |
| එස්එල්අයිසී | 4,555,716 | 9,235,253 | 13,790,969 | 3,216,447 | 3,314,683 | 2,575,519 | 5,890,202 |
| යුනියන් ලයිෆ් | 1,373,307 | | 1,373,307 | 4,002,194 | 7,384,128 | | 7,384,128 |
| යුනියන් ජෙනරල්. | | 776,630 | 776,630 | | | | |
| **එකතුව** | **13,615,891** | **13,236,597** | **26,852,488** | **23,401,299** | **39,268,468** | **8,543,175** | **47,811,643** |

මෙම අතිරික්තය කොටස් හිමියන්ට මාරු කල හැක්කේ ඔප්පු හිමියන්ට ප්‍රසාද දීමනා ලෙස ලබා දීමේ අරමුණින් විය යුතු බවට රක්ෂකයින්ට උපදෙස් දෙන ලදී. එමෙන්ම, ප්‍රකාශිත බෝනස් මුදලක් තිරසාර, සමාන සහ ඔප්පුහිමියන්ගේ යුක්ති සහගත අපේක්ෂාවන්ට අනුකූල වියයුතු බවට නිර්දේශ කරන ලදී.

ජීවිත රක්ෂකයින් විසින් වාර්තාකළ මුළු ඒකෝපිත අතිරික්තය රුපියල් මිලියන 29,399ක් වූ අතර, සහභාගිත්වය සහ සහභාගිත්වය නොමැතිව 2016 ජනවාරි 01 දිනට විය පිළිවෙලින් රුපියල් මිලියන 10,823ක් හා රුපියල් මිලියන 18,576ක් විය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය මත, සීමිත නියාමන සංචිතය ලෙස කොටස්හිමි අරමුදලට මාරුකරන ලද මුළු ඒකෝපිත අතිරික්තය 2017 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 15,867ක් විය. එකී මාරුකිරීම් 2017 දී ඇතැම් ජීවිත රක්ෂකයින් විසින් වාර්තා කරන ලද ලාභයේ වැඩිවීමකට සෘජුවම හේතු වී ඇත.

## ලාභදායිතාව

4 වන වගුවේ පෙන්වා දෙන පරිදි 2017 වසරේදී ඇතැම් ජීවිත රක්ෂකයින්ගේ ඒකෝපිත අතිරික්තය මාරු කිරීමට පෙර රුපියල් මිලියන 23,401 ක බදු පෙර ලාභයක් වාර්තා කොට ඇත. ඒකෝපිත අතිරික්තය මාරු කිරීමට පෙර බදු පෙර ලාභය වාර්ෂිකව 71.87% කින් වර්ධනය වී ඇත. මෙම වර්ධනයට ප්‍රධාන සාධකය වූයේ විශාල සමාගම් කිහිපයකට ආයුගණකඥයින් විසින් නිර්දේශ කරන ලද සහභාගී නොවන

අතිරික්තය කොටස් හිමියන්ට මාරු කිරීමයි. ඉහත සඳහන් පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය සමඟ "සීමිත නියාමන සංචිතය" ලෙස කොටස්හිමි අරමුදලට මාරුකරන ලද මුළු ඒකෝචිත අතිරික්තය රුපියල් මිලියන 15,867ක් විය. සෙලින්කෝ ලයිෆ්, යූනියන් ලයිෆ්, ජනශක්ති ලයිෆ්, සොෆ්ට්ලොජික් ලයිෆ්, එල්ඕඑල්සී ලයිෆ්, එස්එල්අයිසී සහ ඒඅයිඒ ලයිෆ් මෙම සමාගම් වේ. ඒ අනුව, එකී මාරුකිරීම සමඟ, 2017 වසරේදී ජීවිත රක්ෂණ කර්මාන්තයේ මුළු ලාභය රුපියල් මිලියන 39,268ක් විය.

සාමාන්‍ය රක්ෂකයින් විසින් වාර්තා කළ මුළු බදු පෙර ලාභය 2016 දී වාර්තා කළ රුපියල් මිලියන 13,236ට සාපේක්ෂව 2017 වසරේදී රුපියල් මිලියන 8,543ක් විය. 2016 වසර තුළ ඉහළ ලාභදායිත්වයට 2016 වසර තුළ රුපියල් මිලියන 6,750ක් වූ එස්එල්අයිසී පරිපාලිත සමාගමකින් සැලකියයුතු ලාභාංශ ආදායම් ලැබීම හේතු විය.

## රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල

රක්ෂණ සමාගම් විසින් වාර්තා කළ මුළු කොටස් හිමියන්ගේ අරමුදල් තුළින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ 16 වැනි විධානය අනුව සමහර ජීවිත රක්ෂකයින් විසින් ඒකෝචිත අතිරික්තය මාරුකිරීමත් සමඟ මෙයට පෙර සාකච්ඡා කළ පරිදි වර්ධිත කාර්යසාධනය පෙන්නුම් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 5 වන වගුවේ පෙන්වා දෙන පරිදි මුළු කොටස්හිමියන්ගේ අරමුදල රුපියල් මිලියන 176,706ක් (2016:රුපියල් මිලියන 140,445) වූ අතර 2016 දී වාර්තා කළ 3.15%ක වර්ධන වේගයට සාපේක්ෂව 2017 දී 25.82%කින් වර්ධනය වී ඇත.

2017 දී එස්එල්අයිසී එහි කොටස්හිමියන්ගේ අරමුදල තුළ රුපියල් මිලියන 61,643ක් වාර්තා කරමින් ඉතා ශක්තිමත් ස්ථානයක පසුවිය. කෙසේවෙතත්, එස්එල්අයිසී සාමාන්‍ය සහ ජීවිත රක්ෂණ ව්‍යාපාර බෙදා වෙන් කිරීමට නියමිතය. සෙලින්කෝ ලයිෆ් දෙවන විශාලතම කොටස්හිමියන්ගේ අරමුදලට හිමිකම් පාන අතර, එය 2016 වසරේ වාර්තාකළ රුපියල් මිලියන 11,912ට සාපේක්ෂව රුපියල් මිලියන 20,647කි.

2016 වසරට සාපේක්ෂව ඒඅයිඒ හි මුළු සංචිත තුළ විශාල වර්ධනයක් දක්නට ලැබුණු අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් පත්කළ ආයුගණකඥයාගේ නිර්දේශය සහිතව රුපියල් මිලියන 13,161ක් වූ ඒකෝචිත අතිරික්තය සහ ජීවිත රක්ෂණයේ අතිරික්තය 2017 දෙසැම්බර්

**වගුව 05**

**රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල්**

| රක්ෂකයා | 2016 (අ) | | 2017 (ආ) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල් (රු.'000) | % | ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.'000) | සීමිත නියාමන සංචිතය (රු.'000) | මුළු වෙනත් සංචිතය (රු.'000) | සමස්ත කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රු.'000) | % |
| ඒඅයිඒ ලයිෆ් | 5,360,984 | 3.82 | 511,922 | 6,080,848 | 10,766,147 | 17,358,917 | 9.82 |
| ඒඅයිජී | 43,469 | 0.03 | 812,215 | | (809,272) | 2,943 | 0.00 |
| අලියාන්ස් ජෙනරල් | 973,471 | 0.69 | 905,500 | | 679,081 | 1,584,581 | 0.90 |
| අලියාන්ස් ලයිෆ් | 486,186 | 0.35 | 739,624 | | 149,782 | 889,406 | 0.50 |
| අමානා ජෙනරල් | 1,758,292 | 1.25 | 1,860,001 | | (38,462) | 1,821,539 | 1.03 |
| අමානා ලයිෆ් | 523,517 | 0.37 | 500,000 | | 75,343 | 575,343 | 0.33 |
| ආර්පිකෝ | 754,710 | 0.54 | 675,565 | | 101,686 | 777,251 | 0.44 |
| සෙලින්කෝ ජෙනරල් | 8,801,136 | 6.27 | 500,200 | | 9,362,137 | 9,862,337 | 5.58 |
| සෙලින්කෝ ලයිෆ් | 11,911,828 | 8.48 | 500,001 | 3,456,184 | 16,690,712 | 20,646,897 | 11.68 |
| කොන්ටිනෙන්ටල් | 1,194,534 | 0.85 | 750,000 | | 688,891 | 1,438,891 | 0.81 |
| කෝපරේටිව් ජෙනරල් | 1,695,343 | 1.21 | 1,260,252 | | 803,932 | 2,064,184 | 1.17 |
| කෝප්ලයිෆ් | 485,502 | 0.35 | 500,000 | | 96,209 | 596,210 | 0.34 |
| ෆෙයාෆස්ට් | 816,567 | 0.58 | 3,131,949 | | 1,398,137 | 4,530,086 | 2.56 |
| එච්එන්බී ලයිෆ් | 2,875,330 | 2.05 | 1,171,875 | | 2,604,402 | 3,776,277 | 2.14 |
| එච්එන්බී ජෙනරල් | 971,728 | 0.69 | 1,150,000 | | 20,220 | 1,170,220 | 0.66 |
| ජනශක්ති ලයිෆ් | 8,148,633 | 5.80 | 4,853,752 | 1,795,829 | 2,811,296 | 9,460,877 | 5.35 |
| ජනශක්ති ජෙනරල් | 6,718,571 | 4.78 | 5,878,017 | | 1,866,085 | 7,744,102 | 4.38 |
| එල්අයිසී | 527,255 | 0.38 | 500,000 | | 93,357 | 593,357 | 0.34 |
| එල්ඕඑල්සී ජෙනරල් | 991,715 | 0.71 | 700,000 | | 566,740 | 1,266,740 | 0.72 |
| එල්ඕඑල්සී ලයිෆ් | 583,270 | 0.42 | 800,000 | 256,134 | (72,101) | 984,033 | 0.56 |
| එම්බීඑස්එල් | 91,728 | 0.07 | 1,080,022 | | (1,046,207) | 33,815 | 0.02 |
| එන්අයිටීඑෆ් | 7,564,859 | 5.38 | | | 7,260,349 | 7,260,349 | 4.11 |
| ඔරියන්ට් | 617,545 | 0.44 | 825,000 | | (156,108) | 668,892 | 0.38 |
| පීපල්ස් | 2,629,456 | 1.87 | 1,350,000 | | 1,707,239 | 3,057,239 | 1.73 |
| සණස | 1,215,483 | 0.87 | 1,044,597 | | 3,192 | 1,047,789 | 0.59 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 1,962,167 | 1.40 | 1,062,500 | 798,004 | 2,025,625 | 3,886,129 | 2.20 |
| එස්එල්අයිසී | 63,028,451 | 44.87 | 6,000,000 | 98,236 | 55,544,510 | 61,642,746 | 34.89 |
| යූනියන් ලයිෆ් | 3,866,192 | 2.75 | 1,000,000 | 3,381,934 | 7,582,780 | 11,964,714 | 6.77 |
| යූනියන් ජෙනරල් | 3,847,303 | 2.73 | - | - | - | - | - |
| **එකතුව** | **140,445,225** | **100** | **40,062,992** | **15,867,169** | **120,775,702** | **176,705,863** | **100** |

31 දිනට කොටස්හිමියන්ගේ අරමුදලට මාරු කිරීම හේතුවිය. යුනියන් ලයිෆ් හි මුළු කොටස්හිමියන්ගේ අරමුදල පත්කළ ආයුගණකඥයාගේ නිර්දේශය සහිතව වසර තුළ රුපියල් මිලියන 7,024ක් වූ එකෝච්ත අතිරික්තය මාරුකිරීම සහ අනෙකුත් අතිරික්ත මාරුකිරීම් හේතු කොට ගෙන 200%ට වැඩි ප්‍රමාණයකින් වැඩිවී ඇත.

සාමාන්‍ය රක්ෂණ සමාගම්වලින්, සෙලින්කෝ ජෙනරල් රුපියල් මිලියන 9,862ක් වූ විශාලතම කොටස්හිමියන්ගේ අරමුදල වාර්තා කළ අතර, ඉන්පසුව ජනශක්ති ජෙනරල් සහ ජාතික රක්ෂණ භාර අරමුදල පිළිවෙලින් සිටී. ෆෙයාෆැස්ට් හි මුළු කොටස්හිමියන්ගේ අරමුදල යුනියන් ජෙනරල් ඒකාබද්ධ කිරීමත් සමග සැලකියයුතු ලෙස වර්ධනය වී ඇති අතර, 2017 දී එය රුපියල් මිලියන 4,530ක් (2016: රුපියල් මිලියන 817) විය.

## රක්ෂණ සමාගම්වල ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් පිළිබඳ විශ්ලේෂණය

ව්‍යාපාර ස්වභාවය හේතු කොට ගෙන, දිවයින පුරා ව්‍යාප්ත ශාඛා ගනුදෙනුකරුවන්ට රක්ෂණ සේවා බෙදා හැරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රධාන විකුණුම් ප්‍රදේශය ලෙස බස්නාහිර පළාත තුළ විසිරී ඇති ශාඛා ගණන 677ක් විය. එමෙන්ම, 2016ට සාපේක්ෂව 2017 වසර තුළ, දකුණු පළාත, වයඹ පළාත, නැගෙනහිර පළාත, සබරගමුව පළාත යනාදී පළාත්වල ශාඛා වාර්තාවීමත් සමගම අනෙකුත් පළාත්වල ශාඛා ජාලය පුළුල්කිරීමේ නැඹුරුව දක්නට ලැබුණි.

2017 වසර පුරා, නව ශාඛා 108ක් එකතුකරන ලද අතර, මුළු ශාඛා ගණන පසුගිය වසර තුළ වාර්තා කළ 1,971 සාපේක්ෂව මෙම වසර තුළ 2,079 දක්වා වැඩිවී ඇත. 2017 දී වාර්තාකළ ශාඛාවන්ගේ සංයුතිය අනුව ජීවිත රක්ෂණ ශාඛා 1,151ක්ද, සාමාන්‍ය රක්ෂණ ශාඛා 765 ක් ද සහ මිශ්‍රිත රක්ෂණ ශාඛා 163 ක් ද විය.

රක්ෂණ සමාගම් සඳහා නියෝජිතයින්ගේ කාර්යක්ෂම කළමනාකරණය ඉතා අභියෝගාත්මක කාර්යයක් වුවත්, ජීවිත රක්ෂණ කර්මාන්තය ප්‍රධාන වශයෙන් නිෂ්පාදන අලෙවිකරණ නියෝජිතයින්ගේ දායකත්වය මත රඳා පවතී. මෙම ක්ෂේත්‍රය තුළ සේවය කරමින් සිටි නියෝජිතයින්ගේ මුළු ගණන

**වගුව 06**

**2016 සහ 2017 දෙසැම්බර් 31 ට ක්‍රියාත්මක වූ ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් සංඛ්‍යාව**


| පළාත | ශාඛා සංඛ්‍යාව | | සේවකයින් සංඛ්‍යාව | | නියෝජිතයින් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| මධ්‍යම පළාත | 196 | 177 | 880 | 1,018 | 4,245 | 4,418 |
| නැගෙනහිර පළාත | 132 | 153 | 553 | 652 | 2,223 | 2,286 |
| උතුරු මැද පළාත | 145 | 139 | 617 | 724 | 2,520 | 2,468 |
| වයඹ පළාත | 178 | 224 | 919 | 1,116 | 4,094 | 4,238 |
| උතුරු පළාත | 160 | 161 | 570 | 547 | 3,387 | 3,171 |
| සබරගමුව පළාත | 149 | 161 | 842 | 822 | 2,745 | 3,117 |
| දකුණු පළාත | 234 | 266 | 1,088 | 1,470 | 4,915 | 5,000 |
| ඌව පළාත | 120 | 121 | 478 | 583 | 2,422 | 2,435 |
| බස්නාහිර පළාත | 657 | 677 | 10,949 | 11,535 | 17,265 | 17,733 |
| **එකතුව** | **1,971** | **2,079** | **16,896** | **18,467** | **43,816** | **44,866** |

2016 දී වාර්තාකළ 43,816ට සාපේක්ෂව 2017 දී 44,866ක් විය. නියෝජිතයින් බොහෝ පිරිසක් බස්නාහිර පළාත තුළ ව්‍යාප්තව සිටි අතර, දකුණු සහ මධ්‍යම පළාත් පිළිවෙලින් දෙවන සහ තෙවන ස්ථානවල පසුවිය. සබරගමුව පළාත තුළ සේවය කළ නියෝජිතයින් ගණන 2017 දී 3,117 දක්වා (2016 : 2,745) සැලකිය යුතු ලෙස වැඩිවී ඇති අතර උතුරු සහ උතුරු මැද පළාත්වල සේවය කළ නියෝජිතයින් ගණන තුළ අඩුවීමක් දක්නට ලැබුණි.

6 වැනි වගුව සහ 4 වැනි රූප සටහනේ පෙන්වා දෙන පරිදි, වසර තුළ රක්ෂණ කර්මාන්තයේ සේවය කළ මුළු සේවක සංඛ්‍යාව 18,467ක් වූ අතර පසුගිය

**රූප සටහන 04**

**2017 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක වූ ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් සංඛ්‍යාව**




වසරේ වාර්තාකළ 16,896 ට සාපේක්ෂව වර්ධනය වී ඇත. රක්ෂණ සමාගම්වල සේවය කරන මුළු සේවක සංඛ්‍යාවෙන් 60% කට වැඩි පිරිසක් බස්නාහිර පළාත තුළ ස්ථාන ගතවී ඇත. දකුණු පළාත තුළ සේවා නියුක්තිය 2016 වසරට සාපේක්ෂව 2017 දී 35% කින් සැලකියයුතු ලෙස වැඩි වී ඇත.

## රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ මාර්ග

තාක්ෂණික නවයකරණයත් සමඟ, රක්ෂකයින් විසින් විශේෂයෙන් මාර්ගගත අවකාශය තුළ වඩාත් අළුත් බෙදාහැරීමේ හා සංවර්ධනය කිරීමේ මාර්ග ගවේෂණය කරමින් විවිධ බෙදාහැරීමේ මාර්ග භාවිතා කිරීමට නැඹුරු වී ඇත. විශේෂයෙන් සමාජ මාධ්‍යවල ජනප්‍රියතාව අලෙවිකරණය තුළ රක්ෂකයින් සඳහා අවස්ථාවන් නිර්මාණය කිරීම ඇතුළුව අන්තර්ජාලය හරහා රක්ෂණ නිෂ්පාදන පිළිබඳ තොරතුරු රැස්කිරීමේ ප්‍රවණතාවය දක්නට ඇත. රක්ෂණ සමාගම් කිහිපයක් Insurtech විසඳුම සමඟින් මෑතකාලීනව ඔවුන්ගේ සේවාදායක පදනම පුළුල් කිරීමේදී සන්නිවේදන සපයන්නන් සමග කටයුතු කර ඇත.

**රූප සටහන 05**
**රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ මාර්ග**




| | දීර්ඝ කාලීන 2016 | සාමාන්‍ය 2016 | දීර්ඝ කාලීන 2017 | සාමාන්‍ය 2017 |
|---|---|---|---|---|
| නියෝජිතයින් | 87.59 | 27.17 | 87.94 | 27.15 |
| තැරැව්කරුවන් | 0.51 | 17.41 | 0.79 | 17.57 |
| සෘජු | 5.91 | 43.25 | 4.52 | 44.81 |
| බැංකු රක්ෂණ | 5.04 | 3.86 | 5.97 | 2.66 |
| වෙනත් | 0.95 | 8.30 | 0.78 | 7.81 |

5 වැනි රූපසටහන තුළින් රක්ෂණ සමාගම්වල දළ ලිඛිත වාරිකයට විවිධ බෙදාහැරීමේ මාර්ගවල දායකත්වය පැහැදිලි කරයි.

අනෙකුත් බෙදාහැරීමේ මාර්ග මතුවුවත්, නියෝජිත ක්‍රමය දළ ලිඛිත වාරිකයට 87.94%ක් දායක කරමින් ජීවිත රක්ෂණ වෙළෙඳපොල තුළ තවදුරටත් සැමට ඉදිරියෙන් පැවතිණ. ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකයට බැංකු රක්ෂණයේ දායකත්වය 5.97%ක් (2016 : 5.04%) වන අතර සෘජු විකුණුම් තෙවන ස්ථානයේ පසුවිය.


සාමාන්‍ය රක්ෂකයින් විසින් ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සේවා ලබාදීම සඳහා උසස් තාක්ෂණික නිෂ්පාදනවලින් සමන්විත වෘත්තීමය ලෙස පුහුණු අලෙවි බලකායක් තුළින්

**වගුව 07**
**සමාගම් අනුව දළ ලිඛිත වාරික ආදායම සහ වෙළඳපොල කොටස - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2013 | | 2014 | | 2015 | | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරික ආදායම (රු '000) | වෙළඳ පොළ කොටස (%) | වාරික ආදායම (රු.'000) | වෙළඳ පොළ කොටස (%) | වාරික ආදායම (රු.'000) | වෙළඳ පොළ කොටස (%) | වාරික ආදායම (රු.'000) | වෙළඳ පොළ කොටස (%) | වාරික ආදායම (රු.'000) | වෙළඳ පොළ කොටස (%) |
| ඒඅයිඒ ලයිෆ් | 6,863,047 | 16.47 | 7,266,574 | 16.29 | 8,433,333 | 15.71 | 10,103,915 | 15.92 | 11,510,581 | 16.10 |
| අලියාන්ස් ලයිෆ් | 828,790 | 1.99 | 823,456 | 1.85 | 919,144 | 1.71 | 1,040,269 | 1.64 | 1,178,828 | 1.65 |
| අමානා ලයිෆ් | 542,986 | 1.30 | 679,029 | 1.52 | 928,294 | 1.73 | 820,727 | 1.29 | 792,174 | 1.11 |
| ආර්පිකෝ | 206,494 | 0.50 | 297,439 | 0.67 | 482,447 | 0.90 | 745,386 | 1.17 | 1,038,085 | 1.45 |
| සෙලින්කෝ ලයිෆ් | 11,122,906 | 26.69 | 12,002,524 | 26.91 | 13,456,828 | 25.06 | 15,027,600 | 23.67 | 15,765,484 | 22.05 |
| කෝප්ලයිෆ් | 337,623 | 0.81 | 402,046 | 0.90 | 494,598 | 0.92 | 466,997 | 0.73 | 636,178 | 0.89 |
| එච්එන්බී ලයිෆ් | 2,014,547 | 4.83 | 2,342,867 | 5.25 | 2,788,715 | 5.19 | 3,554,078 | 5.60 | 3,963,642 | 5.54 |
| ජනශක්ති ලයිෆ් | 2,193,662 | 5.26 | 2,170,419 | 4.87 | 2,550,782 | 4.75 | 2,943,963 | 4.64 | 2,902,873 | 4.06 |
| එල්අයිසී | 322,268 | 0.77 | 348,767 | 0.78 | 386,885 | 0.72 | 473,867 | 0.75 | 582,114 | 0.81 |
| එල්ඕඑල්සී ලයිෆ් | 274,798 | 0.66 | 592,422 | 1.33 | 1,209,578 | 2.25 | 1,896,558 | 2.99 | 2,467,166 | 3.45 |
| එම්බීඑස්එල් | 251,720 | 0.60 | 294,299 | 0.66 | 203,235 | 0.38 | 235,533 | 0.37 | 123,732 | 0.17 |
| සණස | 283,975 | 0.68 | 260,867 | 0.58 | 311,434 | 0.58 | 367,637 | 0.58 | 377,690 | 0.53 |
| එස්එල්අයිසී | 8,397,718 | 20.15 | 8,121,159 | 18.21 | 10,470,079 | 19.50 | 11,893,640 | 18.74 | 12,517,119 | 17.51 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 2,520,283 | 6.05 | 3,048,148 | 6.84 | 4,091,042 | 7.62 | 5,635,701 | 8.88 | 7,530,935 | 10.53 |
| යුනියන් ලයිෆ් | 5,515,063 | 13.23 | 5,945,499 | 13.33 | 6,964,390 | 12.97 | 8,270,751 | 13.03 | 10,117,630 | 14.15 |
| **එකතුව** | 41,675,880 | 100 | 44,595,516 | 100 | 53,690,783 | 100 | 63,476,622 | 100 | 71,504,231 | 100 |
| **වර්ධන අනුපාතය** (%) | 11.20 | | 7.01 | | 20.40 | | 18.23 | | 12.65 | |

**රූප සටහන 06**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා සමාගම් වශයෙන් දළ ලිඛිත වාරිකයන්හි වෙළෙඳපොල කොටස - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




ඔවුන්ගේ කළඹ බෙදාහැරීම කරන ලදී. ඒ අනුව, දළ ලිඛිත වාරිකයට සංවරණ ගනුදෙනුකරුවන්, විශේෂිත අලෙවි බලකාය වැනි සෘජු විකුණුම්වලින් දායකත්වය 44.81%ක් (2016:43.25%) විය. සෙලින්කෝ ජෙනරල් මෙම වර්ගයට විශාල වශයෙන් දායකවී ඇති අතර, එන්අයිටීඑෆ් විසින් අලෙවිකළ නිෂ්පාදනවල ස්වභාවය හේතු කොට ගෙන එන්අයිටීඑෆ් දෙවන ස්ථානයේ පසුවිය.

2017 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වාරික ආදායමෙන් 27.15%කට (2016:27.17%) නියෝජිතයින් දායක වී ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වාරික ආදායමෙන් 17.57%කට තැරැව්කරුවන් දායක වී ඇති අතර, ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා දායකත්වය ඉතා අඩු මට්ටමක විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වාරික ආදායමෙන් 7.81%ක් අනෙකුත් වර්ග නියෝජනය කළ අතර, එය ප්‍රධාන වශයෙන් සමූහ මූල්‍ය සහ කල්බදු ආයතන තුළින් උපදවන ලද රක්ෂණ ව්‍යාපාරයෙන් සමන්විත වේ.

## දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය දළ ලිඛිත වාරිකය සහ වෙළෙඳපොල කොටස

ආර්ථික අභියෝග හමුවේ, ජීවිත රක්ෂකයින් විසින් 2016 දී වාර්තා කළ රුපියල් මිලියන 63,477ට සාපේක්ෂව 2017 වසර තුළ රුපියල් මිලියන 71, 504ක මුළු වාරික ආදායමක් වාර්තා කර ඇත. ඒ අනුව, ජීවිත රක්ෂණ කර්මාන්තය දළ ලිඛිත වාරික අනුව 12.65%ක (2016:18.23%) වර්ධනයක් වාර්තා කරන ලදී. ජීවිත රක්ෂණයේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්කම වැඩිවීම, පාරිභෝගික ඉල්ලුම සපුරාලීමට නව රක්ෂණ නිෂ්පාදන දියත් කිරීම සහ උසස්කළ ගනුදෙනුකාර සේවා ජීවිත රක්ෂණ අංශය තුළ ප්‍රගතියට ධනාත්මකව දායක වී ඇත. සංයුක්ත රක්ෂකයින් වෙන්කිරීම අනුව, පසුගිය වසර තුන තුළ කර්මාන්තයේ ද්විත්ව සංඛ්‍යාත්මක වර්ධන වේගයක් දක්නට ලැබුණි.


සමාගම් අනුව දළ ලිඛිත වාරිකය සහ දිගුකාලීන රක්ෂණ සමාගම්වල වෙළෙඳපොල කොටස 7 වැනි වගුවෙන් පෙන්නුම් කරයි.

පෙර වසර හා සමානව, සෙලින්කෝ ලයිෆ් 2017 වසර තුළදී ද 22.05%ක වෙළෙඳපොල කොටසක් සමඟ රුපියල් මිලියන 15,765 ක (2016: රුපියල් මිලියන 15,028) දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කරමින් වෙළෙඳපොලහි ඉදිරියෙන් සිටී. එස්එල්අයිසී 15.51%ක වෙළෙඳපොල කොටසක් සහ රුපියල් මිලියන 12,517ක් උපයමින් දළ ලිඛිත වාරිකයට දෙවන විශාලතම දායකයා වූ අතර, ඒඅයිඒ ලයිෆ් 16.10%ක වෙළෙඳපොල කොටසක් (රුපියල් මිලියන 11,511) වාර්තා කරමින් තෙවැනියා බවට පත්විය. මුළු දළ ලිඛිත වාරිකයට මෙම සමාගම් තුනේ දායකත්වය 2016 දී වාර්තා කළ 58.33%ට සාපේක්ෂව 2017 දී 55.66% දක්වා පහත බැස ඇත. යුනියන් ලයිෆ් රුපියල් මිලියන 10,118ක් වාර්තා කර ඇති අතර, වෙළෙඳපොල තුළ සිව්වැනි ස්ථානය රැක ගෙන ඇත.

ආර්පිකෝ, කෝප්ලයිෆ්, සොෆ්ට්ලොජික් ලයිෆ්, එල්ඕඑල්සී ලයිෆ් යන සමාගම් හතර 2016 දී ඔවුන් වාර්තා කළ දළ ලිඛිත වාරිකයට සාපේක්ෂව 2017 දී 30% කට වැඩි වර්ධන වේගයක් වාර්තා කොට ඇත. දළ ලිඛිත වාරිකය අනුව එක් එක් රක්ෂණ සමාගමේ කාර්යසාධනය 6 වැනි රූප සටහනින් පෙන්නුම් කෙරේ.

**රූප සටහන 07**

**2013 සිට 2017 දක්වා වූ වසර සඳහා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළෙඳපොළ කොටස - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | සෙලින්කෝ ලයිෆ් | එස්එල්අයිසී | ඒඅයිඒ ලයිෆ් | යුනියන් ලයිෆ් | සොෆ්ට්ලොජික් ලයිෆ් | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 2013 | 26.69 | 20.15 | 16.47 | 13.23 | 6.05 | 17.41 |
| 2014 | 26.92 | 18.21 | 16.29 | 13.33 | 6.84 | 18.41 |
| 2015 | 25.06 | 19.50 | 15.71 | 12.97 | 7.62 | 19.14 |
| 2016(ආ) | 23.67 | 18.74 | 15.92 | 13.03 | 8.88 | 19.76 |
| 2017(ආ) | 22.05 | 17.50 | 16.10 | 14.15 | 10.53 | 19.67 |

## දළ ලිඛිත වාරිකය සඳහා ප්‍රධාන දායකයින් පස්දෙනාගේ සහ අනිකුත් රක්ෂණකරුවන්ගේ වෙළෙඳපොළ කොටස - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය

පසුගිය වසර පහ තුළ ප්‍රධාන දායකයින් පස්දෙනාගේ සහ අනිකුත් රක්ෂණකරුවන්ගේ වෙළෙඳපොළ කොටසට අදාළ විස්තර 7 වැනි රූප සටහනින් පෙන්නුම් කෙරේ. පසුගිය වසර මෙන්ම සෙලින්කෝ ලයිෆ්, එස්එල්අයිසී, ඒඅයිඒ ලයිෆ්, යුනියන් ලයිෆ් සහ සොෆ්ට්ලොජික් ලයිෆ් 2017 වසර තුළ ජීවිත රක්ෂණ අංශයේ මුළු වෙළෙඳපොළ කොටසින් 80.33%ක් අත්කරගනිමින් දළ ලිඛිත වාරිකයට රුපියල් මිලියන 57,442කින් සාමූහිකව දායක වී ඇත. සෙලින්කෝ ලයිෆ් සහ එස්එල්අයිසී යන ප්‍රධාන රක්ෂණ සමාගම් දෙකේ වෙළෙඳපොළ කොටස 2016ට සාපේක්ෂව 2017 දී තරමක් පහත බැස ඇත.

හතරවැනි දායකයා වශයෙන්, සොෆ්ට්ලොජික් ලයිෆ් වෙළෙඳපොළෙන් 10.53%ක් (2016: 8.88%) ග්‍රහණය කරගෙන ඇති අතර, පසුගිය වසර පහ තුළ ඔවුන්ගේ වෙළෙඳපොළ කොටස ක්‍රමානුකූලව වැඩිකරගෙන ඇත.

## දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂකයින්ට පවරන ලද වාරික සහ රඳවා ගැනීමේ අනුපාතය වර්ග අනුව විශ්ලේෂණය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

8 වැනි වගුවේ පැහැදිලි කළ පරිදි, සහභාගි සහ සහභාගි නොවන ව්‍යාපාර 2017 වසර තුළ දළ ලිඛිත වාරිකයට පිළිවෙලින් 26.99%කින් (2016 : 28.45%) සහ 70.14% කින් (2016 : 68.36%) දායක වී ඇත. සහභාගිත්ව ලක්ෂණ සහිත රතු ඔප්පු නිකුත් කිරීම සමහර රක්ෂකයින් විසින් නවතා ඇති බැවින් එහි සැපයුමේ අඩුවීමක් සිදුවී ඇත. 2017 දී මුළු සහභාගිත්ව ව්‍යාපාර කළඹ මත පදනම්ව, එස්එල්අයිසී සහ සෙලින්කෝ ලයිෆ් වාර්තාකළ දළ ලිඛිත වාරිකයෙන් තුනෙන් දෙකක් අයත් කරගෙන ඇත.

සහභාගි නොවන රක්ෂණ ව්‍යාපාර කළඹේ දායකත්වය 2017 දී රුපියල් මිලියන 50,152 දක්වා 15.57% කින් වර්ධනය වී ඇත. ඒකක සබැඳි ව්‍යාපාරය වෙළෙඳපොළ තුළ අඩු කාර්යසාධනයක් සහිතව ජනප්‍රියතාව අඩු වීමක් පෙන්නුම් කල අතර වෙළෙඳපොළ තුළ වඩාත් තරඟකාරී විකල්ප රක්ෂණ යෝජනා ක්‍රමයන්හි වර්ධනයක් පෙනුනි. ඒ අනුව, දළ ලිඛිත වාරිකයට ඒකක සබැඳි ව්‍යාපාරයේ දායකත්වය 2017 දී රුපියල් මිලියන 2,056ක් විය.

8 වැනි වගුවේ පෙන්වා දෙන පරිදි, ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත රඳවාගැනීම් අනුපාතය 2017 දී 95.97% ක් (2016 දී : 96.09%) විය.

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්

2016 හා 2017 දෙසැම්බර් 31 වන දිනට දීර්ඝ කාලීන රක්ෂණයේ සමාගම් අනුව මුළු වත්කම් ප්‍රමාණය 9 වැනි වගුවෙන් හා 8 වැනි රූප සටහනින් පැහැදිලි කරයි. දීර්ඝ කාලීන රක්ෂණ සමාගම්වල මුළු වත්කම් ප්‍රමාණය 2016 වසරේදී පැවති රුපියල් මිලියන 345,589ට සාපේක්ෂව 2017 වසර තුළ රුපියල් මිලියන 392,400ක් විය.

පෙර වසර මෙන්ම එස්එල්අයිසී මුළු වත්කම්වලින් 31.02%ක් නියෝජනය කරමින් ප්‍රමුඛස්ථානයේ පසු වන අතර එහි අගය රුපියල් මිලියන 121,740ක් විය. සෙලින්කෝ ලයිෆ් සහ ඒඅයිඒ ලයිෆ් වෙළෙඳපොළ තුළ වත්කම් වටිනාකමින් 27.04%ක් (රුපියල් මිලියන 106,095) සහ 13.40%ක් (රුපියල් මිලියන 52,577) අත්කර ගනිමින් පිළිවෙලින් දෙවැනි හා තුන්වැනි ස්ථාන පවත්වාගෙන ඇත. ඒ අනුව, එස්එල්අයිසී, සෙලින්කෝ ලයිෆ් සහ ඒඅයිඒ ලයිෆ් සාමූහිකව දීර්ඝ කාලීන රක්ෂණ කර්මාන්තය තුළ මුළු වත්කම් හිමිකාරත්වයෙන් 71%කට වැඩිපුර අයත් කරගෙන ඇත.

යුනියන් ලයිෆ්, ජනශක්ති ලයිෆ් සහ එච්එන්බී ලයිෆ් යන සමාගම්වලට ඔවුන්ගේ වත්කම් පදනම් වැඩිකර ගැනීමට හැකිවී ඇති අතර, පිළිවෙලින් කර්මාන්තය තුළ සිව්වැනි, පස්වැනි සහ සයවැනි ස්ථානවල පසු විය. 2017 දෙසැම්බර් 31 වන දිනට එක් සමාගමක් හැර සියලුම සමාගම්වලට ඒවායේ මුළු වත්කම් පසු ගිය වසරට සාපේක්ෂව වැඩි කරගැනීමට හැකි වී ඇත.

## 2016 සහ 2017 දෙසැම්බර් 31 වන දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

වෙනස්වන පොළී අනුපාත වාතාවරණය තුළ, දිගුකාලීන වගකීම සඳහා ආයෝජනයන් ගැලපීම ජීවිත රක්ෂකයන්ට ඉහළ අභියෝගයක් විය හැකිය. මෙවැනි අභියෝග හමුවේ වුවද 2017 වසර තුළ ජීවිත රක්ෂකයින්ගේ වත්කම් 13.55%කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය වී ඇත.

**වගුව 08**

**දළ ලිඛිත වාරික ආදයම ප්‍රතිරක්ෂකයන්ට පවරන ලද වාරික සහ රඳවාගැනීමේ අනුපාතය දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| පන්තිය | 2015 | | | 2016 (අ) | | | 2017 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ ලිඛිත වාරිකය (රු. '000) | ප්‍රතිරක්ෂකයන්ට පවරන ලද වාරික (රු. '000) | රඳවාගැනීමේ අනුපාතය (%) | දළ ලිඛිත වාරිකය (රු. '000) | ප්‍රතිරක්ෂකයින් පවරන ලද වාරික (රු. '000) | රඳවාගැනීමේ අනුපාතය (%) | දළ ලිඛිත වාරිකය (රු. '000) | ප්‍රතිරක්ෂකයින්ට පවරන ලද වාරික (රු. '000) | රඳවාගැනීමේ අනුපාතය (%) |
| සහභාගි | 18,257,891 | 238,383 | 98.69 | 18,056,530 | 178,699 | 99.01 | 19,296,371 | 151,849 | 99.21 |
| සහභාගි නොවන | 32,987,375 | 1,749,826 | 94.70 | 43,393,219 | 2,271,917 | 94.76 | 50,151,583 | 2,671,119 | 94.67 |
| ඒකක සබැඳි | 2,445,517 | 30,008 | 98.77 | 2,026,873 | 30,069 | 98.52 | 2,056,277 | 58,048 | 97.18 |
| එකතුව | **53,690,783** | **2,018,218** | **96.24** | **63,476,622** | **2,480,685** | **96.09** | **71,504,231** | **2,881,016** | **95.97** |

**වගුව 09**

**සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**


| රක්ෂකයා | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | රු.'000 | % | රු.'000 | % |
| ඒඅයිඒ ලයිෆ් | 46,082,441 | 13.34 | 52,576,947 | 13.40 |
| අලියාන්ස් ලයිෆ් | 2,907,569 | 0.84 | 4,072,925 | 1.04 |
| අමානා ලයිෆ් | 2,707,599 | 0.78 | 2,928,702 | 0.75 |
| ආර්පිකෝ | 1,586,962 | 0.46 | 2,106,353 | 0.54 |
| සෙලින්කෝ ලයිෆ් | 96,458,088 | 27.91 | 106,094,508 | 27.04 |
| කෝප්ලයිෆ් | 1,824,173 | 0.53 | 2,188,203 | 0.56 |
| එච්එන්බී ලයිෆ් | 12,199,440 | 3.53 | 15,419,280 | 3.93 |
| ජනශක්ති ලයිෆ් | 19,092,842 | 5.53 | 20,384,326 | 5.19 |
| එල්අයිසී | 2,256,631 | 0.65 | 2,682,943 | 0.68 |
| එල්බීඑල්සී ලයිෆ් | 2,806,696 | 0.81 | 4,102,317 | 1.04 |
| එම්බීඑස්එල් | 596,568 | 0.17 | 634,896 | 0.16 |
| සණස | 1,933,526 | 0.56 | 1,923,053 | 0.49 |
| එස්එල්අයිසී | 109,525,219 | 31.69 | 121,739,739 | 31.02 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 9,917,607 | 2.87 | 12,478,446 | 3.18 |
| යුනියන් ලයිෆ් | 35,693,463 | 10.33 | 43,067,007 | 10.98 |
| **එකතුව** | **345,588,824** | **100** | **392,399,645** | **100** |

නියාමන අවශ්‍යතා සහ දිගුකාලීන ආයෝජනයන් හා බැඳුණු අවදානම් හේතු කොට ගෙන, 10 වැනි වගුවේ සහ 9 වැනි රූප සටහනින් පෙන්වා දෙන පරිදි, ජීවිත රක්ෂකයින් විසින් ඔවුන්ගේ වත්කම් වගකීම් කළමනාකරණ ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය ණය සුරැකුම්පත්වල ආයෝජනය සඳහා ඉහළ ප්‍රමුඛතාවක් ලබා දී ඇත. ඒ අනුව, රාජ්‍ය ණය සුරැකුම්පත් මුළු වත්කම් වලින් 46.73% දක්වා ළඟා වෙමින් රුපියල් මිලියන 183,353ක් වූ අතර වාර්ෂිකව 12.97%ක වර්ධනයක් වාර්තා කරන ලදී.

සංස්ථා ණය, ආයෝජිත වත්කම් අතුරින් ප්‍රධාන ස්ථානයක් ගත් අතර, 2017 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 73,010ක් (2016 : රුපියල් මිලියන 71,381) වාර්තා කළේය. ස්කන්ධ රුපියල් මිලියන 44,383ක් වූ අතර මුළු වත්කම් කළඹින් 11.31%ක් නියෝජනය කරන ලදී. 2017 දෙසැම්බර් 31 දිනට තැන්පතුවල සැලකියයුතු ඉහළයාමක් තිබූ අතර එය රුපියල් මිලියන 40,795ක් විය. මෙම ප්‍රමාණය පසුගිය වසරට සාපේක්ෂව 44.23%ක වැඩිවීමකි. පොදුවේ, රජයේ සුරැකුම්පත් සහ තැන්පතු සඳහා පිරිනමන ලද ආකර්ෂණීය පොළී අනුපාත මෙම ආයෝජන වර්ගීකරණ දෙක තුළ තවදුරටත් ආයෝජනය කිරීමට හේතු වී ඇත. 80%කට වඩා වැඩිපුර ඒකක භාරවල ආයෝජනය කරනු ලබන්නේ එස්එල්අයිසී සහ සොෆ්ට් ලොජික් ලයිෆ් වලින් විය. තවද ඒකක භාර තුළ ආයෝජනය ද රුපියල් මිලියන 4,942කින් වැඩිවී ඇත.

**රූප සටහන 08**

**2016 හා 2017 දෙසැම්බර් 31 වන දිනට සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




## ආයෝජන ආදායම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජනවලින් උපයන ලද මුළු ආදායම 2016 වසරේදී වාර්තා කළ රුපියල් මිලියන 27,610 සාපේක්ෂව රුපියල් මිලියන 34,675 දක්වා 25.59% කින් සැලකියයුතු ලෙස වර්ධනය වී ඇත. 11 වැනි වගුවේ පෙන්වා දෙන පරිදි, රජයේ භාණ්ඩාගාර බැඳුම්කර, ණයකර සහ බැංකු තැන්පතු වඩාත් හිතකර ආයෝජන වර්ගීකරණ වූ අතර එය මුළු ආයෝජන ආදායමින් 89%කට දායක විය.

2017 දී රජයේ සුරැකුම්පත් වලින් උපයන ලද ආයෝජන ආදායම රුපියල් මිලියන 19,943ක් වූ අතර සාමාන්‍ය ආයෝජනය සඳහා රුපියල් මිලියන 172,825ක් විය. ඒ අනුව, රජයේ සුරැකුම්පත් 2017 වසර වෙනුවෙන් 11.54%ක ආයෝජන ඵලදාවක් වාර්තා කරන ලදී. තැන්පතු සියලුම මූල්‍ය ආයෝජනවලින් 13.14%ක ඉහළම ආයෝජන ඵලදාව වාර්තා කළේය. එමෙන්ම, තැන්පතු මත පොළී ආදායම පසුගිය වසරට සාපේක්ෂව 46.43% කින් වැඩිවී ඇත. ආයෝජන කළඹ තුළ සැලකිය යුතු කොටසක් නියෝජනය කරන සංස්ථා ණය රුපියල් මිලියන 8,416ක (2016 : රුපියල් මිලියන 6,731) ආයෝජන ආදායමක් උපයාගෙන ඇති අතර, වාර්ෂිකව 25.05%කින් වර්ධනය වී ඇත. තවද, සංස්ථා ණයවල ආයෝජන ඵලදාව 2016 දී වාර්තා කළ 10.89%ට සාපේක්ෂව 11.66%ක් විය.

**වගුව 10**

**2016 සහ 2017 දෙසැම්බර් 31 වන දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| වත්කම් වර්ගය | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | රු.'000 | % | රු.'000 | % |
| රාජ්‍ය ණය සුරැකුම්පත් | 162,296,721 | 46.96 | 183,353,483 | 46.73 |
| ස්කන්ධ | 44,311,123 | 12.82 | 44,382,861 | 11.31 |
| සංස්ථා ණය | 71,380,883 | 20.65 | 73,009,816 | 18.60 |
| ඉඩම් හා ගොඩනැගිලි | 10,005,535 | 2.90 | 11,059,556 | 2.82 |
| තැන්පතු | 28,285,552 | 8.18 | 40,794,927 | 10.40 |
| ඒකක භාර | 1,939,392 | 0.56 | 6,881,291 | 1.75 |
| රක්ෂණ ඔප්පු මත ණය | 5,724,534 | 1.66 | 6,136,682 | 1.56 |
| වෙනත් වත්කම් | 19,174,620 | 5.55 | 23,297,044 | 5.94 |
| මුදල් හා මුදල් සමාන දෑ | 2,470,464 | 0.72 | 3,483,985 | 0.89 |
| **එකතුව** | **345,588,824** | **100** | **392,399,645** | **100** |

සමස්ත ආයෝජන ඵලදාව 2016 දී වාර්තා කළ 9.15%ට සාපේක්ෂව 10.30% ක් විය.

## රක්ෂණ සමාගම්වල නුබුන්වත් භාවය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

රක්ෂණ ක්ෂේත්‍රයේ ආරක්ෂාව සහ ප්‍රත්‍යස්ථිතිය වැඩි කිරීමේ අරමුණ ඇතිව කොමිෂන් සභාව විසින් ජීවිත රක්ෂකයින්ගේ අවදානම් පාදක ප්‍රාග්ධනය මැනීම සහ නියාමනය අඛණ්ඩව සිදුකරන ලදී. 12, 13 සහ 14 වගු තුළින් නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) නියමයන් අනුව ජීවිත රක්ෂකයින්ගේ අවදානම් පාදක ප්‍රාග්ධනය (RBC) රීති 2015ට අදාළ විස්තර පෙන්නුම් කරයි.

ඒ අනුව, 2017 දෙසැම්බර් 31 දිනට එම්බීඑස්එල් හැර සියලූම රක්ෂකයින් රුපියල් මිලියන 500ක පූර්ණ පවත්නා ප්‍රාග්ධනයක් (TAC) පවත්වා ගෙන ඇත. එමෙන්ම, සියලුම රක්ෂණ සමාගම් ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයට අනුකූලවීම සඳහා 120%ක අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයක් (CAR) පවත්වා ගැනීම අවශ්‍ය වේ. සියලූම ජීවිත රක්ෂකයින් විසින් කොමිෂන් සභාවෙහි බලාත්මක මට්ටම වන 160%ට ඉහළ අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයක් (CAR) පවත්වාගන්නා බව සහතික කරන ලදී. දිගුකාලීන රක්ෂණ සමාගම්වල සාමාන්‍ය අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය 2017 දෙසැම්බර් 31 දිනට 321%ක් විය. (2016 :302%)


සියලූම ජීවිත රක්ෂණ ගිවිසුම් එකම අවස්ථාවේ පවාරණය කරන්නේනම් පවාරණ අගයේ ප්‍රාග්ධන ගාස්තුව ගණනය කිරීමේදී (SVCC) අතිශයින් අහිතකර සිදුවීම්වල අවදානමද ගණනය කරන අතර එවැනි අවස්ථාවක සමහර

**වගුව 11**

**සවිස්තරාත්මක සාමාන්‍ය ආයෝජන සහ ආයෝජන ආදායම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| වර්ගීකරණය | 2016 (අ) | | | 2017 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම් (රු. '000) | සාමාන්‍ය ආයෝජනය (රු. '000) | ආයෝජන ඵලදා අනුපාතිකය (රු. '000) | ආයෝජන ආදායම් (රු. '000) | සාමාන්‍ය ආයෝජනය (රු. '000) | ආයෝජන ඵලදා අනුපාතිකය (රු. '000) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 17,287,423 | 149,720,570 | 11.55 | 19,943,319 | 172,825,102 | 11.54 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 15,799,939 | | | 18,488,291 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 112,769 | | | 115,075 | | |
| - වෙනත් (රීපෝ) | 1,374,715 | | | 1,339,953 | | |
| **ස්කන්ධ** | (90,015) | 39,492,171 | (0.23) | 1,032,285 | 35,940,489 | 2.87 |
| - ප්‍රාග්ධන ලාභ/ පාඩු | (1,211,655) | | | (275,534) | | |
| - ලාභාංශ | 1,121,640 | | | 1,307,819 | | |
| **සංස්ථා ණය** | 6,730,680 | 61,832,558 | 10.89 | 8,416,426 | 72,195,350 | 11.66 |
| - ණයකර | 6,680,698 | | | 8,324,759 | | |
| - වාණිජමය පත්‍රිකා සහ වෙනත් | 48,924 | | | 91,667 | | |
| - වෙනත් සමාන මූල්‍ය උපකරණ | 1,058 | | | - | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 72,101 | 8,800,403 | 0.82 | 76,147 | 10,532,545 | 0.72 |
| **තැන්පතු** | 3,098,884 | 33,758,505 | 9.18 | 4,537,799 | 34,540,239 | 13.14 |
| - බැංකු | 2,886,761 | | | 4,066,946 | | |
| - මූල්‍ය ආයතන | 212,123 | | | 470,853 | | |
| **ඒකක භා** | 92,602 | 2,166,425 | 4.27 | 125,887 | 4,410,341 | 2.85 |
| **ජීවිත රක්ෂක ඔප්පු මත ණය** | 366,026 | 5,537,077 | 6.61 | 497,367 | 5,930,608 | 8.39 |
| **වෙනත්** | 52,624 | 290,963 | 18.09 | 46,139 | 438,906 | 10.51 |
| **එකතු** | **27,610,325** | **301,598,672** | **9.15** | **34,675,369** | **336,813,580** | **10.30** |

**රූප සටහන 09**
**2016 සහ 2017 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




රක්ෂණ සමාගම් සඳහා මෙම අගය සෘණ හෝ ශූන්‍ය විය හැකිය. ඒ අනුව, 2017 දෙසැම්බර් 31 වන දිනට වාර්තා කළ පවාරණ අගයේ ප්‍රාග්ධන ගාස්තුව රුපියල් මිලියන 6,113ක් වූ අතර 2016 දෙසැම්බර් 31 වන දිනට වාර්තා කළ රුපියල් මිලියන 12,442ට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩුවී ඇත.

## රක්ෂණ සමාගම්වල ලබාගතහැකි පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාවය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

2017 දෙසැම්බර් 31 වන දිනට දිගුකාලීන රක්ෂණ සමාගම්වල පූර්ණ පවත්නා ප්‍රාග්ධනය රුපියල් මිලියන 191,175ක් (2016 : රුපියල් මිලියන 175,122) වූ අතර වාර්ෂිකව 9.17%කින් වර්ධනය වී ඇත. පූර්ණ පවත්නා ප්‍රාග්ධනය පළමු පෙළ ප්‍රාග්ධනය (Tier 1), දෙවන පෙළ ප්‍රාග්ධනය (Tier 11) සහ අඩුකිරීම්වලින් සමන්විත වේ.

පළමු පෙළ ප්‍රාග්ධනය යනු රඳවාගත් ඉපයීම්, රඳවාගත් ඉපයීම්වලට ගැලපීම් සහ අලාභ ආවරණය කිරීමට සම්පූර්ණයෙන්ම ලබාගත හැකි ප්‍රාග්ධනයයි. 2017 දෙසැම්බර් 31 වන දිනට පළමු පෙළ ප්‍රාග්ධනය රුපියල් මිලියන 209,989ක් විය. 2017 දෙසැම්බර් 31 වන දිනට අඛණ්ඩ පදනමක් මත යම් තරමකට අලාභ දරාගැනීමට සහයවන දෙවන පෙළ ප්‍රාග්ධනය රුපියල් මිලියන 5,879ක් විය. අස්පෘශ්‍ය හෝ ද්‍රවශීල වත්කම්වලින් ප්‍රධාන වශයෙන් සමන්විත අඩුකිරීම් පූර්ණ පවත්නා ප්‍රාග්ධනයෙන්

**වගුව 12**
**2016 හා 2017 දෙසැම්බර් 31 වන දිනට සමාගම් අනුව නුබුන්වත්භාවය පිළිබඳ විශ්ලේෂණය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31 දිනට (අ) | | | | 2017 දෙසැම්බර් 31 දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු'000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු'000) | පවාරණ අගයේ ප්‍රාග්ධන ගාස්තුව (රු'000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු'000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු'000) | පවාරණ අගයේ ප්‍රාග්ධන ගාස්තුව (රු'000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) |
| ඒඅයිඒ ලයිෆ් | 21,107,662 | 3,755,882 | 5,853,682 | 361 | 23,866,513 | 3,853,018 | 4,010,591 | 595 |
| අලියාන්ස් ලයිෆ් | 897,438 | 297,902 | 110,061 | 301 | 1,120,048 | 187,798 | 21,381 | 596 |
| අමානා ලයිෆ් | 550,223 | 372,733 | - | 148 | 586,807 | 279,153 | - | 210 |
| ආර්පිකෝ ලයිෆ් | 1,250,144 | 200,880 | 63,453 | 622 | 1,424,463 | 362,451 | - | 393 |
| සෙලින්කෝ ලයිෆ් | 43,094,498 | 12,847,731 | - | 335 | 52,730,727 | 13,582,910 | - | 388 |
| කෝප්ලයිෆ් | 758,207 | 359,965 | - | 211 | 697,394 | 405,471 | - | 172 |
| එච්එන්බී ලයිෆ් | 5,274,682 | 1,058,500 | 1,185,311 | 445 | 6,038,377 | 1,689,029 | 483,048 | 358 |
| ජනශක්ති ලයිෆ් | 3,751,144 | 1,405,869 | - | 267 | 5,178,103 | 2,151,085 | 717,405 | 241 |
| එල්අයිසී | 536,864 | 207,057 | 49,678 | 259 | 665,053 | 253,947 | - | 262 |
| එල්ඕඑල්සී ලයිෆ් | 887,316 | 392,696 | - | 226 | 1,008,326 | 442,673 | - | 228 |
| එම්බීඑස්එල් ලයිෆ් | 105,905 | 73,229 | - | 145 | 156,415 | 78,626 | - | 199 |
| සණස ලයිෆ් | 936,626 | 177,125 | 481,480 | 195 | 523,137 | 280,955 | 54,773 | 186 |
| එස්එල්අයිසී ලයිෆ් | 73,125,635 | 17,134,441 | 311,006 | 427 | 74,563,589 | 17,278,458 | - | 432 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 8,570,469 | 2,761,510 | 4,386,958 | 195 | 6,084,461 | 2,920,932 | 826,001 | 208 |
| යූනියන් ලයිෆ් | 14,274,762 | 3,598,467 | - | 397 | 16,532,023 | 4,701,641 | - | 352 |
| **එකතුව/ මුළු එකතුව** | **175,121,575** | **44,643,987** | **12,441,629** | **302** | **191,175,436** | **48,468,147** | **6,113,199** | **321** |

**වගුව 13**
**රක්ෂණ සමාගම්වල මුළු ලබාගතහැකි ප්‍රාග්ධන අවශ්‍යතාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31 දිනට (අ) | 2017 දෙසැම්බර් 31 දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|
| | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු'000) | පළමු පෙළ ප්‍රාග්ධනය (රු'000) | දෙවන පෙළ ප්‍රාග්ධනය (රු'000) | අඩුකිරීම් (රු'000) | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු'000) |
| ඒඅයිඒ ලයිෆ් | 21,107,662 | 26,167,050 | 441,176 | 2,741,713 | 23,866,513 |
| අලියාන්ස් ලයිෆ් | 897,438 | 1,323,766 | - | 203,718 | 1,120,048 |
| අමානා ලයිෆ් | 550,223 | 629,586 | 120 | 42,900 | 586,806 |
| ආර්පිකෝ ලයිෆ් | 1,250,144 | 1,567,254 | - | 142,791 | 1,424,463 |
| සෙලින්කෝ ලයිෆ් | 43,094,498 | 55,949,722 | 3,624,279 | 6,843,274 | 52,730,727 |
| කෝප්ලයිෆ් | 758,207 | 817,912 | 44,705 | 165,223 | 697,394 |
| එච්එන්බී ලයිෆ් | 5,274,682 | 8,111,048 | - | 2,072,671 | 6,038,377 |
| ජනශක්ති ලයිෆ් | 3,751,144 | 12,325,288 | | 7,147,185 | 5,178,103 |
| එල්අයිසී | 536,864 | 792,033 | - | 126,980 | 665,053 |
| එල්බීඑල්සී ලයිෆ් | 887,316 | 1,195,555 | - | 187,230 | 1,008,325 |
| එම්බීඑස්එල් | 105,905 | 158,019 | - | 1,604 | 156,415 |
| සණස | 936,626 | 705,636 | 1,221 | 183,720 | 523,137 |
| එස්එල්අයිසී | 73,125,635 | 75,873,864 | 31,128 | 1,341,403 | 74,563,589 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 8,570,469 | 6,905,366 | 48,436 | 869,340 | 6,084,462 |
| යූනියන් ලයිෆ් | 14,274,762 | 17,467,260 | 1,688,310 | 2,623,547 | 16,532,023 |
| **එකතුව** | **175,121,575** | **209,989,359** | **5,879,375** | **24,693,299** | **191,175,436** |

12.92%ක් නියෝජනය කරන ලදී.


## රක්ෂණ සමාගම්වලට නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) පිළිබඳ සැසඳීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) යනු සීමා අවදානම් සාධක පදනම් කර ගත් ප්‍රාග්ධන රීති යටතේ ගණනය කල අය කිරීම් වල එකතුවයි. 14 වැනි වගුවෙන් පෙන්වා දෙන පරිදි, මෙම අරමුණ සඳහා වැදගත් අවදානම් වර්ගීකරණ ලෙස ණය අවදානම, සංකේන්ද්‍රණ අවදානම, වෙළෙඳපොල අවදානම, ප්‍රතිරක්ෂණ අවදානම, වගකීම් අවදානම සහ මෙහෙයුම් අවදානම සලකා බලනු ලබයි. 2017 දී, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සඳහා විවිධාංගීකරණයෙන් පසු මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් රුපියල් මිලියන 48,468ක් (2016 : 44,644) විය. විවිධාංගීකරණයට පෙර, 2017 දී එම ප්‍රමාණය රුපියල් මිලියන 63,550ක් විය. පසුගිය වසරට සමානව, වෙළෙඳපොල අවදානම ප්‍රධාන අවදානම බවට පත්වෙමින් රුපියල් මිලියන 36,728ක් වූ අතර එයට පසුව වගකීම් අවදානම සහ සංකේන්ද්‍රණ අවදානම පිළිවෙලින් විය. ඒ අනුව, මෙම අවදානම් තුන විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම්වලින් 84.47%ක් නියෝජනය කරන ලදී.

## නිකුත් කරන ලද හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

10 වැනි රූපසටහනේ පෙන්වා දෙන පරිදි, බලපවත්නා මුළු ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2016 දී පැවති

**රූප සටහන 10**
**නිකුත් කරන ලද සහ බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
|---|---|---|---|---|---|
| නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 546,292 | 545,303 | 740,511 | 668,714 | 636,156 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 2,477,695 | 2,604,667 | 2,889,763 | 3,009,427 | 3,068,846 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස* | 12.0 | 12.5 | 13.8 | 14.19 | 14.31 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස* | 28.1 | 29.6 | 33.6 | 37.62 | 35.51 |

*මූලාශ්‍රය - වසර මැද ශ්‍රම බලකාය සහ ජනගහනය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**වගුව 14**

**2016 හා 2017 දෙසැම්බර් 31 වන දිනට සමාගම් අනුව නියමිත අවදානම් ප්‍රාග්ධනය පිළිබඳ විශ්ලේෂණය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31 දිනට (අ) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම | සංකේන්ද්‍රණ අවදානම | වෙළෙඳපොල අවදානම | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම | විවිධාංගීකරණයට පසු මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම |
| ඒඅයිඒ ලයිෆ් | 522,912 | 767,887 | 2,030,977 | - | 1,690,531 | 463,209 | 5,475,515 | 3,755,882 |
| අලියාන්ස් ලයිෆ් | 2,383 | 24,317 | 236,982 | 367 | 135,930 | 23,367 | 423,347 | 297,902 |
| අමානා ලයිෆ් | 30,407 | 279,493 | 59,373 | 601 | 37,298 | 27,063 | 434,235 | 372,733 |
| ආර්පිකෝ | 19,302 | 110,716 | 69,027 | 108 | 21,027 | 15,776 | 235,956 | 200,880 |
| සෙලින්කෝ ලයිෆ් | 888,650 | 504,103 | 11,231,956 | 10,420 | 2,129,986 | 938,552 | 15,703,667 | 12,847,731 |
| කෝප්ලයිෆ් | 25,529 | 21,907 | 286,671 | 1,235 | 129,581 | 18,152 | 483,075 | 359,965 |
| එච්එන්බී ලයිෆ් | 124,489 | 279,699 | 410,127 | 974 | 664,619 | 118,356 | 1,598,264 | 1,058,500 |
| ජනශක්ති ලයිෆ් | 245,566 | 245,914 | 817,698 | 560 | 477,108 | 182,810 | 1,969,658 | 1,405,869 |
| එල්අයිසී | 17,884 | 37,093 | 143,027 | 86 | 56,344 | 21,401 | 275,836 | 207,057 |
| එල්ඕඑල්සී ලයිෆ් | 1,072 | 1,490 | 305,867 | 3,349 | 237,107 | 28,020 | 576,905 | 392,696 |
| එම්බීඑස්එල් | 4,306 | 16,065 | 13,324 | - | 64,742 | 5,966 | 104,403 | 73,229 |
| සණස | 36,075 | 6,017 | 132,674 | 931 | 12,410 | 18,710 | 206,816 | 177,125 |
| එස්එල්අයිසී | 880,170 | 1,435,350 | 14,440,153 | - | 3,413,384 | 1,088,729 | 21,257,785 | 17,134,441 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 65,587 | 298,230 | 1,846,349 | - | 1,652,722 | 98,046 | 3,960,934 | 2,761,510 |
| යුනියන් ලයිෆ් | 184,021 | 399,384 | 2,688,718 | 357 | 1,456,248 | 345,230 | 5,073,958 | 3,598,467 |
| **එකතුව** | **3,048,353** | **4,427,665** | **34,712,923** | **18,988** | **12,179,037** | **3,393,387** | **57,780,354** | **44,643,987** |

| රක්ෂකයා | 2017 දෙසැම්බර් 31 දිනට (ආ) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම | සංකේන්ද්‍රණ අවදානම | වෙළෙඳපොල අවදානම | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම | විවිධාංගීකරණයට පසු මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම |
| ඒඅයිඒ ලයිෆ් | 544,451 | 474,348 | 2,267,270 | - | 1,941,588 | 527,000 | 5,754,658 | 3,853,018 |
| අලියාන්ස් ලයිෆ් | 2,618 | 25,017 | 86,290 | 494 | 145,002 | 33,924 | 293,345 | 187,798 |
| අමානා ලයිෆ් | 29,497 | 201,296 | 43,883 | 585 | 36,015 | 29,333 | 340,610 | 279,153 |
| ආර්පිකෝ | 19,663 | 270,640 | 61,596 | 168 | 83,571 | 20,870 | 456,508 | 362,451 |
| සෙලින්කෝ ලයිෆ් | 1,076,424 | 567,911 | 11,671,525 | 4,653 | 2,430,953 | 1,072,306 | 16,823,772 | 13,582,910 |
| කෝප්ලයිෆ් | 50,089 | 12,620 | 290,161 | - | 198,532 | 21,795 | 573,196 | 405,471 |
| එච්එන්බී ලයිෆ් | 194,403 | 362,576 | 1,030,356 | 1,759 | 551,798 | 152,059 | 2,292,949 | 1,689,029 |
| ජනශක්ති ලයිෆ් | 247,394 | 53,919 | 1,700,189 | 1,082 | 760,967 | 194,302 | 2,957,852 | 2,151,085 |
| එල්අයිසී | 25,835 | 44,087 | 174,420 | 82 | 63,257 | 27,289 | 334,970 | 253,947 |
| එල්ඕඑල්සී ලයිෆ් | 1,072 | 16,189 | 240,874 | 4,457 | 354,006 | 41,041 | 657,639 | 442,673 |
| එම්බීඑස්එල් | 4,428 | 14,432 | 47,752 | 5 | 41,276 | 6,363 | 114,256 | 78,626 |
| සණස | 27,862 | 156,839 | 84,412 | 300 | 77,346 | 19,237 | 365,995 | 280,955 |
| එස්එල්අයිසී | 1,042,994 | 1,972,474 | 13,709,970 | - | 4,149,374 | 1,259,957 | 22,134,770 | 17,278,458 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 92,124 | 348,759 | 1,481,824 | - | 2,195,653 | 118,941 | 4,237,301 | 2,920,932 |
| යුනියන් ලයිෆ් | 196,407 | 471,272 | 3,837,662 | 276 | 1,270,902 | 435,499 | 6,212,016 | 4,701,641 |
| **එකතුව** | **3,555,261** | **4,992,379** | **36,728,184** | **13,861** | **14,300,240** | **3,959,916** | **63,549,837** | **48,468,147** |

3,009,427ට සාපේක්ෂව 2017 දී 3,068,846ක් විය. එසේවුවත්, 2017දී නිකුත්කළ නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව තුළ සුළු අඩුවීමක් දක්නට ලැබුණ අතර, එය 636,156ක් විය.

2017 වසර තුළ, මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 14.31% (2016 : 14.19) දක්වා සුළු වශයෙන් වර්ධනය වී ඇති අතර, ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 35.51% (2016 : 37.62%) දක්වා සුළු වශයෙන් අඩුවී ඇත.(2016: 37.62%)

## නිෂ්පාදන අනුව බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සහ රක්ෂණය කළ මුදල - දීර්ඝ කාලීන රක්ෂණ

2016 සහ 2017 වසර සඳහා නිෂ්පාදන වර්ගය මත පදනම් වී බලපවත්නා රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සහ රක්ෂිත මුදල පිළිබඳ විස්තර 15 වැනි වගුවෙන්

**වගුව 15**
**2016 සහ 2017 සඳහා නිෂ්පාදන අනුව බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සහ රක්ෂණය කළ මුදල - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| නිෂ්පාදන වර්ගය | 2016 | | 2017 | |
|---|---|---|---|---|
| | බලපවත්නා රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | රක්ෂිත මුදල (රු.000') | බලපවත්නා රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | රක්ෂිත මුදල (රු.000') |
| කාලීන රක්ෂණය | 476,468 | 805,553,921 | 501,899 | 878,057,665 |
| යුනිවර්සල් ජීවිත රක්ෂණය | 840,150 | 323,335,829 | 871,299 | 367,730,167 |
| යාවජීව ජීවිත රක්ෂණය | 29,793 | 1,674,568 | 25,701 | 1,581,575 |
| උප්පාදන රක්ෂණය | 1,499,479 | 332,101,717 | 1,438,145 | 371,193,218 |
| වෙනත් | 163,537 | 489,831,801 | 231,802 | 795,092,598 |
| **එකතුව** | **3,009,427** | **1,952,497,836** | **3,068,846** | **2,413,655,223** |

පෙන්වා දේ. නිෂ්පාදන ප්‍රධාන වශයෙන් අනුරක්ෂණය, සාමාන්‍ය රක්ෂණය, කාලීන රක්ෂණය, සම්පූර්ණ ජීවිත රක්ෂණය සහ වෙනත් රක්ෂණය ලෙස වර්ගීකරණය කරනු ලබයි. මුළු රක්ෂිත මුදල රුපියල් මිලියන 2,413,655ක් වූ අතර වාර්ෂිකව 23.62% කින් වර්ධනය වී ඇත.

බලපවත්නා රක්ෂණ ඔප්පුවලින් බහුතරය උපපාදන රක්ෂණය නියෝජනය කරන අතර, කල්පිරීමේදී එකවර ගෙවීමේ ආවේණික ලක්ෂණ හේතු කොට ගෙන එම ප්‍රමාණය 1,438,145 ක් විය. එසේවුවත්, උපපාදන රක්ෂණය හා යාවජීව රක්ෂණ ඔප්පු ගනුදෙනුකරුවන්ගේ ඉල්ලුම වෙනස්වීමත් සමඟ පසුගිය වසර තුළ පහත වැටීමක් පෙන්නුම් කරයි. අනෙක් අතට, යුනිවර්සල් රක්ෂණ නිෂ්පාදන කරා ඉල්ලුම, ආයෝජන ඉතුරුම්, නම්‍යශීලහාවය වැනි සමහර ලක්ෂණ හේතු කොට ගෙන වර්ධනය වෙමින් පවතී. ඒ අනුව, රුපියල් මිලියන 367,730 (2016 : 323,336)ක මුළු රක්ෂිත මුදලක් සමඟ 2017 වසර අවසානයේදී බලපවත්නා යුනිවර්සල් ජීවිත රක්ෂණ ඔප්පු ගණන 871,299ක් විය. කාලීන රක්ෂණය ද රක්ෂිත මුදලෙන් සැලකිය යුතු කොටසක් නියෝජනය කළ අතර, බලපවත්නා මුළු රක්ෂණ ඔප්පුවලින් 16.35%ක් සඳහා දායක විය.


**වගුව 16**
**රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 6,980 | 8,120 | 14,081 | 9,521 | 10,749 |
| මරණ | 5,284 | 5,795 | 6,747 | 8,418 | 11,253 |
| පවාරණ | 41,964 | 46,312 | 42,814 | 46,484 | 46,780 |
| කල්පිරීමේ ප්‍රතිලාභ | 102,050 | 107,353 | 120,661 | 108,680 | 115,311 |
| වෙනත් ප්‍රතිලාභ | 99,257 | 84,835 | 112,337 | 143,336 | 157,251 |
| **එකතුව** | **255,535** | **252,415** | **296,640** | **316,439** | **341,344** |

## රක්ෂණ ඔප්පු අවලංගුවීම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

නව රක්ෂණ ඔප්පු සහ මුළු රක්ෂණ ඔප්පු අනුව අවලංගු අනුපාත තුළ සමස්ථ අඩුවීමක් 11 වැනි රූපසටහනින් පෙන්නුම් කරයි. උපයෝජ්‍ය ආදායමේ උච්චාවචන සමඟ ගනුදෙනුකරුවන් විසින් වාරික නොගෙවා සිටීම, නියෝජිතයින් අයුතු ලෙස අත්කර ගැනීම, නිෂ්පාදන නොගැලපීම, ඔප්පු කලමනාකරණය තුළ අකාර්යක්ෂමතාව යනාදී බොහෝ කරුණු හේතු කොට ගෙන සෑම වසරක් තුළම වාර්තාකරන ඔප්පු අවලංගුවීමේ ඉහළ අනුපාතය සමඟ කර්මාන්තය තුළ රඳා පැවැත්ම ගැටළුවකි. 2017 දී, අවලංගු වූ මුළු ජීවිත රක්ෂණ ඔප්පු ගණන 378,660ක් වූ අතර ඉන් 90,038ක් නව ඔප්පුවලින් සමන්විත විය. එමෙන්ම, 2017 දී බලපවත්නා මුළු ඔප්පුවල ප්‍රතිශතයක් ලෙස අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය 12.34% (2016: 12.95)ක් වූ අතර, නිකුත් කළ නව ඔප්පුවල ප්‍රතිශතයක් ලෙස නව ඔප්පු අවලංගුවීම 14.15% කි (2016 :15.36%).


**රූප සටහන 11**
**2013 සිට 2017 දක්වා අවලංගු වූ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සහ රක්ෂණ ඔප්පු අවලංගු වූ අනුපාතය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2013 | 2014 | 2015 | 2016(අ) | 2017(ආ) |
|---|---|---|---|---|---|
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු | 107,906 | 103,500 | 93,008 | 102,697 | 90,038 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු | 366,506 | 362,664 | 364,567 | 389,732 | 378,660 |
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කළ නව ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 19.75 | 18.98 | 12.56 | 15.36 | 14.15 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලපවත්නා මුළු ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 14.79 | 13.92 | 12.62 | 12.95 | 12.34 |

පසුගිය වසර පහ තුළ සාමාන්‍යය අනුව, අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ගණන 372,000කට වැඩිය.

**රූප සටහන 12**
**රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම්පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2013 | 2014 | 2015 | 2016(අ) | 2017(ආ) |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 45,457 | 436,518 | 430,617 | 488,818 | 636,758 |
| මරණ | 1,358,337 | 1,889,289 | 1,640,801 | 1,616,565 | 2,088,118 |
| පවාරණ | 5,677,638 | 7,184,611 | 5,267,864 | 5,121,636 | 5,391,723 |
| කල්පිරීමේ ප්‍රතිලාභ | 9,839,833 | 9,754,751 | 11,687,811 | 12,370,659 | 14,239,953 |
| වෙනත් | 1,388,698 | 1,378,929 | 1,906,560 | 2,887,039 | 3,610,801 |

## රක්ෂණ සමාගම් විසින් දැරීමට සිදු වූ හිමිකම්පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

දරන ලද ජීවිත රක්ෂණ හිමිකම්පෑම් 2017 වසර තුළ රුපියල් මිලියන 25,967 (2016 :22,485) දක්වා සැලකියයුතු ලෙස වැඩිවී ඇති බවත්, එය වාර්ෂිකව 15.49%කින් වර්ධනය වී ඇති බවත් සඳහන් කිරීම වැදගත්ය. පසුගිය වසර පහ තුළ, මෙම ප්‍රමාණය වටිනාකම අනුව ජීවිත රක්ෂකයින් විසින් දරන ලද විශාලතම හිමිකම්පෑම් විය. කල්පිරීමේ ප්‍රතිලාභ බහුතරය නියෝජනය කරමින් රුපියල් මිලියන 14,240ක් (2016 : රුපියල් මිලියන 12,371) වූ අතර, මුළු ප්‍රතිලාභවලින් 54.84%ක් නියෝජනය කරන ලදී. ඒ අනුව, කල්පිරීමේ ප්‍රතිලාභ 2016 වසරට සාපේක්ෂව 2017 වසර තුළ 15.11%කින් ඉහළ ගොස් ඇත. පවාරණය කරන ලද හිමිකම් රුපියල් මිලියන 5,392ක් වූ අතර, මුළු හිමිකම්පෑම්වලින් 20.76%ක් නියෝජනය කරන ලදී.

2017 වසර තුළ, අකර්මන්‍යතා ප්‍රතිලාභ සහ මරණ ප්‍රතිලාභ 2016 වසරට සාපේක්ෂව පිළිවෙලින් 30.26%කින් හා 29.17%කින් ඉහළ ගොස් ඇත. සෞඛ්‍ය ප්‍රතිලාභ, අත්තිකාරම් ගෙවීම්, ප්‍රසාද දීමනා සමහර අවලංගු කිරීම් සහ ආපසු ගෙවීම් යනාදිය ඇතුළත් වෙනත් ප්‍රතිලාභ රුපියල් මිලියන 3,611ක් වූ අතර, එය දරන ලද මුළු හිමිකම්පෑම්වලින් 13.91% ක් හා වාර්ෂිකව 25.07%ක වර්ධනයක් වාර්තා කරන ලදී.


දීර්ඝ කාලීන රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම්පෑම්වල විස්තර 12 වැනි රූපසටහනින් ලබා දේ.

## රක්ෂණ සමාගම් විසින් දැරීමට සිදු වූ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

2017 දී හිමිකම්පෑම් වටිනාකම තුළ දක්නට ලැබුණ 15.49%ක වර්ධනයට අනුව, 2017 වසර සඳහා මුළු හිමිකම්පෑම් 341,344 දක්වා 7.87% කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. කල්පිරීමේ ප්‍රතිලාභ හිමිකම්පෑම් සංඛ්‍යාව 115,311 (2016 :108,680)ක් වූ අතර මුළු හිමිකම්පෑම්වලින් 33.78% ක් නියෝජනය කරන ලදී. සෞඛ්‍ය ප්‍රතිලාභ, අවලංගුකිරීම්, ආපසු ගෙවීම්, කොටස් ලෙස ආපසු ගැනීම යනාදී විවිධ හිමිකම්පෑම්වල සංයෝගයක් වන “වෙනත්” වාර්ෂිකව 157,251 දක්වා 9.71% කින් වර්ධනය වී ඇත.

පවාරණ ප්‍රතිලාභ මුළු හිමිකම්පෑම්වලින් 13.70%ක් නියෝජනය කළ අතර, මෙය අඩුකිරීම සඳහා රක්ෂකයින් විසින් අවධානය යොමුකළ යුතු වේ. ගෙවන ලද මරණ ප්‍රතිලාභ සංඛ්‍යාව 2016 දී වාර්තා කළ 8,418 සිට 2017 දී 11,253 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

**රූප සටහන 13**
**2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ සමාගම් අනුව දළ ලිඛිත වාරිකවල වෙළෙඳපොල කොටස**



**වගුව 17**

**සමාගම් අනුව දළ ලිඛිත වාරික සහ වෙළෙඳ පොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2013 | | 2014 | | 2015 | | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) |
| ඒඅයිඒ ජෙනරල් | 2,428,675 | 4.17 | 2,655,577 | 4.34 | 3,297,840 | 4.76 | | | | |
| ඒඅයිජී | 880,060 | 1.51 | 414,805 | 0.68 | 3,141 | 0.00 | | | | |
| අලියාන්ස් ජෙනරල් | 1,964,907 | 3.37 | 2,723,406 | 4.45 | 3,244,844 | 4.68 | 4,247,691 | 5.34 | 5,593,322 | 6.01 |
| අමානා ජෙනරල් | 1,432,135 | 2.46 | 1,285,418 | 2.10 | 1,438,732 | 2.08 | 1,474,186 | 1.85 | 1,739,936 | 1.87 |
| සෙලින්කෝ ජෙනරල් | 10,311,479 | 17.69 | 11,431,680 | 18.68 | 12,921,561 | 18.65 | 15,265,433 | 19.18 | 17,012,087 | 18.27 |
| කොන්ටිනෙන්ටල් | 1,330,515 | 2.28 | 1,761,747 | 2.88 | 2,309,413 | 3.33 | 3,088,064 | 3.88 | 3,892,991 | 4.18 |
| කෝපරේටිව් ජෙනරල් | 1,272,941 | 2.18 | 1,358,932 | 2.22 | 1,691,705 | 2.44 | 2,420,130 | 3.04 | 2,966,680 | 3.19 |
| ෆෙයාෆස්ට් | 1,556,386 | 2.67 | 1,638,126 | 2.68 | 1,908,901 | 2.76 | 2,361,614 | 2.97 | 9,610,990 | 10.32 |
| එච්එන්බී ජෙනරල් | 1,767,361 | 3.03 | 2,182,915 | 3.57 | 2,577,224 | 3.72 | 2,982,385 | 3.75 | 3,748,215 | 4.03 |
| ජනශක්ති ජෙනරල් | 6,318,626 | 10.84 | 6,491,556 | 10.61 | 7,406,160 | 10.69 | 10,137,864 | 12.74 | 11,744,148 | 12.61 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,485,521 | 2.55 | 1,815,486 | 2.97 | 2,476,961 | 3.58 | 3,096,834 | 3.89 | 3,795,106 | 4.07 |
| එම්බීඑස්එල් | 1,132,789 | 1.94 | 961,225 | 1.57 | 1,159,208 | 1.67 | 972,976 | 1.22 | 227,813 | 0.24 |
| එන්අයිටීඑෆ් | 4,973,357 | 8.53 | 5,295,759 | 8.65 | 4,961,413 | 7.16 | 6,420,822 | 8.07 | 8,114,417 | 8.71 |
| ඔරියන්ට් | 355,001 | 0.61 | 491,127 | 0.80 | 746,935 | 1.08 | 810,728 | 1.02 | 1,179,000 | 1.27 |
| පීපල්ස් | 3,085,041 | 5.29 | 3,286,063 | 5.37 | 3,637,404 | 5.25 | 4,166,727 | 5.24 | 4,584,347 | 4.92 |
| සණස | 322,592 | 0.55 | 344,041 | 0.56 | 349,527 | 0.50 | 384,481 | 0.48 | 554,332 | 0.60 |
| එස්එල්අයිසී | 12,549,763 | 21.53 | 12,113,994 | 19.79 | 13,583,222 | 19.61 | 15,198,381 | 19.10 | 18,355,361 | 19.71 |
| යූනියන් ජෙනරල් | 5,116,966 | 8.78 | 4,950,741 | 8.09 | 5,557,189 | 8.02 | 6,561,571 | 8.23 | - | - |
| **මුළු ගණන** | **58,284,115** | **100** | **61,202,599** | **100** | **69,271,380** | **100** | **79,589,887** | **100** | **93,118,745** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **9.53** | | **5.01** | | **13.18** | | **14.90** | | **17.00** | |

2013 සිට 2017 දක්වා රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව පිළිබඳ විස්තර 16 වැනි වගුවෙන් පෙන්වා දේ.


## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය දළ ලිඛිත වාරික ආදායම

රක්ෂණ සමාගම් දොළහක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ තනිව ක්‍රියාත්මකවීම සමඟ තවත් සංයුක්ත රක්ෂණ සමාගම් තුනක් සාමාන්‍ය සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය යන දෙකම මෙහෙයවීමත් සමඟින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා 2017 වසර තවත් එක් සාර්ථක වසරක් විය. අහිතකර කාලගුණ තත්ත්වයන්, විනිමය අනුපාත උච්චාවචනය, රථවාහන මත අයකළ තීරුබදු ගාස්තුවල වෙනස්වීම්, මදුරුවන්ගෙන් ඇතිවන වෛරස් ආසාදනවල වැඩිවීම යනාදී අභියෝග ගණනාවක් පසුගිය වසර තුළ, මෙම රක්ෂකයින්ට ජයගැනීමට හැකි වී ඇත.

පෙර වසරට සමානව, රක්ෂණ

**රූප සටහන 14**

**2013 වසරේ සිට 2017 වසර දක්වා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




| | එස්එල්අයිසී | සෙලින්කෝ | ජනශක්ති | ෆෙයාෆස්ට් | ජාතික රක්ෂණ භාර අරමුදල | වෙනත් රක්ෂකයින් |
|---|---|---|---|---|---|---|
| 2013 | 21.53 | 17.69 | 10.84 | 8.78 | 8.53 | 32.62 |
| 2014 | 19.79 | 18.68 | 10.61 | 8.09 | 8.65 | 34.18 |
| 2015 | 19.61 | 18.65 | 10.69 | 8.02 | 7.16 | 35.86 |
| 2016 (අ) | 19.10 | 19.18 | 12.74 | 8.24 | 8.07 | 32.67 |
| 2017 (ආ) | 19.71 | 18.27 | 12.61 | 10.32 | 8.71 | 30.38 |

**වගුව 18**

**දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**


| උප වර්ගය | දළ ලිඛිත වාරික ආදායම (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
| ගිනි | 6,303,725 | 6,353,292 | 6,604,074 | 7,479,910 | 8,239,759 |
| මුහුදු | 1,796,969 | 1,911,944 | 1,996,862 | 2,086,394 | 2,222,191 |
| මෝටර් රථවාහන | 33,331,917 | 35,786,941 | 42,622,205 | 49,333,000 | 56,072,846 |
| සෞඛ්‍ය | 7,292,091 | 7,593,386 | 8,534,364 | 10,036,518 | 14,676,421 |
| විවිධ | 7,015,630 | 6,721,836 | 6,495,454 | 7,120,742 | 7,871,246 |
| **උප එකතුව** | **55,740,332** | **58,367,399** | **66,252,959** | **76,056,564** | **89,082,463** |
| SRCC හා T | 2,543,783 | 2,835,200 | 3,018,421 | 3,533,324 | 4,036,283 |
| **එකතුව** | **58,284,115** | **61,202,599** | **69,271,380** | **79,589,888** | **93,118,746** |

| උප වර්ගය | වර්ධනය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
| ගිනි | 15.16 | 0.79 | 3.95 | 13.26 | 10.16 |
| මුහුදු | (6.75) | 6.40 | 4.44 | 4.48 | 6.51 |
| මෝටර් රථවාහන | 4.67 | 7.37 | 19.10 | 15.74 | 13.66 |
| සෞඛ්‍ය | 22.58 | 4.13 | 12.39 | 17.60 | 46.23 |
| විවිධ | 22.27 | (4.19) | (3.37) | 9.63 | 10.54 |
| උප එකතුව | **9.44** | **4.71** | **13.51** | **14.80** | **17.13** |
| SRCC හා T | 11.51 | 11.46 | 6.46 | 17.06 | 14.23 |
| **එකතුව** | **9.53** | **5.01** | **13.18** | **14.90** | **17.00** |

| උප වර්ගය | ප්‍රතිශත කොටස (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
| ගිනි | 10.82 | 10.38 | 9.53 | 9.40 | 8.85 |
| මුහුදු | 3.08 | 3.12 | 2.88 | 2.62 | 2.39 |
| මෝටර් රථවාහන | 57.19 | 58.47 | 61.53 | 61.98 | 60.22 |
| සෞඛ්‍ය | 12.51 | 12.41 | 12.32 | 12.61 | 15.76 |
| විවිධ | 12.04 | 10.98 | 9.38 | 8.95 | 8.45 |
| **උප එකතුව** | **95.64** | **95.37** | **95.64** | **95.56** | **95.67** |
| SRCC හා T | 4.36 | 4.63 | 4.36 | 4.44 | 4.33 |
| **එකතුව** | **100** | **100** | **100** | **100** | **100** |

**රූප සටහන 15**

**2013 සිට 2017 දක්වා දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
|---|---|---|---|---|---|
| SRCC & T | 4.36 | 4.63 | 4.36 | 4.44 | 4.33 |
| විවිධ | 12.04 | 10.98 | 9.38 | 8.95 | 8.45 |
| සෞඛ්‍ය | 12.51 | 12.41 | 12.32 | 12.61 | 15.76 |
| මෝටර් රථ වාහන | 57.19 | 58.47 | 61.53 | 61.98 | 60.22 |
| මුහුදු | 3.08 | 3.12 | 2.88 | 2.62 | 2.39 |
| ගිනි | 10.82 | 10.38 | 9.53 | 9.40 | 8.85 |
| කර්මාන්ත වර්ධනය | 9.53 | 5.01 | 13.18 | 14.90 | 17.00 |

වෙළෙඳපොලේ දළ ලිඛිත වාරිකය ප්‍රධාන වශයෙන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය විසින් මෙහෙයවනු ලැබූ අතර, 2017 වසර තුළ වර්තා කළ මුළු දළ ලිඛිත වාරිකයෙන් 56.57%ක් (2016 : 55.63%) සඳහා දායක වී ඇත. අභියෝගාත්මක වාතාවරණය නොසළකා 2016 දී වාර්තා කළ 79,590ක් වූ දළ ලිඛිත වාරිකයට සාපේක්ෂව 93,119ක දළ ලිඛිත වාරිකයක් උපයාගනිමින්, 17.00%ක (2016 :14.90%) ධනාත්මක වර්ධනයක් සමඟ 2017 වසර අවසන් විය.

2017 වසර තුළ මෙම ස්ථාවර වර්ධනය සඳහා රථවාහන සහ සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු විය. 2017 ඔක්තෝබර් හි සියලුම ශ්‍රී ලාංකීය පාසල් සිසුන් සඳහා එස්එල්අයිසී හරහා අධ්‍යාපන අමාත්‍යංශය විසින් හඳුන්වා දෙන ලද සුරක්ෂා නොමිලේ වෛද්‍ය සහ පුද්ගල අනතුරු ආවරණය සහ එන්අයිටීඑෆ් විසින් ක්‍රියාත්මක කරන අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ වාරික ආදායම වැඩිවීම 2016 දී වාර්තා කළ 17.60%ක් වූ සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වර්ධනයට සාපේක්ෂව 46.23%කින් 2017 දී එම වර්ධනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත.

17 වැනි වගුවේ සහ 13 වැනි රූප සටහනේ පෙන්වා දෙන පරිදි,

එස්එල්අයිසී 19.71%ක (2016 : 19.10%) වෙළෙඳපොල කොටසක් අත්කර ගනිමින් වෙළෙඳපොල නායකයා වූ අතර, 2017 දී රුපියල් මිලියන 18,355ක වාරික ආදායමක් වාර්තා කරන ලදී. ඒ අනුව, 2016 වසර හැර අඛණ්ඩව වසර හතරක් සඳහා දළ ලිඛිත වාරිකය අනුව සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොල තුළ පළමු ස්ථානය රැකගැනීමට එස්එල්අයිසී හැකි වී ඇත. 2016 වසරේ වාර්තා කළ රුපියල් මිලියන 15,198ක් වූ වාරික ආදායමට සාපේක්ෂව 20.77%ක සැලකියයුතු වර්ධන අනුපාතයක් 2017 වසරේ දී පැවතුණි. මෙයට රුපියල් බිලියන 2.3ක් වූ සුරක්ෂා නොමිලේ වෛද්‍ය සහ පුද්ගල අනතුරු ආවරණය තුළින් උපයන ලද වාරිකය ඇතුළත් වේ. සෙලින්කෝ ජෙනරල් දෙවන ස්ථානය අත්කර ගත් අතර, 2017 දී 18.27%ක (2016 : 19.18%) වෙළෙඳපොල කොටසක් අත්කර ගනිමින් රුපියල් මිලියන 17,012ක (2016 : රුපියල් මිලියන 15,265) වාරික ආදායමක් වාර්තා කළේය. ජනශක්ති ජෙනරල් 12.61%ක (2016 : 12.74%) වෙළෙඳපොල කොටසක් සමඟ තවදුරටත් තුන්වන ස්ථානයේ රැඳී සිටි අතර, රුපියල් මිලියන 11,774ක (2016 : රුපියල් මිලියන 10,138) වාරික ආදායමක් වාර්තා කළේය. ෆෙයාෆස්ට් සමාගම යූනියන් ජෙනරල් සමාගම හා ඒකාබද්ධවීමත් සමඟ වෙළෙඳපොල හතරවැනි ස්ථානය අත්කර ගත් අතර, 2017 දී රුපියල් මිලියන 9,611 දක්වා 307%කින් දළ ලිඛිත වාරික ආදායම වර්ධනය කර ගෙන ඇත.


2017 දී එන්අයිටීඑෆ් රුපියල් මිලියන 8,114ක (2016 : 6,421) වාරික ආදායමක් සමඟ 8.71%ක (2016 : 8.07%) වෙළෙඳපොල කොටසක් අත්කර ගනිමින් පස්වැනි විශාලතම වෙළෙඳපොල කොටස අත්කරගත් සමාගම බවට පත් වූ අතර, 2016 වසරට සාපේක්ෂව 26.38%ක වර්ධන අනුපාතයක් වාර්තා කරන ලදී. අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැලඹීම් හා ත්‍රස්තවාදය රක්ෂණ ක්‍රමය තුළින් උපයන ලද වාරිකවල සැලකියයුතු වර්ධනය 2017 වසර තුළ එන්අයිටීඑෆ් විසින් වාර්තා කළ ඉහළ වර්ධන අනුපාතයට ප්‍රධාන වශයෙන් දායක වී ඇත. අලියාන්ස් ජෙනරල් සමාගමට සහ පීපල්ස් සමාගමට 2017 වසර තුළ පිළිවෙලින් 6.01% (2016 : 5.34%) සහ 4.92% (2016 : 5.23%) ක වෙළෙඳපොල කොටසක් අත්කර ගැනීමට හැකි වී ඇත.

ඔරියන්ට්, සණස, අලියාන්ස් ජෙනරල්, කොන්ටිනෙන්ටල් සහ එච්එන්බී ජෙනරල් රක්ෂණ සමාගම් 2016 වසර තුළ වාර්තාකළ දළ ලිඛිත වාරිකයට සාපේක්ෂව 25%ට ඉහළ වර්ධන අනුපාත වාර්තාකර ඇති අතර, එය

**වගුව 19**
**2016 හා 2017 සඳහා රක්ෂණ ව්‍යාපාරයේ විවිධ රක්ෂණ උප-පන්තියේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය**

| වර්ගය | දළ ලිඛිත වාරික ආදායම රු.'000 | |
|---|---|---|
| | 2016 (අ) | 2017 (ආ) |
| අභිධානය | 492,883 | 507,621 |
| පුද්ගලික අනතුරු | 1,454,497 | 1,434,518 |
| කොන්ත්‍රාත්කරුගේ සියලු අවදානම් | 59,428 | 197,680 |
| වෘත්තීය හානිරක්ෂණය | 183,227 | 275,178 |
| වාරිකා රක්ෂණය | 442,893 | 497,729 |
| විශ්වාසනා ඇපය | 97,700 | 93,894 |
| ගෙවල් බිඳීම | 349,480 | 376,890 |
| සේප්පුවේ ඇති මුදල් ඇතුළු මාර්ගස්ථ මුදල් | 435,132 | 411,760 |
| මාර්ගස්ථ භාණ්ඩ | 81,776 | 133,885 |
| නිෂ්පාදන වගකීම | 124,341 | 139,905 |
| මහජන වගකීම | 384,149 | 397,677 |
| බැංකුකරුවන්ගේ හානිරක්ෂණය | 396,791 | 389,531 |
| ගුවන්යානා බඳ | 997,727 | 840,116 |
| සේවක වන්දි රක්ෂණය | 535,456 | 565,864 |
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) | 300,000 | 500,000 |
| වෙනත් | 1,180,419 | 1,476,720 |
| **උප එකතුව** | **7,515,899** | **8,238,968** |
| අඩුකළා- ජාතික රක්ෂණ භාර අරමුදල හේතුවෙන් වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැලඹීම් හා ත්‍රස්තවාදය මුළු වාරික ආදායම | (370,791) | (347,729) |
| සම-රක්ෂකයින්ගේ වාරික ආදායම | (24,364) | (19,990) |
| **මුළු විවිධ රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම** | **7,120,744** | **7,871,249** |

**රූප සටහන 16**
**ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**



**වගුව 20**

**දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| උප වර්ගය | දළ ලිඛිත වාරික ආදායම (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
| ගිනි | 6,303,725 | 6,353,292 | 6,604,074 | 7,479,910 | 8,239,759 |
| මුහුදු | 1,796,969 | 1,911,944 | 1,996,862 | 2,086,394 | 2,222,191 |
| රථවාහන | 33,331,917 | 35,786,941 | 42,622,205 | 49,333,000 | 56,072,846 |
| සෞඛ්‍ය | 7,292,091 | 7,593,386 | 8,534,364 | 10,036,518 | 14,676,421 |
| විවිධ | 7,015,630 | 6,721,836 | 6,495,454 | 7,120,742 | 7,871,246 |
| **උප එකතුව** | **55,740,332** | **58,367,399** | **66,252,959** | **76,056,564** | **89,082,463** |
| SRCC හා T | 2,543,783 | 2,835,200 | 3,018,421 | 3,533,324 | 4,036,283 |
| **එකතුව** | **58,284,115** | **61,202,599** | **69,271,380** | **79,589,888** | **93,118,746** |

| උප වර්ගය | ප්‍රතිරක්‍ෂක වාරික ආදායම (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
| ගිනි | 4,823,731 | 5,075,545 | 5,137,042 | 5,959,242 | 6,578,120 |
| මුහුදු | 998,976 | 1,171,768 | 1,154,511 | 1,174,266 | 1,207,575 |
| රථවාහන | 864,394 | 636,603 | 1,115,036 | 1,233,466 | 2,170,337 |
| සෞඛ්‍ය | | | | 486,984 | 2,674,504 |
| විවිධ | 2,700,309 | 2,634,795 | 3,012,362 | 3,213,645 | 3,823,138 |
| **උප එකතුව** | **9,387,410** | **9,518,711** | **10,418,951** | **12,067,603** | **16,453,674** |
| SRCC හා T | - | - | - | - | 108,750 |
| **මුළු ප්‍රතිරක්ෂක වාරික ආදායම** | **9,387,410** | **9,518,711** | **10,418,951** | **12,067,604** | **16,562,424** |

| උප වර්ගය | රඳවා ගැනීම (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
| ගිනි | 1,479,994 | 1,277,747 | 1,467,033 | 1,520,667 | 1,661,639 |
| මුහුදු | 797,994 | 740,176 | 842,351 | 912,129 | 1,014,617 |
| රථවාහන | 32,467,523 | 35,150,338 | 41,507,169 | 48,099,534 | 53,902,509 |
| සෞඛ්‍ය | | | | 9,549,533 | 12,001,917 |
| විවිධ | 11,607,412 | 11,680,427 | 12,017,456 | 3,907,097 | 4,048,108 |
| **උප එකතුව** | **46,352,923** | **48,848,688** | **55,834,008** | **63,988,960** | **72,628,790** |
| SRCC හා T | 2,543,783 | 2,835,200 | 3,018,421 | 3,533,324 | 3,927,533 |
| **මුළු ශුද්ධ ලිඛිත වාරික ආදායම** | **48,896,706** | **51,683,888** | **58,852,429** | **67,522,284** | **76,556,323** |

| උප වර්ගය | දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස රඳවා ගැනීම (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
| ගිනි | 23.48 | 20.11 | 22.21 | 20.33 | 20.17 |
| මුහුදු | 44.41 | 38.71 | 42.18 | 43.72 | 45.66 |
| රථවාහන | 97.41 | 98.22 | 97.38 | 97.50 | 96.13 |
| සෞඛ්‍ය | | | | 95.15 | 81.78 |
| විවිධ | 81.13 | 81.59 | 79.96 | 54.87 | 51.43 |
| උප එකතුව | **83.16** | **83.69** | **84.27** | **84.13** | **81.53** |
| SRCC හා T | 100 | 100 | 100 | 100 | 97.31 |
| **සමස්ත රඳවාගැනීමේ අනුපාතය** | **83.89** | **84.45** | **84.96** | **84.84** | **82.21** |

එම සමාගම් වල වෙළෙඳපොල කොටස් වර්ධනයට හේතු විය. සියලුම රක්ෂණ සමාගම්වල වෙළෙඳපොල කොටස් සෙලින්කෝ ජෙනරල්, ජනශක්ති ජෙනරල්, එම්බීඑස්එල් සහ පීපල්ස් හැර සුළු වශයෙන් වැඩි වී ඇත.

## දළ ලිඛිත වාරික ආදායම ජනනය කිරීම අතින් ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළෙඳපොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2013 සිට 2017 දක්වා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමුඛතම වෙළෙඳපොළ කොටස වාර්තා කරන ලද සමාගම් පහ සහ අනෙක් රක්ෂකයින් වාර්තා කළ වෙළෙඳපොළ කොටස පිළිබඳ විස්තර 14 වැනි රූප සටහනින් නිරූපණය වේ.

පෙර වසරට සමානව, එස්එල්අයිසී සහ සෙලින්කෝ ජෙනරල් සමාගම 37.98%ක (2016 : 38.28%)ක සමස්ථ වෙළෙඳපොළ කොටසකට දායක වෙමින් සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොල මෙහෙයවන ලදී. තෙවැනි, හතරවැනි සහ පස්වැනි ස්ථාන පිළිවෙලින් ජනශක්ති ජෙනරල්, ෆෙයාෆස්ට් සහ එන්අයිටීඑෆ් විසින් අත්කර ගන්නා ලදී. මෙම සමාගම් පහ එක්ව මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 69.62%කට දායක වූ අතර, වාර්ෂිකව 2.29%ක වර්ධනයක් වාර්තා කරන ලදී. පෙර වසරට සමානව, ඉතිරි රක්ෂණ සමාගම්වල සමස්ථ වෙළෙඳපොල කොටස 2016 වසරේදී වාර්තා කළ

32.67% සිට 30.38% දක්වා තවදුරටත් අඩුවී ඇත.

## දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප වර්ග වන ගිනි, මුහුදු, මෝටර් රථ වාහන, සෞඛ්‍ය, විවිධ රක්ෂණය සහ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැලඹීම් හා ත්‍රස්තවාදය (SRCC හා T) යන රක්ෂණ ව්‍යාපාර තුලින් 2013 සිට 2017 වසර දක්වා කාල පරිච්ඡේදය තුළ උපයන ලද දළ ලිඛිත වාරික ආදායම් විශ්ලේෂණය 18 වැනි වගුවෙන් සහ 15 වැනි රූප සටහනෙන් නිරූපනය කරයි.

පසුගිය වසර හා සමානවම, සමස්ත දළ ලිඛිත වාරිකයෙන් 60.22% ක නියෝජනයක් වූ රුපියල් මිලියන 56,073ක අගයක් වාර්තා කරමින් මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරය සාමාන්‍ය රක්ෂණ වෙළඳපලෙහි ප්‍රමුඛත්වය තවදුරටත් පවත්වා ගත් අතර, එය 2016 වසරේ වාර්තාගත වූ 61.98% ක වෙළඳපල කොටසට සාපේක්ෂව 1.76% ක අඩුවීමකි.

තවද, 2016 වසරේ වාර්තා වූ 15.74% ක වර්ධන අනුපාතිකයට සාපේක්ෂව මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරයෙහි වර්ධන අනුපාතිකය 13.66%ක් දක්වා පහත වැටී තිබුණි.

පසුගිය වසරට සාපේක්ෂව 46.23%ක සැලකිය යුතු වර්ධන අනුපාතිකයක්

**වගුව 21**

**සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | (රු.'000) | % | (රු.'000) | % |
| ඒඅයිජී | 125,282 | 0.07 | 55,380 | 0.03 |
| අලියාන්ස් ජෙනරල් | 5,211,062 | 3.00 | 7,333,401 | 3.95 |
| අමානා ජෙනරල් | 2,939,990 | 1.69 | 3,141,550 | 1.69 |
| සෙලින්කෝ ජෙනරල් | 23,376,250 | 13.44 | 25,572,536 | 13.77 |
| කොන්ටිනෙන්ටල් | 3,584,797 | 2.06 | 4,369,211 | 2.35 |
| කෝපරේටිව් ජෙනරල් | 3,787,315 | 2.18 | 4,669,447 | 2.51 |
| ෆෙයාෆස්ට් | 2,945,827 | 1.69 | 15,836,675 | 8.53 |
| එච්එන්බී ජෙනරල් | 3,492,537 | 2.01 | 4,385,775 | 2.36 |
| ජනශක්ති ජෙනරල් | 19,023,897 | 10.93 | 22,142,143 | 11.92 |
| එල්ඕඑල්සී ජෙනරල් | 4,069,023 | 2.34 | 5,113,204 | 2.75 |
| එම්බීඑස්එල් | 1,086,971 | 0.62 | 625,377 | 0.34 |
| එන්අයිටීඑෆ් | 12,176,936 | 7.00 | 13,259,239 | 7.14 |
| ඔරියන්ට් | 1,713,218 | 0.98 | 1,726,427 | 0.93 |
| පීපල්ස් | 6,720,143 | 3.86 | 7,745,115 | 4.17 |
| සණස | 521,765 | 0.30 | 635,851 | 0.34 |
| එස්එල්අයිසී | 67,503,909 | 38.80 | 69,155,434 | 37.22 |
| යුනියන් ජෙනරල් | 15,706,231 | 9.03 | | |
| **එකතුව** | **173,985,153** | **100** | **185,766,765** | **100** |

සහිතව රුපියල් මිලියන 14,676 ක (2016 : රුපියල් මිලියන 10,037) දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමින් සෞඛ්‍ය අංශය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දෙවන විශාලතම ප්‍රභේදය නියෝජනය කරයි.

නවාතැන් සහ නේවාසික ඒකක සඳහා වන ඉල්ලුම ගිනි රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් අවස්ථා වැඩි වශයෙන් ඇතිකර තිබෙන අතර, පසුගිය වසරට සාපේක්ෂව 10.16%ක වර්ධන අනුපාතිකයක් කරා ළඟා වී ඇත්තේ රුපියල් මිලියන 8,240ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමිනි. (2016 : රුපියල් මිලියන 7,480කි)


විවිධ රක්ෂණයන් ප්‍රමාණය රුපියල් මිලියන 7,871ක වාරික ආදායමක් (2016 : රුපියල් මිලියන 7121කි) උත්පාදනය කරමින් සමස්ත දළ ලිඛිත වාරිකයෙන් 8.45%ක් වාර්තා කළ අතර, එය 2016 වසරට සාපේක්ෂව 10.54% කින් වර්ධනය වී තිබුණි.

මුහුදු රක්ෂණ ව්‍යාපාරය හරහා උත්පාදනය වූ දළ ලිඛිත වාරිකය 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ දී 6.51%කින් ඉහළ ගොස් තිබේ.

එන්අයිටීඑෆ් විසින් තහවුරු කර ඇති පරිදි, වැඩ වර්ජන, කැරලි කෝලාහාල,ජන කැළඹීම් හා ත්‍රස්ථවාදය සම්බන්ධව එකතු කරගන්නා ලද වාරික ප්‍රමාණය වූ රුපියල් මිලියන 4,036, සමස්ත දළ ලිඛිත වාරිකයෙන් 4.33% ක් (2016 : රුපියල් මිලියන 3,533කි) නියෝජනය කළේ 2017 වසරේ දී එහි වර්ධන අනුපාතිකය 14.23%ක් ලෙස වාර්තා කරමිනි.

**රූප සටහන 17**

**සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**



## විවිධ රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික වර්ගය අනුව විශ්ලේෂණය

2016 සහ 2017 වසර තුළදී, විවිධ රක්ෂණ ව්‍යාපාරය යටතේ වර්ගීකරණය කළ විවිධ රක්ෂණ අංශ විසින් උපයන ලද දළ ලිඛිත වාරික 19 වැනි වගුවෙන් පෙන්නුම් කෙරේ. විවිධ රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන වර්ගීකරණයන්ට පුද්ගල අනතුරු, ගුවන්යානා බඳ, හිමිකම් රක්ෂණය, සේවක වන්දි රක්ෂණය, වාරිකා රක්ෂණය, මාර්ගස්ථ මුදල් යනාදිය ඇතුළත් වේ. විවිධ රක්ෂණ ව්‍යාපාරයෙන් උපයන ලද මුළු දළ ලිඛිත වාරික ආදායම SRCC හා T සහ සමරක්ෂණ වාරික රහිතව 2017 වසරේදී රුපියල් මිලියන 7,871ක් (2016 : රුපියල් මිලියන 7,121) වූ අතර, 2016 වසරට සාපේක්ෂව 10.54%කින් වර්ධනය වී ඇත.

පුද්ගල අනතුරු, විශ්වාසතා ඇපය, සේප්පුවේ මුදල් ඇතුළුව මාර්ගස්ථ මුදල්, බැංකුකරුවන්ගේ හානිරක්ෂණය සහ ගුවන්යානා බඳ රක්ෂණය හැර, විවිධ රක්ෂණ ව්‍යාපාරයේ සියලුම වර්ගීකරණ 2017 වසරේදී වැඩි වී ඇත. කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවදානම්, වෘත්තීය හානිරක්ෂණය, මාර්ගස්ථ භාණ්ඩ සහ ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) තුළින් උපයනලද දළ ලිඛිත වාරිකය 2017 වසර තුළ විවිධ රක්ෂණ ව්‍යාපාරයෙන් උපයන ලද මුළු දළ ලිඛිත වාරික ආදායම කෙරෙහි ධනාත්මකව බලපා ඇත.

"වෙනත්" කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇති රක්ෂණ ව්‍යාපාර යටතට මූලික වශයෙන් අඩංගු වන්නේ කාර්ය සාධන බැදුම්කර, පුද්ගලික රක්ෂණ නිෂ්පාදන සහ නැව් බඳ සියලු අවදානම් යන රක්ෂණ ව්‍යාපාරයන් වන අතර, එය 2017 වර්ෂය සඳහා විවිධ රක්ෂණ ව්‍යාපාරයේ SRCC හා T ඇතුළුව මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 18.76%ක් (2016:16.58%) නියෝජනය කරමින්, විවිධ රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන වර්ගීකරණයක් බවට පත්ව ඇත. 2017 වසර තුළ දළ ලිඛිත වාරික ආදායමට රුපියල් මිලියන 1,434 කින් (2016 : රුපියල් මිලියන 1,454) දායක වෙමින් පුද්ගල අනතුරු රක්ෂණය දෙවන විශාලතම වර්ගීකරණය බවට පත්ව ඇති අතර 2016 වසරට සාපේක්ෂව 1.37%ක ඍණ වර්ධනයක් වාර්තා කරන ලදී. ගුවන්යානා බඳ රක්ෂණය රුපියල් මිලියන 840ක් (2016 : රුපියල් මිලියන 998) දළ ලිඛිත වාරිකයට උපයාදෙමින් ඊට ආසන්න ස්ථානයේ පසුවිය.

## දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂණකරුවන් විසින් රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය.

2013 සිට 2017 වසර දක්වා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ රක්ෂණ සමාගම් විසින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂකයින්ට පවරන ලද ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ ප්‍රධාන පන්තිවල රඳවා ගැනීමේ මට්ටම් 20 වැනි වගුව සහ 16 වැනි රූපසටහනින් නිරූපණය වේ. 20 වැනි වගුවේ පෙන්වා දෙන පරිදි, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය විසින් උපයන ලද රුපියල් මිලියන 89,082ක් (2016 : රුපියල් මිලියන 76,057) වූ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් රුපියල් මිලියන 16,454ක් (2016 : රුපියල් මිලියන 12,068) ප්‍රතිරක්ෂකයින් වෙත පවරනු ලැබ ඇත.ඒ අනුව, 2017 වසර තුළ සාමාන්‍ය රක්ෂකයින් විසින් 81.53%ක් (2016 : 84.13%) (SRCC හා T රහිතව) සමස්ත රඳවාගැනීම් අනුපාතයක් වාර්තා කරන ලද අතර එය පසුගිය වසරට සාපේක්ෂව සුළු අඩුවීමකි. පසුගිය වසර පහ තුළ රථවාහන රක්ෂණ ව්‍යාපාරය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ඉහළම රඳවාගත් උප වර්ගය විය. 2017 වසර තුළ, රථවාහන උප වර්ගය 96.13%ක (2016 : 97.50%) රඳවාගැනීම් අනුපාතයක් වාර්තා කරන ලදී. එසේවුවත්, රථවාහන රක්ෂණ ව්‍යාපාරය සඳහා ප්‍රතිරක්ෂකයින්ට පවාරණය කළ වාරික 75.95% කින් වැඩි වී ඇති අතර, 2016 දී වාර්තා කළ රුපියල් මිලියන 1,2330 සාපේක්ෂව රුපියල් මිලියන 2,170ක් විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් ඉහළ හිමිකම්පෑම් ගෙවීම් සඳහා හේතු වූ පසුගිය වසර දෙක තුළ පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් හේතු කොට ගෙන ප්‍රතිරක්ෂණ ආවරණය ඉහළයාම හේතු විය.

2017 වසරේ දී සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරය ද තවදුරටත් 81.78%ක (2016 : 95.15%) ඉහළ රඳවාගැනීම් අනුපාතයක් වාර්තා කරනු ලැබුවත්, ප්‍රතිරක්ෂණ ආවරණය ඉහළයාම හේතු කොට ගෙන පසුගිය වසරට සාපේක්ෂව රඳවා ගැනීමේ අනුපාතය තුළ අඩුවීමක් වාර්තා කරන ලදී.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ගිනි රක්ෂණ ව්‍යාපාරය 2017 වසරේදී වාර්තාකළ 20.17%ක් (2016 : 20.33%) වූ රඳවාගැනීම් අනුපාතයත් සමග පසුගිය වසර පහ සඳහා අඩුම රඳවා ගැනීමේ අනුපාතය වාර්තා කරන ලදී. මෙයට සමානව, මුහුදු රක්ෂණ ව්‍යාපාරය ද පසුගිය වසර පහ සඳහා අඩුම රඳවාගැනීමේ අනුපාත වාර්තා කරන ලද අතර, 2017 දී වාර්තාකරන ලද රඳවාගැනීමේ අනුපාතය 45.66%ක් විය. මෙම හිමිකම්පෑම් නිරාවරණය අවමකිරීමට ප්‍රතිරක්ෂකයින් වෙත ඉහළ අවදානම් මාරුකිරීම හේතු කොට ගෙන මෙම උප වර්ග අවම රඳවාගැනීමේ අනුපාත වාර්තා කරන ලදී.

## සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය.

2016 හා 2017 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ සමාගම් අතර වත්කම් බෙදීයාම 21 වැනි වගුවෙන් සහ 17 වැනි රූප සටහනින් නිරූපනය වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් 2017 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 185,767ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 වන දිනට වාර්තාකළ රුපියල් මිලියන 173,985ක් වූ වත්කම්වලට සාපේක්ෂව 6.77%ක වර්ධනයක් වාර්තා කරන ලදී.

එස්එල්අයිසී පසුගිය වසරට සමානව සාමාන්‍ය රක්ෂණ සමාගම් අතර විශාලතම වත්කම් කොටස හිමිකරගෙන ඇති අතර, රුපියල් මිලියන 69,155ක් (2016 : රුපියල් මිලියන 67,504) වටිනා වත්කම් වාර්තා කරමින් ක්ෂේත්‍රයේ මුළු වත්කම්වලින් 37.22%ක් (2016 : 38.80%) නියෝජනය කරන ලදී. එසේවුවත්, ඔවුන්ගේ වත්කම් කොටස 2016 වසරට සාපේක්ෂව 1.58%කින් අඩුවී ඇත.

සෙලින්කෝ ජෙනරල් සහ ජනශක්ති ජෙනරල් 2017 දෙසැම්බර් 31 වන දිනට මුළු වත්කම්වලින් පිළිවෙලින් 13.77%ක් සහ 11.92%ක් නියෝජනය කරමින් හා රුපියල් මිලියන 25,573 (2016 : රුපියල් මිලියන 23,376) ක් සහ රුපියල් මිලියන 22,142 (2016 : රුපියල් මිලියන 19,024)ක් වූ වත්කම් වටිනාකමක් වාර්තා කරමින් විශාලතම දෙවන හා තුන්වැනි ස්ථාන ලබාගනු ලැබීය.

**වගුව 22**

**2016 සහ 2017 දෙසැම්බර් 31 වන දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| වත්කම් වර්ගය | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | රු.000 | % | රු.000 | % |
| රාජ්‍ය ණය සුරැකුම්පත් | 40,101,080 | 23.05 | 41,870,344 | 22.54 |
| ස්කන්ධ | 37,795,017 | 21.72 | 38,355,376 | 20.65 |
| සංස්ථා ණය | 11,659,017 | 6.70 | 12,761,621 | 6.87 |
| ඉඩම් හා ගොඩනැගිලි | 11,573,141 | 6.65 | 11,364,135 | 6.12 |
| තැන්පතු | 11,404,871 | 6.56 | 18,500,476 | 9.96 |
| ඒකක භාර | 1,142,393 | 0.66 | 1,528,271 | 0.82 |
| ප්‍රතිරක්ෂණ ලැබීම් | 18,737,908 | 10.77 | 16,622,166 | 8.95 |
| ඔප්පුහිමියන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබියයුතු වාරික | 17,981,467 | 10.34 | 21,087,107 | 11.35 |
| දේපල, පිරියත හා උපකරණ | 5,783,922 | 3.32 | 6,524,695 | 3.51 |
| වෙනත් වත්කම් | 14,944,018 | 8.59 | 14,432,659 | 7.77 |
| මුදල් හා මුදල් සමාන දෑ | 2,862,317 | 1.65 | 2,719,914 | 1.46 |
| **එකතුව** | **173,985,152** | **100** | **185,766,765** | **100** |


ෆෙයාෆස්ට් සහ එන්අයිටීඑෆ් පිළිවෙලින් මුළු වත්කම්වලින් 8.53%ක සහ 7.14%ක් දායක වූ අතර, වත්කම් කොටස් අනුව හතරවැනි සහ පස්වැනි ස්ථාන ලබා ගත්හ. ෆෙයාෆස්ට් 2017 වසරේදී යූනියන් ජෙනරල් සමඟ ව්‍යාපාරික කටයුතු ඒකාබද්ධකිරීම හේතු කොට ගෙන රුපියල් මිලියන 12,891ක වැඩිවීමක් වාර්තා කරමින් 2017 වසර තුළ රුපියල් මිලියන 15,837 (2016 : රුපියල් මිලියන 2,946) ක වත්කම් වටිනාකමක් වාර්තා කරන ලදී. රක්ෂණ සමාගම්වල මුළු වත්කම්වලින් 78.58%ක් ඉහළම රක්ෂණ සමාගම් පහ අතර සංකේන්ද්‍රගතවී ඇති බවත් ඉතිරි 21.42% අනෙකුත් රක්ෂණ සමාගම් දොළහ විසින් අත්කරගෙන ඇති බවත් සඳහන් කිරීම වැදගත්ය.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම.

2016 හා 2017 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම 22 වැනි වගුවෙන් හා 18 වැනි රූප සටහනින් නිරූපණය කරයි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශයේ ප්‍රධාන ආයෝජන ක්‍ෂණය ලෙස රාජ්‍ය ණය සුරැකුම්පත් පැවති අතර, මුළු වත්කම් කළඹින් 22.54% නියෝජනය කරමින් රුපියල් මිලියන 41,870ක් (2016 : රුපියල් මිලියන 40,101) වාර්තා කරන ලදී. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 25(1) වගන්තියට අනුකූලව, රක්ෂකයින් විසින් අවම වශයෙන් තාක්ෂණික සංචිතයෙන් 20% ක ප්‍රමාණයක් රජයේ සුරකුම්පත්වල ආයෝජනය කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, රක්ෂණ සමාගම් එයට අනුකූල වී ඇති බවත්, ගොනුකළ වාර්තා මත පදනම් වී 2012 නිර්ණය 1 ට අනුකූලව ඉතිරි වත්කම් ආයෝජනය කළ බවත් කොමිසම සහතික කරයි.

**රූප සටහන 18**

**2016 සහ 2017 දෙසැම්බර් 31 වන දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ දෙවන විශාලතම වත්කම් වර්ගය නියෝජනය කරන ස්කන්ධ තුළ ආයෝජනය 2017 දෙසැම්බර් 31 දිනට 2016 වසර තුළ වාර්තා කරන ලද රුපියල් මිලියන 37,795 සිට 1.48%ක සුළු වැඩිවීමක් සමඟින් රුපියල් මිලියන 38,355 ක් විය. ඔප්පුහිමියන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබියයුතු වාරික ආදායම 2017 දී රුපියල් මිලියන 21,087ක් (2016 : රුපියල් මිලියන 17,981) වූ අතර, මුළු වත්කම්වලින් 11.35%ක් නියෝජනය කරමින් 2016 වසරට සාපේක්ෂව 17.27%කින් වැඩිවී ඇත.

2017 දී තැන්පතු තුළ ආයෝජන රුපියල් මිලියන 18,500ක් වූ අතර, බැංකු විසින් පිරිනමන ලද හිතකර පොළී අනුපාත හේතු කොට ගෙන 2016 වසර තුළ වාර්තා කරන ලද තැන්පතුවලට සාපේක්ෂව 62.22%ක වර්ධනයක් පෙන්නුම් කරමින් සැලකියයුතු ලෙස වැඩිවී ඇත. ඒ අනුව, මුළු වත්කම්වලින් 9.96%ක් (2016 :

වගුව 23

සවිස්තරාත්මක ආයෝජන ආදායම සහ සාමාන්‍ය ආයෝජන - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

| වර්ගය | 2016 (අ) | | | 2017 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජන (රු. '000) | ආයෝජන එලදා අනුපාතය (%) | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජන (රු. '000) | ආයෝජන එලදා අනුපාතය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 3,588,284 | 39,023,078 | 9.20 | 4,212,077 | 40,985,713 | 10.28 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 2,089,935 | | | 2,735,629 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 803,739 | | | 590,397 | | |
| - වෙනත් (රිපෝ) | 694,610 | | | 886,051 | | |
| **ස්කන්ධ** | 7,597,574 | 38,326,247 | 19.82 | 655,827 | 38,075,197 | 1.72 |
| - ප්‍රාග්ධන ලාභ/ අලාභ | (721,337) | | | 104,334 | | |
| - ලාභාංශ | 8,318,911 | | | 551,493 | | |
| **සංස්ථා ණය** | 1,114,281 | 10,267,033 | 10.85 | 1,413,752 | 12,210,319 | 11.58 |
| - ණයකර | 1,094,355 | | | 1,353,313 | | |
| - වාණිජ පත්‍රිකා හා වෙනත් | 19,926 | | | 60,439 | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 10,484 | 10,389,225 | 0.10 | - | 11,468,638 | - |
| **තැන්පතු** | 1,051,222 | 12,828,577 | 8.19 | 1,492,512 | 14,952,674 | 9.98 |
| - බැංකු | 818,071 | | | 1,131,569 | | |
| - මූල්‍ය ආයතන | 233,152 | | | 360,943 | | |
| **ඒකක භාර** | 96,798 | 1,486,219 | 6.51 | 102,045 | 1,335,332 | 7.64 |
| **රත්‍රන්** | - | 2,599 | - | - | 1,353 | - |
| **වෙනත්** | 364,141 | 541,405 | 67.26 | 464,209 | 576,326 | 80.55 |
| **එකතුව** | **13,822,785** | **112,864,383** | **12.25** | **8,340,422** | **119,605,552** | **6.97** |

6.56%) තැන්පතු නියෝජනය කරන ලදී. ප්‍රතිරක්ෂණ ලැබීම්, වත්කම් කොටසින් 8.95%ක් (2016 : 10.77%) නියෝජනය කළ අතර 2016 ට සාපේක්ෂව අඩුවීමක් වාර්තා කරමින් 2017 වසර තුළ රුපියල් මිලියන 16,622 ක් විය.

සංස්ථා ණය ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශයේ ප්‍රධාන ආයෝජන වර්ගයක් වන අතර, 2017 දී මුළු වත්කම්වලින් 6.87%ක් (2016 : 6.70%) නියෝජනය කරන ලදී.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජන ආදායම.

2016 සහ 2017 වසර සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සවිස්තරාත්මක ආයෝජන ආදායම, ආයෝජනයේ සාමාන්‍ය සහ විවිධ වත්කම් වර්ගවල

වගුව 24

රක්ෂණ සමාගම්වල ණය ගෙවීමේ හැකියාව අනුව සමාගම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2016 හා 2017 දෙසැම්බර් 31වන දිනට

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31වන දිනට (අ) | | | 2017 දෙසැම්බර් 31වන දිනට (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | පූර්ණ පවතින ප්‍රාග්ධනය (රු'000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු'000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) | පූර්ණ පවතින ප්‍රාග්ධනය (රු'000) | අවශ්‍ය අවදානම් ප්‍රාග්ධනය (රු'000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) |
| අලියාන්ස් ජෙනරල් | 717,076 | 561,308 | 128 | 1,242,299 | 862,788 | 144 |
| අමානා ජෙනරල් | 612,166 | 282,964 | 216 | 694,303 | 368,950 | 188 |
| සෙලින්කෝ ජෙනරල් | 4,808,967 | 2,898,591 | 166 | 5,256,966 | 2,683,035 | 196 |
| කොන්ටිනෙන්ටල් | 990,264 | 362,339 | 273 | 1,254,166 | 435,656 | 288 |
| කෝපරේටිව් ජෙනරල් | 930,531 | 668,347 | 139 | 1,255,470 | 707,534 | 177 |
| ෆෙයාර්ෆස්ට් | 697,852 | 498,335 | 140 | 2,996,328 | 1,879,831 | 159 |
| එච්එන්බී ජෙනරල්. | 745,532 | 444,704 | 168 | 945,781 | 530,608 | 178 |
| ජනශක්ති ජෙනරල් | 5,555,651 | 2,960,794 | 188 | 6,950,621 | 2,944,742 | 236 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,065,705 | 529,397 | 201 | 1,161,195 | 537,801 | 216 |
| එම්බීඑස්එල් | (112,186) | 395,693 | -28 | (188,192) | 146,896 | -128 |
| ඔරියන්ට් | 524,830 | 219,733 | 239 | 565,891 | 311,104 | 182 |
| පීපල්ස් | 2,782,250 | 819,580 | 339 | 2,825,708 | 884,562 | 319 |
| සණස | 126,492 | 79,881 | 158 | 131,015 | 106,859 | 123 |
| එස්එල්අයිසී | 25,791,641 | 13,866,523 | 186 | 27,050,916 | 13,501,434 | 200 |
| යුනියන් ජෙනරල් | 1,923,728 | 1,332,421 | 144 | | | |
| **එකතුව** | **47,160,499** | **25,920,610** | **177** | **52,142,466** | **25,901,800** | **177** |

ආයෝජන ඵලදා අනුපාතය පිළිබඳ විස්තර 23 වැනි වගුවෙන් පෙන්වා දේ.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ, සාමාන්‍ය ආයෝජනය 2017 දී රුපියල් මිලියන 119,606ක් වූ අතර 2016 දී වාර්තා කළ රුපියල් මිලියන 112,864ට සාපේක්ෂව 5.97%කින් එය වැඩි වී ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 8,340ක (2016 : රුපියල් මිලියන 13,823) ආයෝජන ආදායමක් වාර්තා කරන ලද අතර, 2017 දී 6.97% (2016 : 12.25%) ක සමස්ථ ආයෝජන ඵලදාවකට හේතු විය. 2016 සහ 2017 වසර තුළ ආයෝජන ආදායම සහ ආයෝජන ඵලදාවේ වෙනස්වීමට, ස්කන්ධ ආයෝජන යටතේ 2016 වසර තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වාර්තාකළ සැලකිය යුතු ලාභාංශ ආදායම ප්‍රධාන වශයෙන් හේතු විය.

රජයේ සුරැකුම්පත්වලින් උපයන ලද ආයෝජන ආදායම 2017 දී රුපියල් මිලියන 4,212ක් වූ අතර, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු සාමාන්‍ය ආයෝජනයෙන් රුපියල් මිලියන 40,986 ක් (2016 : රුපියල් මිලියන 39,023) බවට පත්වෙමින් සාමාන්‍ය ආයෝජනයේ විශාලතම කොටස වාර්තා කළේය. එමෙන්ම, රජයේ ණය සුරැකුම්පත් 2016 දී වාර්තා කළ 9.20%ට වඩා සුළු වැඩිවීමක් සමඟ 10.28%ක ආයෝජන ඵලදාවක් වාර්තා කර ඇත.

රක්ෂකයින් සංස්ථා ණය වෙළෙඳපොළ තුළ ආයෝජනය කිරීමට කැමැත්ත දක්වා ඇති අතර, 11.58%ක (2016 : 10.85%) ආයෝජන ඵලදාවක්

**වගුව 25**

**පූර්ණ පවතින ප්‍රාග්ධනය (TAC) සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2016 සහ 2017 දෙසැම්බර් 31වන දිනට**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31 දිනට (අ) පූර්ණ පවතින ප්‍රාග්ධනය (රු'000) | 2017 දෙසැම්බර් 31වන දිනට (අ) | | | |
|---|---|---|---|---|---|
| | | පළමු පෙළ ප්‍රාග්ධනය (රු'000) | දෙවන පෙළ ප්‍රාග්ධනය (රු'000) | අඩුකිරීම් (%) | පූර්ණ පවතින ප්‍රාග්ධනය (රු'000) |
| අලියාන්ස් ජෙනරල් | 717,076 | 1,516,063 | - | 273,765 | 1,242,298 |
| අමානා ජෙනරල් | 612,166 | 1,770,334 | 230,332 | 1,306,363 | 694,303 |
| සෙලින්කෝ ජෙනරල් | 4,808,967 | 9,728,950 | - | 4,471,984 | 5,256,966 |
| කොන්ටිනෙන්ටල් | 990,264 | 1,436,054 | - | 181,888 | 1,254,166 |
| කෝපරේටිව් ජෙනරල් | 930,531 | 1,821,632 | 299,401 | 865,563 | 1,255,470 |
| ෆෙයාෆස්ට් | 697,852 | 4,408,989 | - | 1,412,661 | 2,996,328 |
| එච්එන්බී ජෙනරල් | 745,532 | 1,127,779 | - | 181,998 | 945,781 |
| ජනශක්ති ජෙනරල් | 5,555,651 | 7,411,668 | 130,046 | 591,093 | 6,950,621 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,065,705 | 1,366,785 | - | 205,590 | 1,161,195 |
| එම්බීඑස්එල් ජෙනරල් | (112,186) | (16,206) | (8,125) | 163,861 | (188,192) |
| ඔරියන්ට් ජෙනරල් | 524,830 | 655,315 | - | 89,424 | 565,891 |
| පීපල්ස් | 2,782,250 | 3,054,156 | - | 228,448 | 2,825,708 |
| සණස | 126,492 | 216,900 | 2,666 | 88,552 | 131,015 |
| එස්එල්අයිසී | 25,791,641 | 40,247,281 | 8,140,049 | 21,336,414 | 27,050,916 |
| යූනියන් ජෙනරල් | 1,923,728 | | | | |
| **එකතුව** | **47,160,499** | **74,745,700** | **8,794,369** | **31,397,604** | **52,142,466** |

නියෝජනය කරමින් රුපියල් මිලියන 12,210ක් (2016 : රුපියල් මිලියන 10,267) වූ සාමාන්‍ය ආයෝජනයක් වාර්තා කරන ලදී.

බැංකු හා මූල්‍ය සමාගම් තැන්පතුවල සාමාන්‍ය ආයෝජනය රුපියල් මිලියන 14,953ක් වූ අතර, 2016 දී වාර්තා කළ රුපියල් මිලියන 12,829ට සාපේක්ෂව 16.56%ක ධනාත්මක වැඩිවීමක් වාර්තා කරන ලදී. ඒ අනුව, තැන්පතුවලින් උපයන ලද ආයෝජන ආදායම 42%

**වගුව 26**

**2016 සහ 2017 දෙසැම්බර් 31වන දිනට නියමිත අවදානම් පාදක ප්‍රාග්ධනය සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31වන දිනට (අ) (රු.'000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම | සම්බන්ධතා අවදානම | වෙළෙඳපොළ අවදානම | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම | විවිධාංගීකරණයට පසු මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම |
| අලියාන්ස් ජෙනරල් | 2,180 | 237,304 | 124,417 | 20,458 | 407,160 | 39,437 | 830,957 | 561,308 |
| අමානා ජෙනරල් | 21,957 | 192,716 | 27,660 | 7,621 | 129,781 | 27,354 | 407,089 | 282,964 |
| සෙලින්කෝ ජෙනරල් | 91,744 | 1,236,712 | 933,655 | 160,111 | 1,580,436 | 192,073 | 4,194,731 | 2,898,591 |
| කොන්ටිනෙන්ටල් | 30,840 | 82,511 | 120,790 | 25,043 | 251,418 | 30,039 | 540,641 | 362,339 |
| කෝපරේටිව් ජෙනරල් | 41,868 | 287,050 | 257,654 | 7,504 | 303,897 | 37,511 | 935,485 | 668,347 |
| ෆෙයාෆස්ට් | - | 312,810 | 26,518 | 2,586 | 361,380 | 28,922 | 732,217 | 498,335 |
| එච්එන්බී ජෙනරල් | 32,197 | 147,137 | 123,060 | 12,596 | 312,514 | 29,638 | 657,142 | 444,704 |
| ජනශක්ති ජෙනරල් | 221,028 | 742,781 | 1,593,990 | 90,617 | 1,314,322 | 157,305 | 4,120,044 | 2,960,794 |
| එල්ඕඑල්සී ජෙනරල් | 5,119 | 116,844 | 249,236 | 17,900 | 357,167 | 35,976 | 782,243 | 529,397 |
| එම්බීඑස්එල් | 7,643 | 319,052 | 21,438 | 19,040 | 147,104 | 10,870 | 525,146 | 395,693 |
| ඔරියන්ට් | 20,370 | 130,676 | 39,334 | 10,125 | 88,783 | 14,058 | 303,347 | 219,733 |
| පීපල්ස් | 92,857 | 73,973 | 377,322 | 7,178 | 603,036 | 63,976 | 1,218,342 | 819,580 |
| සණස | 3,347 | 24,298 | 44,659 | 3,149 | 25,803 | 4,700 | 105,955 | 79,881 |
| එස්එල්අයිසී | 129,353 | 6,754,211 | 6,640,757 | 100,841 | 2,485,869 | 675,194 | 16,786,224 | 13,866,523 |
| යූනියන් ජෙනරල් | 29,950 | 400,858 | 485,341 | 165,000 | 773,589 | 89,577 | 1,944,315 | 1,332,421 |
| **එකතුව** | **730,453** | **11,058,934** | **11,065,831** | **649,769** | **9,142,259** | **1,436,630** | **34,083,878** | **25,920,610** |

| රක්ෂකයා | 2017 දෙසැම්බර් 31වන දිනට (ආ) (රු.'000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම | සම්බන්ධතා අවදානම | වෙළෙඳපොල අවදානම | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම | විවිධාංගීකරණයට පසු මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම |
| අලියාන්ස් ජෙනරල් | 3,424 | 452,847 | 118,166 | 21,050 | 621,642 | 57,957 | 1,275,087 | 862,788 |
| අමානා ජෙනරල් | 24,535 | 253,239 | 59,175 | 5,421 | 134,244 | 29,764 | 506,378 | 368,950 |
| සෙලින්කෝ ජෙනරල් | 132,763 | 1,000,487 | 790,817 | 155,445 | 1,680,795 | 221,894 | 3,982,201 | 2,683,035 |
| කොන්ටිනෙන්ටල් | 51,223 | 78,492 | 111,412 | 21,073 | 345,841 | 37,968 | 646,009 | 435,656 |
| කෝපරේටිව් ජෙනරල් | 81,205 | 237,695 | 265,311 | 12,193 | 377,975 | 45,177 | 1,019,556 | 707,534 |
| ෆෙයාෆස්ට් | 36,684 | 1,084,791 | 414,418 | 23,577 | 1,044,536 | 103,739 | 2,707,745 | 1,879,831 |
| එච්එන්බී ජෙනරල් | 36,572 | 198,031 | 73,910 | 23,870 | 411,933 | 37,108 | 781,425 | 530,608 |
| ජනශක්ති ජෙනරල් | 263,296 | 626,577 | 1,538,642 | 161,096 | 1,389,150 | 188,889 | 4,167,651 | 2,944,742 |
| එල්ඕඑල්සී ජෙනරල් | 2,519 | 93,170 | 124,446 | 24,104 | 476,997 | 45,289 | 766,525 | 537,801 |
| එම්බීඑස්එල් | 3,255 | 82,679 | 24,758 | 6,259 | 88,708 | 5,645 | 211,303 | 146,896 |
| ඔරියන්ට් | 24,077 | 217,405 | 27,829 | 2,783 | 149,976 | 16,047 | 438,118 | 311,104 |
| පීපල්ස් | 118,529 | 139,463 | 215,990 | 8,342 | 738,073 | 71,151 | 1,291,548 | 884,562 |
| සණස | 3,204 | 43,318 | 52,022 | 1,677 | 36,620 | 5,770 | 142,612 | 106,859 |
| එස්එල්අයිසී | 172,360 | 5,796,802 | 7,069,453 | 138,351 | 2,860,164 | 689,716 | 16,726,847 | 13,501,434 |
| **එකතුව** | **953,646** | **10,304,996** | **10,886,349** | **605,241** | **10,356,654** | **1,556,114** | **34,663,005** | **25,901,800** |

කින් වැඩිවී ඇති අතර, 2017 වසර තුළ රුපියල් මිලියන 1,493ක් (2016 : රුපියල් මිලියන 1,051) වාර්තා කරන ලදී.

## රක්ෂණ සමාගම්වල ණය ගෙවීමේ හැකියාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය.

24 වැනි වගුව මගින් 2016 සහ 2017 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC) නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) හා ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (CAR) පිළිබඳ විස්තර ලබා දේ. 2016 සහ 2017 වසර සඳහා වාර්තා කළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය 177% ක්ව පැවතිණ. එක් සමාගමක් හැර අනෙකුත් සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් 2017 දෙසැම්බර් 31 වන දිනට 120%ක් වූ අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාත අවශ්‍යතාවය සමඟ අනුකූල වී ඇත. සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොල තුළ සමාගම් අතර පවත්නා දැඩි තරඟකාරීත්වය හමුවේ, රක්ෂණ සමාගම් බොහොමයක් 2016 දෙසැම්බර් 31 වන දිනට සාපේක්ෂව සමාගමේ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය වැඩිකර ගැනීමට හැකියාව ලැබී ඇත. පසුගිය වසරට සමානව, රක්ෂණ සමාගම් දෙකකට 2017 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 500 අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයට අනුකූල වීමට නොහැකි වී ඇත.

ඒ අනුව, කොමිෂන් සභාව විසින් 2015 නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) නියමයන් අනුකූල නොවූ එකී සමාගම් වලට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. එමෙන්ම, ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය 120% සහ 160% බලාත්මක මට්ටම අතර වාර්තා කරන ලද සමාගම් කොමිසම විසින් නිකුත් කළ අවදානම් පාදක වූ ප්‍රාග්ධනය පිළිබඳ බලාත්මක කිරීමේ ක්‍රමෝපාය ප්‍රකාරව සමීපව නියාමනය කරන ලදී.

## රක්ෂණ සමාගම්වල පූර්ණ පවත්නා ප්‍රාග්ධන (TAC) අවශ්‍යතාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2016 සහ 2017 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ වන්නා වූ පූර්ණ පවතින ප්‍රාග්ධනය 25 වැනි වගුවෙන් විස්තර කරයි. 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක වූ ප්‍රාග්ධනය) නියමයන් අනුව, පූර්ණ පවත්නා ප්‍රාග්ධනය පළමු පෙළ ප්‍රාග්ධනය, දෙවන පෙළ ප්‍රාග්ධනය සහ අඩුකිරීම්වලින් සමන්විත වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත, පූර්ණ පවත්නා ප්‍රාග්ධනය 2017 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 52,142ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 වන දිනට වාර්තා කළ රුපියල් මිලියන 47,160ට සාපේක්ෂව 10.56%කින් වැඩි වී ඇත. නිකුත්කළ හා සම්පූර්ණයෙන් ගෙවූ සාමාන්‍ය කොටස්, ප්‍රාග්ධන සංචිත සහ 2017 දී රුපියල් මිලියන 74,746ක් (2016 : රුපියල් මිලියන 73,330) වූ රඳවාගත් ඉපයීම් සඳහා අනෙකුත් ගැලපීම්වලින් පළමු පෙළ ප්‍රාග්ධනය සමන්විත වේ. පළමු පෙළ ප්‍රාග්ධනයෙන් 50% ඉක්මවිය නොහැකි දෙවන පෙළ ප්‍රාග්ධනය 2017 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 8,794ක් විය. පූර්ණ පවතින ප්‍රාග්ධනයෙන් අඩුකිරීම් වලංගු නොවන ණය, අත්තිකාරම්, පෙරගෙවීම්, තොග, ඔඩපනය කළ වත්කම්, විලම්බිත ආදායම් බදු යනාදියෙන් සමන්විත වන අතර, 2017 වසර තුළ රුපියල් මිලියන 31,398ක් විය.

## රක්ෂණ සමාගම් විසින් නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) සැසැඳීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය.

2016 සහ 2017 දෙසැම්බර් 31 වන දිනට අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයට අදාළ වන්නා වූ විවිධ අවදානම් අයකිරීම්වල සමාගම් අනුව සංයුතිය 26 වැනි වගුවෙන් විස්තර කරයි. විවිධාංගීකරණයට පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය විසින් වාර්තා කළ නියමිත අවදානම් ප්‍රාග්ධනය රුපියල් මිලියන 25,902 (2016 : රුපියල් මිලියන 25,921) ක් විය. විවිධාංගීකරණයට පෙර, මෙම ප්‍රමාණය රුපියල් මිලියන 34,663ක් විය. වෙළෙඳපොල අවදානම

**වගුව 27**

**ශුද්ධ ඉපයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| උප වර්ගය | ශුද්ධ ඉපයූ වාරික ආදායම (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016(අ) | 2017(ආ) |
| ගිනි | 1,405,887 | 1,241,985 | 1,283,463 | 1,213,542 | 1,727,872 |
| මුහුදු | 806,277 | 753,643 | 797,026 | 903,170 | 991,961 |
| රථවාහන | 31,346,284 | 33,826,829 | 37,958,834 | 44,593,900 | 50,558,538 |
| සෞඛ්‍ය | 5,204,603 | 7,079,162 | 8,071,777 | 9,349,093 | 11,496,828 |
| විවිධ | 5,640,974 | 4,402,900 | 3,270,599 | 3,306,901 | 3,869,039 |
| **උප එකතුව** | **44,404,025** | **47,304,518** | **51,381,699** | **59,366,606** | **68,644,238** |
| SRCC හා T | 2,406,477 | 2,692,730 | 2,914,630 | 3,274,297 | 3,734,322 |
| **එකතුව** | **46,810,502** | **49,997,248** | **54,296,329** | **62,640,903** | **72,378,560** |

| උප වර්ගය | දරන ලද ශුද්ධ හිමිකම්පෑම් (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016(අ) | 2017(ආ) |
| ගිනි | 810,281 | 717,626 | 645,231 | 1,024,290 | 1,604,152 |
| මුහුදු | 432,748 | 266,560 | 295,624 | 266,057 | 343,612 |
| රථවාහන | 19,514,319 | 20,281,109 | 24,274,415 | 28,966,019 | 31,189,912 |
| සෞඛ්‍ය | 4,029,410 | 6,252,704 | 6,958,816 | 8,065,476 | 10,470,746 |
| විවිධ | 2,133,310 | 1,522,689 | 1,677,736 | 2,121,221 | 4,312,451 |
| **උප එකතුව** | **26,920,068** | **29,040,687** | **33,851,822** | **40,443,063** | **47,920,873** |
| SRCC හා T | - | 56,897 | 780 | 33,677 | (10,519) |
| **එකතුව** | **26,920,068** | **29,097,585** | **33,852,602** | **40,476,740** | **47,910,354** |

| උප වර්ගය | ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016(අ) | 2017(ආ) |
| ගිනි | 57.63 | 57.78 | 50.27 | 84.40 | 92.84 |
| මුහුදු | 53.67 | 35.37 | 37.09 | 29.46 | 34.64 |
| රථවාහන | 62.25 | 59.96 | 63.95 | 64.96 | 61.69 |
| සෞඛ්‍ය | 77.42 | 88.33 | 86.21 | 86.27 | 91.08 |
| විවිධ | 37.82 | 34.58 | 51.30 | 64.15 | 111.46 |
| **උප එකතුව** | **60.63** | **61.39** | **65.88** | **68.12** | **69.81** |
| SRCC හා T | - | 2.11 | 0.03 | 1.03 | (0.28) |
| **එකතුව** | **57.51** | **58.20** | **62.33** | **64.62** | **66.19** |

| විස්තරය | ශුද්ධ වියදම් (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016(අ) | 2017(ආ) |
| SRCC සහ T හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ වියදම් | 17,359,623 | 19,524,543 | 19,134,713 | 21,421,928 | 24,262,663 |
| SRCC හා T | 414,422 | 466,435 | 486,985 | 653,706 | 703,970 |
| **එකතුව** | **17,774,045** | **19,990,978** | **19,621,698** | **22,075,634** | **24,966,633** |

| විස්තරය | ශුද්ධ වියදම් අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016(අ) | 2017(ආ) |
| SRCC සහ T හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ වියදම් අනුපාතය | 39.09 | 41.27 | 37.24 | 36.08 | 35.35 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ වියදම් අනුපාතය | 37.97 | 39.98 | 36.14 | 35.24 | 34.49 |

| විස්තරය | ශුද්ධ ඒකාබද්ධ අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016(අ) | 2017(ආ) |
| SRCC සහ T හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ ඒකා-බද්ධ අනුපාතය | 99.72 | 102.67 | 103.12 | 104.21 | 105.16 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය | 95.48 | 98.18 | 98.49 | 99.86 | 100.69 |

ප්‍රධාන අවදානම් වර්ගය වූ අතර, 2017 වසර තුළ විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම්වලින් 31.41% (2016 : 32.47%) ක් නියෝජනය කරන ලදී. වාරික ආදායම සහ හිමිකම්පෑම් වගකීම් ඇතුළත් වගකීම් අවදානම් අයකිරීම් මුළු අවදානම් අයකිරීම්වලින් 29.88%ක් නියෝජනය කළ අතර, 2016 වසර තුළ වාර්තාකළ 26.82%ට සාපේක්ෂව 2017 වසර තුළ 3.06%කින් වැඩි විය. සම්බන්ධතා අවදානම මුළු වලංගු ප්‍රාග්ධනයෙන් වලංගු නොවන හා අඩු කිරීමට අවශ්‍ය නොවන වත්කම් වල වටිනාකමට අදාල වන අතර 2017 වසර තුළ රුපියල් මිලියන 10,305ක් වෙමින් 2016 දෙසැම්බර් 31 දිනට වාර්තා කළ රුපියල් මිලියන 11,059ට සාපේක්ෂව 6.82%කින් අඩුවී ඇත.


සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර දත්ත අනුව මෙහෙයුම් අවදානම, ණය අවදානම සහ ප්‍රතිරක්ෂණ අවදානම සංසන්දනාත්මකව අඩු අගයක් ගන්නා අතර, 2017 දෙසැම්බර් 31 වන දිනට විවිධාංගිකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම්වලින් පිළිවෙලින් 4.49%, 2.75%ක් සහ 1.75%ක් විය.

## ශුද්ධ ඉපයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

27 වැනි වගුව සහ 19 වැනි රූපසටහනින් පෙන්වා දෙන පරිදි, SRCC හා T ඇතුළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප වර්ගවලින් උපයන ලද ශුද්ධ ඉපයූ වාරික ආදායම 2016 වසරේ වාර්තා කළ රුපියල් මිලියන 62,641ට සාපේක්ෂව රුපියල් මිලියන 72,379ක් වූ අතර 15.55%ක වර්ධනයක් වාර්තා කරන ලදී. 2017 වසරේදී දළ ලිඛිත වාරික ආදායම දැක්වූ වර්ධනය ශුද්ධ ඉපයූ වාරික ආදායම තුළ වාර්තාකළ ඉහත සඳහන් වර්ධනයට හිතකර අයුරින් බලපාන ලදී.

දරන ලද මුළු ශුද්ධ හිමිකම්පෑම් පසුගිය වසර පහ තුළ වැඩිවී ඇති අතර, 2017 දී 18.49% (2016 : 21.01%) කින් වැඩිවිය. SRCC හා T හැර දරන ලද මුළු ශුද්ධ හිමිකම්පෑම් 2016 දී වාර්තා කළ රුපියල් මිලියන 40,443ට සාපේක්ෂව රුපියල් මිලියන 47,921ක් ලෙස වාර්තා

**රූප සටහන 19**
**ශුද්ධ ඉපයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උපවර්ගවල හිමිකම්පෑම්වල වැඩිවීමකට හේතු වූ මිනිසුන් සහ දේපල විශාල සංඛ්‍යාවකට බලපාමින් රටතුළ පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් සහ ඩෙංගු අවස්ථාවන් හී වර්ධිත සංඛ්‍යාව මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. එමනිසා, කාලගුණ රටාවේ වෙනස්වීම්, වර්ෂාපතනයේ වාරගණන සහ දරුණුකම වැඩිවීම රක්ෂකයින් සඳහා අවදානම් වැඩිකර ඇති අතර ඒ නිසාම රක්ෂකයින් විසින් කාර්යක්ෂම ආකාරයකින් එකී අවදානම් පිළිබඳ කාර්යක්ෂම මිලකරණය සහ තක්සේරු කිරීමේ අවශ්‍යතාව ඉස්මතු විය.

මෝටර් රථවාහන රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 50,559ක් වූ (2016 : රුපියල් මිලියන 44,594) ශුද්ධ ඉපයූ වාරික ආදායම් වාර්තා කර ඇති අතර, 2017 වසර තුළ SRCC සහ T ඇතුළුව මුළු ශුද්ධ ඉපයූ වාරික ආදායමෙන් 69.85%ක් නියෝජනය කරන ලදී. රථවාහන රක්ෂණ වර්ගය රුපියල් මිලියන 31,190ක් වූ (2016 : රුපියල් මිලියන 28,966) දරන ලද ඉහළම ශුද්ධ හිමිකම්පෑම් වාර්තා කරන ලද අතර, 2017 දී SRCC සහ T ඇතුළුව දරන ලද මුළු හිමිකම්පෑම්වලින් 65.10%ක් නියෝජනය කරමින් 61.69%ක (2016 : 64.96%) ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයක් වාර්තා කරන ලදී.

සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරය 2017 වසර සඳහා (SRCC සහ T ඇතුළුව) මුළු ශුද්ධ ඉපයූ වාරික ආදායම්වලින් 15.88% ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 11,497ක් (2016 :රුපියල් මිලියන 9,349) වූ ශුද්ධ ඉපයූ වාරික ආදායම් වාර්තා කරන ලදී. මෙම වර්ගයේ ව්‍යාපාරය 2017 වසර තුළ රුපියල් මිලියන 10,470 (2016 : රුපියල් මිලියන 8,065) වාර්තා කරමින් සහ (SRCC සහ T හැර) දරන ලද මුළු ශුද්ධ හිමිකම්පෑම්වලින් 21.85%ක් (2016 : 19.94%) නියෝජනය කරමින් දෙවන විශාලතම ශුද්ධ හිමිකම්පෑම් වාර්තා කරන ලදී. 91.08% (2016 : 86.27%) ක් වූ ඉහළ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොල සඳහා අභියෝගයකි.

විවිධ රක්ෂණ ව්‍යාපාරය 2016 වසරේ වාර්තා කළ රුපියල් මිලියන 3,306ට සාපේක්ෂව 17%ක වැඩිවීමක් සමඟ රුපියල් මිලියන 3,870ක ශුද්ධ ඉපයූ වාරික ආදායමක් වාර්තා කරන ලදී. මෙම උප වර්ගය 2017 වසරේදී 111.46%ක ඉහලම ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය වාර්තා කළ අතර 2016 වසර තුළ වාර්තාකළ 64.15% ක් වූ හිමිකම් අනුපාතයේ සිට සැලකියයුතු ලෙස වැඩි වී ඇත. නියඟය හැර සුළි සුළඟ, කුණාටුව, චණ්ඩ මාරුතය, ගංවතුර, නායයාම්, සැඩ කුණාටු, භූමිකම්පා, සුනාමි සහ වෙනත් යම් සමාන ස්වභාවික ආපදාවලින් රක්ෂණය නොකළ ජීවිත සහ දේපල, නිවාස සහ සුළු පරිමාණ ව්‍යාපාර ආයතනවලට ඇතිවන ආලාභ

වගුව 28

දළ ලිඛිත වාරික ආදායම නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

| | ඔප්පු සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
| ගිනි | 177,749 | 188,578 | 227,800 | 246,058 | 242,184 |
| මුහුදු | 158,893 | 186,447 | 190,720 | 191,966 | 196,293 |
| මෝටර් රථවාහන | 3,795,059 | 4,004,162 | 4,531,187 | 5,075,622 | 5,428,618 |
| තුන්වැනි පාර්ශ්ව පමණක් | 2,126,037 | 2,229,153 | 2,460,596 | 2,628,255 | 2,785,000 |
| විස්තීරණ | 1,669,022 | 1,775,009 | 2,070,591 | 2,447,367 | 2,643,618 |
| සෞඛ්‍ය | 11,609 | 13,716 | 15,053 | 16,040 | 14,121 |
| විවිධ | 186,131 | 204,285 | 202,038 | 238,921 | 290,357 |
| **එකතුව** | **4,329,441** | **4,597,188** | **5,166,798** | **5,768,607** | **6,171,573** |

ආවරණය කිරීමට ආරක්ෂක යෝජනා ක්‍රමයක් ලෙස 2016 අප්‍රේල් 01 දින සිට ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වාදුන් ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) මෙයට ප්‍රධාන හේතුව විය. ඉහත යෝජනා ක්‍රමයේ මුළු ආවරණය 2017/2018 දී රුපියල් බිලියන 10 සිට රුපියල් බිලියන 15 දක්වා වැඩිවිය. එන්අයටීඑෆ් 2016 සහ 2017 අවසානයේදී පිළිවෙලින් රුපියල් බිලියන 3.5ක සහ රුපියල් බිලියන 4.7ක දරන ලද මුළු හිමිකම්පෑම් වාර්තා කරන ලදී. NNDIS 2016 දී ප්‍රතිරක්ෂණ ආවරණයක් මගින් පිටු බලයදුන් අතර, ප්‍රතිරක්ෂකයින්ගෙන් රුපියල් බිලියන 2.2ක් ආවරණය කිරීමට සැලසුම් කරයි. එසේවුවත්, 2017/2018 සඳහා, ප්‍රතිරක්ෂණ ආවරණය මැයි මස ගංවතුරෙන් පසු බලාත්මකවූ අතර හිමිකම්පෑම් ගෙවීම් රඳවාගැනීමේ සීමාවන් තුළ රඳවමින්, මුළු හිමිකම්පෑමේ වගකීම ජාතික රක්ෂණ භාරකාර අරමුදල වෙත පැවරිණි.

ගිනි රක්ෂණ ව්‍යාපාරය සඳහා දරන ලද ශුද්ධ හිමිකම්පෑම් 2016 වසරේ වාර්තා කළ රුපියල් මිලියන 1,024 සිට 56.64% කින් 2017 වසරේ රුපියල් මිලියන 1,604 දක්වා වැඩි වී ඇති අතර 92.84%ක ශුද්ධ හිමිකම්පෑමේ අනුපාතයක් වාර්තා කරන ලදී. මෙය ගංවතුර හිමිකම්පෑම් හේතුකොට ගෙන 2016 වසර තුළ වාර්තා කළ 84.40%ට වඩා වැඩි අගයකි.

පෙර වසරට සමානව, මුහුදු රක්ෂණය 34.64%ක අඩු හිමිකම් අනුපාතයක් වාර්තා කළ අතර, 2016 වසරේදී වාර්තා කළ 29.46%ක හිමිකම්පෑමේ අනුපාතයට සාපේක්ෂව 5.18%කින් සුළු වශයෙන් වැඩිවීමකි.

27 වැනි වගුවේ හා 19 වැනි රූප සටහනේ නිරූපණය වන පරිදි, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය විසින් දරන ලද ශුද්ධ වියදම් (SRCC සහ T ඇතුළුව) 2017 දී රුපියල් මිලියන 24,967ක් (2016 : රුපියල් මිලියන 22,076) වූ අතර, 3.10%කින් වැඩිවී ඇත. එන්අයිටීඑෆ් විසින් SRCC සහ T සඳහා වාර්තාකළ ශුද්ධ වියදම පසුගිය වසර පහ තුළ අඛණ්ඩව වැඩිවී ඇති අතර, 2017 දී රුපියල් මිලියන 704ක් (2016 : රුපියල් මිලියන 654)ක් විය.

ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය සහ ශුද්ධ වියදම් අනුපාතය යන දෙකෙහිම සමාහාරය පිළිබිඹු කරන ශුද්ධ ඒකාබද්ධ අනුපාතය 2016 දී වාර්තා කළ 99.86% සිට 100.69 දක්වා වැඩිවී ඇත. 100% ඉක්මවන ඒකාබද්ධ අනුපාතය තුළින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු හිමිකම්පෑම් සහ දරන වියදම ඉපයූ වාරික ආදායමට ඉහළින් ඇති බව පෙන්නුම් කරයි.

## දළ ලිඛිත වාරික ආදායම නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය.

2013 සිට 2017 දක්වා දළ ලිඛිත වාරික ආදායමට දායක වී ඇති සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විවිධ උප වර්ගවලට අදාළ වන්නා වූ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 28 වැනි වගුවෙන් නිරූපණය කරයි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප වර්ගවලට අදාළ රක්ෂණ ඔප්පුවල මුළු ගණන 2016 දී වර්තා කළ ඔප්පු

වගුව 29

නව, අලුත් කළ සහ ක්‍රියාත්මකව ඇති රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

| | 2016 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| | නව ඔප්පු | අලුත් කළ ඔප්පු | වසර අවසානයට ක්‍රියාත්මක ඔප්පු | නව ඔප්පු | අලුත් කළ ඔප්පු | වසර අවසානයට ක්‍රියාත්මක ඔප්පු |
| ගිනි | 103,969 | 136,976 | 344,682 | 88,247 | 156,266 | 242,602 |
| මුහුදු | 165,619 | 5,180 | 237,873 | 170,330 | 5,669 | 166,547 |
| මෝටර් රථ වාහන | 2,191,720 | 2,886,731 | 5,053,554 | 2,380,751 | 3,029,136 | 5,354,234 |
| තුන් වැනි පාර්ශ්වය පමණක් | 1,178,712 | 1,453,258 | 2,657,337 | 1,289,099 | 1,484,081 | 2,780,940 |
| විස්තීර්ණ | 1,013,008 | 1,433,473 | 2,396,217 | 1,091,652 | 1,545,055 | 2,573,294 |
| සෞඛ්‍ය | 8,826 | 6,235 | 14,649 | 5,043 | 7,716 | 11,563 |
| විවිධ | 183,772 | 47,437 | 259,060 | 229,380 | 63,798 | 276,921 |
| **එකතුව** | **2,653,906** | **3,082,559** | **5,909,818** | **2,873,751** | **3,262,585** | **6,051,867** |

5,768,607 සිට 2017 දී ඔප්පු 6,171,573 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

පසුගිය වසරට සමානව, රථවාහන රක්ෂණ ව්‍යාපාරය 2017 වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ තනි උප වර්ගයකින් විශාලතම ඔප්පු සංඛ්‍යාව සඳහා දායක වූ අතර, 2017 වසර තුළ මුළු ඔප්පුවලින් 87.96%ක් (2016 : 87.98%) නියෝජනය කරන ලදි. නිකුත් කරන ලද මුළු රථවාහන ඔප්පුවලින්, බහුතරය තෙවන පාර්ශව රක්ෂණය වූ අතර ඒ තුළින් පිළිඹිබු කරනුයේ ජනතාව නීතිමය අවශ්‍යතාව සපුරාලීමට පමණක් අඩු වාරිකයක් සඳහා අවම මට්ටමේ ආරක්ෂාවක් කෙරෙහි යොමුවන බවයි. ගිනි හා සෞඛ්‍ය රක්ෂණ ඔප්පු හැර සියලූම උප වර්ග සඳහා රක්ෂණ ඔප්පු 2016ට සාපේක්ෂව 2017 දී වැඩි වී ඇත.

## නව, අලුත් කළ සහ ක්‍රියාත්මකව ඇති රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය.

29 වැනි වගුවෙන් සහ 20 වැනි රූප සටහනින් පෙන්වන පරිදි 2016 සහ 2017 වසර සඳහා නව රක්ෂණ ඔප්පු, අළුත්කළ ඔප්පු සහ බලාත්මක ඔප්පු පිළිබඳ විස්තර නිරූපණය කරයි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියළු උප වර්ගවලට අදාළ බලාත්මකව පවත්නා මුළු ඔප්පු සංඛ්‍යාව 2017 දී 6,051,867 (2016 : 5,909,818)ක් වූ අතර, 2016ට සාපේක්ෂව 2.40%කින් වැඩිවී ඇත. පසුගිය වසරට සමානව, රථවාහන රක්ෂණය ඔප්පු 5,354,234 (2016 : 5,053,554) ක් වාර්තා කරමින් 2017 වසර අවසානයේදී බලාත්මකව පවත්නා විශාලතම ඔප්පු සංඛ්‍යාව නියෝජනය කළ අතර, එය තෙවන පාර්ශ්ව රක්ෂණ ඔප්පු 2,780,940කින් ( 2016 : 2,657,337) සහ විස්තීර්ණ රක්ෂණ ඔප්පු 2,573,294 කින් (2016 : 2,396,217) සමන්විත විය. වසර තුළ, මුහුදු රක්ෂණය සහ ගිනි රක්ෂණය සඳහා බලාත්මක ඔප්පු පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් 29.98%කින් සහ 29.62%කින් අඩුවී ඇත. බලාත්මක විවිධ ඔප්පු 2016ට සාපේක්ෂව 2017 දී 6.89% කින් සුළු වශයෙන් වැඩිවී ඇත.

## ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය.


එන්අයිටීඑෆ් ප්‍රාථමික රක්ෂකයින්ට ප්‍රතිරක්ෂණ ආවරණ ලබාදෙන ශ්‍රී ලංකාවේ එකම ආයතනය ලෙස ක්‍රියා කරයි. 2012.12.31 දිනැති අංක 1791/4 දරණ රජයේ ගැසට් නිවේදනයට අනුව සියලුම ප්‍රාථමික රක්ෂකයින් විසින් එන්අයිටීඑෆ් වෙත සෑම සාමාන්‍ය රක්ෂණ ක්‍රමයකින්ම 30%ක ප්‍රතිපාදනයක් ලබාදිය යුතුය.

2017 වසර තුළ, එන්අයිටීඑෆ් ප්‍රතිරක්ෂණ වාරික ආදායම ලෙස රුපියල් මිලියන 3,683ක් උපයාගෙන ඇති අතර එය 2016 දී උපයන ලද රුපියල් මිලියන 2,397ට සාපේක්ෂව 53.64%කින් වැඩිවීමකි.


2017 වසර තුළ, එන්අයිටීඑෆ් විසින් ආපසු පවරාදෙන වාරික ලෙස රුපියල් මිලියන 175ක් (2016 : රුපියල් මිලියන 252) ප්‍රතිරක්ෂකයින්ට පවරා දී ඇති අතර එය 95.25%ක (2016 : 89.50%) රඳවාගැනීමේ අනුපාතයක් වාර්තා කිරීමට හේතු වී ඇත. එන්අයිටීඑෆ් 58.53%ක ධනාත්මක වැඩිවීමක් පිළිබිඹු කරමින් රුපියල් මිලියන 3,058 (2016 : රුපියල් මිලියන 1,929)ක ශුද්ධ ඉපයූ වාරික ආදායමක් වාර්තා කරන ලදී.

2017 දී දැරූ ශුද්ධ හිමිකම්පෑම් රුපියල් මිලියන 2,326 (2016 :රුපියල් මිලියන 2,868) ක් වූ අතර. එය 76.06% (2016 : 148.68%)ක හිමිකම්පෑම් අනුපාතයකට හේතු විය. එන්අයිටීඑෆ් හි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය වාර්තාකළ වියදම 2017 වසර

**රූප සටහන 20**
**නව, අලුත් කළ සහ ක්‍රියාත්මකව ඇති රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




**රූප සටහන 21**
**2008 සිට 2017 දක්වා රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා ජනනය කළ දළ ලිඛිත වාරික ආදායම**




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දීර්ඝ කාලීන රක්ෂණය ද.ලි.වා.ආ.(රු.මිලියන) | 195 | 188 | 243 | 296 | 195 | 191 | 158 | 206 | 263 | 341 |
| සාමාන්‍ය රක්ෂණය ද.ලි.වා.ආ.(රු. මිලියන) | 8,781 | 8,698 | 9,317 | 10,193 | 12,532 | 14,189 | 14,559 | 16,124 | 17,518 | 22,083 |
| මුළු ද.ලි.වා.ආ.(%) තැරැව්කාර සමාගම්වල දායකත්වය | 15.43 | 15.44 | 14.43 | 12.78 | 14.03 | 14.39 | 13.91 | 13.28 | 12.43 | 13.62 |

තුළ රුපියල් මිලියන 765ක් වූ අතර, 2016 දී දරන ලද රුපියල් මිලියන 583ට වඩා 31.22%ක වැඩිවීමක් වාර්තා කරමින් 2017 දී 25.02%ක (2016 : 30.22%) වියදම් අනුපාතයකට හේතු විය. ඒ අනුව, හිමිකම් අනුපාතය සහ වියදම් අනුපාතයේ එකතුව වන ඒකාබද්ධ අනුපාතය 2016 දී වාර්තා කළ 178.90% ට වඩා 77.82%කින් සැලකිය යුතු ලෙස අඩුවෙමින් 101.08%ක් විය.

එන්අයිටීඑෆ් හි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය විසින් දරන ලද මුළු වත්කම් 2017 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 4,250ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 වන දිනට වාර්තා කළ රුපියල් මිලියන 5,755ක් වූ වත්කම් වටිනාකමට සාපේක්ෂව 26.15% කින් අඩුවී ඇත. එන්අයිටීඑෆ් හි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කරන ලද රජයේ සුරැකුම්පත්වල ආයෝජන 2016 දෙසැම්බර් 31 වන දිනට වාර්තා කළ රුපියල් මිලියන 1,625ට අනුව 2017 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 347 දක්වා 78.65%කින් සැලකිය යුතු ලෙස පහත වැටී ඇත.

ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන වත්කම් වර්ගීකරණය වන ප්‍රතිරක්ෂණ ලැබීම් රුපියල් මිලියන 2,194 (2016 : රුපියල් මිලියන 2,880)ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 වන දිනට මුළු වත්කම් වලින් 51.62%ක් නියෝජනය කරන ලදී. එකී ශේෂය 2016 සිට වෙනස් නොවී පවතී. ඒ අනුව, එන්අයිටීඑෆ් හි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට 2017 දෙසැම්බර් 31 වන දිනට රක්ෂණ ගිවිසුම් වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් අනුමත ආයෝජන නොතිබුණි.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

2017 වසර තුළ දී රක්ෂණ තැරැව්කාර සමාගම් හැටක් වෙළඳපොල තුළ ක්‍රියාත්මක වූ අතර රුපියල් මිලියන 22,423ක් වූ දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කළේය. ඒ අනුව රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදිත මුළු දළ ලිඛිත වාරික ආදායම 2016 වසරේ දී උත්පාදිත රුපියල් මිලියන 17,781 හා සැසඳීමේ දී 2017 දී 26.11%ක

**වගුව 30**

**රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා ජනනය කළ දළ ලිඛිත වාරික ආදායම - 2017**

| | | දළ ලිඛිත වාරික ආදායම | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය | | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | | එකතුව | |
| රක්ෂණ තැරැව්කාර සමාගමේ නම | | රු.('000) | වෙළඳපොළ කොටස (%) | රු.('000) | වෙළඳපොළ කොටස (%) | රු.('000) | වෙළඳපොළ කොටස (%) |
| 1 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 14,725 | 4.32 | 692,419 | 3.14 | 707,144 | 3.15 |
| 2 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 3,745 | 1.10 | 627,123 | 2.84 | 630,868 | 2.81 |
| 3 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 882 | 0.26 | 684,235 | 3.10 | 685,117 | 3.06 |
| 4 | ඇලියොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 6,671 | 1.96 | 120,540 | 0.55 | 127,211 | 0.57 |
| 5 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 403 | 0.12 | 1,829,565 | 8.29 | 1,829,968 | 8.16 |
| 6 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 510 | 0.15 | 131,486 | 0.60 | 131,996 | 0.59 |
| 7 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 79 | 0.02 | 2,704,243 | 12.25 | 2,704,322 | 12.06 |
| 8 | කලම්බුරී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 6,445 | 1.89 | 272,431 | 1.23 | 278,876 | 1.24 |
| 9 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 35,560 | 10.44 | 2,527,181 | 11.44 | 2,562,741 | 11.43 |
| 10 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 73,091 | 21.45 | 967,461 | 4.38 | 1,040,552 | 4.64 |
| 11 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | - | 158,195 | 0.72 | 158,195 | 0.71 |
| 12 | එසාජි කරීම්ජී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 23,806 | 6.99 | 462,280 | 2.09 | 486,087 | 2.17 |
| 13 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 20,006 | 5.87 | 1,251,088 | 5.67 | 1,271,094 | 5.67 |
| 14 | ෆෝසයිට් ඉන්සුවරන්ස් ඇන්ඩ් රීඉන්සුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | - | - | 143,942 | 0.65 | 143,942 | 0.64 |
| 15 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5,307 | 1.56 | 115,258 | 0.52 | 120,565 | 0.54 |
| 16 | ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 23,898 | 7.01 | 130,859 | 0.59 | 154,758 | 0.69 |
| 17 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,169 | 0.64 | 157,476 | 0.71 | 159,645 | 0.71 |
| 18 | මර්කන්ටයිල් ඉන්සුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 159 | 0.05 | 326,290 | 1.48 | 326,449 | 1.46 |
| 19 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 7,194 | 2.11 | 1,612,609 | 7.30 | 1,619,803 | 7.22 |
| 20 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5,995 | 1.76 | 350,873 | 1.59 | 356,868 | 1.59 |
| 21 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | - | 1,301,599 | 5.89 | 1,301,599 | 5.80 |
| 22 | ආර්.එම්.එස්.ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | - | - | 106,778 | 0.48 | 106,778 | 0.48 |
| 23 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 26,383 | 7.74 | 579,623 | 2.62 | 606,006 | 2.70 |
| 24 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 18,092 | 5.31 | 1,469,745 | 6.66 | 1,487,837 | 6.64 |
| 25 | සෙන්කඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | - | 1,082,045 | 4.90 | 1,082,045 | 4.83 |
| 26 | ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 8,676 | 2.55 | 954,691 | 4.32 | 963,367 | 4.30 |
| 27 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 923 | 0.27 | 219,709 | 0.99 | 220,632 | 0.98 |
| | **උප-එකතුව** | **284,719** | **83.56** | **20,979,745** | **95.01** | **21,264,464** | **94.83** |
| | **වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් 33** | **55,998** | **16.44** | **1,103,022** | **4.99** | **1,159,020** | **5.17** |
| | **මුළු එකතුව** | **340,717** | **100** | **22,082,767** | **100.00** | **22,423,484** | **100.00** |

වර්ධනයක් පෙන්නුම් කරයි. පිළිවෙලින් රුපියල් මිලියන 341 (1.52%)ක් සහ රුපියල් මිලියන 22,083 (98.48%)ක් වූ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හරහා උත්පාදිත වාරික ආදායම මෙම මුළු දළ ලිඛිත වාරික ආදායමට ඇතුළත් විය.

පසුගිය වසර කිහිපය හා සමානව, 2017 වසර තුළදී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි රක්ෂණ තැරැව්කාර සමාගම්වල දායකත්වය එතරම් වැදගත් නොවීය. රක්ෂණ තැරැව්කාර සමාගම්වලින් ලබාදෙන ලද තොරතුරු අනුව, දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 0.48%ක් (රුපියල් මිලියන 71,504) පමණ විය. එසේවුවත්, රක්ෂණ තැරැව්කාර සමාගම් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 23.72%ක් උත්පාදනය කර ඇති අතර (වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම ඇතුළුව) එය රුපියල් මිලියන 93,119ක් විය.

2017 වසරේ දී, රක්ෂණ තැරැව්කාර සමාගම් 27ක් විසින් රු. මිලියන 100 ඉක්මවන දළ ලිඛිත වාරික ආදායමක් ප්‍රසම්පාදනය කළ අතර, මෙම රක්ෂණ තැරැව්කරුවන් සාමූහිකව රුපියල් මිලියන 21,264ක දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කළේය. 30 වැනි වගුවෙන් නිරූපණය කර ඇති පරිදි ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් 33, රු. මිලියන 1,159ක් උත්පාදනය කර ඇත.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## අධීක්ෂණ සමාලෝචනය

### රක්ෂණ සමාගම්

### 1. වාර්තා පිළිබඳ සමාලෝචනය

#### අ) වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ජීවගණකඥ වාර්තා

සියලු රක්ෂණ සමාගම් ඔවුන්ගේ වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාල මූල්‍ය වර්ෂය අවසන් වී සිව් මසක් ඇතුළත නිර්ණය අංක 14ට අනුකූල වන පරිදි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ. තවද දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ නිරත වී සිටින රක්ෂණ සමාගම් ජීවගණකඥ වාර්තාවන් සහ එහි සංක්ෂිප්තයන් ද වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

කොමිෂන් සභාව ඉහත සඳහන් වාර්තා නියමිත දිනට පනතේ විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කර ඇතිදැයි විශ්ලේෂණය කර, තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කරනු ලබයි. එම වාර්තාවන් සමාලෝචනය කිරීමේදී හඳුනාගනු ලබන ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවලින් බැහැරවීම්, වෙනත් විෂමතාවයන් හා හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා අදාල රක්ෂණ සමාගම් දැනුවත් කරන ලදී. පනතේ විධිවිධාන ප්‍රකාරව රක්ෂණ සමාගම් කටයුතු කර ඇත්දැයි නිරීක්ෂණය කිරීමට කොමිෂන් සභාව විසින් පසු විපරම් කටයුතු සිදු කරන ලදී. තවද ඉදිරිපත් කරන ලද වාර්තා සමාලෝචනය කිරීමේදී නිරීක්ෂණය කරන ලද ඇතැම් කරුණු ක්ෂේත්‍රගත විමර්ෂණ අතරතුරදී අවධානයට ලක් කරන ලදී.

#### ආ) අවදානම් ඇගයීමේ වාර්තා

අවදානම් පාදක ප්‍රාග්ධන රාමුව සමග අනුකූලවීම සඳහා අවදානම් ඇගයීමේ වාර්තා මෙම වර්ෂය තුළදී සංශෝධනය කරන ලදී.

රක්ෂණ සමාගම් විසින් 2016 වර්ෂයට අදාල අවදානම් ඇගයීමේ වාර්තාවන් 2017 ඔක්තෝබර් මස 31 දිනට හෝ ඊට ප්‍රථම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු විය. රක්ෂණ සමාගම් 06ක් හැර සෙසු සමාගම් නියමිත දිනට මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වූහ. එක් එක් රක්ෂණ සමාගම්වල මෙහෙයුම් කටයුතු පිළිබඳ සමාලෝචනයන් ලබාගැනීම සඳහාත්, ආයතනික ව්‍යුහය, හිමිකාරත්වය, ව්‍යාපාර පැතිකඩ, ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය, වෙළඳපල හා බෙදාහැරීම් කටයුතු, හිමිකම් පරිපාලනය, අවධානම් කළමනාකරණය ආදී කරුණු මෙම වාර්තා සමාලෝචනය මගින් අධ්‍යයනය කරන ලදී.

#### ඇ) ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල

පනතේ 31(1) වගන්තිය ප්‍රකාරව සියලු රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ ප්‍රතිරක්ෂණ ගිවිසුම් වාර්ෂිකව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. කොමිෂන් සභාව විසින් නියම කරන ලද ශ්‍රේණිගත කිරීම් අවශ්‍යතා සම්පූර්ණ කරන ලද ප්‍රතිරක්ෂකයින්ගෙන් ප්‍රතිරක්ෂණ ආවරණ ලබාගෙන ඇත්දැයි සහ සියලුම උපපන්ති සඳහා රක්ෂණ ආවරණ ලබාගෙන ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා එකී ලේඛන සමාලෝචනය කරනු ලැබීය. එමෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ භාර අරමුදල වෙත අනිවාර්යයෙන් යොමු කළ යුතු ප්‍රතිරක්ෂණ ප්‍රතිශතයන් නිසි ලෙස සපුරා ඇතිද යන්න පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලදී. කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලද කොන්දේසි වලින් බැහැරවීම් සහ විචලනයන් නියමිත කාලයක් තුළ නිවැරදි කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස අදාල සමාගම් වෙත උපදෙස් ලබා දෙන ලදී.

තවද සියලුම රක්ෂණ සමාගම් විසින් එලැඹුණු අතිරේක (Facultative) ප්‍රතිරක්ෂණ ආවරණ සෑම කාර්තුවක්ම අවසන් වී දින 45ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර කොමිෂන් සභාව විසින් එම වාර්තාවල නිරවද්‍යතාව හා ඉහත සඳහන් කළ කරුණු පිළිබඳව සමාලෝචනය කරන ලදී. හඳුනාගත් කොන්දේසිවලින් බැහැර වීම් හා විචලනයන් නියමිත කාලයක් තුළ නිවැරදි කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස අදාල සමාගම් වෙත උපදෙස් ලබා දුනි.

#### ඈ) කාර්තුමය වාර්තා

සියලුම රක්ෂණ සමාගම් විසින් පනතේ විධිවිධාන ප්‍රකාරව සෑම කාර්තුවක්ම අවසන් වී දින 45ක් ඇතුළත සිය කාර්තුමය වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. 2017 වර්ෂය තුළදී ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තා සමාලෝචනය කර එක් එක් රක්ෂණ සමාගමේ කාර්යසාධනය සහ පනතේ නීති රෙගුලාසිවලට අනුකූලතාවයන් පිළිබඳව නිරීක්ෂණය කරන ලදී.

එක් එක් රක්ෂණකරුවන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තා වාරික ආදායම, ප්‍රාරක්ෂණ ලාභය සහ ශුද්ධ ලාභය පදනම් කරගෙන දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණය සඳහා විශ්ලේෂණය කරන ලදී. තවද රක්ෂණ සමාගම්වල කාර්තුමය කාර්යසාධනය තක්සේරු කිරීම සඳහා ලාභදායිතාව, වියදම් හා හිමිකම් පිළිබඳ පරිපූර්ණ අනුපාත විශ්ලේෂණයන් සිදු කරන ලදී.

සෑම රක්ෂණකරුවෙකුගේ ම මූල්‍ය තත්ත්වය, ඔවුන්ගේ වත්කම් හා වගකීම් තත්ත්වය, ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (Solvency) සහ ද්‍රවශීලතාවය කාර්තුමය වාර්තා විශ්ලේෂණය කරමින් නිරතුරුවම අධීක්ෂණය කරන ලදී. කාර්තුමය වාර්තා විශ්ලේෂණය කිරීමේදී හඳුනාගත් විෂමතාවන් සහ කොන්දේසිවලින් බැහැරවීම් අදාල රක්ෂණකරුවන් වෙත නියම කරන ලද කාල සීමාවන් තුළ නිවැරදි කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

සියලුම රක්ෂණ සමාගම් විසින් සෑම කාර්තුවකම ඔවුන් පනතේ විධිවිධාන සහ රීති සපුරාලන බවට ත්, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු විධිවිධාන පනතට අනුකූල වී ඇති බවට ත් සහතික කිරීමේ වාර්තා දෙකක් කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු වේ.

### ඉ) මාසික වාර්තා

කොමිෂන් සභාව විසින් නිකුත්කළ නියෝගවලට අනුව රක්ෂණ සමාගම් තුනක් එක් එක් මාසය අවසන් වී දින 21ක් ඇතුළත ඔවුන්ගේ මාසික වාර්තා අවදානම් පාදක ප්‍රාග්ධන රාමුව අනුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. කොමිෂන් සභාව විසින් මෙම තීරණය ගනු ලැබුයේ එකී සමාගම්වල පැවති පනතේ විධිවිධාන වලින් බැහැරවීම් සහ මූල්‍ය ස්ථාවරත්වය සහ අනුකූලතාවය නිරන්තරයෙන් පරීක්ෂාකර බැලීමේ අවශ්‍යතාවය පදනම් කරගෙන ය. ඒ අනුව එකී සමාගම් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා පනතේ රෙගුලාසි වලට අනුකූලද යන්න සහ ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය සහතික කිරීම සඳහා කොමිෂන් සභාව විසින් එකී වාර්තා සමාලෝචනය කරන ලදී.

## 2. ණය ගෙවීමේ හැකියාවේ සීමා රීති ප්‍රකාරව අනුකූලතාවය අධීක්ෂණය කිරීම

අවදානම් පාදක ප්‍රාග්ධන නියමය - 2015 ට අනුව සෑම සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ සමාගමක් විසින්ම අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලිය යුතුය. එමෙන් ම සෑම සමාගමක්ම මාසික/කාර්තුමය හා වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා එවනු ලබන අතර මුළු ප්‍රාග්ධන අගයන් සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයන් කොමිෂන් සභාව විසින් සමාලෝචනය කිරීම සිදු කෙරේ. එම අගයන් අනුකූල නොවන අවස්ථාවලදී හෝ ගණනය කිරීම් නිරවද්‍ය නොවන අවස්ථාවලදී නිශ්චිත කාල සීමාවන් තුළදී පනතේ රීතිවලට අනුකූල වීමට නිසි පියවර ගන්නා ලෙස අදාල රක්ෂණ සමාගම් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් දෙන ලදී.

## 3. නිශ්චිත ආයෝජනවල අනුකූලතාව අධීක්ෂණය කිරීම

### අ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම

පනතේ 25 වගන්තිය ප්‍රකාරව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා වූ තාක්ෂණික සංචිතවලින් 20%ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ වත්කම්වලින් 30%ට නොඅඩු ප්‍රමාණයක් රක්ෂකයින් විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතු වේ.

පනතේ 25 වගන්තියට අනුකූල වීම සහතික කිරීම සඳහා කොමිෂන් සභාව විසින් මාසික/ කාර්තුමය හා වාර්ෂික පදනම මත රක්ෂණ සමාගම් විසින් රජයේ සුරැකුම්පත්වල කර ඇති ආයෝජන සියුම්ව අධීක්ෂණය කරන ලදී. මෙම ආයෝජනවල නිරවද්‍යතාවය සහ හිමිකාරත්වය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් සමාගම වෙත නිකුත් කළ තැන්පතු පිළිබඳ ප්‍රකාශන කොමිෂන් සභාව විසින් විමර්ෂණය කරනු ලැබේ.

එහිදී හඳුනාගනු ලැබූ නියාමන අවශ්‍යතා වලින් බැහැර වීම් නිශ්චිත කාල සීමාවක් තුළ නිවැරදිකර කොමිෂන් සභාව වෙත යලි යොමු කරන ලෙස අදාල රක්ෂණ සමාගම් වෙත දැනුම් දෙන ලදී.

### ආ) නිර්ණය අංක 01 අනුව කෙරෙන අනෙකුත් ආයෝජන

2011 මාර්තු පළමුවන දින දරන නිර්ණය කිරීම් අංක 01 සහ පසුව කළ සංශෝධනවලට අනුව සියලුම රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව පවතින වත්කම් සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ ශේෂව පවතින වත්කම් ආයෝජනය කළ යුතු වේ.

හඳුනාගත් පනතේ නීති රීතිවලින් බැහැර වීම් නිශ්චිත කාල සීමාවක් තුළ නිවැරදි කර නැවත යොමු කරන ලෙස අදාල රක්ෂණ සමාගම් වෙත දැනුම් දෙන ලදී.

### ඇ) අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපායමාර්ග

අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතා අනුව ප්‍රාග්ධන අවශ්‍යතා පවත්වා ගැනීමට අපොහොසත් වූ රක්ෂණ සමාගම් වලට එම රීතිවලට අනුකූලවීම සඳහා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග කොමිෂන් සභාව සම්පාදනය කරන ලද අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපායමාර්ග අනුව සම්පාදනය කරන ලෙස දැනුම් දී ඇත. මෙහි මූලික අරමුණ වූයේ ගැටළු සහගත රක්ෂණ සමාගම් මුල් අවධියේදී ම හඳුනා ගැනීම සහ එම තත්ත්වය පාලනය කිරීමට ප්‍රායෝගික හා ඵලදායී පිළියම් ලබා දීමයි. තවද අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපායමාර්ග තුළින් අදාළ රක්ෂණ සමාගම්වල කාර්යසාධනය සමීපව අධීක්ෂණය කිරීමට ඉඩ සැලසෙන අතර අර්බුධකාරී තත්ත්වයන් හට ගැනීමට පාදක විය හැකි මූල්‍ය තත්ත්වය හෝ ණය ගෙවීමේ හැකියාව සැලකිය යුතු ලෙස අඩු වීම වැළැක්වීමට ද ඉඩ සැලසෙයි.

## 4. ක්ෂේත්‍රගත විමර්ෂණ

2017 වර්ෂය තුළ දී අවදානම් පාදක අධීක්ෂණ ක්‍රමවේදය යටතේ කොමිෂන් සභාව විසින් රක්ෂණ සමාගම් තුනක ක්ෂේත්‍රගත විමර්ෂණ පවත්වන ලදී. මෙහි මූලික අරමුණ වූයේ එක් එක් සමාගමෙහි අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමයි.

පනතේ විධිවිධාන ප්‍රකාරව සහ කොමිෂන් සභාව මගින් පනවන ලද අනෙකුත් නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා එම ආයතනවල මෙහෙයුම් පද්ධති, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අධීක්ෂණය කළේය. තවද අදාල රක්ෂණ සමාගම්වල මෙහෙයුම් පද්ධති, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම පිණිස රක්ෂණ සමාගම්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අභ්‍යන්තර/බාහිර විගණකයින් සහ ජීවගණකඥයින් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එමෙන්ම මුදල් විශුද්ධිකරණ පනතේ මාර්ගෝපදේශවලට අනුගතවීම් පරීක්ෂා කරන ලදී.

ක්ෂේත්‍රගත විමර්ෂණ අතරතුරදී කරන ලද නිරීක්ෂණයන් වැඩිදියුණු කිරීම සඳහා වූ කොමිෂන් සභාවේ නිර්දේශයන් අදාල සමාගම් වෙත දැනුම් දෙන ලදී.

## 5. වැඩිදුර මූල්‍ය ඇගයීම්

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විමර්ෂණ/පැමිණිලි සම්බන්ධව වැඩිදුර මූල්‍ය ඇගයීම් සිදුකරන ලදී. මේ සම්බන්ධයෙන් තීරණවලට එලැඹීමට ප්‍රථම අතිරේක මූල්‍ය තොරතුරු අදාල පාර්ශවයන්ගෙන් ලබා ගන්නා ලදී. පැමිණිලිවල සඳහන් කර ඇති කරුණු තවදුරටත් තහවුරු කරගැනීම සඳහා ද ක්ෂේත්‍රගත විමර්ෂණ සිදු කරන ලදී. 2017 වර්ෂයේදී මෙවැනි ක්ෂේත්‍රගත

විමර්ශණයක් පවත්වනු ලැබුණි.

## 6. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

කාර්තුමය වාර්තා මගින් එක්රැස් කරගත් සංඛ්‍යානමය සහ අනෙකුත් තොරතුරු මත පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳව මූල්‍ය තොරතුරු කාර්තුමය පදනමකින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය.

රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය තහවුරු කරගැනීම සඳහා සමස්ථ වත්කම්, වාරික ආදායම, ලාභදායීත්වය, ඉපැයීම්, ද්‍රවශීලතාවය, රඳවා ගැනීම් ආදිය පිළිබඳ තොරතුරු විවිධ රක්ෂණ උපපන්තීන් සඳහා විශ්ලේෂණය කරනු ලැබීය.

## 7. රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2016

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් රක්ෂණ සමාගම්වලින් එක්රැස් කරගනු ලැබූ තොරතුරු සහ සංඛ්‍යාලේඛන පදනම් කරගෙන රක්ෂණ කර්මාන්තයේ අත්පොත, රක්ෂණ කර්මාන්තයේ සහ පාර්ශවකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත්කරනු ලැබීය.

මෙම අත්පොතෙහි එක් එක් රක්ෂණ සමාගමෙහි මුළු වත්කම්, එක් එක් උපපන්තීන්හි දළ වාරික ආදායම, වෙළඳපළ කොටස, පුළුල් ආදායම් ප්‍රකාශන සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ හිමිකම් අනුපාතය ද ඇතුලත්කර සකස් කර ඇත.

## 8. රක්ෂණ සමාගම් සඳහා ආයෝජන උපදෙස්

රක්ෂණ සමාගම් සඳහා වූ ආයෝජන උපදෙස් කොමිෂන් සභාව විසින් නිකුත් කළ අතර මෙහි ප්‍රධාන අරමුණ වූයේ ආයෝජනවල සුරක්ෂිතභාවය ඉහළ නැංවීමත් ප්‍රශස්ථ ලෙස සහ විචක්ෂණශීලීව ආයෝජනය කිරීමට යොමු කරවීමත් ය.

ආයෝජන කළමනාකරණය, ආයෝජන කළඹ කළමනාකරණය කිරීම සහ ඒ ආශ්‍රිත අවදානම් කළමනාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු අවම ප්‍රතිපත්තීන් එහි ඇතුළත් වේ.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

### 1. කාර්තුමය වාර්තා, අතුරු මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

2010 පෙබරවාරි 25 දින අංක 1642/16 දරන ගැසට් නිවේදනය (පළමු උපලේඛනය) අනුව සියලු රක්ෂණ තැරැව්කාර සමාගම් ඔවුන්ගේ කාර්තුමය වාර්තා, අතුරු මූල්‍ය ප්‍රකාශන එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ.

බහුතරයක් රක්ෂණ සමාගම් සිය කාර්තුමය වාර්තා සහ අතුරු මූල්‍ය ප්‍රකාශන නියමිත කාලසීමාව ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. එම සමාගම් ඉදිරිපත් කළ කාර්තුමය වාර්තා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කළ අතර එහිදී නිරීක්ෂණය වූ නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් සහ විෂමතාවයන් නියම කළ කාලසීමාවන් තුළ නිවැරදි කරන ලෙස අදාල තැරැව්කාර සමාගම් වෙත දැනුම් දෙනු ලැබීය.

රක්ෂණ තැරැව්කාර සමාගම්වල විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාල මූල්‍ය වර්ෂය අවසන් වී මාස හයක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කළ අතර එහිදී නිරීක්ෂණය වූ නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් සහ විෂමතාවයන් නිවැරදි කරන මෙන් අදාල තැරැව්කාර සමාගම් වෙත දැනුම් දෙනු ලැබීය.

### 2. වාරික එකතු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම

පනතේ 89 වගන්තිය ප්‍රකාරව රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් එකතු කරන ලද රක්ෂණ වාරික සති දෙකක් ඇතුළත අදාල රක්ෂණ ආයතන වෙත ප්‍රේෂණය කළ යුතු වේ. කාර්තුමය වාර්තා සමාලෝචනය කිරීමේදී සහ ක්ෂේත්‍රගත විමර්ශණ අතරතුරදී රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් පනතේ 89 වගන්තිය පිළිපැදීම පිළිබඳව සියුම්ව අධීක්ෂණය කරනු ලැබීය.

### 3. ක්ෂේත්‍රගත විමර්ශණ

පනතට සහ කොමිෂන් සභාවේ නීති සහ රෙගුලාසිවලට අනුකූලවන ආකාරයෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා 2017 වර්ෂය තුළදී ක්ෂේත්‍රගත විමර්ශණ අටක් පවත්වන ලදී. ක්ෂේත්‍රගත විමර්ශණවලදී සිදුකල නිරීක්ෂණ නිවැරදි කිරීමේ පියවර සඳහා නිර්දේශයන් අදාල තැරැව්කාර සමාගම්හි අවධානයට යොමු කල අතර අවශ්‍ය අවස්ථාවලදී නියාමන පියවර ගනු ලැබීය.

### 4. ලියාපදිංචිය අළුත් කිරීම

2018 වර්ෂය සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම සඳහා එක් එක් සමාගමෙන් ලද ඉල්ලුම් පත්‍ර කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලදී. මෙහිදී තැරැව්කාර සමාගම් විසින් ඉදිරිපත් කළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය වාර්තා විශ්ලේෂණය කරමින් එම සමාගම්හි මූල්‍ය තත්ත්වයන් විමර්ශණයට ලක්කරනු ලැබීය.

### 5. නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම

නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලෙස ලියාපදිංචි වීම සඳහා සමාගම් වෙතින් අයදුම් පත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරිණි. එම ආයතන ලියාපදිංචි කිරීමට ප්‍රථම ඔවුන්ගේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ව්‍යාපාර සැලැස්ම, සංවිධාන ව්‍යුහය, යටිතල පහසුකම් සපුරා ගැනීම වැනි කරුණු කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

# නියාමන සමාලෝචනය

## රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

මෙම වසර තුලදී, රක්ෂණ සමාගම් ලෙස ක්‍රියා කිරීම සඳහා නව ලියාපදිංචි කිරීම් ප්‍රදානය කර නොමැත. එබැවින්, ලියාපදිංචි රක්ෂණ සමාගම් ගණන 28 ලෙසම පැවතිණි.

කෙසේ වුවද, එක් ලියාපදිංචි රක්ෂණ සමාගමක්, තවදුරටත් රක්ෂණ ව්‍යාපාර කටයුතු වල නිරත වීම නවත්වා ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයෙන් ඉවත්වීම අරඹා ඇත.

**ඇමුණුම I :** කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින රක්ෂණ සමාගම්වල නාම ලේඛනය, ඔවුන්ට කරගෙන යාමට අවසර ලබාදී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය / පන්ති දැක්වේ.

### නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම

රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා, නව ඉල්ලුම් පත්‍ර භාර ගැනීම සම්බන්ධයෙන් පනවා තිබූ තාවකාලික තහනම 2016 දී ඉවත් කරන ලදි. ඒ අනුව මෙම වසර තුලදී රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා නව ව්‍යාපාර යෝජනා පත්‍ර 9 කොමිෂන් සභාව වෙත ලැබී ඇත. ඒ අතරින් ව්‍යාපාර නාම සඳහා අනුමැතිය 5 දෙනෙකුට ලබා දී ඇත. එමෙන්ම තිදෙනෙකුට නව ලියාපදිංචි කිරීම් ලබා දී ඇත.

තවදුරටත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම් 2, විසින් ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහාද ලියාපදිංචිය ඉල්ලා සිටින ලදි. ඒ අනුව එම සමාගම් වලට ලියාපදිංචිය ලබාදෙන ලදි.

2018 වසර සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේ අපේක්ෂාවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 57 කින් ඉල්ලුම් පත්‍ර කොමිෂන් සභාව වෙත ලැබී තිබෙන අතර එම සමාගම් පනත යටතේ අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති බැවින් 2018 වසර සඳහා එම සියළුම සමාගම් වලට සිය ලියාපදිංචිය අළුත් කිරීම් ප්‍රධානය කර ඇත.

**ඇමුණුම II :** කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛණය, ඔවුන්ට කරගෙන යමට අවසර ලබාදී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති සහ ලියාපදිංචි කාලපරිච්ජේදය දැක්වේ.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ සමාගම්

#### අත්හිටුවීම්

කොමිෂන් සභාව විසින් එක් රක්ෂණ සමාගමක පහල යන මූල්‍යමය තත්වය සලකා බලා (සමාගමේ මූල්‍ය ස්වශක්තතාව සංකීර්ණ ගැටළුවකට පත්ව තිබිම හා ඒ හේතුවෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් වලට අගතිදැයි බලපෑමක් ඇති වීමට ඇති අවස්ථාවක) එම සමාගමේ සාමාන්‍ය හා ජීවිත රක්ෂණය පවත්වා ගෙන යාමට ලබාදි තිබූ ලියාපදිංචිය 2017 ජුනි 28 දින සිට අත්හිටුවන ලදි. ඒ අනුව අදාල සමාගම විසින් ලිඛිතව කොමිෂන් සභාව වෙත අදාල අත්හිටුවීම ඉවත් කල යුත්තේ ඇයිදැයි හේතු දැක්වීමක් සහ පනතේ ප්‍රතිපාදන වලට අනුකූල නියමිත ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අදාල ප්‍රාග්ධන සැලස්මක් වහාම කොමිෂන් සභාවේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කල යුතු විය. කෙසේ වුවද එසේ සිදු කිරීමට සමාගම අපොහොසත් වීම නිසා අදාල අත්හිටුවීම 2017 ජූලි 20 දින සිට පනත ප්‍රකාර නියාමක ප්‍රධාන අවශ්‍යතාවය සපුරාලන තෙක් දීර්ඝ කරන ලදී.

2009 වසරේදී සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සම්බන්ධයෙන් පනවන ලද අත්හිටුවීම අඛණ්ඩව ක්‍රියාත්මක වේ. අදාල වසර තුල සෙලින්කෝ තකාෆුල් විසින් අව්‍යාජ බවට හඳුනාගත් සියළු හිමිකම් පෑම් නිරවුල් කරන ලදි.

කෙසේවුවද, සමාගමට එරෙහිව තවමත් විභාග වෙමින් පවතින නඩුකරයන් නිසා අදල හිමිකම් නිරවුල් කිරීම අවසන් කිරීමට නොලැබුණි. පනතේ 18(1) වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම, වෙනත් කරුණු අතර කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව පවත්වා ගෙන යාමට අසමත් වීම සහ පනතේ යම් විධි විධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ පනත යටතේ කොමිෂන් සභාව විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද යම් විධානයක් කඩ කර තිබීම හේතුවෙන්, සම්පූර්ණයෙන්ම හෝ රක්ෂණ ව්‍යාපාරයේ එක්තරා පන්තියක් අනුපන්තියක් සම්බන්ධයෙන් අවලංගු කරනු ලැබිය හැකිය.

#### අවවාද කිරීම්

පනතේ 57 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් එක් රක්ෂණ සමාගමකට 2017 අගෝස්තු මස පටන් මාසික වාර්තා ඉදිරිපත් කිරීමට නියම කර ඇත. අදාල වාර්තාව සෑම මසකම අවසානයේ සිට දින 21 තුල කොමිෂන් සභාව වෙත ලබා දිය යුතුය. කෙසේ වුවද අදාල සමාගම විසින් යවන ලද සිහිකැඳවීම් නොසලකා 2017 අගෝස්තු මාසය සඳහා අදාල මාසික වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. ඒ අනුව කොමිෂන් සභාව විසින් පනතේ ප්‍රතිපාදන කඩ කිරීම සහ විශේෂයෙන්ම නිකුත් කර තිබූ විධානය කඩ කිරීම සම්බන්ධයෙන් අවවාද කිරීමක් සිදු කරන ලදී.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ තැරැව්කාර සමාගම්

#### අවවාද කිරීම්

1. කොමිෂන් සභාව විසින් පනතේ 86(1) වගන්තිය ප්‍රතිපාදන හා

අනුකූල වීමට අපොහොසත් වීම හේතුවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 2 ට අවවාද කරන ලදි.

2010 පෙබරවාරි 25 දිනැති, අංක 1642/16 දරන, අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 07 වන රීතිය සමග කියැවෙන පනතේ 86(1) වගන්තිය මගින් වෙනත් කරුණු අතර දැක්වෙන්නේ සෑම රක්ෂණ තැරැව්කරුවෙකු විසින්ම රක්ෂණ තැරැව්කාර සමාගමේ ප්‍රධාන නිලධාරියා සහ එම සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින් සහතික කරනු ලැබූ කාර්තුමය වාර්තාව එක් එක් කාර්තුව අවසානයේදී දින 45 ඇතුලත දී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

### විධාන කිරීම්

1. සමහරක් රක්ෂණ තැරැව්කාර සමාගම්, තමන්ගේ සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය සමග අනුයාත සේවා සපයන බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. පනත අනුව රක්ෂණ තැරැව්කාර සමාගමක අර්ථනිරූපණය සහ රක්ෂණ ව්‍යාපාරයේ මතය සැලකිල්ලට ගනිමින්, සියළුම රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත දන්වා සිටින ලද්දේ, අනුයාත සේවා සැපයීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බවය.

2. පනතේ 101 වගන්තිය අනුව ශ්‍රී ලංකාවේ යම් තැනැත්තෙකු, සෘජුව හෝ වක්‍රව කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා නොමැති රක්ෂණ සමාගමකින් කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව රක්ෂණ සේවා ලබා ගැනීම තහනම් කොට ඇත. කොමිෂන් සභාව විසින් මීට ව්‍යතිරේඛයක් වශයෙන් චක්‍රලේඛ අංක 36 නිකුත් කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගත් රක්ෂණ තැරැව්කාර සමාගම් වලට විදේශීය සෞඛ්‍ය රක්ෂණ ඔප්පු ලබා දීම සඳහා අවසර දෙන ලදි.

   කෙසේ වුවද, පසුව නිකුත් කරන ලද විධානයක් මගින් මෙම අනුමැතිය වෙනත් රක්ෂණ තැරැව්කරුවකුට පවරා දීම සහ පවරා දීම තහනම් කරන ලදි.

3. පනතේ 94 වගන්තිය ප්‍රකාරව 94 (1) සෑම රක්ෂණකරුවකු සහ තැරැව්කරුවකු විසින් ම ප්‍රධාන කාර්යාලයක් පවත්වා ගෙන යනු ලැබිය යුතු අතර, තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් සුදුසුකම් ඇති තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය. තව ද ඒ නිලධරයා එහි ව්‍යාපාර කටයුතුවල සාමාන්‍ය පාලනය, ව්‍යාපාර මෙහෙවීම හා අධීක්ෂණය සම්බන්ධයෙන් වගකිව යුතු ය.

   කෙසේවුවද, සමහර දැනුම්දීම් අදාල සමාගම්වල අධ්‍යක්ෂක කොමිෂන් සභාවේ අවධානයට යොමු වී නැති බව අවබෝධ වීමෙන් පසු, කොමිෂන් සභාව විසින් සියළු රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත විධානයක් නිකුත් කරමින් එම සමාගම්වල සියළු ප්‍රධාන නිලධරයන් විසින් කොමිෂන් සභාව සමග පවත්වනු ලබන සියළු සන්නිවේදනයන් අදාල සමාගමේ අධ්‍යක්ෂ කොමිෂන් සභාව වෙත දැනුම් දීම හැකි විගස සිදු කිරීමට නියම කෙරිනි.

4 එක්තරා රක්ෂණ තැරැව්කාර සමාගමක් තම සංස්ථාපිත සේවාදායකයන් වෙනුවෙන් වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගමක් සහ සහයෝගයෙන් විදේශ සෞඛ්‍ය රක්ෂණ ඔප්පු යෝජනා කිරීම සිදුකර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව කොමිෂන් සභාව විසින් විධානයක් නිකුත් කරමින් එලෙස වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගමක් වෙනුවෙන් විදේශ සෞඛ්‍ය රක්ෂණ ඔප්පු යෝජනා කිරීම වලක්වන ලදි.

5 රක්ෂණ තැරැව්කාර සමාගම් 2ක ශුද්ධ ප්‍රාග්ධනය නියමිත අගය වන රුපියල් මිලියන 2.5 ට වඩා අඩුවීම හේතුවෙන් කොමිෂන් සභාව විසින් වහාම ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා අවශ්‍ය මුදල් යොදවන ලෙස සහ වාර්තා මාසිකව ඉදිරිපත් කරන ලෙස නියම කරන ලදි. මෙම මාසික වාර්තා ඉදිරිපත් කල යුතු වන්නේ කාර්තුමය වාර්තාවලට අමතරවය.

### නියාමන / උපදේශන ක්‍රියාමාර්ග

1. එක්තරා රක්ෂණ සමාගමකට 2015 දි නියම කරන ලද්දේ කොමිෂන් සභාව විසින් අධිකරණයට ඈවර කිරීමේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බවට සහ ශ්‍රී ලංකාවෙන් පිටතට මුදල් යැවීම, ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු සිදු නොකල යුතු බවටයි. එම රක්ෂණ සමාගම ස්වේඡාවෙන් ගනන් බේරා වසා දැමීම සඳහා කොමිෂන් සභාවෙන් අවසර ඉල්ලා සිටි අතර, අදාල සමාගම විසින් ලබාදිය යුතු යම් යම් පොරොන්දුවීම් වලට යටත්ව, කොමිෂන් සභාව මේ සඳහා අවසර දෙන ලදි. එමෙන්ම එක්සත් රාජධානියේ ස්ථාපිත එක්තරා නීති ව්‍යාපාර ආයතනයක නෛතික ගාස්තු බැර කිරීම සඳහාද කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටි අතර, කොමිෂන් සභාව විසින් ඊට අවසර ලබා දෙන ලදී.

2. එක්තරා නෞකා ආයතනයක් විසින් ඔවුන්ගේ නැව් පන්තියක් සඳහා 2017 ජූනි 01 දා සිට අවුරුද්දක කාලසීමාවක් සඳහා විදේශීය රක්ෂණකරුවකුගෙන් ලබාගත් hull, machinery and war risk රක්ෂණාවරණය තවදුරටත් පවත්වා ගෙන යාමට කොමිෂන් සභාවෙන් අනුමැතිය ඉල්ලා සිටින ලදි. එකී නෞකා ආයතනය විසින් 2016 වසරේදී කොමිෂන් සභාව වෙත කරන ලද ඉල්ලීමකට අනුව, ඉහත සදහන් රක්ෂණාවරණය සඳහා

කොමිෂන් සභාව විසින් පනතේ 101 වගන්තිය ප්‍රකාරව අනුමැතිය ලබා දෙන ලද්දේ 2017 වසර සඳහා එකී රක්ෂණාවරණයට නැවත වරක් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය යන කොන්දේසියට යටත්වය. ඒ අනුව, ඉදිරිපත් කරන ලද තොරතුරු සලකා බැලීමෙන් පසුව, ඔවුන්ගේ ඉල්ලීමට ඉඩ දෙන ලදි. තවද එකී ආයතනය විසින් පසුව කරන ලද ඉල්ලීමකට අනුව, නව යාත්‍රාවක් අනුමත නැව් පන්තියට ඇතුළත් කිරීම සඳහා ද අනුමැතිය ලබා දෙන ලදි.

පනතේ 101 වගන්ති ප්‍රකාරව, ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාලව හැර, කොමිසමේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, ශ්‍රී ලංකාවේ කිසිම තැනැත්තෙකු විසින්, පනත යටතේ ලියාපදිංචි කර නොමැති රක්ෂණකරුවෙකු සමඟ කෙළින් හෝ අන්‍යාකාරයෙන් රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කටයුතු කළ නොහැකි අතර, රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රතිපත්තිය සහ ජාතික යහපත සැලකිල්ලට ගැනීමෙන් පමණක් ඉහත සඳහන් ආකාර ලිඛිත අනුමැතිය ලබා දීමට සලකා බලනු ලැබේ.

3. පනතේ 15(අ) වගන්තියේ දක්වා ඇති පරිදි කොළඹ කොටස් වෙළඳ පොලෙහි ලැයිස්තු ගතවීම සඳහා කාලය දීර්ඝ කිරීමක් ලබා දෙන ලෙසට නව රක්ෂණ සමාගමක් විසින් කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි. මෙම නව රක්ෂණ සමාගම, සාමාන්‍ය රක්ෂණ සමාගම් දෙකක් ඒකාබද්ධ වීම හේතුවෙන් ඇති වූවක් නිසා, ඔවුන්ගේ ඉල්ලීම සඳහා ඉඩ දෙන ලදි.

   පනතේ 15 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් වසර තුනක කාලයක් ඇතුලත සෑම රක්ෂණකරුවකු විසින්ම බලපත්‍රලාභී ව්‍යාපාරවස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත වී සිටිය යුතු බවට 15 අ වගන්තිය යටතේ දන්වා ඇත.

4. එක්තරා රක්ෂණ සමාගමක් වෙත එම සමාගමට ආශ්‍රිත,පාලිත,පාලක හෝ සමාගම් සමූහයක සාමාජික සමාගමක් සමඟ හෝ කොමිසමේ අනුමැතිය නොමැතිව ගනුදෙනු වලට ඇතුළත් වීම තහනම් කරමින් 2015 වසරේදි කොමිෂන් සභාව විසින් විධානයක් නිකුත් කරන ලදි. එකී රක්ෂණ සමාගම විසින් සමහර ආශ්‍රිත සමාගම් වලින් ඇතැම් භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීම සඳහා කොමිසමේ අනුමැති ඉල්ලා සිටින ලදි. එහිදී කොමිෂන් සභාව තීරණය කරන ලද්දේ එකී රක්ෂණ සමාගම විසින් අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය හා රක්ෂණ ව්‍යාපාරයන් වෙන් කිරීමේ අවශ්‍යතාවයන් හා අනුකූල වන්නේ නම්, ඉහත සඳහන් විධානයන් සංශෝධනය කිරීම සලකා බැලිය හැකි බවය.

5. රක්ෂණ සමාගමක හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධරයා එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා සහ / හෝ කළමණාකාර අධ්‍යක්ෂවරයා සහ / හෝ එම සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ විධාන ක්‍රියාවට නැංවීමෙහිලා වගකීම දරන තැනැත්තා හෝ වියයුතු බව පනතේ 96 අ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් 2016 දී විධානයක් නිකුත් කරන ලද අතර, එකී විධානය සඳහා 2017 මැයි 12 වන විට අනුකූලතාවය දැක්විය යුතු බවද එහි සඳහන් ව තිබුනි. එසේ නමුත් කොමිෂන් සභාව වෙත කරන ලද ඉල්ලීම් සලකා බැලීමෙන් පසුව එකී විධානයට අනුකූලව ක්‍රියා කිරීම සඳහා රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන්ට 2017 දෙසැම්බර් 31 දක්වා සහන කාලයක් ලබා දෙන ලදි.

6. චක්‍රලේඛ #36 යටතේ ඉල්ලීම් කරන ලද රක්ෂණ තැරැව්කාර සමාගම් කීපයක් සඳහා විදේශ සෞඛ්‍ය රක්ෂණ ඔප්පු ඉදිරිපත් කිරීමේ බලය ලබා දීමේ බලපත්‍ර ලබා දෙන ලදි.

   චක්‍ර ලේඛ #36 අනුව විදේශීය සෞඛ්‍ය රක්ෂණාවරණයන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන රක්ෂණ තැරැව්කාර සමාගම් ඒ සඳහා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතු වේ.

7. තම බාහිර ජීවගණකඥයින් අතරින් බොහෝ දෙනා එතෙර වාසය කරන බැවින්, රක්ෂණ සමාගම් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතු වාර්තා වලට එකී ජීවගණකඥයින්ගේ අත්සන් ලබා ගැනීමේ ප්‍රායෝගික අපහසුතාවයන් ඇති බැවින්, ඔවුන්ගේ ඉලෙක්ට්‍රොනික අත්සන් පිළිගන්නා ලෙසට රක්ෂණ සමාගම් විසින් කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරන ලදි. ඒ අනුව රක්ෂණ සමාගම් විසින් තමන්ගේ පත්කල ජීවගණකඥයින්ගේ නම් හා ආදර්ශ අත්සන් හා රාජකාරි විද්‍යුත් තැපෑල දන්වමින්, තමන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමත කල යොජනාවක් ඉදිරිපත් කළ යුතුය යන කොන්දේසියට යටත්ව 2006 අංක 19 දරන "Electronic Transaction Act" යටතේ ස්කෑන් අත්සන පිළිගත හැකි බව කොමිෂන් සභාව දන්වන ලදි.

8. රක්ෂණ නියෝජිතයන් ලෙස ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන පුද්ගලයින් විසින් ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ පවත්වනු ලබන පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා තම සුදුසුකම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ ඉල්ලීම් සලකා බලා 2010 ඔක්තෝබර් 5 දිනැති අංක 1674/4 මඟින් සංශෝධිත 2002 සැප්තැම්බර් 23 දිනැති 1255/3 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 2 (ඇ) (11) රීතිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් අනුමැතිය ප්‍රදානය කර ඇත. රක්ෂණ

නියෝජිත සුදුසුකම් රීති 2 (ඇ) (1) 2010 ඔක්තෝබර් 5 දිනැති අංක 1674/4 මගින් සංශෝධිත 2002 සැප්තැම්බර් 23 දිනැති අංක 1255/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, ගණිතය සහ සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව යන විෂයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වී තිබීම රක්ෂණ නියෝජිතයෙකු ලෙස ලියාපදිංචි වීමට සපුරාලිය යුතු එක් අවම සුදුසුකමක් ලෙස සඳහන් කර ඇත. එසේ වුවද, එම රීති 2 (ඇ) (11) ප්‍රකාරව, යම් තැනැත්තෙකු රීති 2 (ඇ) (1) හි සඳහන් කර ඇති මට්ටමට සමාන හෝ ඉහල වෙනත් යම් අදාල ක්ෂේත්‍රයකින් සුදුසුකම් ලබා ඇත්තේ නම්, එම සුදුසුකම්, රක්‍ෂණ නියෝජිත සුදුසුකම් රීති වල සඳහන් කර ඇති මට්ටමට සමාන බවට, කොමිෂන් සභාව විසින්, එක් එක් සිද්ධිය අනුව, සලකා බලනු ලැබිය හැකිය.

9. එක්තරා සමාගමක් විසින්, රක්ෂණ කරුවෙකු ලෙස ලියාපදිංචිය ලබා ගැනීමට අදාල පනතේ විධිවිධාන හා අනුකූලතාවය දැක්වීම සඳහා බොහෝ කාලයක් ගතකරමින් සිටි බැවින්, ඔවුන්ගේ අයදුම්පත සලකා බැලීම සිදු නොකිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදි. එකී තීරණය සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ද දන්වා යවන ලදි.

10. කොමිෂන් සභාව විසින්, රක්ෂණ තැරැව්කාර සමාගම් කීපයක් වෙත විධාන අංක 10 යටතේ රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය හැර වෙනත් ආකාරයක අනුයාත සේවා කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

    විධාන අංක 10 අනුව රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් පනතේ අර්ථ දක්වා ඇති රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය හැර වෙනත් ආකාරයක අනුයාත සේවා කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වේ.

11. සංශෝධිත පනතකින් හදුන්වා දුන් විධිවිධාන ප්‍රකාරව රක්ෂණ සමාගම් වල අධ්‍යක්‍ෂවරු පත්කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ඉල්ලුම් පත්‍ර රාශියකට අනුමැතිය ප්‍රදානය කර ඇත.

12. පනතේ විධිවිධාන අනුව ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර රාශියකට කොමිෂන් සභාව විසින් අනුමැතිය ප්‍රදානය කරන ලදි.

13. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍ර රාශියකට කොමිෂන් සභාව ප්‍රතිචාර දක්වන ලදි.

# විමර්ශන සමාලෝචනය

වත්මන් හා අනාගත ඔප්පුහිමියන්ගේ සුභසිද්ධිය සුරැකීමේ සමස්ථ පරමාර්ථය පෙරදැරිව, රක්ෂණ හිමිකම්පාන්නන් විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන රක්ෂණ වන්දි ගෙවීම් සම්බන්ධයෙන් රක්ෂකයන් හා හිමිකම්පාන්නන් අතර හටගන්නා ආරවුල් විමර්ශනය කිරීමට හා ඒවා නිරාකරණය කිරීමට කොමිෂන් සභාවට බලතල ඇත. එමෙන්ම, කිසියම් රක්ෂකයකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයකුගේ විෂමාචාරයක් හෝ අක්‍රමිකතාවයක් පිළිබඳව ලැබෙන පැමිණිලි ද කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබේ.


යම් ආරවුලක් හෝ පැමිණිල්ලක් (රක්ෂකයකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයකුට එරෙහිව) කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබූ අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් සිය තීරණය ගැනීමට පෙර අදාල සියළු පාර්ශවයන්ට තම ස්ථාවරයට අදාල කරුණු පැහැදිලි කිරීමට අවස්ථාවක් ලබා දෙනු ලැබේ. රක්ෂකයන් විසින් රක්ෂණ හිමිකම සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණයට පදනම් වූ කරුණු අදාල ලිපි ලේඛන හා තොරතුරු මගින් තහවුරු කළ යුතු වේ. කොමිෂන් සභාව විසින් නිගමනයකට එළඹීමට පෙර අවශ්‍ය අවස්ථාවලදී තෙවන පාර්ශවයන් වෙතින් තොරතුරු තහවුරු කර ගැනීම හා විශේෂඥ මත විමසීම ද සිදු කරනු ලැබේ.

## සමස්ථ පැමිණිලි පිළිබඳ සමාලෝචනය

සමාලෝචනයට පාත්‍රවන වසර තුළ දී නව පැමිණිලි 348 ක් කොමිෂන් සභාව වෙත යොමු වූ අතර වසර තුළ දී පැමිණිලි 341 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කෙරුණි. විමර්ශිත පැමිණිලි අතුරින් කොමිෂන් සභාවේ මැදිහත් වීම මත, රක්ෂණ හිමිකම්පෑම් 78 කට අදාල වන්දි ගෙවා නිරාකරණය කිරීමට රක්ෂකයන් විසින් කටයුතු කරන ලදී. එසේ කොමිෂන් සභාවේ මැදිහත් වීම මත නිරාකරණය කරන ලද රක්ෂණ වන්දිවල මුළු වටිනාකම රුපියල් මිලියන 20 ක් පමණ වේ (මෙය දළ අගයක් වන අතර නිරාකරණය කරන ලද ඇතැම් රක්ෂණ හිමිකම්වල වටිනාකම් වාර්තා වී නොමැත).

පසුගිය වසර පහ (05) තුළ කොමිෂන් සභාවට ලැබුණු සියළු පැමිණිලි වල එකතුව 1549 කි. පළමු රූප සටහනේ දක්වා ඇති පරිදි, සමාලෝචිත වසර තුළ දී ලැබුණු පැමිණිලි සංඛ්‍යාව, ඊට පෙර වසරට සාපේක්ෂව සුළු වශයෙන් අඩු වී ඇති බව නිරීක්ෂණය වේ.

රූප සටහන 2
2017 වසර තුල දී මාසිකව ලැබුණු පැමිණිලි ප්‍රමාණය විශ්ලේෂණය





2017 වසර තුළ කොමිෂන් සභාව වෙත මාසිකව ලැබුණු පැමිණිලි පිළිබඳ විස්තරයක් 2 වැනි රූපසටහන මගින් දැක්වේ. පෙබරවාරි හා මාර්තු මාස වලදී වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (35) වාර්තා වී ඇති අතර අඩුම පැමිණිලි සංඛ්‍යාව වන පැමිණිලි 22 වාර්තා වී ඇත්තේ අප්‍රේල් මාසයේදී ය. සමාලෝචිත වසර තුළ දී මාසිකව ලැබුණු පැමිණලිවල සාමාන්‍ය 29 ක් වන අතර ජනවාරි, පෙබරවාරි, මාර්තු, සැප්තැම්බර් හා නොවැම්බර් යන මාසයන් හි එකී සාමාන්‍යය ඉක්මවා පැමිණිලි ලැබී ඇත. තෙවන රූප සටහන මගින් 2017 වර්ෂය තුළ ලද සමස්ත පැමිණිලිවල වර්ගීකරණයක් දක්වා ඇත. ඒ අනුව, වසර තුළ දී යොමු වූ මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 210 (60%) ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ආශ්‍රිතව ද පැමිණිලි 99 ක් (29%) ක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද විය. ඉතිරි පැමිණිලි 39 (11%) සාමාන්‍ය හෝ දීර්ඝ කාලීන ලෙස වර්ගීකරණය කළ නොහැකි පැමිණිලි වේ. 2017 වර්ෂයේ

වගුව 1


දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි : ගැටළුව අනුව

| ගැටළුව | # | % |
|---|---|---|
| හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම | 28 | 28.2 |
| යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 26 | 26.3 |
| ඔප්පු අවලංගු කිරීම / පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම් | 26 | 26.3 |
| වෙනත් | 19 | 19.2 |
| එකතුව | 99 | 100.0 |

රූප සටහන 1
පසුගිය වසර පහ (5) තුළ වාර්ෂිකව ලැබුණු පැමිණිලි



**රූප සටහන 3**
**2017 වසරේදී ලැබුණු පැමිණිලි වර්ගීකරණය**




දී කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි වල සංයුතිය පසුගිය වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වෙනස් වී නොතිබුණි.

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාලව ලැබුණු පැමිණිලි, එසේ පැමිණිලි කිරීමට හේතු වූ මූලික කාරණාවට අනුව සිදු කළ වර්ගීකරණයක් පළමු වගුවේ ඇත.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ ලද පැමිණිලි වලින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවකට (28%) හේතු වී ඇත්තේ රක්ෂණ හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම බව පළමු වගුව අනුව පෙනී යයි. හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු අධ්‍යයනය කිරීමේ දී අනාවරණය වූයේ, රක්ෂණ ඔප්පුව ලබාගැනීමේ දී හෝ පුනස්ථාපනය කිරීමේ දී වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ වරදවා දැක්වීම හිමිකම් ප්‍රතික්ෂේප වීමට බලපෑ ප්‍රධාන හේතුව බවයි. රක්ෂණ ගිවිසුමක පදනම වන උපරිම සද්භාවය නම් මූලධර්මය රක්ෂකයා හා රක්ෂිතයා යන දෙපාර්ශවයටම එක සේ අදාල වේ. රක්ෂණ යෝජකයා විසින් රක්ෂණ යෝජනා පත්‍රය මගින් හෙළිදරව් කරන කරුණු මත පදනම්ව, රක්ෂණ යෝජකයාගේ ජීවිතය පිළිබඳ අවදානම බාරගන්නේ ද යන වග සහ ඊට අදාල කොන්දේසි හා නියමයන් රක්ෂකයා විසින් තීරණය කරයි. එබැවින්, රක්ෂණ ඔප්පුහිමියා විසින් කිසියම් වැදගත් කරුණක් හෙළිදරව් නොකළහොත් හෝ වරදවා දැක්වීමක් සිදුකළහොත්, උපරිම සද්භාවය පිළිබඳ මූලධර්මය උල්ලංඝණය වේ.

ඇතැම් අවස්ථාවලදී, වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ වරදවා දැක්වීමට හේතු වී ඇත්තේ රක්ෂණ ඔප්පුහිමියන්ගේ රක්ෂණ මූලධර්ම හා තම වගකීම් පිළිබඳ දැනුවත්භාවය ප්‍රමාණවත් නොවීම බව නිරීක්ෂණය විය. එබැවින්, රක්ෂණ යෝජකයා හෝ රක්ෂණ ඔප්පුහිමියා වෙත පැවරෙන වැදගත් කරුණු හෙළිදරව් කිරීමේ වගකීම හා එම කරුණු හෙළිදරව් නොකිරීමෙන් සිදු වන අහිතකර ප්‍රතිඵල පිළිබඳ ඔවුන්ව නිසි පරිදි දැනුවත් කළ බව තහවුරු කිරීමට අවශ්‍ය පියවර රක්ෂකයා විසින් ගත යුතුය. කොමිෂන් සභාව මගින් සිදුකරන විමර්ශනයන්හි දී අනාවරණය වූ කරුණු මත, වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම හිතාමතා හෝ වංචනිකව සිදු නොකළ බව තහවුරු වන අවස්ථාවලදී පමණක් අදාල රක්ෂණ හිමිකම්පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය.

හිමිකම ප්‍රතික්ෂේප වීමට බලපාන්නා වූ තවත් ප්‍රධාන හේතුවක් වන්නේ, අලාභය සිදුවන දින වන විට, නියමිත දිනට පෙර වාරිකය නොගෙවීම නිසා රක්ෂණ ඔප්පුව අප්‍රාණිකව පැවතීමයි. රක්ෂණ ඔප්පුවේ සඳහන් නියමිත දිනට පෙර වාරික ගෙවීමට රක්ෂණ ඔප්පුහිමියාහට ගිවිසුම්ගත වගකීමක් ඇත. ගෙවනු ලැබූ වාරික ලැබුණු බවට රක්ෂකයන් විසින් ඔප්පු හිමියන්ට දැන්විය යුතු අතර කිසියම් ආරවුලක් පැන නැගුණු අවස්ථාවකදී තමන් විසින් වාරික ගෙවන ලද බව තහවුරු කිරීමට ඔප්පුහිමියන් සතුව සාක්ෂි තිබිය යුතුය. නියමිත කාලසීමාව තුළ වාරික ගෙවන ලද බව තහවුරු කළ හැකි සහ වාරික ගෙවීමේදී සිදු වූ ප්‍රමාදය සාධාරණීකරණය කළ හැකි අවස්ථාවලදී පමණක් කොමිෂන් සභාවට හිමිකම්පාන්නන්ට සහාය වීමට හැකි විය.

රක්ෂකයන් විසින් ගෙවීමට යෝජිත හිමිකම් මුදල හා එකඟ නොවීම සම්බන්ධයෙන් වූ පැමිණිලිවල ප්‍රතිශතය 26.3% ක් වේ. රක්ෂණ ඔප්පු කොන්දේසි පිළිබඳ වැරදි වටහා ගැනීම් හා රක්ෂකයන් විසින් තම තීරණ පිළිබඳව ප්‍රමාණවත් පැහැදිලි කිරීම් හා විස්තර ලබා නොදීම ඊට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. රක්ෂකයන් වෙතින් අවශ්‍ය තොරතුරු ලබාගැනීමෙන් පසු, ලිඛිතව සහ සාකච්ඡා මගින් හිමිකම්පාන්නන්හට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදීමට කටයුතු කරන ලදි. රක්ෂණ ඔප්පුවේ සඳහන් කොන්දේසි පැහැදිලි හෝ ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී, කොමිෂන් සභාවේ ඉල්ලීම සහ ඔප්පුහිමියන්ගේ සුභසිද්ධිය පිණිස, යෝජිත හිමිකම් මුදලට අදාල තම තීරණ නැවත සලකා බැලීමට අවස්ථාවන් කිහිපයකදී රක්ෂකයන් එකඟ විය.

රක්ෂණ ඔප්පුව අවලංගු කර ගෙවන ලද වාරික මුදල් නැවත ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීම්වල ප්‍රතිශතය 26.3% කි. ඔප්පුව අවලංගු කළ හැකි කාලසීමාව (එනම්, රක්ෂණ ඔප්පුව ලැබුණු දින සිට දින 21 ක් ඇතුළත) ඉක්ම වූ පසු ගෙවන ලද වාරික මුදල් නැවත ලබාගැනීමට ඔප්පුහිමියාට අයිතියක් නොමැත. කෙසේවෙතත්, ඔප්පුහිමියන් මුහුණපා ඇති දුෂ්කරතාවයන් සැලකිල්ලට ගෙන, යම් සහනයක් සැලසීමට අවස්ථා කිහිපයකදී පමණක් රක්ෂකයන් එකඟ විය.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල වෙනත් පැමිණිලි (19.2%) සඳහා ප්‍රධාන හේතුව වූයේ රක්ෂණ නියෝජිතයන් හෝ

අදාල සේවකයන් විසින් සිදු කරන ලදැයි පැවසූ රක්ෂණ වාරික අවභාවිතාවන්ය. මෙහිදී අදාල පාර්ශවයන් විමර්ශනයක් සඳහා කොමිෂන් සභාව වෙත කැඳවන ලද අතර රක්ෂණ වාරික මුදල් අවභාවිතය පිළිගත හැකි සාක්ෂි මගින් තහවුරු කළ හැකි අවස්ථාවල දී පමණක් ඔප්පුහිමියන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකියාව ලැබුණි. මෙවැනි සිද්ධීන් අවම කිරීමේ පියවරක් වශයෙන්, මූල්‍ය අවභාවිතය හෝ වංචාවන් හේතුවෙන් සේවයෙන් ඉවත් කරන ලද පුද්ගලයන් සේවයට බඳවා ගැනීමෙන් වලකින ලෙස නියෝගයක් ද කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි පිළිබඳ

**වගුව 2**

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි : ගැටළුව අනුව**

| ගැටළුව | # | % |
|---|---|---|
| හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම | 133 | 63.3 |
| යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 40 | 19.1 |
| හිමිකම් ගෙවීම ප්‍රමාද වීම | 12 | 5.7 |
| වෙනත් | 25 | 11.9 |
| එකතුව | 210 | 100.0 |

## විශ්ලේෂණය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාලව කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි අදාල ගැටළුවේ ස්වභාවය අනුව වර්ගීකරණය කර දෙවන වගුවේ දක්වා ඇත.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි වලින් බහුතරය "රථ වාහන රක්ෂණය" සම්බන්ධයෙන් වූ අතර ඉතිරිය ගිනි රක්ෂණය, මුහුදු රක්ෂණය හා රක්ෂකයන් විසින් නිකුත් කළ මූල්‍ය ඇපකර සම්බන්ධයෙන් වේ. ඉහත දෙවන වගුවෙන් දැක්වෙන පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි සඳහා ප්‍රධාන වශයෙන් (63.3%) හේතු වී ඇත්තේ හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීමයි. හිමිකම් ප්‍රතික්ෂේප වීම සඳහා මුල් වූ කරුණු අධ්‍යයනය කිරීමේ දී අනාවරණය වූයේ; රක්ෂණය ලබාගත් අරමුණට පරිබාහිර අරමුණු සඳහා වාහනය භාවිතා කිරීම, රියදුරු ලෙස වෙනත් පුද්ගලයකු ඉදිරිපත් කිරීම, රියදුරු බීමත්ව සිටීම, හිමිකම්පාන්නාට වාහනය කෙරෙහි රක්ෂණීය බැඳියාවක් නොමැති වීම, වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති අයෙක් රියපැදවීම සහ නියමිත දිනට පෙර වාරිකය නොගෙවීම හේතුවෙන් රක්ෂණ ඔප්පුව අවලංගු වී තිබීම ඒ සඳහා හේතු වී ඇති බවයි. අවශ්‍ය අවස්ථාවන්හි දී, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, පොලිසිය හා සිද්ධිය පිළිබඳ ප්‍රකාශ ලබාදුන් අය වෙතින් අදාල තොරතුරු කැඳවීමෙන්, සියළු හිමිකම් ආරවුල් සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයන් පවත්වන ලදී. හිමිකම උද්ගතවීමට හේතු වූ අලාභය රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය වන සහ කිසිදු ආකාරයක වංචාවක් හෝ හිතාමතා කරුණු වරදවා දැක්වීමක් සිදුව නොමැති අවස්ථාවලදී පමණක්, හිමිකම් නොගෙවීම සම්බන්ධයෙන් මැදිහත් වීමට කොමිෂන් සභාවට හැකි විය.

සාමාන්‍ය රක්ෂණයට අදාල පැමිණිලි සඳහා ප්‍රධාන වශයෙන් බලපෑ මීළඟ හේතුව (19.1%) වූයේ, හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීමයි. මෙම පැමිණිලිවලට මූලික හේතූන් වූයේ රක්ෂණ ාවරණයට අදාල කරුණු වරදවා වටහා ගැනීම, රක්ෂකයන් විසින් ගෙවන ලද හිමිකම් මුදල් ගණනය කර ඇති ආකාරය සහ කරන ලද අඩු කිරීම් ආදිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ලබා නොදීමයි. රක්ෂකයන් වෙතින් අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදීම මගින් මෙම පැමිණිලි නිරාකරණය කළ හැකි විය.

හිමිකම් ගෙවීම ප්‍රමාද වීම් සම්බන්ධයෙන් ලැබුණු සියළු ආරවුල් කොමිෂන් සභාවේ මැදිහත් වීම මත නිරාකරණය කළ හැකි විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යටතේ ලද වෙනත් පැමිණිලි (11.9%) සඳහා ප්‍රධාන හේතුව වූයේ නියමිත දිනට පෙර වාරිකය නොගෙවීම හෝ අධික ලෙස හිමිකම් වාර්තාවීම හේතුවෙන් රක්ෂණ ඔප්පු අවලංගු වීමයි. නියමිත කාල සීමාව තුළ සම්පූර්ණ වාරිකය ගෙවන ලද බව ඔප්පුහිමියන්හට තහවුරු කළ හැකි අවස්ථාවලදී පමණක්, ඔප්පු අවලංගුවීම් සම්බන්ධයෙන් මැදිහත් වීමට කොමිෂන් සභාවට හැකි විය.

## වෙනත් පැමිණිලි

සමාලෝචිත වසර තුළ දී දීර්ඝ කාලීන හෝ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට සෘජුව අදාල නොවන වෙනත් පැමිණිලි 39 ක් කොමිෂන් සභාවට ලැබුණි. එම පැමිණිලිවලින් බහුතරය රක්ෂණ නියෝජිතයන්ගේ සේවය අසාධාරණ ලෙස අවසන් කිරීම හා අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් විය. පනත යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, එම පැමිණිලි සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගන්නා ලදී.

## ව්‍යාපාරික චර්යාව නියාමනය කිරීම

### 1.රක්ෂකයන් සහ රක්ෂණ තැරැව්කරුවන් විසින් පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමට අදාල මාර්ගෝපදේශයන්

කොමිෂන් සභාව විසින් 2016 ඔක්තෝබර් මස සිට බලාත්මක වන පරිදි නිකුත් කරන ලද මෙම මාර්ගෝපදේශයන් අනුව, සිය පාරිභෝගික පැමිණිලි කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්ති සහ පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රියාපටිපාටීන් රක්ෂකයන් විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. මාර්ගෝපදේශයන් යටතේ අර්ධ වාර්ෂික කාර්යසාධක වාර්තා ද රක්ෂකයන් විසින් ඉදිරිපත් කරනු ලැබුණි. රක්ෂකයන් විසින් ඉදිරිපත් කරන තොරතුරු අනුව මාර්ගෝපදේශයන් හා අනුකූලතාවය අධීක්ෂණය කරනු ලැබේ.

### 2.රක්ෂණ නියෝජිතයන්ට අදාල කරුණු

රක්ෂණ නියෝජිතයන්ට බලපාන කරුණු පිළිබඳ සාකච්ඡා කොට නිසි පියවර ගැනීම සඳහා මෙම කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය (IASL), ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA) හා ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ (SLII) සාමාජිකත්වයෙන් කමිටුවක්

පත් කරනු ලැබීය. කොමිෂන් සභාවේ උපදේශකත්වයෙන් ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය විසින් සකස් කරන ලද රක්ෂණ නියෝජිතයන් සඳහා වන ආචාර ධර්ම පද්ධතිය ප්‍රකාශයට පත් කිරීම කමිටුවට ඉටු කිරීමට ඉතිරිව තිබූ අවසාන කර්තව්‍ය වූ අතර එය ඉටු කිරීමෙන් පසු මෙම කමිටුව විසුරුවා හරිනු ලැබීය.

මෙම ආචාර ධර්ම පද්ධතිය, සපුරාලිය යුතු පහත සඳහන් අවශ්‍යතාවයන්ට යටත්ව, 2017 මාර්තු මාසයේ දී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

- සමාගම් විසින් තම සියළුම ලියාපදිංචි රක්ෂණ නියෝජිතයන්ට ආචාර ධර්ම පද්ධතියේ පිටපතක් ලබාදිය යුතු අතර එය ඔවුන් විසින් කියවා තේරුම් ගත් බවට සහතිකයක් සමාගම විසින් නියෝජිතයන්ගෙන් ලබාගත යුතුය.

- ආචාර ධර්ම පද්ධතිය නියෝජිතයාට කැමති භාෂාවකින් ලබාදිය යුතුය.

- ආචාර ධර්ම පද්ධතියේ දක්වා ඇති මූලධර්ම, රක්ෂණ අලෙවිකරණයේ යෙදී සිටින සියළු පුද්ගලයන්ගේ කාර්යසාධන කළමනාකරණය හා ප්‍රතිලාභ පිරිනැමීමට අදාල මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් තුළ අනුගත කිරීමට සමාගම් විසින් උත්සාහ කළ යුතුය.

- ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය (IASL) හා ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA) විසින් සිය වෙබ් අඩවිවල මෙම ආචාර ධර්ම පද්ධතිය භාෂා ත්‍රිත්වයෙන් ප්‍රකාශයට පත් කළ යුතුය.

### 3.රක්ෂණ හර මූලධර්ම (ICP) 19

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS) විසින් සකස් කර ඇති රක්ෂණ හර මූලධර්මයන් (Insurance Core Principles) මගින්, රක්ෂණ කර්මාන්තය නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා ගෝලීය වශයෙන් පිළිගත් රාමුවක් සපයයි. ව්‍යාපාරික චර්යාව පිළිබඳ වන 19 වන රක්ෂණ හර මූලධර්මය (ICP) මගින්, රක්ෂණ ගිවිසුමකට එළැඹීමට පෙර සිට රක්ෂණ ගිවිසුමක් යටතේ රක්ෂණ සමාගමක

**වගුව 3**
**පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම පිළිබඳ මූලධර්ම**

| | |
|---|---|
| පළමු වන මූලධර්මය | පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම, සියළු සමාගම්වල ව්‍යාපාරික ආකෘතියේ හදවත බදු විය යුතුය. |
| දෙවන මූලධර්මය | පාරිභෝගිකයන්ගේ සුභසිද්ධිය සැලසෙන අයුරින් රක්ෂණ සැලසුම් නිර්මාණය කිරීම හා අලෙවිකරණය සිදු කළ යුතුය. |
| තෙවන මූලධර්මය | රක්ෂණ සැලසුම් අලෙවියට පෙර, අලෙවියේ දී හා අලෙවියට පසු පාරිභෝගිකයන්හට පැහැදිලි තොරතුරු ලබාදිය යුතුය. |
| සිව්වන මූලධර්මය | රක්ෂණ සැලසුම් පිළිබඳව පාරිභෝගිකයන්හට ලබාදෙන උප-දෙස්වල යෝග්‍යතාවය |
| පස්වන මූලධර්මය | පාරිභෝගිකයන්ගේ සාධාරණ අපේක්ෂාවන් කළමනාකරණය කිරීම |
| හයවන මූලධර්මය | රක්ෂණ හිමිකම් සම්බන්ධයෙන් සාධාරණ ලෙස කටයුතු කිරීම |
| සත්වන මූලධර්මය | පාරිභෝගික ප්‍රතිචාරයන් විශ්ලේෂණය කිරීම හා පැමිණිලි සම්බන්ධයෙන් සාධාරණ ලෙස කටයුතු කිරීම |

සියළු වගකීම් නිමාවන අවස්ථාව දක්වාම පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම සම්බන්ධයෙන් අවධානය යොමු කොට ඇත. ව්‍යාපාරික චර්යාව පිළිබඳ වන 19 වන රක්ෂණ හර මූලධර්මය යටතේ ප්‍රමිතීන් 13 ක් දක්වා ඇති අතර පහත දැක්වෙන ලෙස ඒවා ඛාණ්ඩගත කොට ඇත:

- ප්‍රමිතීන් 19.1 සිට 19.2 - පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම

- ප්‍රමිතීන් 19.3 සිට 19.7 - අලෙවියට පෙර ක්‍රියාවලිය

- ප්‍රමිතීන් 19.8 සිට 19.13 - අලෙවියෙන් පසු ඔප්පුවට අදාල සේවා සැපයීම

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS) මගින් ප්‍රකාශිත මාර්ගෝපදේශයන් අනුව අභ්‍යන්තරව සිදු කරන ලද විශ්ලේෂණයේ දී හඳුනාගත් පරතරයන් සැලකිල්ලට ගනිමින්, කොමිෂන් සභාව විසින් රක්ෂණ හර මූලධර්ම 19 යටතේ සඳහන් අධීක්ෂණයට අදාල පරතරයන් පියවීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

## පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම පිළිබඳ මූලධර්ම

රක්ෂකයන් සහ අතරමැදියන් විසින් සම්මත ආචාර ධර්ම හා සද්භාවයෙන් යුතුව කටයුතු කිරීම පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම සඳහා මූලික පදනම සපයයි. ව්‍යාපාරයේ ස්වභාවය අනුව, රක්ෂකයන් හා අතරමැදියන් පිළිබඳව මෙන්ම සපයනු ලබන භාණ්ඩ හා සේවාවන් පිළිබඳව පාරිභෝගිකයන් තුළ ඇති පිළිගැනීම හා විශ්වාසනීයත්වය මත රක්ෂණ ව්‍යාපාරයේ සාර්ථකත්වය විශාල වශයෙන් රඳා පවතී. එබැවින්, රක්ෂකයන් හා අතරමැදියන් විසින් පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම දිරිමත් කිරීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් මස දී මෙම මූලධර්ම නිකුත් කරන ලදී. මෙම මූලධර්ම යටතේ පාරිභෝගිකයන්ට බලපාන ක්ෂේත්‍ර තෙවන වගුවේ දක්වා ඇත.

### 4.මූල්‍ය අවභාවිතය හෝ වංචාවන් හේතුවෙන් සේවයෙන් ඉවත් කරන ලද පුද්ගලයන් නැවත සේවයට බඳවා ගැනීම

රක්ෂණ සමාගමක සේවකයකු (ශාඛා කළමනාකරුවෙකු) විසින් රක්ෂණ වාරික අවභාවිතා කිරීම පිළිබඳ සිදු කරන ලද විමර්ශනයකදී අනාවරණය වූ කරුණු මත පදනම්ව, මූල්‍ය අවභාවිතය හෝ වංචාවන් හේතුවෙන් සේවයෙන් ඉවත් කරන ලද පුද්ගලයන් නැවත රක්ෂණ ක්ෂේත්‍රයේ සේවයට බඳවා ගැනීම වළක්වමින්, කොමිෂන් සභාව විසින් පනතේ 96A වගන්තිය යටතේ නියෝගයක් නිකුත් කරන ලදී. වත්මන් හා අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව සැලසෙන පරිදි, වෘත්තීමය හා විචක්ෂණ ආකාරයෙන් රක්ෂණ ව්‍යාපාරය කරගෙන යනු ලබන බවට වග බලාගැනීම සඳහා මෙම නියෝගය නිකුත් කරන ලදී.

### 5. රක්ෂණ ආරවුල් නිරාකරණය කිරීමේ පටිපාටිය විධිමත් කිරීම

**ආසියානු සංවර්ධන බැංකුව**

**TA-9213 SRI: ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන වැඩසටහන**

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට ප්‍රතිපත්තිමය ණය මුදලක් අනුමත කර ඇත. මෙම ණය වැඩසටහනේ දෙවන අදියර යටතේ, කොමිෂන් සභාව වෙත සිය නිර්දේශයන් යොමු කරනු ලබන රක්ෂණ ක්ෂේත්‍රය සඳහා ආරවුල් නිරාකරණය කිරීමේ මඩුල්ලක් පිහිටුවා ඊට අදාල සේවකයන් අනුයුක්ත කළ යුතු ය.

ආසියානු සංවර්ධන බැංකුව විසින් පත් කරන ලද විදේශීය උපදේශකවරුන්ගේ මූලික සංචාරයෙන් පසු, අදාල පාර්ශවයන් සමග පැවති සාකච්ඡා හා අදාල ලියකියවිලි සමාලෝචනය කිරීම මඟින් ව්‍යාපෘතියේ විෂය පථය, සිදු කරනු ලබන කාර්යයන් සහ ගැටළුසහගත තත්වයන් ආදිය ඇතුළත් සිය මූලික/ආරම්භක වාර්තාව උපදේශකයන් විසින් ඉදිරිපත් කරනු ලැබීය. උපදේශකවරුන්ගේ ඊළඟ සංචාරයේ දී වර්තමාන යාන්ත්‍රණයට යෝජිත වෙනස්කම් හා නිරාකරණය කරගත යුතු මූලික ගැටළු වන ස්ථාපනය කිරීමට අදාල නීතිමය ප්‍රතිපාදන, නියෝගයන් බලාත්මක කිරීම සහ අවශ්‍ය අරමුදල් සැපයීම වැනි කරුණු පිළිබඳව ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් (ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා) සමග සාකච්ඡා කිහිපයක් පවත්වන ලදි. මෙම සංචාරයේදී උපදේශකවරුන් විසින් කොමිෂන් සභාවට හා ක්ෂේත්‍රයේ නියෝජිතයන්හට සිය නිර්දේශයන් සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීම් ද සිදු කරන ලදි. ඉන් අනතුරුව, කෙටුම්පත් කරන ලද ආරවුල් නිරාකරණය කිරීමේ මඩුල්ලක් පිහිටුවීම සඳහා වන යෝජිත රාමුව, ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම හා යෝජිත මඩුල්ලේ කාර්යභාරය සඳහන් ලියකියවිලි උපදේශකවරුන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

උපදේශකවරුන් විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු/ලියකියවිලි, ශ්‍රී ලංකාවේ රක්ෂණ ආරවුල් නිරාකරණය කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම හා උචිත යාන්ත්‍රණයක් නිශ්චය කිරීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් සමාලෝචනය කෙරෙමින් පවතී.

#### රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යභාරය විධිමත් කිරීම සඳහා වන ඉල්ලීම

දැනට ක්‍රියාත්මක වන රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යභාරය විධිමත් කරන ලෙස ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය හා වත්මන් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා විසින් කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන ලදි. එම ඉල්ලීම් සලකා බැලීමෙන් පසු, ආසියානු සංවර්ධන බැංකුවේ ණය ව්‍යාපෘතිය යටතේ යෝජිත රක්ෂණ ආරවුල් නිරාකරණය කිරීමේ විකල්ප ක්‍රමවේදය විධිමත් කරන තෙක් ආරවුල් නිරාකරණය කිරීමට අදාල වත්මන් තත්වය පවත්වා ගෙන යෑමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදි. තවද, කිසියම් ආරවුලක් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා විසින් විමර්ශනය කෙරෙමින් පවතින හෝ විමර්ශනය අවසන් කර ඇති විටක දී (එම විමර්ශනයේ අවසන් තීරණය ද සමග) ඒ පිළිබඳව කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලබන අවස්ථාවකදී කොමිෂන් සභාව වෙත දන්වන මෙන් රක්ෂණ සමාගම් වෙත උපදෙස් දෙන ලදි.

## වෙනත් කටයුතු

#### පාසල් සිසුන් සඳහා වන සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ආරවුල් නිරාකරණය කිරීම

රක්ෂණ ඔප්පුවේ ස්වභාවය සහ ඔප්පු කොන්දේසි සමාලෝචනය කිරීමෙන් අනතුරුව, "බේරුම්කරණය" වෙනුවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ඒකඟතාවය මත විකල්ප ආරවුල් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලෙස කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (රක්ෂණාවරණය නිකුත් කරන ලද රක්ෂණ සමාගම) වෙත උපදෙස් ලබාදෙන ලදි.

# වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය

රක්ෂණ ඔප්පුහිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව බලය ලබා ඇත. මේ කාරණය සම්බන්ධව මහජනතාව තුළ "අවදානම් කළමණාකරන මෙවලමක්" ලෙස රක්ෂණයෙ වැදගත්කම ගැන මහජනතාව තුළ හොඳ අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය වී ඇත. බලාපොරොත්තු රහිත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සිදුවිය හැකි මූල්‍යමය හානි ආවරණය කිරීමට භාවිතා කරන අද්විතීය හා වැදගත් මූල්‍යමය උපකරණයක් ලෙස රක්ෂණය සැලකිය හැකිය. එම නිසා රක්ෂණය තිරසාර ආර්ථික වර්ධනය සඳහා තීරණාත්මක කාර්ය භාරයක් සිදුකරනු ලබයි.

විවිධ රක්ෂණ නිමැවුම් (බලපත්‍රලාභී රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද) තිබීම හා සමාජයට මෙන්ම ආර්ථිකයට එය වැදගත් වුවද, කලාපයේ අනිකුත් රටවල් සමග සංසන්දනය කරන විට මූල්‍ය හා රක්ෂණ සාක්ෂරතාව මදකම නිසා ශ්‍රී ලංකාවේ රක්ෂණ ගහනය අඩු මට්ටමක පවතී. එනිසා, රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම වැඩිකිරීම තුළින් පුද්ගලයන්ට හා ව්‍යාපාරික ප්‍රජාවට අනාගතයේදී සිදුවිය හැකි ආර්ථික පාඩු වලින් ආරක්ෂා වීම සඳහා අවස්ථාවක් සලසාදීමත්, එමගින් රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට පහසුකම් සැලසීමත් සිදුකෙරේ. මේ සම්බන්ධව බලන විට කොමිෂන් සභාව රක්ෂණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම වැඩිදියුණු කිරීම වෙනුවෙන් මැදිහත් වී ඇත.

### දැනුවත්කිරීමේ වැඩසටහන්

### ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හිදී පවත්වන ලද වැඩසටහන්

අදාළ කාලය තුළදී කොමිෂන් සභාව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව ක්‍රියාකරන රජයේ නිලධාරීන් වන ග්‍රාමසේවා නිලධාරීන්, පොලිස්, සුරාබදු, දිවිනැගුම, සංවර්ධන, කෘෂිකර්ම හා ක්ෂේත්‍ර නිලධාරීන් වැනි රජයේ නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. කොමිෂන් සභාවේ කාර්යභාරය (රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස) තමන්ගේ අවශ්‍යතාවය අනුව රක්ෂණ ඔප්පුවක් තිබීමේ වැදගත්කම, තම ජීවිත හා දේපල වලට වන අවදානම් ආවරණය කිරීම, රක්ෂණ ඔප්පුහිමියන්ගේ යුතුකම් හා අයිතිවාසිකම්, රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීමේදී හා එය පවත්වාගෙන යෑමේදී සලකා බැලිය යුතු වැදගත් තොරතුරු සහ රක්ෂණ ඔප්පුවක් යටතේ හිමිකම් ලැබීමේදී දැනගත යුතු කරුණු පිළිබඳව සහභාගීවූවන් දැනුවත් කරන ලදී. සමාජයේ බිම් මට්ටමේ සේවය කරමින් මහජනතාව සමග නිතර කටයුතු කරන ඉහත රජයේ නිලධාරීන් සමග අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධවීම හරහා රක්ෂණය සම්බන්ධයෙන් මහජනතාවගේ අත්දැකීම් හා සිතුම් පැතුම් වටහාගැනීමට උපකාරී වේ.

ග්‍රාමසේවා වසම් 796 ක් ආවරණය වන පරිදි තංගල්ල, කැස්බෑව, හගුරන්කෙත, ගලේවෙල, උඩුනුවර, කැකිරාව, බෙලිඅත්ත, මැදදුම්බර, දඹුල්ල හා වාවාකච්චේරි යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කොට්ඨාශ දින රැස්වීම් වලදී දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා අදාල ප්‍රදේශ වල රජයේ නිලධාරීන් 1782ක් පමණ සංඛ්‍යාවක් සහභාගී වී ඇත.



ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩ සටහනක්

### අනෙකුත් වැඩසටහන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවත්වන ලද ප්‍රධාන දැනුවත්කිරීමේ වැඩසටහන් වලට අමතරව පාසැල් ළමුන් වෙනුවෙන් පහත සඳහන් දැනුවත්කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

- වාණිජ විෂය ධාරාව හදාරන අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ ළමුන්ට හා එම අංශයේ ගුරුවරුන් වෙනුවෙන් දැනුවත්කිරීමේ වැඩසටහනක් යක්කල, ශ්‍රී චන්ද්‍රජෝති විද්‍යාලයේදී පවත්වන ලදී.



පාසැල් වැඩසටහනක්

### විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීම

සමාජය තුළ විවිධ මාර්ග ඔස්සේ අදහස් හුවමාරු කරගැනීම වඩාත් දියුණු කිරීමට විද්‍යුත් මාධ්‍ය වඩාත් තීරණාත්මක කාර්ය භාරයක් ඉටුකරන බව අවබෝධ කරගනිමින් කොමිෂන් සභාව විසින් සමාලෝචිත වසර තුළ රූපවාහිනී වැඩසටහන් 03ක් සහ ගුවන්විදුලි වැඩසටහන් 02ක් පවත්වා ඇත. රක්ෂණය සම්බන්ධ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණ සහිතව පහත සඳහන් වැඩසටහන් සඳහා කොමිෂන් සභාවේ නිලධාරීන් සහභාගී වී ඇත.

### රූපවාහිනී වැඩසටහන්

- ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ පටිගත කොට විකාශනය කරන ලද "Coffee Table" සාකච්ඡාමය වැඩසටහන

- ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ පටිගත කොට විකාශනය කරන ලද "සල්මල් යාය" සාකච්ඡාමය වැඩසටහන

- ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ සිංහල ප්‍රධාන පුවත් විකාශනය තුළින් ප්‍රචාරය කරන ලද ප්‍රවෘත්තිමය වැඩසටහන

## ගුවන්විදුලි වැඩසටහන්

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වෙළඳ සේවය ඔස්සේ ප්‍රචාරය කරන ලද "සාර ප්‍රභා ගිර" සජීවි සාකච්ඡාමය වැඩසටහන

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ City FM නාලිකාව ඔස්සේ ප්‍රචාරය කරන ලද "Coffee with Dan" සාකච්ඡාමය වැඩසටහන

## මුද්‍රිත මාධ්‍ය හරහා දැනුවත් කිරීම

සමාලෝචිත වසර තුළ කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන පුවත්පත් නිවේදන සහ දැන්වීම් ප්‍රකාශයට පත්කරන ලදී.

## පුවත්පත් නිවේදන

- 2016 වසරේ 03 වන කාර්තුව තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

- 2016 වසර තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

- 2017 වසරේ 01 වන කාර්තුව තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

- 2017 වසරේ පළමු අර්ධ වාර්ෂික කාලසීමාව තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

- රක්ෂණ හිමිකම් විමර්ශනය කිරීමේ මාර්ගෝපදේශ.

- කොමිෂන් සභාවෙන් අධීක්ෂණය නොවන හෝ විධිමත් කිරීමට හසුනොවන ආයතන සම්බන්ධයෙන් රක්ෂණ නියාමන ආයතනයේ පැහැදිලි කිරීම.

- රක්ෂණ නියාමන ආයතනයේ නම වෙනස්වීම

## පුවත්පත් දැන්වීම්

- "මහජනතාව වෙත කෙරෙන විශේෂ නිවේදනයයි" යන ශීර්ෂය යටතේ ලියාපදිංචි රක්ෂණ සමාගම් හා තැරැව්කාර සමාගම් පිළිබඳව වූ වාර්ෂිකව පළකෙරෙන දැන්වීම.

- රක්ෂණ ඔප්පුහිමියන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් මතු කරමින් "ඔබගේ යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව ඔබ දැනුවත්ද - රක්ෂණ ඔප්පු හිමියන් වෙත කෙරෙන පණිවුඩයක්" පිළිබඳ දැන්වීම.

- නියාමනයට හසුනොවන ආයතන - රක්ෂණ නියාමන ආයතනයෙන් කෙරෙන පැහැදිලි කිරීම.

## පුවත්පත් සාකච්ඡාව

"අද" පුවත්පතේ පළවූ අධ්‍යක්ෂ ජනරාල්වරිය සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව

## ප්‍රකාශන

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව පිළිබඳව දැනුවත් කිරීමේ අත්පත්‍රිකාව සමාලෝචිත කාලය තුළ නැවත මුද්‍රණය කර ප්‍රධාන වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී බෙදාහරින ලදී.

රක්ෂණ උපදේශකවරුන්ගේ වෘත්තීමය තත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් ඔවුන්ගේ විශේෂ අවධානය යොමුවිය යුතු අවශ්‍ය තොරතුරු ඇතුලත් "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් පණිවිඩයක්" යන තේමාව යටතේ පිළියෙල කරන ලද ප්‍රකාශනය ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය වෙත යවා ඔවුන්ගේ වෙබ් අඩවි වල (භාෂා තුනෙන්ම) පළකිරීම සහ එම සංගම්වල සාමාජිකත්වය හරහා ලියාපදිංචි රක්ෂණ උපදේශකවරුන් (පැරණි හා අළුත්) වෙත ලබාදීම මගින් කොමිෂන් සභාවේ පණිවුඩය සියළුම රක්ෂණ උපදේශකවරුන් වෙත ලැබුණු බවට තහවුරු කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

## ජාතික රක්ෂණ දිනය

රක්ෂණ කර්මාන්තයෙන් සමාජයේ සුභසිද්ධිය හා ජාතික ආර්ථිකයට කරන ලද දායකත්වය හඳුනාගනිමින් ශ්‍රී ලංකා රජය විසින් සෑම වසරකම සැප්තැම්බර් මස 01 වන දින "ජාතික රක්ෂණ දිනය" ලෙස ප්‍රකාශයට පත්කිරීම ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ වැදගත් සන්ධිස්ථානයකි. මෙය කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ හවුල් ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.

අතිගරු ජනාධිපතිතුමාගේ නිල නිවසේදී ගරු තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමතිවරයා විසින් ජාතික රක්ෂණ දිනයේ සමාරම්භක අවස්ථාව සිහිපත් කරමින් විශේෂ සැමරුම් මුද්දරයක් හා මුල්දින කවරයක් කොමිෂන් සභාවේ හා ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ නියෝජිතයින් ඉදිරිපිටදී අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලදී. පළමු ජාතික රක්ෂණ දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංගමය, කොමිෂන් සභාව, ආසියානු සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය හා රක්ෂණ සමාගම් හි නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් සමාරම්භක උත්සවයක් 2017 සැප්තැම්බර් මස 01 වන දින නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේදී පවත්වන ලදී.

"රක්ෂණයෙ වැදගත්කම" පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට අවස්ථාවක් කරගනිමින් සමාරම්භක ජාතික රක්ෂණ දිනය හා රක්ෂණය පිළිබඳව දැනුවත්කිරීමේ මාසය උත්සවාකාරයෙන් සැමරීම සඳහා සැප්තැම්බර් මාසය තුළ කොමිෂන් සභාව විසින් පහත සඳහන් වැඩසටහන් සංවිධානය කරන ලදී.

**1. ජාතික රක්ෂණ දිනය සැමරීමට මුද්දරයක් හා මුල්දින කවරයක් නිකුත් කිරීම.**

**2. ගුවන්විදුලි වැඩසටහන්**

(අ) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ FM වෙළඳ සේවයේ "සාර ප්‍රභා ගිර" සාකච්ඡාමය සජීවි වැඩසටහන

(ආ) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ

සියලුම නාලිකා වල ප්‍රධාන පුවත් ප්‍රකාශයෙන් පසුව ප්‍රචාරය වූ කළින් පටිගත කරන ලද කෙටි පණිවිඩ.

### 3. රූපවාහිනී වැඩසටහන්

(අ) ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ පටිගත කොට විකාශනය කරන ලද "සල්මල්යාය" සම්මුඛ සාකච්ඡාව

(ආ) ශ්‍රී ලංකා රූපවාහිනිය ඔස්සේ විකාශනය කරන ලද "සංහිඳ" සජීවී වැඩසටහන.

### 4. පුවත්පත් නිවේදන

(අ) සැප්තැම්බර් මස 01 වන දින " ජාතික රක්ෂණ දිනය" ලෙස ප්‍රකාශයට පත්කිරීම පිළිබඳව පළවූ පුවත්පත් නිවේදනය.

### 5. කොමිෂන් සභාව විසින් රක්ෂණ උපදේශකවරුන් වෙත නිකුත්කරන ලද පණිවිඩ.

(අ) ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් සිය ශාඛා කාර්යාල හරහා සංවිධානය කරන ලද ප්‍රාදේශීය සක්‍රිය කිරීමේ වැඩසටහන් වලදී මෙම ලියවිල්ල (භාෂා තුනෙන්ම) සියලු රක්ෂණ උපදේශකවරුන් වෙත නිකුත් කළ අතර කොමිෂන් සභාවේ වෙබ් අඩවියේද පළකරන ලදී.




මුල් දින කවරය හා සැමරුම් මුද්දරය

### ADB ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන

රක්ෂණ නිමැවුම් පිළිබඳ මූල්‍යමය සාක්ෂරතාව පුළුල්කිරීම සඳහා පූර්ණ උපායමාර්ග සංවර්ධනය කිරීම සඳහා කොමිෂන් සභාවට උපදෙස් දීම හා සහාය ලබාදීම වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රවීණෝපදේශකයෙකු පත්කෙරිණි. එකී තාක්ෂණික සහායවීම යටතේ ව්‍යාපෘතියේ විෂයපථය හා අඩංගු කරුණු, කර්තව්‍යයන්, විසඳිය යුතු ප්‍රශ්ණ, අනෙකුත් අදාළ ඉටුවිය යුතු දේ හා ක්‍රියාකාරකම් සඳහන් කරමින් පිළියෙළ කෙරුණු මූලික වාර්තාවක් 2017 වර්ෂයේ අප්‍රේල් මාසයේදී උපදේශකවරයා විසින් කොමිෂන් සභාව වෙත භාරදෙන ලදී.

අන්තර්ජාතිකව පිළිගත් ව්‍යවහාර ක්‍රියාකාරකම් හා සැසඳීමේදී ශ්‍රී ලංකාව් දැනට පවතින වැඩසටහන්, සන්නිවේදන මාධ්‍ය, උපායමාර්ග, විෂය නිර්දේශ ආදියෙහි අඩුපාඩු හා පරතරයන් සාකච්ඡා කිරීම සඳහා රක්ෂණ කර්මාන්තයෙහි පාර්ශවකරුවන් සමග උපදේශන වාර කීපයක් පවත්වන ලදී. එලෙස පිළියෙළ කරන ලද විශ්ලේෂණ වාර්තාව 2017 ජූනි මාසයේදී කොමිෂන් සභාව වෙත භාරදෙන ලදී.

විශ්ලේෂණ වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු හා පරතරයන් සාකච්ඡා කිරීම සඳහා රක්ෂණ කර්මාන්තයේ පාර්ශවකරුවන් හා කොමිෂන් සභාව සමග අවසාන වශයෙන් උපදේශන වාරයක් 2017 ඔක්තෝබර් මාසයේදී පවත්වන ලදී. සවිස්තරාත්මක ක්‍රියාමාර්ග, ක්‍රියාවට නැංවීමේ කාලසීමා හා අවශ්‍ය සම්පත් හඳුනාගනිමින් පිළියෙළ කරන ලද අධ්‍යාපන උපායමාර්ග හා ක්‍රියාවට නැංවීමේ සැලැස්ම 2017 දෙසැම්බර් මාසයේදී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරුණි.

එකී අධ්‍යාපන උපායමාර්ග හා ක්‍රියාවට නැංවීමේ සැලැස්ම අධ්‍යයනය කිරීමෙන් අනතුරුව යෝජිත ක්‍රියාකාරකම්,

- එකඟ වූ ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් හා ගැලපේද;
- කොමිෂන් සභාවේ විෂයපථය හා සම්පත් සැලකීමේදී ලඟාකර ගත හැකිද ; හා
- පැහැදිලි විශේෂිත මෙන්ම ප්‍රතිඵල මැනිය හැකිද

යන්න පිළිබඳ තහවුරු කරගැනීම සඳහා තවදුරටත් තොරතුරු/පැහැදිලි කිරීම අවශ්‍ය බව කොමිෂන් සභාව විසින් ප්‍රවීණෝපදේශකවරයා වෙත දන්වන ලදී.

මීට පිළිතුරු ලෙස ආසියානු සංවර්ධන බැංකුව මෙන්ම උපදේශකවරයා විසින් ද ප්‍රතිශෝධිත අධ්‍යාපන උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමට එකඟ වී ඇත.

### අනෙකුත් කටයුතු
### රක්ෂණ නිමැවුම් විශ්ලේෂණය කිරීම

වෙළඳපොළ තත්වයන් හා නියාමන රාමුව තුළ මෑතක සිදුවූ සංවර්ධනයන් පදනම් කරගෙන සමාලෝචිත කාලය තුළ මෝටර් රථ, සෞඛ්‍යය හා ගිනි රක්ෂණ නිමැවුම් වර්ග වල කරන ලද විශ්ලේෂණ වාර්තා (පසුගිය වසර වල කරන ලද) ප්‍රතිශෝධනය කරන ලදී. මෙම වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ සංගමය වෙත ඔවුන්ගේ ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාව විසින් අදාල නිර්දේශ සම්බන්ධ සාකච්ඡා වාර කීපයක් කර්මාන්තයට අදාළ ආයතන (ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ නියෝජිතයන්) සමග පවත්වන ලදී. ඉන්පසුව කොමිෂන් සභාවේ නිර්දේශ පිළිබඳව සාකච්ඡා කර එකඟ වූ පරිදි අවශ්‍ය කටයුතු සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංගමය වෙත ඉදිරිපත් කර ඇත.

### මහජන තොරතුරු විමසීම

සමාලෝචිත වසර තුළදී රක්ෂණය පිළිබඳව මහජනතාවගෙන්, ඔප්පුහිමියන්ගෙන් හා අනෙකුත් අදාළ පාර්ශවවලින් ඉදිරිපත් වූ විවිධ විමසීම් හා තොරතුරු ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දක්වන ලදී.

**රක්ෂණ නියෝජිතවරුන්ගේ පූර්ව අනුයුක්තතා විභාගයේ පාඨමාලා අත්පොත සමාලෝචනය කිරීම.**

රක්ෂණ නියෝජිතයන්ගේ පූර්ව අනුයුක්තතා විභාගයේ වෙළඳපොළ කටයුතු සම්බන්ධ කරුණු වලට අදාළ පාඨමාලා අත්පොත් වල අන්තර්ගතය හා විභාග ප්‍රශ්ණ පත්‍රවල සාම්පල වඩාත් වැඩිදියුණු කිරීමේ අදහසින් පරීක්ෂා කරන ලදී. තවදුරටත් කළ යුතු වැඩි දියුණු කිරීම් වලට අදාල වෙනස්කම් කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇත.

**කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ "නිතර විමසන ප්‍රශ්ණ" වලට අදාල ලියවිල්ල වැඩිදියුණු කිරීම.**

කොමිෂන් සභාවේ කාර්යභාරය සහ එහි නියාමන කටයුතු, ජීවිත රක්ෂණය හා මෝටර් රථ රක්ෂණය ආවරණය වන පරිදි "නිතර විමසන ප්‍රශ්ණ" අන්තර්ගත වන සම්පූර්ණ ලියවිල්ලක් සාදා ඇත.

**දැනුවත්කිරීම් හා සම්බන්ධ වීඩියෝ පට You Tube හි ගිණුමක් නිර්මාණය කිරීම**

දැනුවත් කිරීම් හා සම්බන්ධ පටිගත කරන ලද ශ්‍රව්‍ය හා දෘෂ්‍ය මාධ්‍ය පටයන් ලබාගත හැකිවන පරිදි You Tube නාලිකාවක් නිර්මාණය කර ඇත. කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සියලුම දැනුවත්කිරීමේ වැඩසටහන් වල සියලුම පටිගත කරන ලද වැඩසටහන් (ශ්‍රව්‍ය හා දෘෂ්‍ය) මෙම You Tube නාලිකාවට ඇතුලත් කොට ඇත.

# පරිපාලනමය සමාලෝචනය

## මානව සම්පත්

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන්ම රැඳී තිබෙන්නේ එහි ක්‍රියාකාරීත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. කොමිෂන් සභාවේ සාර්ථක උපක්‍රමවල කශේරුව (කොඳුනාරටිය) වන්නේ අපගේ මානව සම්පත් බැව් අප විශ්වාස කරන්නේ එබැවිනි.

අපේක්ෂිත වෘත්තිකයින් නිසි කලට බඳවා ගැනීම තුලින් මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර මේ වසර තුළදී කොමිෂන් සභාව විසින් ගන්නා ලදී. මෙම පියවර සාක්ෂාත් කර ගැනීම උදෙසා සමාලෝචිත වසර තුළ දී එක් අධ්‍යක්‍ෂවරයෙක්, සහය අධ්‍යක්ෂවරයෙක් සහ විධායක නිලධාරීන් 6 ක් ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදි. 2017 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලය 44 ක් විය.

කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

| නිළධාරීන් සංඛ්‍යාව | අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධිය ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය | ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| 44 | 07 | 02 | 04 | 07 | 09 | 03 |

## පුහුණු කිරීම්

ආයතනික අරමුණු සහ කාර්යසාධනය වර්ධනය කර ගැනීම උදෙසා දැනුම සහ වෘත්තීයමය නිපුණතාවන් කෙරෙහි යොමුවීම ප්‍රධාන වේ. සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම උදෙසා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථාවන් ඔවුන් වෙත වගුවේ දැක්වෙන පරිදි ලබා දෙන ලදී.

| වර්ගය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| දේශීය පුහුණු | 1,297,577/- | 2,021,522/- |
| විදේශීය පුහුණු | 4,741,449 /- | 8,370,750/- |

## කාර්ය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් කොමිෂන් සභාව විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත්ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තව ද, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සබැඳියාවන් වර්ධනය කිරීම උදෙසා වාර්ෂික සුහද හමුවක් පවත්වන ලදී.

# මූල්‍ය සමාලෝචනය

## රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (PPF)


රක්ෂණ පනතේ නියමයන්ට අනුව රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් එකතුවන මුදලින් (සෙස්), නියම කොට ඇති කටයුතු සඳහා ක්ෂණිකව යොදවන්නට අවශ්‍ය නොවන මුදල් විචක්ෂණ ලෙස උපරිම ප්‍රතිලාභ ලැබෙන අන්දමින් මෙම වසර තුළ දී ද කොමිෂන් සභාව විසින් ආයෝජනය කරන ලද අතර 1 වැනි රූපසටහනෙන් එම සෙස් බදු ආදායමත් ආයෝජන ආදායමත් විදහා දක්වයි.

වාසිදායක වෙළඳපල තත්වයන්ගේ බලපෑම හේතුවෙන් ආයෝජන ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී දැකිය හැක.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම පසුගිය වසර පහ තුළ වර්ධනය වී ඇති අන්දම 2 වැනි රූපසටහන මඟින් පෙන්නුම් කරයි.


2017 දෙසැම්බර් 31 වැනි දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය පහත දක්වා ඇත. (රූප සටහන 03)

**රූප සටහන 1**
**2013-2017 කාලපරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම සහ ආයෝජන ආදායම**





| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| සෙස් ආදායම (රු. මිලියන) | 246 | 274 | 322 | 408 | 418 |
| ආයෝජන ආදායම (රු. මිලියන) | 236 | 158 | 145 | 229 | 372 |

**රූප සටහන 2**
**2013 - 2017 කාලපරිච්ඡේදය සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය**




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 1,778 | 2,183 | 2,643 | 3,292 | 4,110 |

**රූප සටහන 3**
**2017 දෙසැම්බර් 31 වැනි දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය**



### කොමිෂන් සභාවේ අදායම

කොමිෂන් සභාවේ සමස්ථ ආදායම ජනනය වන්නේ පහත දැක්වෙන ප්‍රභවයන්ගෙනි:

- රක්ෂකයින් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචිය සඳහා අයකරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තු
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් වලින් අය කරන ගාස්තු
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම

2013 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ සමස්ත ආදායම බෙදී ඇති ආකාරය 4 වැනි රූපසටහන මඟින් දැක් වේ.


### කොමිෂන් සභාවේ වියදම

2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී වියදමේ සුළු වර්ධනයක් දක්නට ලැබේ.

කොමිෂන් සභාවේ ආසන්න වශයෙන් රු. මිලියන 31ක අතිරික්තයක් 2017 වසරේදි වාර්තාකර ඇත. පනතේ විධි විධානවලට අනුකූලව අදයම හා වියදම අතර හිගය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂක අරමුදලින් පෙර වර්ෂවලදී පියවාගෙන ඇති බැවින්, ඉහත අතිරික්තය ආරක්ෂණ අරමුදලට බැර කරන ලදි.


2013 සිට 2017 කාලපර්ච්ඡේදය දක්වා කොමිෂන් සභාවේ සමස්ථ වියදම 5 වැනි රූපසටහනෙන් දැක්වේ.

**රූප සටහන 4**
**2013 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ ආදායම**




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| වාර්ෂික ගාස්තු (රු. මිලි) | 70 | 73 | 104 | 126 | 142 |
| ලියාපදිංචි හා ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු (රු. මිලි) | 4 | 4 | 9 | 5 | 9 |
| වෙනත් ආදායම් (රු. මිලි) | 1 | 2 | 2 | 3 | 3 |
| ප්‍රදාන හඳුනා ගැනීම් (රු. මිලි) | 5 | 4 | 5 | 2 | 1 |
| මුළු ආදායම් (රු. මිලි) | 80 | 83 | 119 | 136 | 157 |

**රූප සටහන 5**
**2013 සිට 2017 කාලපරිච්ඡේදය තුල කොමිෂන් සභාවේ සමස්ථ වියදම**




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| මුළු වියදම (රු. මිලියන) | 105 | 107 | 123 | 124 | 125 |



# මූල්‍ය තොරතුරු

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**2017 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 2017<br>රු. | 2016<br>නැවත ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | 7,324,758 | 7,629,457 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - කුළී සහ විද්‍යුත් තැන්පතු හා භාණ්ඩාගාර බැඳුම්කර | 2 | 1,086,252,949 | 1,091,418,880 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 3 | 347,299 | 393,033 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන හා වෙනත් | 2 &16 | 3,023,706,256 | 2,200,446,486 |
| අනෙකුත් ජංගම වත්කම් | 4 | 12,194,049 | 13,505,456 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | 42,000,000 | 22,700,000 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 5 | 5,796,222 | 5,207,234 |
| **මුළු වත්කම්** | | 4,177,621,532 | 3,341,300,546 |
| **සංචිත හා වගකීම්** | | | |
| **සංචිත** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 6 & 16 | 4,109,959,205 | 3,291,865,366 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 7,389,652 | 7,389,652 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදාන | 7 | 5,718,532 | 3,523,232 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 8 | 10,902,547 | 9,842,625 |
| | | 16,621,079 | 13,365,857 |
| **ජංගම වගකීම්** | | | |
| ලද අත්තිකාරම් | 16 | 7,358,099 | 8,238,794 |
| අනෙකුත් ජංගම වගකීම් | 9 & 16 | 36,293,496 | 20,440,878 |
| | | 43,651,596 | 28,679,671 |
| **මුළු සංචිත හා වගකීම්** | | 4,177,621,532 | 3,341,300,546 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයින් වෙත පැවරේ.

ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිටු අංක 88 සිට 94 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් සමඟ සංයෝජිතව කියවිය යුතු වේ.

**මනෝ තිත්තවැල්ල**
සභාපති

**ඒ.ආර්. දේසප්‍රිය**
සාමාජික

**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජනරාල්

**චායා විතානවසම්**
අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන

කොළඹ, ශ්‍රී ලංකාව
2018 මැයි 30

# මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය

**2017 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 31.12.2017 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. | 31.12.2016 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අයභාරය | 10 | 150,783,219 | 130,972,036 |
| ප්‍රදාන හඳුනා ගැනීම් | 7 | 1,455,019 | 2,061,963 |
| පොලී ආදායම | | 4,486,296 | 3,112,336 |
| වෙනත් ආදායම් | 11 | 302,826 | 258,370 |
| **මුළු ආදායම** | | 157,027,360 | 136,404,704 |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 12 | (69,941,211) | (71,862,315) |
| වෘත්තීය ගාස්තු | 13 | (2,000,000) | (2,801,156) |
| මෙහෙයුම් වියදම් | 14 | (53,212,244) | (49,032,420) |
| මූල්‍ය සහ අනෙකුත් | 15 | (114,876) | (150,126) |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරුකිරීම් | 6 | (31,220,674) | (12,185,206) |
| **මුළු වියදම්** | | (156,489,005) | (136,031,223) |
| බදුවලට පෙර ශුද්ධ අතිරික්තය / (ඌණතාවය) | | 538,355 | 373,480 |
| බදු | | (538,355) | (373,480) |
| බදුවලට පසු ශුද්ධ අතිරික්තය / (ඌණතාවය) | | - | - |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | - | - |

පිටු අංක 88 සිට 94 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| | | | නැවත ප්‍රකාශිත |
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | - | - |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | 3,955,019 | 4,259,214 |
| ක්ෂය සඳහා ගැලපීම් | | 1,893,706 | 1,807,178 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | | (41,449) | (66,590) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් අලාභය | | (833,784) | - |
| ප්‍රදාන හඳුනාගැනීම | | (1,455,019) | (2,061,963) |
| ආදායම් බදු | | 538,355 | 373,480 |
| පොලී ආදායම | | (4,486,296) | (3,112,336) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | | (429,467) | 1,198,985 |
| | | | |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| තොගවල (වැඩිවීම) / අඩුවීම | | 45,735 | 52,869 |
| ලැබිය යුතු දෑ වල (වැඩිවීම) / අඩුවීම | 16 | 1,289,668 | 3,712,122 |
| අත්තිකාරම් ලැබීම් වල (වැඩිවීම) / අඩුවීම | | (880,694) | 742,508 |
| ණය හිමියන් සහ උපචිතයන්හි (වැඩිවීම) / අඩුවීම | 16 | 15,852,619 | 13,220,213 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහය | | 16,307,328 | 17,727,712 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය | | 15,877,861 | 18,926,697 |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබු/(ක්‍රියාකාරකම් සඳහා යෙදු) මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්පත් වල ආයෝජනය | | (19,300,000) | (21,700,000) |
| පොලී ආදායම | | 3,969,678 | 2,683,182 |
| දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 41,449 | 71,419 |
| දේපල පිරියත සහ උපකරණ මිලට ගැනීම් | | (3,650,319) | (619,406) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (18,939,191) | (19,564,804) |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලැබු මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරුකිරීම් | | 3,650,319 | 619,406 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 3,650,319 | 619,406 |
| | | | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම) | | 588,988 | (18,701) |
| | | | |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 5,207,234 | 5,225,935 |
| | | | |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 5,796,222 | 5,207,234 |
| | | | |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 5 & 18 | 5,796,222 | 5,207,234 |

පිටු අංක 88 සිට 94 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන් | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වර්ධනය | | 818,093,839 | 648,638,132 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 818,093,839 | 648,638,132 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම** | | | |
| රජයේ සුරැකුම්පත් වලින් ලැබිය යුතු පොලියෙහි වැඩිවීම / (අඩුවීම) | | (68,356,404) | (46,126,635) |
| ලැබිය යුතු සෙස් බදුවල වැඩිවීම / (අඩුවීම) | | (15,572,411) | (24,664,812) |
| අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය වැඩිවීම / (අඩුවීම) | | 5,165,931 | - |
| සෙස් අරමුදලින් මාරු කළ යුතු අරමුදල්හි වැඩිවීම / (අඩුවීම) | | (16,376,099) | (19,967,093) |
| | | (95,138,983) | (90,758,539) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 722,954,856 | 557,879,592 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්හි ආයෝජනය | | 1,049,400,000 | 362,599,903 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | (1,772,300,000) | (922,000,000) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද/(යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (722,900,000) | (559,400,097) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම) | | 54,856 | (1,520,505) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 503,267 | 2,023,772 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 558,124 | 503,267 |
| බැංකුවේ ඇති මුදල් | 2 & 18 | 558,124 | 503,267 |

පිටු අංක 88 සිට 94 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත සකස් කර ඇති අතර ඒවා ඉදිරිපත් කිරීමේ දී අගයන් ආසන්නම ශ්‍රී ලංකා රුපියලට දක්වා ඇත.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේ දැක්වෙන සටහන් මගින් අනාවරණය කර ඇත.

### 1.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇති අතර, එම මූල්‍ය ප්‍රකාශන එම ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය දක්වනු ලැබේ.

### 1.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තහවුරු කර ඇත. රක්ෂණ නියාමන කොමිෂන් සභාව චිරස්ථායී අනාගතයක් උදෙසා අඛණ්ඩව මෙහෙයුම් පවත්වාගෙන යන බවටත්, එහි ව්‍යවස්ථාපිත වගකීම් සපුරාලන බවටත් කොමිෂන් සභාවේ සාමාජිකයන් හට සාධාරණ තක්සේරුවක් ඇත.

අනාගත සියලුම තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඈවර කිරීමේ හෝ එහි මෙහෙයුම් නවතාලීමේ අවශ්‍යතාවයක් හඳුනාගෙන නොමැත.

ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන ඇත.

### 1.4 වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සිදුවීම්

වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ දී සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

### 1.5 සංසන්දනාත්මක සංඛ්‍යාවන්

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුකූල විය යුතු ආකාරයට පෙර වර්ෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත.

### 1.6 බදුකරණය

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි ප්‍රතිපාදනයන් හා අනුකූලව ගණනය කර ඇත.

පොලී හා ලාභාංශ ආදායම හැර කොමිෂන් සභාවේ අනෙකුත් ආදායම් මේ වන විට ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

### 1.7 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවැති විනිමය අනුපාතිකයන් පාදකව, වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත.

## 2. වත්කම් සහ අගය කිරීමේ පදනම

### 2.1 දේපල, පිරියත හා උපකරණ ස්වසන්තක අයිතිය සහිත දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන්/ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ, අත්පත් කර ගැනීමේ පිරිවැය සමඟ එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

#### ක්ෂය

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ.

| | වාර්ෂික (%) |
|---|---|
| මෝටර් වාහන | 25 |
| ලී බඩු, වැද්දුම් සහ සවි කිරීම් | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම් | 25 |
| උපකරණ | 25 |

ක්ෂය ප්‍රතිපාදන එම වත්කම් මිල දී ගත් දින සිට කරනු ලැබේ. ක්ෂය ප්‍රතිපාදනය වත්කම භාවිතයෙන් ඉවත් කරන තෙක් කරනු ලැබේ. වත්කම් විකුණුම් ලාභ/අලාභ වත්කම් විකුණුම් මුදල එකී වත්කමේ ලියා අඩුකල අගය සමඟ සංසන්දනය කිරීමෙන් නිශ්චය කෙරේ.

### 2.2 ආයෝජන

රජයේ සුරැකුම්පත්හි සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්හි කර ඇති ආයෝජන අගය කර ඇත්තේ ඒවායේ පිරිවැයට හෝ මුහුණත් අගය යන 2න් අඩු අගයට වන අතර, ඒවා සඳහා වර්ෂය අවසානය තෙක් පොලී උපචිත පදනම මත ගිණුම් ගත කර ඇත.

### 2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

### 2.4 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නිරූපණය කර ඇත්තේ, ඇස්තමේන්තුගත උපලබ්ධි අගයටයි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවලින් නියෝජනය වන්නේ බැංකුවේ මුදල් සහ අතැති මුදල්ය.

### 3. බැරකම් සහ ප්‍රතිපාදන

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

### 3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවකයන් සඳහා සේවක පාරිතෝෂිකය ප්‍රථම සේවා වර්ෂයේ සිට සම්පූර්ණ ප්‍රතිපාදනය කෙරෙන ආකාරයට ගිණුම් ගත කර ඇත.

කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත හා අනුකූලව ගෙවීම් පිළිබඳව වගකීම ඇති වන්නේ වර්ෂ 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද්දේ නම් පමණි.

### 3.1.2 නිශ්චිත සහභාග සැලසුම් - සේ.අ.අ. සහ සේ.නි.භා.අ.

නිශ්චිත ව්‍යවස්ථාවන් සහ නියාමන හා අනුකූලව කොමිෂන් සභාවේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට සහ සේවක භාරකාර අරමුදලට දායකවීමට සුදුසුකම් ලබති. කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙළින් 12% ක සහ 3% ක මුදලක් දායක කරයි.

### 3.2 බැරකම්

බැරකම් අතරින් වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළවිටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත. වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයකින් ඔබ්බට ගෙවිය යුතු සියළුම ගෙවීම් ජංගම නොවන බැරකම් ගණයට ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළුම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

### 3.3 ප්‍රදාන

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනා ගනු ලැබේ.

### 4. ආදායම් සහ වියදම්

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

### 4.2 වියදම් හඳුනා ගැනීම

කොමිෂන් සභාව පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියාහරිනු ලැබේ.

### 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 දේපළ පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | ලී බඩු, වෑද්දුම් හා සවිකිරීම් | කාර්යාල උපකරණ (විද්‍යුත් දත්ත සැකසුම් සහ වෙනත්) | පුහුණු උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | 10,000,000 | 13,538,944 | 22,422,500 | 141,450 | 46,102,894 |
| එකතු කිරීම් | - | 703,387 | 2,946,931 | - | 3,650,319 |
| බැහැර කිරීම් | - | (89,900) | (333,840) | - | (423,740) |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 10,000,000 | 14,152,432 | 25,035,591 | 141,450 | 49,329,474 |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | 5,893,773 | 11,861,247 | 20,576,966 | 141,450 | 38,473,436 |
| වර්ෂය සඳහා අය කිරීම් | 2,500,000 | 532,847 | 922,172 | - | 3,955,019 |
| බැහැර කිරීම් | - | (89,900) | (333,840) | - | (423,740) |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 8,393,773 | 12,304,194 | 21,165,298 | 141,450 | 42,004,716 |
| **ලියා අඩු කළ අගය** | | | | | |
| **2017 දෙසැම්බර් 31 දිනට** | 1,606,227 | 1,848,237 | 3,870,294 | - | 7,324,758 |
| ලියා අඩු කළ අගය | | | | | |
| 2016 දෙසැම්බර් 31 දිනට | 4,106,227 | 1,677,696 | 1,845,535 | - | 7,629,457 |

* ලී බුඩු, වෑද්දුම් හා සවිකිරීම් වලට අදාල ආරම්භක ශේෂය සඳහා රු:1393/= ක ගැලපීමක් සිදුකර ඇත.

** සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | 4,622,633 |
| ලී බඩු සහ සවිකිරීම් | 6,279,005 |
| කාර්යාල උපකරණ - විද්‍යුත් දත්ත සැකසුම් | 16,466,253 |
| කාර්යාල උපකරණ - වෙනත් | 2,446,483 |
| පුහුණු උපකරණ | 141,450 |
| | **35,386,801** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2017 රු. | 2016 නැවත ප්‍රකාශිත රු. |
|---|---|---|---|
| **2 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ අනෙකුත් ජංගම නොවන වත්කම්** | | | |
| කුළී සහ විද්‍යුත් තැන්පතු | | 9,593,949 | 14,759,880 |
| භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජන | | 1,076,659,000 | 1,076,659,000 |
| | | 1,086,252,949 | 1,091,418,880 |
| **ජංගම වත්කම්** | | | |
| රජයේ සුරැකුම්හි ආයෝජන | | - | 1,049,400,000 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | 2,694,300,000 | 922,000,000 |
| රජයේ සුරැකුම්පත් හා ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොලිය | | 173,597,603 | 105,241,199 |
| ලැබිය යුතු සෙස් බදු | 17 | 127,037,223 | 111,464,812 |
| බැංකුවේ ඇති ශේෂය | 18 | 558,124 | 503,267 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කළ යුතු අගය | 16 | 28,213,306 | 11,837,206 |
| | | 3,023,706,256 | 2,200,446,486 |
| මුළු වත්කම් | | 4,109,959,205 | 3,291,865,366 |
| **3 භාණ්ඩ තොග** | | | |
| මුද්‍රණ ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග | | 331,359 | 352,633 |
| මුද්දර | | 15,940 | 40,400 |
| | | 347,299 | 393,033 |
| **4 අනෙකුත් ජංගම වත්කම්** | | | |
| තැන්පතු | | 202,895 | 195,363 |
| ඉතිරි කිරීම් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | 500 | - |
| වෙනත් ලැබිය යුතු දෑ | | 79,420 | 3,106,577 |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | | 1,934,725 | 1,515,446 |
| එකතු කල අගය මත බදු පාලන ගිණුම | | 1,735,599 | 1,607,046 |
| පොලී ලැබීම් - භාණ්ඩාගාර බිල්පත් | | 211,727 | 121,919 |
| සේවක ණය* | | 5,769,159 | 5,764,542 |
| අත්තිකාම් සහ පෙර ගෙවීම් | | 1,965,955 | 1,062,196 |
| ආර්ථික සේවා ගාස්තු | 17 | 279,070 | 132,365 |
| සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් ලැබිය යුතු | | 15,000 | - |
| | | 12,194,049 | 13,505,456 |
| *කාර්යය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය | | | |
| ජනවාරි 1 දිනට ශේෂය | | 5,764,543 | 4,948,645 |
| වර්ෂය තුළ දී ප්‍රදානය කළ ණය | | 3,319,000 | 4,162,000 |
| | | 9,083,543 | 9,110,645 |
| වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම් | | (3,314,383) | (3,346,103) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | 5,769,159 | 5,764,543 |
| **5 මුදල් සහ මුදල් හා සමාන දෑ** | | | |
| බැංකුවේ ඇති මුදල් | 18 | 9,373,734 | 5,643,249 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය | 18 | (3,577,513) | (438,314) |
| ලංකා බැංකුව -ලෙජරයට අනුව | | - | 2,301 |
| අතැති මුදල් | | 5,796,222 | 5,207,234 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2017<br>රු. | 2016<br>නැවත ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **6 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල** | | | |
| ආරම්භක ශේෂය | 16 | 3,291,865,366 | 2,643,227,233 |
| වර්ෂය තුළදී ලද සෙස් බදු | | 418,234,960 | 408,178,592 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය මත පොළී | | - | 2,647,461 |
| ප්‍රති මිල දී ගැනීම් සහ ඉල්ලුම් හිණුම් මත පොළී | | 28,364,495 | 127,179,906 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත පොළී | | 95,120,708 | 95,381,313 |
| ස්ථාවර තැන්පතු මත පොළී | | 248,496,708 | 3,437,951 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය මත පොළිය | | 331,799 | 263,804 |
| කොමිෂන් සභාවේ ශුද්ධ අතිරික්තය | | 31,220,674 | 12,185,206 |
| | | 4,113,634,709 | 3,292,501,466 |
| අඩු කළා: | | | |
| මෙහෙයුම් වියදම් සඳහා මාරු කිරීම් | | - | - |
| ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | | 3,650,319 | 619,406 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම් | | 3,650,319 | 619,406 |
| බැංකු ගාස්තු | | 25,186 | 16,695 |
| | | 3,675,504 | 636,100 |
| අවසාන ශේෂය | | 4,109,959,205 | 3,291,865,366 |
| **7 ප්‍රදාන** | | | |
| වසර ආරම්භයේ දී ශේෂය | | 3,523,232 | 4,965,789 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් | | 3,650,319 | 619,406 |
| අඩු කළා: වර්ෂය තුළ දී ක්‍රමක්ෂය කිරීම් | | (1,455,019) | (2,061,963) |
| වසර අවසානයේ දී ශේෂය | | 5,718,532 | 3,523,232 |
| **සටහන - ප්‍රදාන හඳුනා ගැනීම** | | | |
| ප්‍රදානයන්, මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත. | | | |
| මෝටර් රථ වාහන | | 25% | |
| කාර්යාල උපකරණ - වෙනත් සහ වි.ද.සැ. | | 25% | |
| ලී බඩු වැද්දුම් සහ සවි කිරීම් | | 12.5% | |
| පුහුණු උපකරණ | | 25% | |
| **8 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | | |
| වසර ආරම්භයේ දී ශේෂය | | 9,842,625 | 8,035,447 |
| වසර තුළ ප්‍රතිපාදන | | 1,893,706 | 1,807,178 |
| අඩුකළා - වසර තුළ සිදු කරන ලද ගෙවීම් | | (833,784) | - |
| වසර අවසානයේ ශේෂය | | 10,902,547 | 9,842,625 |
| **9 අනෙකුත් ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | | 6,403,725 | 7,448,565 |
| සේවක අර්ථසාධක අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | | 694,744 | 654,487 |
| සේවක භාරකාර අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | | 104,212 | 98,174 |
| උපයන විට බදු සඳහා කළ යුතු ගෙවීම් | | 193,832 | 195,330 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂන අරමුදලට මාරුකල යුතු අගය | 16 | 28,213,306 | 11,837,206 |
| වෙනත් | | 683,677 | 207,115 |
| | | 36,293,496 | 20,440,878 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| **10 ආයභාරය** | | |
| රක්ෂණ සමාගම්වලින් වාර්ෂික ගාස්තු | 142,174,726 | 125,489,332 |
| ලියාපදිංචි කිරීමේ සහ අළුත් කිරීමේ ගාස්තු | 8,608,493 | 5,482,704 |
| | 150,783,219 | 130,972,036 |
| **11 වෙනත් ආදායම්** | | |
| මෝටර් වාහන ණය මත පොළී | 38,235 | 26,129 |
| ආපදා ණය මත පොළී | 160,369 | 146,279 |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | 41,449 | 66,590 |
| වෙනත් ආදායම් | 62,773 | 19,371 |
| | 302,826 | 258,370 |
| **12 කාර්ය මණ්ඩල වියදම** | | |
| කාර්ය මණ්ඩල වැටුප | 40,561,287 | 39,765,213 |
| සේ.අ.අ. 12% | 4,867,354 | 4,775,620 |
| සේ.භා.අ. 3% | 1,216,839 | 1,193,905 |
| සභාපතිනියගේ වියදම් - දීමනා | 1,200,000 | 1,200,000 |
| සභාපතිනියගේ ඉන්ධන වියදම් | 238,680 | 238,680 |
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගාස්තු | 630,000 | 750,000 |
| පුහුණුවන නිළධාරි දීමනා | 25,000 | 225,037 |
| අතිකාල | 144,169 | 137,226 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් | 1,767,019 | 1,662,539 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය | 1,080,307 | 920,277 |
| ගිනි හා පුද්ගල රක්ෂණය | 254,026 | 367,374 |
| කාර්ය මණ්ඩල සුබසාධන | 946,202 | 1,264,417 |
| කාර්ය මණ්ඩල පුහුණු - දේශීය | 1,297,577 | 2,021,522 |
| විදේශ ගමන් හා පුහුණු | 4,741,449 | 8,370,750 |
| කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා | 2,093,426 | 2,072,650 |
| ප්‍රචාරණය - බඳවා ගැනීම් | 536,990 | 137,520 |
| අධ්‍යක්ෂක දුරකථන | 463,199 | 300,613 |
| නිවාඩු දීමනා | 714,347 | 758,115 |
| වාහන මෙහෙයුම් කල්බදු ගාස්තු | 970,032 | - |
| රියදුරු දීමනා | 111,290 | - |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාහන දීමනා | 3,243,548 | 3,000,000 |
| අධ්‍යක්ෂකවරුන්ගේ ඉන්ධන දීමනා | 944,764 | 893,680 |
| සේවක පාරිතෝෂික | 1,893,706 | 1,807,178 |
| | 69,941,211 | 71,862,315 |
| **13 වෘත්තීමය ගාස්තු** | | |
| උපදේශක සේවා ගාස්තු | 2,000,000 | 2,801,156 |
| | 2,000,000 | 2,801,156 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| **14 මෙහෙයුම් වියදම්** | | |
| කාර්යාල කුලී | 32,175,621 | 29,495,421 |
| රථ ගාල් කිරීමේ ගාස්තු | 508,670 | 384,743 |
| දුරකථන හා අන්තර්ජාල වියදම් | 1,605,633 | 1,686,159 |
| විදුලිය | 1,324,406 | 1,315,853 |
| කාර්යාල නඩත්තු කිරීම් | 473,899 | 617,424 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 2,096,822 | 1,328,183 |
| මහජන දැනුවත් කිරීම් | 3,334,383 | 2,922,135 |
| සංග්‍රහ වියදම් | 32,515 | 54,591 |
| ගමන් වියදම් - දේශීය | 92,044 | 105,542 |
| කාර්යාල උපකරණ නඩත්තු වි.ද.සෑ හා වෙනත | 1,178,671 | 1,216,309 |
| සාමාජිකත්වය - IAIS | 2,784,043 | 2,717,637 |
| ප්‍රචාරණය - වෙනත් | 85,950 | 31,040 |
| රැස්වීම් ගාස්තු | 559,353 | 705,435 |
| පුවත්පත් හා පුස්තකාල පොත් | 135,959 | 126,414 |
| තැපැල් හා පණිවිඩ ගාස්තු | 990,554 | 207,402 |
| විගණන ගාස්තු - විගණකාධිපති | 227,100 | 223,500 |
| ක්ෂය | 3,955,019 | 4,259,214 |
| පොදු වියදම් | 98,343 | 118,475 |
| නීති වියදම් | 12,960 | 8,040 |
| විමර්ශන වියදම් | 4,492 | 6,798 |
| අධීක්ෂණ වියදම් | 2,000 | - |
| වාහන නඩත්තු | 422,040 | 494,627 |
| වාහන රක්ෂණ | 107,011 | 130,859 |
| වාහන ඉන්ධන වියදම් | 182,727 | 202,343 |
| සේප්පු ගාස්තු | 3,000 | - |
| ජාතිය ගොඩනැගීමේ බදු | 819,026 | 674,276 |
| | 53,212,244 | 49,032,420 |
| **15 මූල්‍ය හා වෙනත් වියදම්** | | |
| බැංකු ගාස්තු | 114,876 | 150,126 |
| | 114,876 | 150,126 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

16. **නැවත ප්‍රකාශ කිරීම**

2014 වර්ෂයේ ආදායම සඳහා, සාමාජිකත්වය අළුත් කිරීමේ ආදායම රු: 30,000 ක මුදල හඳුනාගෙන නොමැත. ඒ අනුව, එම මුදල ලද අත්තිකාරම් ගිණුමේ ශේෂය තුල පැවැති අතර, එම ගිණුමෙන් අඩු කර, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට එකතු කර ඇත. එබැවින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල රු: 30,000 කින් වැඩි වී ඇත.

17. **ජාතික රක්ෂණ භාර අරමුදලින් ලැබිය යුතු මුදල්**

සෙස් ආදායම තුළ ජාතික රක්ෂණ භාර අරමුදලින් ලැබිය යුතු ලෙස නිශ්චය කළ රු.10,062,587.55/ක් අන්තර්ගත වන අතර එකී අගය 2015 හා 2016 වසර වෙනුවෙන් ජා.ර.භා. අරමුදලින් ලද සෙස් ආදායමේ සාමාන්‍යයට 10%ක වර්ධනයක් ගලපා ඇස්තමේන්තු කර ඇත. ජා.ර.භා. අරමුදල කාර්තුමය වශයෙන් කොමිෂන් සභාවට සෙස් ගෙවා නොමැත.

18. **අරමුදල් කළමණාකරණ ගිණුම්, ලෙජර් ශේෂයන් හා බැංකු ශේෂයන්**

කොමිෂන් සභාවේ ජංගම ගිණුම් 2ට සම්බන්ධව අරමුදල් කලමණාකරණ ගිණුම් 2 ක් පවත්වාගෙන යන අතර ජංගම ගිණුමේ ශේෂය රු. 1,000,000/- ඉක්මවන විට එකී ඉක්මවූ අගය අරමුදල් කළමණාකරණ ගිණුමට මාරු කෙරේ. කොමිෂන් සභාව විසින් නිකුත් කරන චෙක් පත් සැම විටම, එසැනින්ම බැංකුවට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන බැවින්, ඉහත අරමුදල් කළමණාකරණ ගිණුම් හා සම්බන්ධිත ගණුදෙනු කොමිෂන් සභාවේ ගිණුම්වලට ඇතුලත් කළ පසු, ලෙජරයේ දැක්වෙන බැංකු ශේෂය සෘණ අගයක් ගත හැක.

2017 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය පහත පරිදි වේ.

| | |
|---|---|
| කොමිෂන් සභාව | - රු. 999,250.00 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | - රු. 558,123.72 |

19. **බදුකරණය**

බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2006 අංක 10 දරණ ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලවයි.

19.1 **රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපල ගනුදෙනු වෙනුවෙන් රඳවාගත් බදු සඳහා ලැබෙන නාමික බැර**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 137 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත උපයන පොලී ආදායම අදාළ තක්සේරු වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් සේ සලකන අතර එම පොලිය වෙනුවෙන් නාමික බදු බැර සඳහා හිමිකාරත්වය ලැබේ.

ඒ අනුව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනුවලින් කොමිෂන් සභාව විසින් උපයන ලද ශුද්ධ ආදායම දළ ආදායම බවට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්‍ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නාමික බදු බැර වටිනාකම රුපියල් 301,876.18/- ක් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත කරනු ලැබූ ආයෝජනයන්ගෙන් උපයන ලද පොලී ආදායම ගිණුම්ගත කර හඳුනාගෙන ඇත්තේ ශුද්ධ අගයටය.

20. **ප්‍රාග්ධන බැඳියාව**

2017 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

21. **අසම්භාව්‍ය බැරකම්**

2017 දෙසැම්බර් 31 දිනට කිසිදු අසම්භාව්‍ය බැරකමක් නොමැත.

22. **වාර්තා කරන දිනෙන් පසු හටගත් සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නොමැත.

23. **සම්බන්ධිත පාර්ශව අනාවරණ**

ඉන්ද්‍රානි සුගතදාස මහත්මිය (සභාපතිනිය), ඩී.ආර්. දේශප්‍රිය මහතා, ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා (නිල බලයෙන් පත්වූ සාමාජිකයන්), ජෙරම් බෝලින් මහතා හා ආචාර්ය අලි අස්ගර් ශබීර් ගුලාම් හුසේන් මහතා 2017 වසර පුරාම කොමිෂන් සභාව අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකත්වය හොබවන ලදී.

නිල බලයෙන් පත්වූ සාමාජික ජී. සමරසිරි මහතා 2017 අගෝස්තු 19 දින සිට එකී ධූරයෙන් ඉවත් වූ අතර සී.ජේ.පී. සිරිවර්ධන මහතා 2017 අගෝස්තු 19 දින සිට එකී ධූරයට පත්විය.

සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ගේ සංස්ථාපිත සම්බන්ධතාවය පහත වගුවෙන් නිරූපණය කෙරේ.

| සාමාජිකයාගේ නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාව |
|---|---|---|
| ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය | කළුබොවිටියාන තේ කම්හල් සමාගම<br>එන් ඩී බී බැංකුව | අධ්‍යක්ෂිකා<br>අධ්‍යක්ෂිකා |
| ඩී.ආර්. දේශප්‍රිය මහතා | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව<br>සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය<br>ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. | මණ්ඩල සාමාජික (2016 ජූලි 14 සිට)<br>මණ්ඩල සාමාජික<br>මණ්ඩල සාමාජික (2017 ඔක්තෝම්බර් 03 සිට) |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| සාමාජිකයාගේ නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාව |
|---|---|---|
| පී සමරසිරි මහතා | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය | සභාපති |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | සභාපති |
| | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සාමාජික 2017 අගෝස්තු 19 දින දක්වා |
| | ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වූ අපි වෙනුවෙන් අපි කළමණාකරන මණ්ඩලය | සාමාජික |
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | මණ්ඩල සාමාජික |
| | ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය | මණ්ඩල සාමාජික |
| ජෙරම් බෝලින් මහතා | ඔක්ටගන් කන්සල්ටන්ස් (පෞද්) සමාගම | අධ්‍යක්ෂක |
| | | අධ්‍යක්ෂක |
| | එන්ඩ්ලස් අවුට්ඩෝස් (පෞද්) සමාගම | අධ්‍යක්ෂක |
| ආචාර්ය අලි අස්ගර් ශබීර් ගුලාම්හුසේන් මහතා | ඇඩම් කැපිටල් පීඑල්සී | අධ්‍යක්ෂක |
| | සිලෝන් ඇන්ඩ් ෆොරින් ට්‍රේඩ්ස් පීඑල්සී | අධ්‍යක්ෂක |
| | බිස්නස් චේම්බර් ඔෆ් කොමර්ස් | අධ්‍යක්ෂක |
| | ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය | අධ්‍යක්ෂක |
| | ඇඩම් එක්ස්පෝ (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් කාබන්ස්(පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් කැපිටල් මයික්‍රෝ ක්‍රෙඩිට් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | නෙට්වර්ක් කොමියුනිකේෂන්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් මෙටල්ස්(පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් එයා කන්ඩිෂනර්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් ඇපරල්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් ඔටොමොබයිල්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | වෙල්වින් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ජියෝර්ජියෝ මොරැන්ඩි (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ස්පයිස් ඔෆ් ලයිෆ් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | සිලෝන් ඇන්ඩ් ෆොරින් සර්ජිටෙක් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | කලම්බෝ ඇපොතිකරීස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | කලම්බෝ ෆ්‍රේට් ඇන්ඩ් ට්‍රාන්ස්පෝට් සමාගම | අධ්‍යක්ෂක |
| | ඩොඩ්වෙල් ඇන්ඩ් කම්පනි සමාගම | අධ්‍යක්ෂක |
| | හැමිල්ටන් රිසෝට්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |

වෙළඳපොළ වටිනාකම් මත සිදු කරන ලද සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මත සිදු කල ගනුදෙනු හැර උක්ත ආයතන සමඟ සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

# විගණකාධිපති වාර්තාව

## විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ටීආර්ටී/සී/අයිආර්සීඑස්එල්/2017/එෆ්එස්/16 | ඔබේ අංකය / உமது இல. / Your No. |
| දිනය / திகதி / Date | 2018 අගෝස්තු 31 දින | |

සභාපති

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ සංශෝධිත පනත හා 2000 අංක 43 දරන ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 8 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2018 ජූලි 18 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (IBSL) යන නාමය ශ්‍රී ලංකා රක්ෂණ නියාමක කොමිෂන් සභාව යනුවෙන් වෙනස් කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි සියලු රක්ෂණ සමාගම් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ අනිවාර්ය ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමේ අරමුණ ඇතිව, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙස 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතින් වෙනස් කර තිබුණි.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

----------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

---------------------------------------------

2006,2008 හා 2012 වර්ෂවලදී මිලදීගෙන තිබුණු ධාරණ අගය රු.2,604,348 ක්වූ මෝටර් වාහන 2014 වර්ෂයේදී රු.10,000,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වනවිට නැවතත් ප්‍රත්‍යාගණනයක් සිදු කළ යුතු වුවත් 2014 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රමිතයෙහි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් මෝටර් වාහන හැර පිරිවැය රු.31,724,786 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රක්ෂණ ආයතනයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලීම සඳහා නිශ්චිත කාල සීමාවක් නිර්ණය කර නොමැති අතර අයදුම්පතේ සඳහන් කර තිබුණු කොන්දේසි අනුව, රක්ෂණ ආයතනයක් ලෙස ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කල ආයතනය අයදුම්පත ඉවත් කර ගැනීමක් සිදු කරයි නම් අදාල මුදලින් සියයට 50 ක් පමණක් ආපසු ගෙවන බව සඳහන් කර තිබුණි. එසේ වුවද විගණනය විසින් පරීක්ෂණයට භාජනය කළ අවස්ථා තුනකදී ඒ අනුව කටයුතු නොකර වැයකල මුළු මුදල වූ රු.500,000 ක් ආපසු ගෙවා තිබුණු අවස්ථාවක් මුළු මුදල රඳවාගෙන ගෙවිය යුතු ලෙස සටහන් කර තිබුණු අවස්ථාවක් මුළු මුදලම ආදායමට ගෙන තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය.

(ආ) කොමිෂන් සභාව විසින් පුස්ථකාල පොත් සම්බන්ධව අනුගමනය කර තිබූ ප්‍රතිපත්තිය වනුයේ සියළු පොත් පිරිවැය, මිලදී ගන්නා වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීමයි. කෙසේ වුවද, සභාව මිළදී ගෙන තිබූ පිරිවැය රු.100,000 ඉක්මවූ පොත්ද ඉහත කී පරිදි වියදම් ලෙස ගිණුම්ගත කර තිබෙන බව පුස්ථකාල පරිග්‍රහණ ලේඛනය අනුව නිරීක්ෂණය විය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 16(1) හා (2) වගන්ති අනුව, සෑම රක්ෂණකරුවෙකු විසින්ම තම රක්ෂණ සමාගම්වල මුළු ලේඛනගත වාරික මුදල මත වාර්ෂික ගාස්තුවක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු විය. ඒ අනුව 2017 ජුනි 28 දින කටයුතු අත්හිටුවා තිබූ රක්ෂණ සමාගමකින් ලැබිය යුතු රු. 1,460,687 ක් ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

------------------------------

2017 වර්ෂයට අදාළව ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලැබියයුතු සෙස් ආදායම ලෙස රු. 10,062,587 ක් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද 2017 වර්ෂයේ ජාතික රක්ෂණ භාර අරමුදලේ අවසන් මූල්‍ය ප්‍රකාශන අනුව කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු සෙස් ආදායම රු. 16,107,274 ක් වීම හේතුවෙන් රු. 6,044,687 ක වෙනසක් විය.

## 2.3 ලැබිය යුතු ගිණුම්

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 38(1)(ආ) වගන්තිය ප්‍රකාරව, 2015 වර්ෂයේදී දීර්ඝ කාලීන (ජීවිත රක්ෂණ) හා සාමාන්‍ය රක්ෂණ ලෙස රක්ෂණ ආයතන වෙන් කිරීම සඳහා අයඳුම්කළ රක්ෂණ සමාගමකින් ලැබී තිබුණු රු. 500,000 ක් හා ඊට අදාළව ලැබිය යුතු රු. 71,429 ක බදු මුදලක් විගණිත දින වන විටත් පනත ප්‍රකාරව වෙන්කිරීම් සිදු නොකිරීම නිසා නිරවුල් නොවී පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 38(1)(ආ) වගන්තිය | දීර්ඝ කාලීන රක්ෂණ (ජීවිත රක්ෂණ) ව්‍යාපාරය සම්බන්ධයෙන් වන වත්කම් ,වෙනත් යම් පංතියක රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ වත්කම් වලින් වෙන්ව තබා ගත යුතු වුවද ලියාපදිංචි රක්ෂණ සමාගම් 12 න් රක්ෂණ සමාගම් 2ක් මෙතෙක් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | ලබා ගන්නා තත්කාර්ය අතුරු අග්‍රිම, එය දෙන ලද කාර්ය නිමකල වහාම නැවත පියවිය යුතු වුවත් රු. 755,996 ක් වූ අත්තිකාරමක් ලබා ගෙන මාස 06 ඉක්මවා තිබුණද, විගණිත දිනය වනවිටත් පියවා නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14. ඡේදය | පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබා ගත යුතු වුවද, අත්පොත් සඳහා විගණිත දිනය වන විටත් භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලැබී නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------------

කොමිෂන් සභාව ආරම්භයේ සිටම මූල්‍ය ප්‍රකාශනවල බදු පසු අතිරික්තයක් හෝ ඌණතාවයක් පෙන්නුම් නොකෙරුණු අතර කොමිෂන් සභාව විසින් ආදායම ඉක්මවන වියදම සඳහා වූ මුදල්, රක්ෂණ හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට ගලපමින් ඉහත කී අතිරික්තය හෝ ඌණතාවය ශුන්‍ය කර තිබුණි. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, කොමිෂන් සභාවේ ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.20,622,656 කින් වැඩි වී තිබුණු අතර කොමිෂන් සභාවේ මුළු වියදම ද රු. 20,457,782 කින් එනම් සියයට 15 කින් වැඩි වී තිබුණි. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට කළ මාරු කිරීම රු.19,035,468 කින් හා මෙහෙයුම් වියදම් රු.4,179,824 කින් වැඩිවීම ඉහත වියදම වැඩිවීම කෙරේ ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කොමිෂන් සභාවේ 2013 සිට 2017 දක්වා වර්ෂ 05 සඳහාම මූල්‍ය ප්‍රකාශන අනුව මෙහෙයුම් අතිරික්තයක් නොවුනු නමුදු පසුගිය වසර 05හි සමස්ථ දායකත්ව විචලතාවය පරීක්ෂා කිරීමේදී, 2013, 2014, 2015 හා 2016 වර්ෂයන්හි දායකත්වය ක්‍රමයෙන් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද දායකත්වය වැඩි වී තිබුණද එම වැඩිවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 19 ක් පමණක් වී තිබුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ වර්ෂය තුළදී රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට අරමුදල් මාරු කිරීමයි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ විමර්ෂන, අධීක්ෂණ, නීති හා වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශවල ප්‍රගතිය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) විමර්ෂන අංශය

(i) රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන් විසින් පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත සම්බන්ධයෙන් 2016 ඔක්තෝම්බර් 01 දින නිකුත් කර තිබූ මාර්ගෝපදේශ ලිපිය අනුව 2017 ජනවාරි 01 දින සිට අර්ධ වාර්ෂිකව පැමිණිලි පිළිබඳ හඳුන්වාදුන් ආකෘතිය ප්‍රකාරව දින 30 ක් ඇතුළතදී රක්ෂණ සමාගම් විසින් කොමිෂන් සභාව වෙත තොරතුරු එවිය යුතු වුවද රක්ෂණ ආයතන 27 න් ආයතන 09 ක් විගණිත දිනය වන විටත් එසේ තොරතුරු එවා නොතිබුණි.

(ii) 2017 වර්ෂයේ ලද පැමිණිලි 348 කින් පැමිණිලි 57 ක් එනම් සියයට 16 කට ආසන්න ප්‍රමාණයක් විගණිත දිනය වූ 2018 ජූලි 24 දින වන විටත් නොවිසඳී පැවතුණි.

#### (ආ) අධීක්ෂණ අංශය

(i) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 38(3) (අ) වගන්තිය ප්‍රකාරව නියම කරනු ලබන යම් ආකෘතියක වාර වාර්තාවක් කලින් කළ සපයන ලෙස ඒ ඒ රක්ෂණකරුගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකිය. මාසය අවසන් වී දින 21 ක් ඇතුළත එලෙස ඉල්ලා ඇති ඔවුන්ගේ මාසික ව්‍යවස්ථානුකූල වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළයුතු වුවද ඒ අනුව වාර්තා ඉල්ලා ඇති රක්ෂණ සමාගම් 03 ක් නියමිත කාලපරිච්ඡේදය තුළදී එම වාර්තා කොමිෂන් සභාව වෙත එවා නොතිබුණද කොමිෂන් සභාව ඒ සම්බන්ධව ක්‍රියා කර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2016 වර්ෂය සඳහා රක්ෂණ කර්මාන්තයේ අත්පොත 2017 වර්ෂයේ තුන්වන හා හතරවන කාර්තුව ඇතුළත ප්‍රකාශ කිරීමට සැලසුම් කළද, මාස 04 කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2018 අප්‍රේල් මාසයේදී එය ප්‍රකාශයට පත්කර තිබුණි.

(iii) 2017 ඔක්තෝබර් 31 දින සිට ජීව ගණක තනතුර පුරප්පාඩුව පැවතීම නිසා 2017 වර්ෂයේ තෙවන සහ සිව්වන කාර්තුවල සිට මේ දක්වා රක්ෂණ ආයතනවල අවධානම් පාදක ප්‍රාග්ධනය රාමුවට අනුව වගකීම් සමාලෝචනය කිරීමක් සිදු වී නොතිබුණි.

(iv) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 48(1) වගන්තිය ප්‍රකාරව, රක්ෂණකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ජීව ගණක තොරතුරු ජීව ගණකවරයා විසින් සමාලෝචනය කර නිර්දේශ කිරීම් සිදු කළ යුතු වුවද ජීව ගණක තනතුර පුරප්පාඩුව පැවතීම හේතුවෙන් රක්ෂණකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ජීව ගණක වාර්තා, 2016 වර්ෂයේ සිට මේ දක්වා සමාලෝචනයක් කර නොතිබුණි.

(v) ශ්‍රී ලංකා රක්ෂණ කොමිෂන් සභාව යටතේ රක්ෂණ තැරැව්කාර සමාගම් 60 ක් ලියාපදිංචිව පවතින අතර එම සමාගම් අතුරින් සමාගම් 8 ක පමණක් 2017 වසර තුළ දී ක්ෂේත්‍රගත පරීක්ෂණ අධීක්ෂණය සිදුකර තිබුණි. එය මුළු තැරැව්කාර සමාගම් වලින් සියයට 13 ක පමණ ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(ඈ) නීති අංශය**

------------

(i) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 114 වගන්තියේ අර්ථ නිරූපිත, තැරැව්කරුවන්, ලියාපදිංචි කිරීම 2012 අප්‍රේල් 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව නතර කර තිබුණු අතර 2016 මැයි 02 වන දින එම තහනම ඉවත් කර නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම ආරම්භ කර තිබුණි. එසේ වුවද කොමිෂම විසින් තැරැව්කරුවන් ලියාපදිංචි කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් හා ක්‍රියාපටිපාටියක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් ලියාපදිංචි කටයුතු සිදු කිරීමේ දිගු කාලීන ප්‍රමාදයන් පවතින බවට නිරීක්ෂණය විය.

(ii) නියාමන/ උපදේශාත්මක ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා සෑම රක්ෂණ හා රක්ෂණ තැරැව්කාර ආයතනයක්ම, ප්‍රධාන නිලධාරියෙක් (Principle Officer) ලෙස ප්‍රධාන විධායක නිලධාරී හෝ විධායක කළමනාකරු හෝ එම කාර්යයන්ට වගකීමක් දරන නිලධාරියෙකු පත්කර 2017 මැයි 12 දිනට පෙර කොමිෂමට දැනුම්දිය යුතු බව කොමිෂන් සභාවේ 2016 මාර්තු 13 දිනැති මහ පෙන්වීම් (Direction) 09 මඟින් සියළුම රක්ෂණ හා රක්ෂණ තැරැව්කාර ආයතන 60 කට දැනුම්දී තිබුණි. එම සමාගම් විසින් සිදුකළ ඉල්ලීම් මත මෙම කාලය 2017 සැප්තැම්බර් 30 වන දින තෙක් දීර්ඝ කර තිබුණ ද 2018 ජූලි 24 විගණිත දින වන විටත් රක්ෂණ ආයතන 02 ක් ප්‍රධාන නිලධාරියෙකු පත් කර නොතිබුණි.

(iii) සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් වෙත 2009 වර්ෂයේදී සභාව විසින් ව්‍යාපාර කටයුතු අත්හිටුවීමක් පනවා තිබුණු අතර SC(FR) 191/09 දරන මූලික අයිතිවාසිකම් නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් නියෝග ප්‍රකාර එම සමාගම වෙත ඉදිරිපත් කරනු ලබන අව්‍යාජ රක්ෂණ හිමිකම් පෑම් ක්‍රමවත්ව බේරුම් කිරීමට එකී සමාගම් වත්කම් බැහැර කිරීම සඳහා එවකට මණ්ඩලය, සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වුවද, අව්‍යාජ හිමිකම් පෑම් 142 කින් 132 ක් සඳහා හිමිකම් නිරවුල් කර තිබුණු අතර නඩු ලිපිගොනු 10 පිළිබඳ වර්තමාන තත්ත්වය විගණිත දින වූ 2018 ජූලි 24 දින වන විටත් ඉදිරිපත් වී නොතිබුණි.

**(ඈ) වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය**

---------------------------------------------------

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ග්‍රාම නිලධාරීන්, පොලිස්, දිවිනැගුම, සංවර්ධන, කෘෂිකර්ම හා ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් ඉලක්ක කර ගනිමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වා තිබුණද, සාමාන්‍ය මහජනතාව ඉලක්ක කර දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය නොවීය. එසේම, පවත්වා තිබුණු වැඩසටහන්වලින් සියයට 50 ක්ම මධ්‍යම පළාත තුළ පමණක් පවත්වා තිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රමාණවත් බව හා සාර්ථකත්වය පිළිබඳව ප්‍රශ්නාවලියක් මඟින් සහභාගී වන නිලධාරීන් වෙතින් අදහස් ලබා ගෙන තිබුණි. ඒ අනුව ප්‍රශ්නාවලිය ඉදිරිපත් කිරීමෙන් අනාගත වැඩසහන්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රයෝජනවත් වන බව දන්වා තිබුණද ලද පිළිතුරු සමාලෝචනය කිරීමක්

හෝ ප්‍රතිචාරය අනුව වැඩසටහන යාවත්කාලීන කිරීමක් සිදු කළ බව විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

(iii) වර්ෂය තුළදී පැසැල් සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, එක් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි.

(iv) ක්‍රියාකාරී සැලැස්ම අනුව, 2016 වර්ෂයේ ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ ප්‍රගතිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම මුද්‍රිත මාධ්‍යවල පළ කිරීමට සැලසුම් කළද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් එම නිවේදනය පල කර තිබුණි.

(v) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා නිතර අසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු පිළියෙල කර වෙබ් අඩවියට ඇතුළත් කිරීමට සැලසුම් කර තිබුණද විගණිත දිනය වන 2018 මැයි 18 දින වන විටත් එසේ සිදුකර නොතිබුණි.

(vi) වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර තිබුණු අත්පත්‍රිකා ලෙස Brochures (පොත් පිංච) 08 ක්ද Handout (අත්පත්‍රිකා) 03 ක්ද මුද්‍රණය කර තිබුණද ඒවා යාවත්කාලීන කර නොතිබුණු අතර නව අත්පත්‍රිකා කිසිවක් සකස්කර ප්‍රසිද්ධ කර නොතිබුණි.

(vii) සමාජ මාධ්‍ය ඔස්සේ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ලෙස YouTube හි ගිණුමක් විවෘත කිරීමටත් 2016 හි දැනුවත් කිරීමේ ශ්‍රව්‍ය හා දෘශ්‍ය ලෙස සම්බන්ධ කිරීමටත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය තුළ ඇතුළත් කිරීමටත් කටයුතු කර තිබුණද, 2016 සැප්තැම්බර් මාසයෙන් පසුව වෙබ් අඩවිය යාවත්කාලීන (Update) කර නොතිබුණි.

(viii) ආසියානු සංවර්ධන බැංකුව මඟින් තාක්ෂණික සහාය ලබාදී ශ්‍රී ලංකාවේ රක්ෂණ ඔප්පු පිළිබඳ දැනුම ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති අතර එහි දී පරතර විශ්ලේෂණයක් (Gap Analysis) සිදුකර අඩුපාඩු හඳුනාගෙන තිබුණි. ඒ අනුව අධ්‍යාපන උපායමාර්ග හා ක්‍රියාවට නැංවීමේ සැලැස්ම, 2017 ඔක්තෝබර් කොමිෂන් සභාවට ලබා දී තිබුණද, ඒ සඳහා යෝජිත වැඩසටහන් ආරම්භ කිරීමක් 2018 ජුලි 24 දින වන විටත් නිරීක්ෂණය නොවීය.

**(ඉ) මූල්‍ය හා පරිපාලන අංශය**

-----------------------------

සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා සභාව විසින් 2017 වර්ෂයේ අයවැයගත දත්තයන්ට අනුව දේශීය පුහුණු කිරීම් සඳහා රු.3,000,000 ක් හා විදේශීය පුහුණු කිරීම් සඳහා රු. 10,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, සත්‍ය වශයෙන් වැය කළ අගයන් පිළිවෙලින් රු. 1,297,577 ක් හා රු. 4,741,449 ක් ලෙස පහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් ධාරණ අගය රු. 7,324,758 ක් වූ දේපල, පිරියත හා උපකරණ වත්කම් කාණ්ඩයෙහි, වර්ෂය අවසාන භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් භාවිතයට ගත නොහැකි හෝ හානි වූ ලෙස වර්ගීකරණය වූ අයිතම් 145ක් පමණ ඇතුළත් වූ අතර, ස්ථාවර වත්කම් ලේඛනයට අනුව විගණනයේදී හඳුනාගත හැකි වූ භාවිතයට ගත නොහැකි එම අයිතමයන්හි පිරිවැයෙහි එකතුව රු. 2,331,989 ක් විය. තවද භාවිතයට ගත නොහැකි හානි වූ හඳුනාගත් තොග අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 (1) වගන්තිය ප්‍රකාරව බුන්වත් වූ රක්ෂණ සමාගම්වල රක්ෂණ හිමිකම් නිරවුල් කිරීමේ අරමුණින් රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදල' යනුවෙන් අරමුදලක් පිහිටුවා තිබුණු අතර එම අරමුදලට සෙස් බද්දෙන් උපචිතවන මුදල් බැර කරනු ලැබිය යුතු විය. මෙම අරමුදල දීර්ඝ කාලීන අරමුදලක් වූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එහි ශේෂය රු. 4,109,959,205 ක් විය. අරමුදල ආරම්භයේ සිට අරමුදලේ මුදල් වැය කිරීම සඳහා අවස්ථා උද්ගත වී නොතිබුණි. එම නිසා මෙම අරමුදලේ මුදල් ඉහළ පොලී ආදායමක් ලැබිය හැකි ආයෝජනවල ආයෝජනය කිරීමට හැකියාව තිබියදී එම මුදල් ද්‍රවශීලතාව පදනම් කරගෙන කෙටි දින ගණනකට ආයෝජනය කර ඇති බැවින් අරමුදලට ලැබිය හැකි ඉහළ පොලී ආදායම අහිමි වන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, වාර්ෂික ගාස්තු ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් එදිනෙදා වියදම් පියවා ගැනීම සඳහා අරමුදලේ මුදල් භාවිතා කිරීමට සිදු වූ බැවින් කෙටිකාලීනව මුදල් ආයෝජනය කළ බව කොමිෂන් සභාව විසින් විගණනයට දන්වා තිබුණි.

(ඇ) 2015 ඔක්තෝබර් 05 දිනැති අංක 36 දරන අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ සෞඛ්‍ය රක්ෂණයක් තැරැව්කාර ආයතනයක් හරහා පවත්වා ගෙන යාමට ඕනෑම පුද්ගලයෙකුට අවසර ලබා දී ඇති අතර ඊට අදාළ තැරැව්කාර සමාගම ඒ සඳහා ලියාපදිංචි වී සිටිය යුතු විය. මේ යටතේ රක්ෂණ සමාගම් 02 ක් සඳහා මූලිකව වර්ෂයක කාලයකට අනුමැතිය ලබා දී තිබුණද, එම අනුමැතිය ලිඛිතව දීර්ඝ කර තිබුණු බව අනාවරණය නොවුණු අතර වෙබ් අඩවියේ පමණක් අනුමත කාල සීමාව දීර්ඝ කර ඇති බව දක්වා තිබුණි. වෙබ් අඩවිය දක්වා ඇති අනුමත කාල සීමාව දික් කිරීම නිසි අවසරයක් නොමැතිව සිදු කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරමින් පවතින බව කොමිෂන් සභාව විසින් විගණනයට දන්වා තිබුණි.

(ඇ) කොමිෂන් සභාව 2009 දෙසැම්බර් සිට බලපැවැත්වෙන පරිදි එහි නිලධාරීන් වෙත අප්‍රේල් හා දෙසැම්බර් මාසවල උත්සව අත්තිකාරම් ලෙස රු.50,000 බැගින් ගෙවා තිබුණු අතර කොමිෂන් සභාව මේ සඳහා විශේෂ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඉ) පුස්තකාල පොත් පිළිබඳ භෞතික පරීක්ෂාවේදී පොත් 11 ක් පුස්ථකාලයෙන් බැහැරට නිකුත් කර අවුරුදු 01 සිට අවුරුදු 07 දක්වා කාලයක් ඉක්මවා තිබුණද, නැවත බාර දී ඇති බව නිරීක්ෂණය නොවීය. එසේම රු. 100,000 කට ආසන්න වටිනාකමකින් යුත් පොත් 02 ක් පුස්ථකාලය තුළ භෞතිකව නිරීක්ෂණය නොවීය.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

ආයතනයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2005 අප්‍රේල් 1 දින සිට මාසිකව රු.330,096 ක් ගෙවීමේ පදනමට ගොඩනැගිල්ලක් කුලියට ලබාගෙන තිබුණි. අදාල කුලී ගිවිසුමෙහි 2008 මාර්තු 31 දින කාලය අවසන් වී තිබීම හේතුවෙන් කුලී ගාස්තුවල ඉහළ යාම නිසා වෙනත් ගොඩනැගිල්ලක් සොයා ගත යුතු බව අවස්ථා දෙකකදී අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමුකර තිබුණද එය ක්‍රියාත්මක නොකර 2017 ඔක්තෝබර් 01 දින සිට නැවතත් වසර 02 ක කාලයක් සඳහා මාසිකව රු.1,472,208 ක් ගෙවීමට නැවත එම ගොඩනැගිල්ලේ හිමිකරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට වූ පුරප්පාඩුව පවතින තනතුරු 04 ක් විගණිත දිනය වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2003 ජූනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ අනුමත තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවාගෙන නොතිබුණි.

(ඇ) 2012 මාර්තු 19 දින සකස් කර තිබූ පරිපාලන අත්පොත 2017 මාර්තු 30 දින මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණද, ඒ සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නොතිබුණි. එසේ වුවද මණ්ඩලය විසින් බඳවා ගැනීම්, වැටුප්, දීමනා ප්‍රතිපූර්ණය කිරීම් හා අත්තිකාරම් ගෙවීම් ඇතුළු කටයුතු පරිපාලන අත්පොත ප්‍රකාරව සිදු කරමින් පැවතුණි.

(ඈ) කොමිෂන් සභාවේ මුල්ම වැටුප් පරිමාණයන් 2005 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර එම අනුමත වැටුප් පරිමාණ හා දැනට ගෙවනු ලබන තත්‍ය වැටුප් පරිමාණ අතර වෙනස්කම් නිරීක්ෂණය විය. මෙහිදි අනාවරණය වූයේ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් මෙන්ම රේඛීය අමාත්‍යාංශය මගින් වැටුප් වැඩි කිරීම නිර්දේශ කළ නොහැකි බව දන්වා තිබියදීත් 2012 වර්ෂයේ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත (Treasury Representative) විසින් නිකුත් කර තිබූ අංක PED/360/12/2(II) හා 2012 ජූලි 18 දිනැති නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 25% ක උපරිමයකට යටත් වැටුප් සංශෝධනය කිරීමට විරුද්ධත්වයක් නොමැත යනුවෙන් සඳහන් ලිපියක් මත එලෙස වැටුප් පරිමාණය වැඩිකර ගෙන ඇති බවය.

(ඉ) මණ්ඩලය 2016 වර්ෂයේ ආරම්භයේ සිට රක්ෂණ සමාගම්වල නුබුන්වත් නීති රාමුව වෙනුවට හඳුන්වාදුන් අවධානම් පාදක ප්‍රාග්ධනය මූලික කරගත් සුපරීක්ෂණ ක්‍රමයකට (RBC) යොමුවීම නිසා ජීවගණක ඒකකයක් ඇති කිරීමට ජීවගණක තනතුරක්, සහකාර ජීවගණක තනතුරක් හා ජ්‍යෙෂ්ඨ විධායක/ විධායක තනතුරු 02 ක් 2016 ජූනි 09 හා දෙසැම්බර් 07 දෙදින අනුමත කරගෙන තිබුණි. 2016 වර්ෂයේදී ජීවගණක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරිනියක බඳවා ගෙන තිබුණ අතර 2017 ඔක්තෝබර් 31 දින සිට එම තනතුර පුරප්පාඩුව පැවතුණි. එසේම සහකාර ජීවගණක තනතුර ද 2016 වර්ෂයේ සිට 2018 ජූලි 24 දින දක්වා පුරප්පාඩුව පවතී.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව, මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අනුමත අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 ජුනි 01 දිනදීය.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.2.1 ප්‍රමාද වූ ව්‍යාපෘති

කොමිෂන් සභාව විසින් පරිගණක පද්ධති මෙහෙයුම් කාමරය සඳහා සිසිලන පද්ධතියක් සවිකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය සමඟ කොන්ත්‍රත් වටිනාකම රු. 1,758,654 (වැට් රහිත) කට 2016 මැයි 11 දින ගිවිසුමකට එළඹී තිබූ අතර 2016 ජූනි 07 දින රු. 50,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2018 පෙබරවාරි වන විට මෙම කාර්යය සම්පූර්ණ විය යුතු වුවද විගණිත දිනය වූ 2018 අගෝස්තු 06 දින වන විටත් එය සම්පූර්ණ වී නොතිබුණි.

### 6.3 අයවැය ලේඛනමය පාලනය

මණ්ඩලයේ අයවැයගත ආදායම් හා වියදම්, තත්‍ය අගයන් හා සැසඳීමේදී සියයට 100 සිට සියයට 246 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාර්යයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මෙහෙයුම් පාලනය | (i) කොමිෂන් සභාවේ වියදම් පියවා ගැනීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වාර්ෂික පොලී ආදායමෙන් 20% ක උපරිමයකට යටත්ව මුදල් ලබා ගැනීම |
| (ආ) තොග පාලනය | (i) එක් එක් අයිතමය පහසුවෙන් වෙන්කර හඳුනාගත හැකි පරිදි තොග අසුරා නොතිබීම |
| | (ii) ලිපිද්‍රව්‍ය තොග ලේඛනයන්හි තොග මට්ටම් සඳහන් කර නොතිබීම. |
| | (iii) සෙමින් නිකුත් වෙමින් පැවති ලිපිද්‍රව්‍ය පැවතීම |
| | (iv) ලිපිද්‍රව්‍ය තොග භෞතික පරීක්ෂාවේදී තොග ලේඛනය සමඟ වෙනස්කම් පැවතීම |
| (ඇ) මූල්‍ය පාලනය | (i) අග්‍රිම පියවීම ප්‍රමාද වීම |
| | (ii) නිසි පරිදි ඇස්තමේන්තු නොකොට අග්‍රිම ලබා දීම |
| | (iii) ලේඛන යාවත්කාලීන නොකිරීම |
| (ඈ) ආදායම් පාලනය | සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් නිසි පරිදි හඳුනා නොගැනීම |
| (ඉ) වත්කම් පාලනය | හඳුනා ගැනීමේ සංකේතාංක නිවැරදි නොවීම. |



එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **2.2** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | |
| **2.2.1** | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති * පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.** | |
| (අ) | 2006, 2008 හා 2012 වර්ෂ වලදී මිලදීගෙන තිබුණු ධාරණ අගය රු.2,604,348 ක් වූ මෝටර් වාහන 2014 වර්ෂයේදී රු.10,000,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට නැවතත් ප්‍රත්‍යාගණනයක් සිදු කළ යුතු වුවත් 2014 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් 2018 වසර අවසන්වීමට ප්‍රථම නැවත ප්‍රත්‍යාගණනය කිරීමට අප බලාපොරොත්තු වේ. |
| (ආ) | ප්‍රමිතයෙහි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් මෝටර් වාහන හැර පිරිවැය රු.31,724,786 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෝටර් රථ වාහන හැර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීමෙන් පසු ගිණුම්වලට ගැළපීමට බලාපොරොත්තු වේ. |
| **2.2** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | |
| **2.2.2** | **ගිණුම්කරණ ප්‍රතිපත්ති** | |
| (අ) | රක්ෂණ ආයතනයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලීම සඳහා නිශ්චිත කාල සීමාවක් නිර්ණය කර නොමැති අතර අයදුම්පතේ සඳහන් කර තිබුණු කොන්දේසි අනුව, රක්ෂණ ආයතනයක් ලෙස ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ ආයතනය, අයදුම්පත ඉවත් කර ගැනීමක් සිදු කරයි නම් අදාල මුදලින් සියයට 50ක් පමණක් ආපසු ගෙවන බව සඳහන් කර තිබුණි. එසේ වුවද විගණනය විසින් පරීක්ෂණයට භාජනය කළ අවස්ථා තුනකදී ඒ අනුව කටයුතු නොකර වැයකල මුළු මුදල වූ රු.500,000 ක් ආපසු ගෙවා තිබුණු අවස්ථාවක් මුළු මුදල රඳවාගෙන ගෙවිය යුතු ලෙස සටහන් කර තිබුණු අවස්ථාවක් මුළු මුදලම ආදායමට ගෙන තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය. | අයදුම් පත්‍රයේ දක්වා ඇති පදනම මත මේ දක්වා කටයුතු කරනු ලබන අතර ඔබ දක්වා ඇති අවස්ථා එකී නිර්ණායකයන්ට නොවැටෙන අවස්ථා වන බැවින්, එකී වෙනස් වූ අවස්ථා අනුව ප්‍රායෝගික ක්‍රියා මාර්ග ගෙන ඇත. ඒ අනුව ඒ සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රතිපත්තියක් ඇත.<br><br>අදාල සමාගම නව අයදුම්පතක් නැවත ඉදිරිපත් කළයුතු බැවින් 50%ක් රඳවා තබා ගැනීම සාධාරණ නොවන බැවින් හිඟ බදු මුදල පමණක් අඩුකර ඉතිරිය ආපසු ගෙවන ලදී.<br><br>අදාළ සමාගමේ බලපත්‍රය කොමිෂන් සභාව විසින් නිකුත් කරන තුරු, උපලබ්ධි සංකල්පය මත ලද මුදල්, කලින් ලද අත්තිකාරම් ගිණුමෙන් ඉවත් කර ආදායමක් ලෙස හඳුනාගත නොහැක. අදාළ සමාගම 2014 දී ඉදිරිපත් කළ අයදුම් පත්‍රය (අදාළ මුදල් ගෙවා ඇත්තේ වර්ෂ 2014 දීය) සම්බන්ධයෙන් නෛතික අවශ්‍යතා සපුරාලීමට කීප වතාවක් ලබාදුන්නද, ඔවුන් අපොහොසත් වූ බැවින්, අදාළ මුලු මුදලම ආදායමක් ලෙස හඳුනාගෙන ඇත. මෙය 2017 වසරේ දී සිදුවූ බැවින්, එම වර්ෂයේ ආදායමක් ලෙස සැලකීම යෝග්‍ය වේ. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| 2.2 | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම | |
| 2.2.2 | ගිණුම්කරණ ප්‍රතිපත්ති | |
| (ආ) | කොමිෂන් සභාව විසින් පුස්ථකාල පොත් සම්බන්ධව අනුගමනය කර තිබූ ප්‍රතිපත්තිය වනුයේ සියළු පොත් පිරිවැය, මිලදී ගන්නා වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීමයි. කෙසේ වුවද, සභාව මිළදී ගෙන තිබූ පිරිවැය රු.100,000 ඉක්මවූ පොත්ද ඉහත කී පරිදි වියදම් ලෙස ගිණුම්ගත කර තිබෙන බව පුස්ථකාල පරිග්‍රහණ ලේඛනය අනුව නිරීක්ෂණය විය. | කොමිෂන් සභාව සතු පුස්තකාල පොත් ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකීම අදාල නිර්ණායකයන්ට (SLPSAS 7) අනුකූල නොවන බැවින් එය මිලට ගන්නා ලද වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කරන ලද අතර පුස්තකාල පොත් වලින් බහුතරය සුළු වටිනාකම් වලින් යුක්ත වේ. ඒ සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. |
| 2.2.3 | ගිණුම්කරණ අඩුපාඩු | |
| (i) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 16 (1) හා (2) වගන්ති අනුව, සෑම රක්ෂණකරුවෙකු විසින්ම තම රක්ෂණ සමාගම්වල මුළු ලේඛනගත වාරික මුදල මත වාර්ෂික ගාස්තුවක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු විය. ඒ අනුව 2017 ජූනි 28 දින කටයුතු අත්හිටුවා තිබූ රක්ෂණ සමාගමකින් ලැබිය යුතු රු.1,460,687ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්තමානයේදී භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමේදී ගණනයක් පමණක් සිදු කරන අතර ස්ථාවර වත්කම් ඉවත් කරන අවස්ථාවේදී පමණක් ස්ථාවර වත්කම් ලේඛනය හා සංසන්දනයක් සිදු කරයි. ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනය උපයෝගී කරගනිමින් භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නෙමු. |
| 2.2.4 | පැහැදිලි නොකළ වෙනස්කම් | |
| (අ) | 2017 වර්ෂයට අදාළව ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලැබිය යුතු සෙස් ආදායම ලෙස රු.10,062,587 ක් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද 2017 වර්ෂයේ ජාතික රක්ෂණභාර අරමුදලේ අවසන් මූල්‍ය ප්‍රකාශන අනුව කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු සෙස් ආදායම රු.16,107,274 ක් වීම හේතුවෙන් රු.6,044,687 ක වෙනසක් විය. | අදාල ක්‍රියාමාර්ග ගැනීමට අප බලාපොරොත්තු වේ. |
| 2.3 | ලැබිය යුතු ගිණුම් | |
| (අ) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 38(1) ආ වගන්තිය ප්‍රකාරව 2015 වර්ෂයේදී දීර්ඝ කාලීන ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණය ලෙස රක්ෂණ ආයතන වෙන් කිරීම සඳහා 2015 වර්ෂයේදී අයදුම් කළ රක්ෂණ සමාගමකින් ලැබී තිබුණු රු.500,000 ක් හා ඊට අදාළව ලැබිය යුතු රු.71,429 ක බදු මුදලක් විගණිත දින වන විටත් පනත ප්‍රකාරව වෙන් කිරීම් සිදු නොකිරීම නිසා නිරවුල් නොවී පැවතුණි. | සමාගම මෙතෙක් විභේදන සැලසුම අප වෙත ලබා දී නොමැති බැවින් බදු සම්බන්ධයෙන් වූ අගය නිරවුල් කිරීමට කටයුතු කල නොහැක. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **2.4** | **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.** | |
| (අ) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත | |
| 38(1)(ආ) වගන්තිය | දීර්ඝ කාලින රක්ෂණ ජීවිත රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන වත්කම්, වෙනත් යම් පංතියක රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වු වත්කම් වලින් වෙන්ව තබා ගත යුතු වුවද ලියාපදිංචි රක්ෂණ සමාගම් 12 න් රක්ෂණ සමාගම් 2ක් මෙතෙක් එසේ කටයුතු කර නොතිබුණි. | සංයුක්ත රක්ෂණ සමාගම් 15 න් සමාගම් 3 ක් තවමත් තම රක්ෂණ ව්‍යාපාර විභේදනය කර නොමැත. ඉන් සමාගම් 2 ක ප්‍රාග්ධන අගයන් නිශ්චිත ප්‍රමාණ වලින් නැති අතර අනෙක් සමාගම විභේදනය සම්බන්ධයෙන් භාණ්ඩාගාර නිර්දේශය බලාපොරොත්තුවෙන් සිටී. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371** | |
| මු.රෙ. 371 | ලබා ගන්නා තත්කාර්ය අතුරු අග්‍රිම, එය දෙන ලද කාර්ය නිමකල වහාම නැවත පියවිය යුතු වුවත් රු.755,996 ක් වු අත්තිකාරමක් ලබා ගෙන මාස 06 ඉක්මවා තිබුණද, විගණිත දිනය වනවිටත් පියවා නොතිබුණි. | රු. 755,996/* හා සම්බන්ධ අත්තිකාරම් අයිතම් 5න් 3ක් මේ වන විට නිරවුල් කර ඇත. ඉන්වොයිසියේ මුල් පිටපත නොමැතිකම හේතුවෙන් නිරවුල් කර නොමැති බාහිර පාර්ශවයන්ට ගෙවන ලද අත්තිකාරම් සම්බන්ධයෙන් අත්තිකාරම් මුදල නිදහස් කිරීමේදී ඉන්වොයිසියේ මුල් පිටපත ලබාදීම අනිවාර්ය කිරීමට කටයුතු කරනු ලබන අතර කාර්ය මණ්ඩලයට අදාල අත්තිකාරම සම්බන්ධයෙන් පරිපාලන අත්පොතෙහි පවත්නා ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ලැබේ. |
| (ඇ) | **2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| 9.14. ඡේදය | පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකගතාවය ලබා ගත යුතු වුවද, අත්පොත් සඳහා විගණිත දිනය වන විටත් භාණ්ඩාගාර ලේකම්ගේ එකගතාවය ලැබී නොතිබුණි. | මේ වන විට සිහිකැඳවීම් කිහිපයක්ම යොමු කොට ඇත. ඔවුන් පවසා ඇත්තේ අනුමැතිය සම්බන්ධයෙන් ප්‍රමාදයක් ඇති බවයි. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **3.** | **මූල්‍ය සමාලෝචනය** | |
| **3.1** | **මූල්‍ය ප්‍රතිඵල** | |
| | කොමිෂන් සභාව ආරම්භයේ සිටම මූල්‍ය ප්‍රකාශනවල බදු පසු අතිරික්තයක් හෝ ඌණතාවයක් පෙන්නුම් නොකෙරුණු අතර කොමිෂන් සභාව විසින් ආදායම ඉක්මවන වියදම සඳහා වූ මුදල්, රක්ෂණ හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට ගලපමින් ඉහත කී අතිරික්තය හෝ ඌණතාවය ශූන්‍ය කර තිබුණි. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, කොමිෂන් සභාවේ ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.20,622,656 කින් වැඩි වී තිබුණු අතර කොමිෂන් සභාවේ මුළු වියදම ද රු. 20,457,782 කින් එනම් සියයට 15 කින් වැඩි වී තිබුණි. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට කළ මාරු කිරීම රු.19,035,468 කින් හා මෙහෙයුම් වියදම් රු.4,179,824 කින් වැඩිවීම ඉහත වියදම වැඩිවීම කෙරේ ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.<br><br>කොමිෂන් සභාවේ 2013 සිට 2017 දක්වා වර්ෂ 05 සඳහාම මූල්‍ය ප්‍රකාශන අනුව මෙහෙයුම් අතිරික්තයක් නොවුනු නමුදු පසුගිය වසර 05 හි සමස්ථ දායකත්ව විචලතාවය පරික්ෂා කිරීමේදී, 2013, 2014, 2015 හා 2016 වර්ෂයන්හි දායකත්වය ක්‍රමයෙන් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද දායකත්වය වැඩි වී තිබුණද එම වැඩිවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 19 ක් පමණක් වී තිබුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ වර්ෂය තුළදී රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට අරමුදල් මාරු කිරීමයි. | විශ්ලේෂණ සටහනකි. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.1** | **කාර්යසාධනය** | |
| **4.1.1** | **ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය** | |
| **(අ)** | **විමර්ශන අංශය** | |
| (I) | රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන් විසින් පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත සම්බන්ධයෙන් 2016 ඔක්තෝබර් 01 දින නිකුත් කර තිබූ මාර්ගෝපදේශ ලිපිය අනුව 2017 ජනවාරි 01 දින සිට අර්ධ වාර්ෂිකව පැමිණිලි පිළිබඳ හඳුන්වාදුන් ආකෘතිය ප්‍රකාරව දින 30 ක් ඇතුළතදී රක්ෂණ සමාගම් විසින් කොමිෂන් සභාව වෙත තොරතුරු එවිය යුතු වුවද රක්ෂණ ආයතන 27 න් ආයතන 09 ක් විගණිත දිනය වන විටත් එසේ තොරතුරු එවා නොතිබුණි. | 2017 වර්ෂයට අදාලව තොරතුරු මෙතෙක් එවා නොමැති රක්ෂණ සමාගම් වෙතින් එම තොරතුරු, (2018 පළමු අර්ධ වර්ෂයට අදාල තොරතුරු ද සමඟ) 2018.07.30 වන විට ලබා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |
| (II) | 2017 වර්ෂයේ ලද පැමිණිලි 348 කින් පැමිණිලි 57 ක් එනම් සියයට 16 කට ආසන්න ප්‍රමාණයක් විගණිත දිනය වූ 2018 ජූලි 24 දින වන විටත් නොවිසඳී පැවතුණි. | විගණිත දිනය වන 2018 ජූනි 22 දිනට, 2017 වර්ෂයේ ලද පැමිණිලි වලින් නොවිසඳී පැවතුනේ පැමිණිලි 35 ක් පමණි (විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත ලබාදුන් පැමිණිලි ලේඛනයේ පිටපත අනුව, මේ බව තහවුරු වනු ඇත.) එම පැමිණිලි 35 ට අදාල වර්තමාන තත්වය පහතින් දක්වා ඇත.<br><br>පැමිණිලි 02 - අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත විමර්ශන කටයුතු අවසන් කර ඇත.<br><br>පැමිණිලි 08 - විමර්ශන කටයුතු අවසන් කර ඇති අතර අදාල නිර්දේශයන් (183 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කොට ඇත.<br><br>පැමිණිලි 12 - විමර්ශන කටයුතු අවසන් කර ඇති අතර අදාල නිර්දේශයන් (184 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතව ඇත.<br><br>පැමිණිලි 07 - විසඳා අවසන් කර ඇත.<br><br>පැමිණිලි 02 - වැඩිදුර විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු රක්ෂණ සමාගම්/ තැරැව්කාර සමාගම් වලින් ලැබීමට නියමිතය.<br><br>පැමිණිලි 02 - විමර්ශනයෙන් අනාවරණය වූ කරුණු පැමිණිලිකරුගේ අදහස් විමසීම සඳහා යොමු කරනු ලැබ ඇති අතර ඒ සඳහා ඔවුන්ගේ ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් සිටී.<br><br>පැමිණිලි 02 - අදාල පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවන් පැවැත්වීමට කටයුතු යොදා ඇත. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය / කාර්යසාධනය** | |
| **4.1.1** | **අධීක්ෂණ අංශය** | |
| (I) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 38(3) (අ) වගන්තිය ප්‍රකාරව නියම කරනු ලබන යම් ආකෘතියක වාර වාර්තාවක් කලින් කළ සපයන ලෙස ඒ ඒ රක්ෂණකරුගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකිය. මාසය අවසන් වී දින 21 ක් ඇතුළත එලෙස ඉල්ලා ඇති ඔවුන්ගේ මාසික ව්‍යවස්ථානුකූල වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළයුතු වුවද ඒ අනුව වාර්තා ඉල්ලා ඇති රක්ෂණ සමාගම් 03ක් නියමිත කාලපරිච්ඡේදය තුළදී එම වාර්තා කොමිෂන් සභාව වෙත එවා නොතිබුණද කොමිෂන් සභාව ඒ සම්බන්ධව ක්‍රියාකර නොතිබුණි. | මෙහිදී සමාගම්වල පවතින විවිධ ප්‍රශ්න හේතුවෙන් වාර්තා එවීම ප්‍රමාද විය හැක. නියමිත දිනයට පෙර ලබා නොදෙන වාර්තා සම්බන්ධයෙන් සිහි කැඳවීම් ලිපි යැවීම සිදු කර වාර්තා ගෙන්වා ගැනීම සිදු කරයි. |
| (II) | ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2016 වර්ෂය සඳහා රක්ෂණ කර්මාන්තයේ අත්පොත 2017 වර්ෂයේ තුන්වන හා හතරවන කාර්තුව ඇතුළත ප්‍රකාශ කිරීමට සැලසුම් කළද, මාස 04 කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2018 අප්‍රේල් මාසයේදී එය ප්‍රකාශයට පත්කර තිබුණි. | සෝදුපත් බැලීමේදී ප්‍රමාදයක් සිදු වූ අතර මෙම වසරේදී නියමිත කාලයට ප්‍රකාශයට පත් කිරීමට දැනටමත් කටයුතු කෙරෙමින් පවතී. ප්‍රමාදයන් වැලැක්වීම සඳහා 2018 වසරේ සිට මෑදු පිටපත් පමණක් වෙබ් අඩවියට ඇතුළත් කරනු ලැබේ. |
| (III) | 2017 ඔක්තෝබර් 31 දින සිට ජීව ගණක තනතුර පුරප්පාඩුව පැවතීම නිසා 2017 වර්ෂයේ තෙවන සහ සිව්වන කාර්තුවල සිට මේ දක්වා රක්ෂණ ආයතනවල අවධානම් පාදක ප්‍රාග්ධනය රාමුවට අනුව වගකීම් සමාලෝචනය කිරීමක් සිදු වී නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ විය නොහැක. අවදානම් පාදක ප්‍රාග්ධනය රාමුවට අනුව වගකීම ගණනය කරනු ලබන්නේ රක්ෂණ සමාගම් වලින් වන අතර තවද, රක්ෂණ නියාමන කොමිෂන් සභාව වගකීම් ගණනය කිරීමක් සිදු නොකරයි. මෙහි සඳහන් කර ඇති කාර්තු සඳහා එම ලේඛන අප වෙත ලැබී ඇත. |
| (IV) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 48(1) වගන්තිය ප්‍රකාරව, රක්ෂණකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ජීව ගණක තොරතුරු, ජීවගණකවරයා විසින් සමාලෝචනය කර නිර්දේශ කිරීම් සිදු කළයුතු වුවද ජීවගණක තනතුර පුරප්පාඩුව පැවතීම හේතුවෙන් රක්ෂණ කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ජීවගණක වාර්තා, 2016 වර්ෂයේ සිට මේ දක්වා සමාලෝචනයක් කර නොතිබුණි. | ශ්‍රී ලංකාවේ ජීව ගණකයන්ගේ හිඟයක් පවතින බැවින්, සුදුසු ජීව ගණකවරයකු පත් කිරීමට නොහැකි වී ඇත. නමුත් ලෝක බැංකුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය හරහා ජීව ගණකවරයෙක් පත් කිරීමට බලාපොරොත්තු වේ. |
| (V) | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ රක්ෂණ තැරැව්කාර සමාගම් 60 ක් ලියාපදිංචිව පවතින අතර එම සමාගම් අතුරින් සමාගම් 8 ක පමණක් 2017 වසර තුළ දී ක්ෂේත්‍රගත පරීක්ෂණ අධීක්ෂණය සිදුකර තිබුණි. එය මුළු තැරැව්කාර සමාගම් වලින් සියයට 13 ක පමණ ප්‍රතිශතයක් ගෙන තිබුණි. | දැනට පවතින කාර්ය මණ්ඩලය පාදක කරගෙන ස්ථානීය පරීක්ෂණ සිදුකරන අතර ඉදිරි වර්ෂවල කාර්ය මණ්ඩල හා පරිඝණකගත විමර්ශණ ක්‍රමයක් අනුගමනය කිරීම තුළින් වැඩි ස්ථානීය පරීක්ෂණ ප්‍රමාණයක් කිරීමට සැලසුම් කර ඇති බව දන්වනු කැමැත්තෙමු. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| (ඇ) | නීති අංශය | |
| (I) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 114 වගන්තියේ අර්ථ නිරූපිත, තැරැව්කරුවන්, ලියාපදිංචි කිරීම 2012 අප්‍රේල් 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව නතර කර තිබුණු අතර 2016 මැයි 02 වන දින එම තහනම ඉවත් කර නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම ආරම්භ කර තිබුණි. එසේ වුවද කොමිෂම විසින් තැරැව්කරුවන් ලියාපදිංචි කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් හා ක්‍රියාපටිපාටියක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් ලියාපදිංචි කටයුතු සිදුකිරීමේ දිගු කාලීන ප්‍රමාදයන් පවතින බවට නිරීක්ෂණය විය. | යම් සමාගමක් රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ලියාපදිංචි වීම සඳහා අයදුම්පත කොමිසමට භාරදුන් පසු, අදාල අයදුම්පත සම්බන්ධයෙන් කොමිසමේ නිරීක්ෂණයන් එම සමාගම වෙත දන්වා යවනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සියල්ලම සපුරාලන තෙක් ලියාපදිංචිය ලබා දීමට කොමිසමට හැකියාවක් නොමැත. සුදුසුකම් සපුරාලීම සඳහා සමාගම්ද යම් කාලයක් ගත කරයි.<br><br>ඒ අනුව, රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචිය සඳහා කොමිෂන් සභාව පැහැදිලි ක්‍රමවේදයක් අනුගමනය කර ඇති අතර අදාල සමාගම් විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරාලීම සඳහා ගතවන්නාවු කාලසීමාව අනුව ඒ ඒ සමාගමට ලියාපදිංචිය ලබාදීමට ගතවන කාලසීමාව වෙනස් වේ. |
| (II) | නියාමන / උපදේශාත්මක ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා සෑම රක්ෂණ හා රක්ෂණ තැරැව්කාර ආයතනයක්ම, ප්‍රධාන නිලධාරියෙක් (Principle Officer) ලෙස ප්‍රධාන විධායක නිලධාරී හෝ විධායක කළමනාකරු හෝ එම කාර්යයන්ට වගකීමක් දරන නිලධාරියෙකු පත්කර 2017 මැයි 12 දිනට පෙර කොමිෂමට දැනුම්දිය යුතු බව කොමිෂන් සභාවේ 2016 මාර්තු 13 දිනැති මඟ පෙන්වීම් (Direction) 09 මඟින් සියළුම රක්ෂණ හා රක්ෂණ තැරැ විකාර ආයතන 60 කට දැනුම්දී තිබුණි. එම සමාගම් විසින් සිදුකළ ඉල්ලීම් මත මෙම කාලය 2017 සැප්තැම්බර් 30 වන දින තෙක් දීර්ඝ කර තිබුණ ද 2018 ජූලි 24 විගණිත දින වන විටත් රක්ෂණ ආයතන 02ක් ප්‍රධාන නිලධාරියෙකු පත්කර නොතිබුණි. | මේ වන විට, රක්ෂණ සමාගම් 2ක් හැරුනු කොට අනෙකුත් සියලුම රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් අදාළ Direction 9 අවශ්‍යතා සපුරා ඇත. එයින් එක් රක්ෂණ සමාගමක ව්‍යාපාර කටයුතු මේ වන විටත් අත්හිටුවා ඇත. අනෙක් රක්ෂණ සමාගම 2018 ජූලි 31 දින වනතෙක් කල් ඉල්ලා ඇත. |
| (III) | සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් වෙත 2009 වර්ෂයේදී සභාව විසින් ව්‍යාපාර අත්හිටුවීමක් පනවා තිබුණු අතර SC(FR) 191/09 දරන මූලික අයිතිවාසිකම් නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් නියෝග ප්‍රකාර එම සමාගම වෙත ඉදිරිපත් කරනු ලබන අව්‍යාජ රක්ෂණ හිමිකම් පෑම් ක්‍රමවත්ව බේරුම් කිරීමට එකී සමාගම් වත්කම් බැහැර කිරීම සඳහා එවකට මණ්ඩලය, සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වුවද, අව්‍යාජ හිමිකම් පෑම් 142 කින් 132ක් සඳහා හිමිකම් නිරවුල් කර තිබුණු අතර නඩු ලිපිගොනු 10 පිළිබඳ වර්තමාන තත්ත්වය විගණිත දින වූ 2018 ජූලි 24 දින වන විටත් ඉදිරිපත් වී නොතිබුණි. | පවතින නඩු විගණිත දිනය වන විට නිරවුල් වීමට ප්‍රායෝගික වශයෙන් හැකියාවක් නොමැත. මන්ද, පවත්නා නඩු උසාවි ක්‍රියාමාර්ග අනුව විසඳෙන තෙක් අදාල නිරවුල් කිරීම සිදුකළ නොහැකි වන නිසාය. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| (ඈ) | වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය | |
| (I) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ග්‍රාම නිලධාරීන්, පොලිස්, දිවිනැගුම, සංවර්ධන, කෘෂිකර්ම හා ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් ඉලක්ක කර ගනිමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වා තිබුණද, සාමාන්‍ය මහජනතාව ඉලක්ක කර දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය නොවීය. එසේම, පවත්වා තිබුණු වැඩසටහන්වලින් සියයට 50 ක්ම මධ්‍යම පළාත තුළ පමණක් පවත්වා තිබුණි. | 2017 වසර පුරාම දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත්තේ ග්‍රාම නිලධාරීන්, පොලිස්, දිවි නැගුම, සංවර්ධන, කෘෂි කර්ම හා ක්ෂේත්‍ර නිලධාරීන් රැස්වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කොට්ඨාශ දින රැස්වීම සඳහායි. මීට අමතරව අනෙකුත් ප්‍රජාව වෙත දැනුවත් කිරීමේ වැඩසටහන්, රූපවාහිනිය, ගුවන්විදුලිය හා පුවත්පත් මගින් කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් අංශයේ ක්‍රියාකාරී සැලැස්මේ ඉතා පැහැදිලිව දක්වා ඇත. දේශනවලදී සාමාන්‍ය රක්ෂණය පිළිබඳවද සාකච්ඡා කෙරේ. මීට අමතරව, අප විසින් මුද්‍රණය කර ඇති දැනුවත් කිරීමේ ලේඛනවලින්ද මනාව පැහැදිලි වේ.<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන් 10 න් මහනුවර දිස්ත්‍රික්කය තුළ පවත්වා ඇත්තේ වැඩසටහන් 2 ක් පමණි (20% කි). මධ්‍යම පළාත ලෙස ගත්විට 2017 වසර තුළ වැඩසටහන් 5 ක් පවත්වා ඇත. |
| (II) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රමාණවත් බව හා සාර්ථකත්වය පිළිබඳව ප්‍රශ්ණාවලියක් මගින් සහභාගී වන නිලධාරීන් වෙතින් අදහස් ලබා ගෙන තිබුණි. ඒ අනුව ප්‍රශ්ණාවලිය ඉදිරිපත් කිරීමෙන් අනාගත වැඩසහන්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රයෝජනවත් වන බව දන්වා තිබුණද ලද පිළිතුරු සමාලෝචනය කිරීමක් හෝ ප්‍රතිචාරය අනුව වැඩසටහන යාවත්කාලීන කිරීමක් සිදු කළ බව විගණනයේදී නිරීක්ෂණය නොවුණි. | දැනුවත් කිරීමේ වැඩසටහන්වල අන්තර්ගතය සැලකීමේදී 2016 වසරට වඩා 2017 වසරේ පැහැදිලි වෙනසක් තිබේ. මෙම වැඩසටහන් වලදී යොදාගනු ලබන පවර් පොයින්ට් (Power Point) ඉදිරිපත් කිරීම් සෑම වසරකම සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබේ. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වන වැඩසටහන්වල අප වෙත ලබාදෙන අවස්ථාව හා කාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අභිමතය අනුව තීරණය වේ. එබැවින්, මෙම වැඩසටහන් සඳහා ඉදිරිපත් කරනු ලබන කරුණු යම්කිසි රාමුවකට සීමා කළ යුතු වන අතර ඉතාම වැදගත් හා අත්‍යවශ්‍ය කරුණු පමණක් ඉදිරිපත් කිරීම්වල අඩංගු වේ. |
| (III) | වර්ෂය තුළදී පැසැල් සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, එක් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි. | පාසල් සිසුන් සඳහා වැඩසටහන් පැවැත්වීමට හැකියාව ඇත්තේ විදුහල්පතිවරයාගේ අනුමැතිය තිබේ නම් පමණි. එබැවින්, පාසල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී උපාය මාර්ගික ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීමේ වැඩසටහනෙහි දක්වා ඇත. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුව මගින් පත්කළ ප්‍රවීනෝපදේශක විසින් ඒ උපායමාර්ගික ක්‍රමවේදයන් කුමක්ද යන්න ඉදිරිපත් කළ යුතුව ඇත. ඔහුගේ නිර්දේශයන් අනුව පාසල් සඳහා කෙරෙන වැඩසටහන් ප්‍රතිසංවිධානය කිරීමට නියමිතය. |
| (IV) | ක්‍රියාකාරී සැලැස්ම අනුව, 2016 වර්ෂයේ ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ ප්‍රගතිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම මුද්‍රිත මාධ්‍යවල පළ කිරීමට සැලසුම් කළද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් එම නිවේදනය පල කර තිබුණි. | මෙම පුවත්පත් නිවේදන පළ කරනු ලබන්නේ වියදමකින් තොරවය. එනම්, යම්කිසි පුවත්පතක අභිමතය පරිදි එහි ඉඩකඩ අනුව කොමිෂන් සභාවේ නිවේදනවලට අවස්ථාව සලසා දෙන අතර එම පුවත්පත් මගින් මුදලක් අය නොකෙරේ. රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය පිළිබඳ පුවත්පත් නිවේදන ඉංග්‍රීසි පුවත්පත් විසින් පළ කිරීමත් සිංහල හා දෙමළ මාධ්‍ය පුවත්පත් විසින් පළ නොකිරීමත් කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර කරුණකි. කෙසේවෙතත්, කොමිෂන් සභාව විසින් භාෂා ත්‍රිත්වයෙන්ම පළ කිරීමට පුවත්පත් වලට යැවුවද ඒවා සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පළ කෙරුනේ නැත. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පළ කර තිබුණි. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| (ඈ) | වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය | |
| (V) | 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා නිතර අසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු පිළියෙල කර වෙබ් අඩවියට ඇතුළත් කිරීමට සැලසුම් කර තිබුණද, විගණිත දිනය වන 2018 මැයි 18 දින වන විටත් එසේ සිදු කර නොතිබුණි. | නිතර අසන ලද ප්‍රශ්න (Frequently Asked Questions) හි අන්තර්ගතය සකස් කොට අවසාන වී ඇත. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නාමය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙස වෙනස්වීමත් සමඟ අපගේ වෙබ් අඩවියෙහි සිදුකළ යුතු වෙනස්කම් පිළිබඳ හදාරා මූල්‍ය හා පරිපාලන අංශය විසින් වාර්තාවක් සකස් කොට ඇත.එම වාර්තාවට අනුව සිදු කළ යුතු වෙනස්කම් ද සමගින් මෙම නිතර අසන ලද ප්‍රශ්න (Frequently Asked Questions) ද වෙබ් අඩවියට ඇතුළත් කිරීමට සැලසුම් කර ඇත. වරින්වර විවිධ වෙනස්කම් සිදුකිරීමට සාපේක්ෂව, එකවර, අවශ්‍ය සියළු වෙනස්කම් සිදු කිරීම වඩා යෝග්‍ය යයි අපි විශ්වාස කරමු. |
| (VI) | වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර තිබුණු අත්පත්‍රිකා ලෙස Brochures (පොත් පිංච) 08 ක්ද Handout (අත්පත්‍රිකා) 03 ක්ද මුද්‍රණය කර තිබුණද ඒවා යාවත්කාලීන කර නොතිබුණු අතර නව අත්පත්‍රිකා කිසිවක් සකස්කර ප්‍රසිද්ධ කර නොතිබුණි. | අත් පත්‍රිකා නැවත මුද්‍රණයේදී ඒවායෙහි අන්තර්ගතය විමර්ශනය කොට යාවත්කාලීන කිරීමත් එහි අළුත් අන්තර්ගතය හා නැවත මුද්‍රණය සඳහා අනුමැතිය ලබාගැනීමේ කාර්යයත් සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ. එසේම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහාද යම් කාලයක් වැය වේ. එසේම, කොමිෂන් සභාවේ ලාංඡනය මෙම ප්‍රකාශවලට ඇතුළත් කළ යුතු බැවින්, නිල ලාංඡනයේ කටයුතු අවසන් වී අපහට ලැබුණු දින එනම් 2018/03/22 තෙක් සිටීමටද මෙම ඒකකයට උපදෙස් ලැබී තිබුණි. අත් පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ ආයතනයක් මේ වන විට තෝරා ගෙන ඇත.<br><br>ආයෝජන සම්බන්ධ රක්ෂණ ඔප්පු යන මැයෙන් අත් පත්‍රිකාවක් පිළියෙල කිරීමට 2017 වර්ෂය තුළ සැලසුම් කර නොමැති අතර එය 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ කොටසකි. එයටද නව ලාංඡනය ඇතුලත් කර, මේ වන විට මුද්‍රණය අවසන් කර ඇත. |
| (VII) | සමාජ මාධ්‍ය ඔස්සේ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ලෙස YouTube හි ගිණුමක් විවෘත කිරීමටත් 2016 හි දැනුවත් කිරීමේ ශ්‍රව්‍ය හා දෘශ්‍ය ලෙස සම්බන්ධ කිරීමටත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය තුළ ඇතුළත් කිරීමටත් කටයුතු කර තිබුණද, 2016 සැප්තැම්බර් මාසයෙන් පසුව වෙබ් අඩවිය යාවත්කාලීන (Update) කර නොතිබුණි. | සමාජ මාධ්‍ය ඔස්සේ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව YouTube හි ගිණුමක් විවෘත කරන ලද්දේ 2016.11.08 දිනයි. එහෙත් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නම වෙනස්වීමත් සමඟම වෙබ් අඩවියේද වෙනස්කම් සිදුවිය යුතු බව නිරීක්ෂණය කෙරිනි.<br><br>ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නාමය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙස වෙනස්වීමත් සමඟ අපගේ වෙබ් අඩවියෙහි සිදුකළ යුතු වෙනස්කම් පිළිබඳ හදාරා මූල්‍ය හා පරිපාලන අංශය විසින් වාර්තාවක් සකස් කොට ඇත. එම වාර්තාවට අනුව සිදු කළ යුතු වෙනස්කම් ද සමගින් මෙම YouTube ගිණුම යාවත්කාලීන කිරීම ද වෙබ් අඩවියට ඇතුළත් කිරීමට සැලසුම් කර ඇත. වරින්වර විවිධ වෙනස්කම් සිදුකිරීමට සාපේක්ෂව, එකවර, අවශ්‍ය සියළු වෙනස්කම් සිදු කිරීම වඩා යෝග්‍ය යයි අපි විශ්වාස කරමු. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **(ඈ)** | **වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය** | |
| (VIII) | ආසියානු සංවර්ධන බැංකුව මගින් තාක්ෂණික සහාය ලබාදී ශ්‍රී ලංකාවේ රක්ෂණ ඔප්පු පිළිබඳ දැනුම ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති අතර එහි දී පරතර විශ්ලේෂණයක් (Gap Analysis) සිදුකර අඩුපාඩු හඳුනාගෙන තිබුණි. ඒ අනුව අධ්‍යාපන උපායමාර්ග හා ක්‍රියාවට නැංවීමේ සැලැස්ම, 2017 ඔක්තෝබර් කොමිෂන් සභාවට ලබා දී තිබුණද, ඒ සඳහා යෝජිත වැඩසටහන් ආරම්භ කිරීමක් 2018 ජුලි 24 දින වන විටත් නිරීක්ෂණය නොවීය. | ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රවීන උපදේශක විසින් 2017 දෙසැම්බර් 07 දා ලබාදී තිබෙන අධ්‍යනය උපායමාර්ග හා ක්‍රියාවට නැංවීමේ සැලැස්ම,<br>■ ඒකග වූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයට ඒකග බවටත්<br>■ කොමිෂන් සභාවේ විෂය පථය හා සම්පත් අනුව ළඟා කර ගත හැකි බවටත්<br>■ පැහැදිලි, විශේෂිත හා ප්‍රතිඵල මැනිය හැකි බවටත්<br>තහවුරු කරගත යුතු බව හා ඒ සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු / පැහැදිලි කිරීම ලබාගත යුතු බවටත්, කොමිෂන් සභාවේ 179 වැනි රැස්වීමේදී තීරණය කෙරිනි. ඒ අනුව කොමිෂන් සභාව විසින් අධ්‍යාපන උපායමාර්ග හා ක්‍රියාවට නැංවීමේ සැලැස්මේ සංශෝධන ආසියානු සංවර්ධන බැංකුව වෙත 2018/02/01 දා දැනුම් දී ඇත. එම සංශෝධන වලට අනුකූලව ආසියානු සංවර්ධන බැංකුව විසින් නව සැලැස්මක් කොමිෂන් සභාව වෙත භාරදිය යුතුය. නමුත් මෙතෙක් ආසියානු සංවර්ධන බැංකුව විසින් නව සැලැස්ම භාර දී නොමැත. |
| **(ඉ)** | **මූල්‍ය හා පරිපාලන අංශය** | |
| | සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා සභාව විසින් 2017 වර්ෂයේ අයවැයගත දත්තයන්ට අනුව දේශීය පුහුණු කිරීම් සඳහා රු.3,000,000 ක් හා විදේශීය පුහුණු කිරීම් සඳහා රු.10,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, සත්‍ය වශයෙන් වැය කළ අගයන් පිළිවෙලින් රු. 1,297,577 ක් හා රු. 4,741,449 ක් ලෙස පහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය. | දේශීය පුහුණු කිරීම්වලට අදාළ ප්‍රතිපාදනයෙන් රු.1,400,000 ක්ම Residential Training Programme සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වූ අතර, එම වැඩසටහන නොපැවැත්වීම නිසාම එවැනි වැඩි ශේෂයක් පෙන්වයි.<br><br>මෙම වසරේදී පුහුණුවීම් සඳහා වෙන්කර ඇති අදාළ ප්‍රතිපාදන පූර්ණව යෙදවීමට බලාපොරොත්තු වන්නෙමු.<br><br>විදේශීය පුහුණු කිරීම් සඳහා 2017 වර්ෂයේදී වැඩි අවධානයක් යොමු කරන ලද්දේ පාඨමාලා වියදම් අදාළ පාඨමාලා සංවිධායකවරුන් විසින් දරනු ලබන පුහුණු කිරීම් වෙනුවෙනි. මේ නිසා එම ප්‍රතිපාදනවල අතිරික්තයක් ඇතිවීමට හේතු වුණි. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.2** | **කළමනාකරණ ක්‍රියාකාරකම්** | |
| (අ) | 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ධාරණ අගය රු. 7,324,758 ක් වූ දේපල පිරියත හා උපකරණ වත්කම් කාණ්ඩයෙහි, වර්ෂය අවසාන භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් භාවිතයට ගත නොහැකි හෝ හානි වූ ලෙස වර්ගීකරණය වූ අයිතම් 145ක් පමණ ඇතුළත් වූ අතර, ස්ථාවර වත්කම් ලේඛනයට අනුව විගණනයේදී හඳුනාගත හැකි වූ භාවිතයට ගත නොහැකි එම අයිතමයන් හී පිරිවැයෙහි එකතුව රු. 2,331,989 ක් විය. තවද, භාවිතයට ගත නොහැකි හානි වූ හඳුනාගත් තොග අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | වර්තමානයේ භාණ්ඩ සමීක්ෂනය සිදු කිරීමේදී ගනනයන් පමණක් සිදු කරන අතර ස්ථාවර වත්කම් ඉවත් කරන අවස්ථාවේදී පමණක් ස්ථාවර වත්කම් ලේඛනය හා සන්සන්දනයක් සිදු කරයි. ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනය උපයෝගී කර ගනිමින් භාණ්ඩ සමීක්ෂනයක් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නෙමු. |
| (ආ) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 (1) වගන්තිය ප්‍රකාරව බුන්වත් වූ රක්ෂණ සමාගම්වල රක්ෂණ හිමිකම් නිරවුල් කිරීමේ අරමුණින් රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදල යනුවෙන් අරමුදලක් පිහිටුවා තිබුණු අතර එම අරමුදලට සෙස් බද්දෙන් උපචිත වන මුදල් බැර කරනු ලැබිය යුතු විය. මෙම අරමුදල දීර්ඝ කාලීන අරමුදලක් වූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එහි ශේෂය රු. 4,109,959,205 ක් විය. අරමුදල ආරම්භයේ සිට අරමුදලේ මුදල් වැය කිරීම සඳහා අවස්ථා උද්ගත වී නොතිබුණි. එම නිසා මෙම අරමුදලේ මුදල් ඉහළ පොළී ආදායමක් ලැබිය හැකි ආයෝජනවල ආයෝජනය කිරීමට හැකියාව තිබියදී එම මුදල් ද්‍රවශීලතාව පදනම් කරගෙන කෙටි දින ගණනකට ආයෝජනය කර ඇති බැවින් අරමුදලට ලැබිය හැකි ඉහළ පොළී ආදායම අහිමි වන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, වාර්ෂික ගාස්තු ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් එදිනෙදා වියදම් පියවා ගැනීම සඳහා අරමුදලේ මුදල් භාවිතා කිරීමට සිදු වූ බැවින් කෙටි කාලීනව මුදල් ආයෝජනය කළ බව කොමිෂන් සභාව විසින් විගණනයට දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ, ආදායම මූලිකවම රඳා පවතින්නේ, වාර්ෂික ගාස්තු ආදායම මත වන අතර, රක්ෂණ සමාගම්වලින් වාර්ෂික ගාස්තු කොමිෂන් සභාව වෙත ලැබෙනුයේ ප්‍රවර්තන වර්ෂයේ මාර්තු, අප්‍රේල් හා ජූනි කාල වකවානුවලදීය. ඒ අනුව වසරේ මුල් මාසවල කොමිෂන් සභාවේ වියදම් දැරීම සම්බන්ධයෙන් අරමුදල් සපයාගැනීමේ ගැටලුවකට අප මුහුණපාන අතර එහිදී කොමිෂන් සභාවේ වියදම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අරමුදල් නොපවතින අවස්ථාවකදී කොමිෂන් සභාවේ, මුදල් රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කිරීමෙන් සිදුවනුයේ නැවත වතාවක් කොමිෂන් සභාවේ, මුදල් ඌණතා සඳහා අරමුදලෙන් මුදල් ලබා ගැනීමට සිදු වීමයි. ඒ අනුව 2017 වසරේදී කොමිෂන් සභාවේ, මෙහෙයුම් සඳහා පියවා ගැනීමට ප්‍රමාණවත් ලෙස වාර්ෂික ගාස්තු ලැබී පැවතියේ 2017 අගෝස්තු මාසයේදී වන අතර අදාළ අවස්ථාවේදී එකී මුදල් අරමුදලට බැර කරන ලදී. අරමුදල් ඌණතාවයන් පිළිබඳ ප්‍රායෝගික ගැටලූ සලකා බලා, අතිරික්තය කොමිෂන් සභාවේ වියදම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදලක් ලැබුණු පසු රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කිරීම, ප්‍රායෝගිකව කළහැකි ක්‍රියාමාර්ගයක් වේ.<br><br>2017 වසරේදී වාර්ෂික ගාස්තු ලැබීම එම වසරේ සැප්තැම්බර් මස දක්වා සිදු වූ අතර වරින් වර ලැබෙන මුදල් කොමිෂන් සභාවේ එදිනදා වියදම් පියවා ගැනීම සඳහා භාවිතා කිරීමට සිදු වූ බැවින් කෙටි කාලිනව ආයෝජනය කර ඇත. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.2** | **කළමනාකරණ ක්‍රියාකාරකම්** | |
| **(ඇ)** | 2015 ඔක්තෝම්බර් 05 දිනැති අංක 36 දරන අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ සෞඛ්‍ය රක්ෂණයක් තැරැව්කාර ආයතනයක් හරහා පවත්වාගෙන යාමට ඕනෑම පුද්ගලයෙකුට අවසර ලබා දී ඇති අතර ඊට අදාළ තැරැව්කාර සමාගම ඒ සඳහා ලියාපදිංචි වී සිටිය යුතු විය. මේ යටතේ රක්ෂණ සමාගම් 02ක් සඳහා මූලිකව වර්ෂයක කාලයකට අනුමැතිය ලබාදී තිබුණද, එම අනුමැතිය ලිඛිතව දීර්ඝ කර තිබුණු බව අනාවරණය නොවුණු අතර වෙබ් අඩවියේ පමණක් අනුමත කාල සීමාව දීර්ඝ කර ඇති බව දක්වා තිබුණි. වෙබ් අඩවිය දක්වා ඇති අනුමත කාල සීමාව දික් කිරීම නිසි අවසරයක් නොමැතිව සිදුකර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකෙරෙමින් පවතින බව කොමිෂන් සභාව විසින් විගණනයට දන්වා තිබුණි. | වෙබ් අඩවියේ දක්වා ඇති අනුමත කාලසීමාව දික් කිරීම නිසි අවසරයක් නෙමැතිව සිදුකරන ලද්දකි. එලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකෙරෙමින් පවතී. |
| **(ඈ)** | කොමිෂන් සභාව 2009 දෙසැම්බර් සිට බලපැවැත්වෙන පරිදි එහි නිලධාරීන් වෙත අප්‍රේල් හා දෙසැම්බර් මාසවල උත්සව අත්තිකාරම් ලෙස රු. 50,000 බැගින් ගෙවා තිබුණු අතර කොමිෂන් සභාව මේ සඳහා විශේෂ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | උත්සව අත්තිකාරම් රු.50,000/- ක් ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන 14 පරිච්ඡේදය ලෙස පරිපාලන අත්පොතට ඇතුළත් කර ඇත. පරිපාලන අත්පොතෙහි ගෙවනුලබන උපරිම මුදල සඳහන් කර ඇත. එමෙන්ම සේවකයින්ගේ අවශ්‍යතාවය හා කැමැත්ත පරිදි, එම උපරිම මුදල හෝ ඊට අඩු මුදලක් වර්ෂයකට වරක් (අප්‍රේල් මස හෝ දෙසැම්බර් මස) ඉල්ලා සිටිය හැක. |
| **(ඉ)** | පුස්ථකාල පොත් පිළිබඳ භෞතික පරීක්ෂාවේදී පොත් 11 ක් පුස්ථකාලයෙන් බැහැරට නිකුත් කර අවුරුදු 01 සිට අවුරුදු 07 දක්වා කාලයක් ඉක්මවා තිබුණද, නැවත බාර දී ඇති බව නිරීක්ෂණය නොවීය. එසේම රු. 100,000 කට ආසන්න වටිනාකමකින් යුත් පොත් 02 ක් පුස්ථකාලය තුළ භෞතිකව නිරීක්ෂණය නොවීය. | ආයතනයේ සීමිත නිලධාරීන් සංඛ්‍යාවක් සිටින අතර ආයතනයේ ඒ ඒ අංශයට අදාළ වන පොත් දීර්ඝ කාලයක් එක් පුද්ගලයෙකු පරිහරණය කරනුයේ අදාළ වෘත්තීයමය අවශ්‍යතා සඳහාය. මේ හෙයින් වෙනත් නිලධාරියෙකු හට එකී පොතක අවශ්‍යතාවයක් පැන නැගුණහොත් එය ලබාදීමට කටයුතු කරනු ලැබේ. නමුත් ගතවී ඇති කාලය අනුව ඒ නිලධාරීන්ගෙන් විමසීමට කටයුතු කරනු ලැබේ.<br><br>අදාළ පොත් දෙක වටිනාකමින් ඉතා ඉහළ අගයක් ගන්නා බැවින් එහි සුරක්ෂිතභාවය උදෙසා වෙනත් ආරක්ෂිත ස්ථානයක තබා ඇත. කෙසේ වුවද, නිලධාරියෙකු හට එකී පොත් අවශ්‍ය වුවහොත් ඕනෑම විටක ලබා ගැනීමේ හැකියාව ඇත. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.3** | **ආර්ථික නොවූ ගණුදෙනු** | |
| | ආයතනයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2005 අප්‍රේල් 1 දින සිට මාසිකව රු. 330,096ක් ගෙවීමේ පදනමට ගොඩනැගිල්ලක් කුලියට ලබාගෙන තිබුණි. අදාළ කුලී ගිවිසුමෙහි 2008 මාර්තු 31 දින කාලය අවසන් වී තිබීම හේතුවෙන් කුලී ගාස්තුවල ඉහළ යාම නිසා වෙනත් ගොඩනැගිල්ලක් සොයාගතයුතු බව අවස්ථා දෙකකදී අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමුකර තිබුණද, එය ක්‍රියාත්මක නොකර 2017 ඔක්තෝබර් 01 දින සිට නැවතත් වසර 02ක කාලයක් සඳහා මාසිකව රු.1,472,208 ක් ගෙවීමට නැවත එම ගොඩනැගිල්ලේ හිමිකරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි. | මෙහෙවර පියස සම්බන්ධයෙන් ලිඛිත විමසීම් කරන ලද අතර එම ගොඩනැගිල්ල මේ වන විටද ඉදිකිරීම් මට්ටමේ පවතී. රක්ෂණ කර්මාන්තයේ නියාමක වශයෙන් පවත්වාගෙන යාමට සුදුසු ස්ථානයක්, දැනට පවතින ගොඩනැගිලි කුලියට වඩා අඩු මට්ටමකින් සොයා ගැනීම දුෂ්කර වේ. මෙම කාර්යාල ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මීට පෙර විගණකාධිපති වාර්තාවේ සඳහන් වී, එය කෝප් කමිටුවේදීද සාකච්ඡාවට ගෙන අවසන් වූ කරුණක් බව දැන්වීමට කැමැත්තෙමු. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.4** | **කාර්ය මණ්ඩල පරිපාලනය** | |
| (අ) | 2017 දෙසැම්බර් 31 දිනට වූ පුරප්පාඩුව පවතින තනතුරු 04 ක් විගණිත දිනය වන විටත් පුරප්පාඩුව පැවතුණි. | රියදුරු තනතුර සඳහා තෝරාගත් අයැදුම්කරු 2018.02.26 දින සේවයට බඳවා ගත් අතර 2018.02.27 දින සිට ඔහු සේවයට වාර්තා නොකරන ලදී. දෙවන අයැදුම්කරු බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලද අතර ඔහුද සේවයට වාර්තා නොකරන ලදී.<br><br>එමනිසා සියලු තනතුරු සඳහා පුවත්පත් දැන්වීම් පළකර අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය. |
| (ආ) | 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ අනුමත තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවාගෙන නොතිබුණි. | 2016 වර්ෂයේ විගණකාධිපති 14.2 සී වාර්තාවේ කාර්ය මණ්ඩල පරිපාලනය යටතේ (ආ) සඳහා දී ඇති මණ්ඩලයේ පිළිතුර පහත පරිදි වේ. මණ්ඩලයේ ආරම්භක අවස්ථාවේ සිටම සේවක සංඛ්‍යාව අනුමත කර ගන්නා සෑම විටකදීම බඳවා ගැනීමේ පටිපාටියද ඒ සමගම අනුමත කරවාගෙන ඇත. ඒ අනුව මණ්ඩලයේ තනතුරුවලට අදාළ බඳවාගැනීමේ පටිපාටිය එම තනතුරු ඇති කිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටින අවස්ථාවලදී ම විටින් විට අනුමත කරවාගෙන ඇත. එනමුත්, පසුව සිදුකළ සංශෝධන සහිත බඳවාගැනීමේ පටිපාටිය පරිපාලන අත්පොතට ඇතුළත් කර ඇති අතර මෙය අනුමැතිය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත්තේ 2012 වර්ෂයේ සිටය.<br><br>බඳවාගැනීමේ පටිපාටියට අවශ්‍ය මූලික එහෙත් අත්‍යාවශ්‍ය තොරතුරු ඇතුළත් කර ඇත.<br><br>එමෙන්ම මෑතක අනුමත කරවා ගත් තනතුරුවල බඳවා ගැනීමේ පටිපාටි වෙන වෙනම අනුමත කරගන්නවා හැර වෙනත් විකල්පයක් නොමැති බව අපගේ වැටහීමයි. |
| (ඇ) | 2012 මාර්තු 19 දින සකස් කර තිබූ පරිපාලන අත්පොත 2017 මාර්තු 30 දින මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණද, ඒ සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නොතිබුණි. එසේ වුවද මණ්ඩලය විසින් බඳවා ගැනීම්, වැටුප්, දීමනා ප්‍රතිපූර්ණය කිරීම් හා අත්තිකාරම් ගෙවීම් ඇතුළු කටයුතු පරිපාලන අත්පොත ප්‍රකාරව සිදු කරමින් පැවතුණි. | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, පිහිටවනු ලැබූ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 5(e), 10(1) සහ 10(2) වගන්තීන්ට අනුව මණ්ඩලය විසින් කටයුතු කර ඇත. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.4** | **කාර්ය මණ්ඩල පරිපාලනය** | |
| **(ඇ)** | කොමිෂන් සභාවේ මුල්ම වැටුප් පරිමාණයන් 2005 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර එම අනුමත වැටුප් පරිමාණ හා දැනට ගෙවනු ලබන තත්‍ය වැටුප් පරිමාණ අතර වෙනස්කම් නිරීක්ෂණය විය. මෙහිදී අනාවරණය වූයේ, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් මෙන්ම රේඛීය අමාත්‍යාංශය මගින් වැටුප් වැඩි කිරීම නිර්දේශ කළ නොහැකි බව දන්වා තිබියදීත් 2012 වර්ෂයේ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත (Treasury Representative) විසින් නිකුත් කර තිබූ අංක PED/360/12/2 (II) හා 2012 ජූලි 18 දිනැති නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 25% ක උපරිමයකට යටත් වැටුප් සංශෝධනය කිරීමට විරුද්ධත්වයක් නොමැත යනුවෙන් සඳහන් ලිපියක් මත එලෙස වැටුප් පරිමාණය වැඩිකර ගෙන ඇති බවය. | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වැටුප් පරිමාණයන් ඔබ විසින් දක්වා ඇති පරිදි කිසිදු අවස්ථාවක කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 (1) අනුව පදනම්ව නැත. කොමිෂන් සභාවේ මුල්ම වැටුප් පරිමාණයන් 2005 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද අතර 2012 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතිය සහිතව මූලික වැටුප 25%ක වැඩිවීමක් කරන ලදී. රක්ෂණ නියාමන කොමිසම අනෙකුත් නියාමන කොමිසම් හා සාපේක්ෂව ස්ථාපනය කරන ලද පනත්වල ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කරනු ලැබේ. |
| **(ඉ)** | මණ්ඩලය 2016 වර්ෂයේ ආරම්භයේ සිට රක්ෂණ සමාගම්වල නුබුන්වත් නීති රාමුව වෙනුවට හඳුන්වාදුන් අවධානම් පාදක ප්‍රාග්ධනය මූලික කරගත් සුපරීක්ෂණ ක්‍රමයකට (RBC) යොමුවීම නිසා ජීවගණක ඒකකයක් ඇති කිරීමට ජීවගණක තනතුරක්, සහකාර ජීවගණක තනතුරක් හා ජ්‍යෙෂ්ඨ විධායක/ විධායක තනතුරු 02 ක් 2016 ජූනි 09 හා දෙසැම්බර් 07 දෙදින අනුමත කරගෙන තිබුණි. 2016 වර්ෂයේදී ජීවගණක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරිනියක බඳවා ගෙන තිබුණ අතර 2017 ඔක්තෝබර් 31 දින සිට එම තනතුර පුරප්පාඩුව පැවතුණි. එසේම සහකාර ජීවගණක තනතුර ද 2016 වර්ෂයේ සිට 2018 ජූලි 24 දින දක්වා පුරප්පාඩුව පවතී. | ජීවගණක ඒකකය සඳහා ජීවගණක, සහකාර ජීවගණක සහ විධායක තනතුරු වෙනුවෙන් බඳවා ගැනීම් කිරීමට කටයුතු කළ ද ජීවගණක සහ සහකාර ජීවගණක තනතුරුවලට සුදුසු පුද්ගලයින් නොවීය. ශ්‍රී ලංකාවේ ජීවගණක වෘත්තිකයන් ඇත්තේ ඉතා අවම ප්‍රමාණයක් බවද, සඳහන් කරනු කැමැත්තෙමු. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **5** | **තිරසාර සංවර්ධනය** | |
| **5.1** | **තිරසර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම** | |
| | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | අදාල ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ. |
| **6** | **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය** | |
| **6.1** | **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම** | |
| | 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව, මූල්‍ය වර්ෂය අවසාන වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අනුමත අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 ජූනි 01 දිනදීය. | කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි මස 27 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කෙරිණි.<br><br>නව සාමාජිකයින්ගෙන් යුත් කොමිෂන් සභා රැස්වීම 2018 මැයි මස 18 පවත්වන ලද අතර අනුමත වූ මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 01 දින ඔබ වෙත එවන ලදී. |
| **6.2** | **ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය** | |
| **6.2.1** | **ප්‍රමාද වූ ව්‍යාපෘති** | |
| | කොමිෂන් සභාව විසින් පරිගණක පද්ධති මෙහෙයුම් කාමරය සඳහා සිසිලන පද්ධතියක් සවිකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය සමග කොන්ත්‍රාත් වටිනාකම රු.1,758,654කට (වැට් රහිත) 2016 මැයි 11 දින ගිවිසුමකට එළඹී තිබු අතර 2016 ජූනි 07 දින රු.50,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2018 පෙබරවාරි වන විට මෙම කාර්යය සම්පූර්ණ විය යුතු වුවද විගණිත දිනය වූ 2018 අගෝස්තු 06 දින වන විටත් එය සම්පූර්ණ වී නොතිබුණි. | කාර්යය සිදු කරගෙන යාමේදී මතු වූ විවිධ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් අදාළ සිසිලන පද්ධතිය සවිකිරීමේ කාර්යන් ප්‍රමාද විය. කෙසේවෙතත් මේ වන විට සිසිලන පද්ධතියේ සවිකිරීම් කටයුතු නිමාවට පත්වෙමින් පවතී. |

# 2017 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| 6.3 | **අයවැය ලේඛනමය පාලනය** | |
| | මණ්ඩලයේ අයවැයගත ආදායම් හා වියදම්, තත්‍ය අගයන් හා සැසඳීමේදී සියයට 100 සිට සියයට 246 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාර්යයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | |
| 7. | **පද්ධති හා හා පාලනයන්** | |
| | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. | |
| | **පද්ධති හා හා පාලන ක්ෂේත්‍ර** | |
| | **(අ) මෙහෙයුම් පාලනය**<br>(i) කොමිෂන් සභාවේ වියදම් පියවා ගැනීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වාර්ෂික පොලී ආදායමෙන් 20% ක උපරිමයකට යටත්ව මුදල් ලබා ගැනීම. | |
| | **(ආ) තොග පාලනය**<br>(i) එක් එක් අයිතමය පහසුවෙන් වෙන්කර හඳුනා ගතහැකි පරිදි තොග අසුරා නොතිබීම.<br>(ii) ලිපිද්‍රව්‍ය තොග ලේඛනයන්හි තොග මට්ටම් සඳහන්කර නොතිබීම<br>(iii) සෙමින් නිකුත් වෙමින් පැවති ලිපිද්‍රව්‍ය පැවතීම<br>(iv) ලිපිද්‍රව්‍ය තොග භෞතික පරීක්ෂාවේදී තොග ලේඛනය සමග වෙනස්කම් පැවතීම | ඉදිරියේදී කටයුතු කරගෙන යෑමේදී අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳව අවශ්‍ය පරිදි අවධානය යොමු කරනු ඇත. |
| | **(ඇ) මූල්‍ය පාලනය**<br>(i) අග්‍රිම පියවීම ප්‍රමාද වීම<br>(ii) නිසි පරිදි ඇස්තමේන්තු නොකොට අග්‍රිම ලබාදීම<br>(iii) ලේඛන යාවත්කාලීන නොකිරීම | |
| | **(ඈ) ආදායම් පාලනය**<br>සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් නිසි පරිදි හඳුනා නොගැනීම | |
| | **(ඉ) වත්කම් පාලනය**<br>හඳුනා ගැනීමේ සංකේතාංක නිවැරදි නොවීම. | |

# පරිශිෂ්ඨය I

2017 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

| අංකය | රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 2 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ්* | සාමාන්‍ය රක්ෂණය |
| 3 | ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 4 | ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 5 | අමානා තකාෆුල් ලයිෆ් පී එල් සී | දිගුකාලීන රක්ෂණය |
| 6 | අමානා තකාෆුල් පීඑල්සී | සාමාන්‍ය රක්ෂණය |
| 7 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 8 | සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 9 | ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 11 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 12 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 13 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 14 | කෝප්ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 15 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 16 | එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 17 | ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 18 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 19 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 20 | එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 21 | එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 22 | ජාතික රක්ෂණ භාර අරමුදල | සාමාන්‍ය රක්ෂණය |
| 23 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 24 | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | සාමාන්‍ය රක්ෂණය |
| 25 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 26 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 27 | යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |

*මේ වන විට, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර කටයුතු වලින් ඉවත් වීම අරඹා ඇති අතර, තවදුරටත් නව රක්ෂණ ඔප්පු නිකුත් කරනු නොලැබේ.

දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි යෙදීම සඳහා එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් වෙත ලබාදුන් ලියාපදිංචිය 2017 ජූනි 28 වන දින සිට අත් හිටුවන ලදි.

ඒ අයි ඒ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්, වර්ෂ 2016 ජනවාරි 29 වන දින සිට ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සමඟ ඒකාබද්ධ වී ඇත.

යුනියන් ඇෂුරන්ස් ජෙනරල් ලිමිටඩ්, වර්ෂ 2017 පෙබරවාරි 28 වන දින සිට ෆෝයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සමඟ ඒකාබද්ධ වී ඇත.

# පරිශිෂ්ඨය II

2017 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම්

| අංකය | රක්ෂණ තැරැව්කරු | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | 3 ඩී එච් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 2 | ඒඑම්ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 3 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 4 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 5 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 6 | ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 7 | ඇම්ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 8 | ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 9 | අසෙකි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | දිගුකාලින රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණය |
| 11 | ඇක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 12 | බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 13 | සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 14 | සීලෑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 15 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 16 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 17 | කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 18 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 19 | ඩී එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 20 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 21 | ඊගල් ඩී වී ආර් එස් ඉන්ෂුරන්ස් ඇන්ඩ් රීඉන්ෂුරන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 22 | ඊඒපී - ආර්එම්එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 23 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 24 | එසාජි කරිම්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 25 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 26 | ෆෝසයිට් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 27 | ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 28 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 29 | ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 30 | ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 31 | ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 32 | ජේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 33 | ජේඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 34 | එල්එම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 35 | ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 36 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 37 | මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 38 | මියුචුවල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 39 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 40 | මයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 41 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |

# පරිශිෂ්ඨය II

| | | |
|---|---|---|
| 42 | ජ්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 43 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 44 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 45 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 46 | රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 47 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 48 | රින්කූන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 49 | එස්වයිඑම් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 50 | සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 51 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 52 | සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 53 | ස්ට්‍රැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 54 | ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 55 | යූඑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 56 | යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 57 | වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 58 | වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 59 | වොලන්කා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 60 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |

# පාරිභාෂික ශබ්ද මාලාව

### සමුච්චිත වීම

එක් සමාගමක් සමඟ පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රාරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්ත්වයකි.

### අත්කර ගැනීමේ වියදම්

අභිනව රක්ෂණ ගිවිසුම් අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත්කිරීම (උදා :- කොමිස් මුදල්) යන අවස්ථාවල දී වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

### ජීවගණකඥ

ජීවගණකඥයෙක් යනු අවිනිශ්චිත අවස්ථාවන්හි මූල්‍යමය ප්‍රතියමාන්‍යයන් ඇගයීම සඳහා පුහුණුව ලබා ඇති වෘත්තීයවේදියෙකි. රක්ෂණයේ සහ අනිකුත් මූල්‍ය සේවාවන්හි අනුමානික ස්වභාවය, වත්කම්වලට ආවේණික අවදානම් සහ සංඛ්‍යාලේඛණ ආකෘතීන් පිළිබඳ අවබෝධයක් ජීවගණකඥයින් සතුවිය යුතුය. මේ අනුව උදාහරණයක් ලෙස වාරික, තාක්ෂණික ප්‍රතිපාදන සහ ප්‍රාග්ධන මට්ටම තහවුරු කිරීම සිදු කරනු ලැබෙයි.

### පරිපාලන වියදම්

දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේ දී ආයෝජන කළඹ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

### ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්

ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය නිශ්චය කිරීමේදී ඇතුලත් කරනු ලැබෙන වත්කම් වේ. මෙවැනි වත්කම් 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති හි වගන්ති අංක 15 හි දක්වා ඇත.

### වාර්ෂිකය

යම් කිසි නිශ්චිත කාලසීමාවක් සඳහා වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්භිත හා ක්ෂණිකව ක්‍රියාත්මක වන යනුවෙන් වන මූලික වශයෙන් වර්ග දෙකකට අයත් වාර්ෂික පවතියි. ගෙවීම් සිදුකිරීම යම්කිසි අනාගත කාලයක දී ආරම්භ වන්නේ නම් එය විලම්භිත වාර්ෂිකය නම් වේ. ගිවිසුම ආරම්භ වන අවස්ථාවේදීම අදාල ගෙවීම් සිදුකිරීම අරඹන්නේ නම් එය ක්ෂණික වාර්ෂිකය නම් වේ.

### බැංකු රක්ෂණ සේවාව

රක්ෂකයා විසින් රක්ෂණ සහ ආයෝජන නිෂ්පාදන බැංකු පාරිභෝගිකයින් වෙත අලෙවි කිරීමේ වැඩ පිළිවෙලකි.

### ප්‍රතිලාභියා

ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායකයා ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

### ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය

අවශ්‍ය කරනු ලබන අවදානම් ප්‍රාග්ධනය (RCR) ට සභාය දැක්වීම පිණිස වූ සමස්ත උපයෝජ්‍යය ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය මඟින් මනිනු ලබයි.

$$\text{ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය} = \frac{\text{පූර්ණ පවත්නා ප්‍රාග්ධනය}}{\text{නියමිත අවදානම් ප්‍රාග්ධනය}} \times 100$$

### ප්‍රතිරක්ෂිතයා

ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක්. (ප්‍රාථමික රක්ෂණ සමාගම)

### දායකය

රක්ෂණ සමාගම විසින් ප්‍රතිරක්ෂකයින් වෙතට මාරුකරනු ලබන අවදානම් කොටස

### හිමිකම් පෑම

දේපල විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම. රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිතවීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනා දී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේ දී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

### දරන ලද හිමිකම් පෑම

වර්ෂය ආරම්භයේ දි සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම්පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂයක් තුළ හිමිකම් පෑම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

### දරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම්

දේපල, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදුවී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

### හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

කටයුතු සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට සිදු වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

### සහභාග රක්ෂණය

නිශ්චිත වාර මුදල් එකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමඟ ඇති කර ගන්නා තනි ගිවිසුමක්.

### කොමිස්

රක්ෂකයාගේ නිෂ්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයකුට කරන ගෙවීමක්.

### සංකේන්ද්‍රණ අවදානම

නෛසර්ගික ණය අවදානම යෝග්‍ය ලෙසින් අවමකරලීම පිණිස රක්ෂණ හිමියන්ගේ වත්කම් ප්‍රමාණවත් ලෙස විවිධාංගීකරණය නොමැති නම්, පවතින අතිරේක ණය අවදානම

# පාරිභාෂික ශබ්ද මාලාව

### ණය අවදානම

ශ්‍රේණිගත සුරැකුම්පත් නිකුත් කරන්නන්, (ආයෝජකයාගේ ආයෝජන කළඹෙහි), ණයගැතියන් (උදා. උකස්කරුවන්), ප්‍රති පාර්ශ්වකරුවන් (උදා. ප්‍රතිරක්ෂණ ගිවිසුම්, ව්‍යුත්පන්න ගිවිසුම් හෝ තැන්පතු මත), සහ මැදිහත්කරුවන්ගේ ණය ප්‍රමාණන පැවරීම්වල පැහැර හැරීම් හෝ සංචලනයන් නිසා ඇතිවන මූල්‍ය අලාභ අවදානම. ණය අවදානම තුළ පැහැර හැරීමේ අවදානම, අවශ්‍රේණිගත වීම් හෝ සංක්‍රමණික අවදානම, වක්‍ර ණය හෝ ව්‍යාප්තවීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ සහ සම්බන්ධ අවදානම අන්තර්ගත වේ. ණය අවදානම් මූලාශ්‍රයන්ට ආයෝජන ප්‍රතිපාර්ශ්වකරුවන්, රක්ෂණ ඔප්පුහිමියන් (හිඟ වාරික හරහා), ප්‍රතිරක්ෂණකරුවන්, මැදිහත්කරුවන් සහ ව්‍යුත්පන්න ප්‍රතිපාර්ශ්වකරුවන් ඇතුළත් වේ.

### විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

### අත්හිටවූ මෙහෙයුම්

සමාගමක සමස්ත අංශයක, පරිපාලිත හෝ කොටසක මෙහෙයුම් පවතින විධිමත් සැලැස්මකට අනුව අදාළ සමාගමෙන් ඉවත් කිරීමට ක්‍රියාවලිය වේ.

### ඉපැයූ වාරික

ගිණුම් කාලපරිච්ඡේදයක ආරම්භයේ දී සහ අවසානයේ දී නොඉපැයූ වාරික ප්‍රතිපාදන වෙනුවෙන් සැලසුම් කළ ලිඛිත වාරික මුදල්.

### අනුරක්ෂණ

අනපේක්ෂිත අවස්ථාවක දී පුද්ගලයාගේ ජීවිතය පමණක් ආවරණය කෙරෙන, නමුත් කාලසීමාව අවසානයේ දී කල්පිරීමේ ප්‍රතිලාභයක් ලබාදෙන ජීවිත රක්ෂණ ගිවිසුමකි.

නිශ්චිත කාලපරාසයකට(එහි කල්පිරීමේ දී) පසු හෝ මරණයක දී එකවර ගෙවීම පිණිස සැලසුම් කරන ලද ජීවිත රක්ෂණ ගිවිසුමකි.

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

ගිනි, මුහුදු උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ බද්ධ වශයෙන් පවත්වාගෙන යාම, ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරික ද සහිත අගය

### දළ වාරිකය

වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිදාන අඩුකිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩුකිරීමට පෙර වූ වාරිකය.

### රක්ෂකයා

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

### තාක්ෂණ රක්ෂණ විසඳුම්

වත්මන් රක්ෂණ කර්මාන්ත ආකෘතියෙන් ඉතුරුම් සහ කාර්යක්ෂමතාවය උකහා ගැනීම පිණිස සැලසුම් කර ඇති තාක්ෂණික නවෝත්පාදන භාවිතය තාක්ෂණික රක්ෂණය යනුවෙන් අදහස් වේ. ඉන්ෂුවරටෙක් යනු ෆින්ටෙක් (Fintech) යන වදනින් පෙළඹි රක්ෂණය සහ තාක්ෂණය යන්නෙහි සුසංයෝග යකි.

### අහෝසි වූ ඔප්පුව

වාරික මුදල් නොගෙවීම මත සහන කාලය අවසානයේ දී අවලංගු වූ රක්ෂණාවරණ

### වගකීම් ප්‍රාමාණිකතා පරීක්ෂණය

අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්තමාන අගය ඒවායේ රක්ෂණ ගිවිසුම් යටතේ යොදාගනිමින් එහි හඳුනාගත් රක්ෂණ වගකීම් ප්‍රමාණවත් ද යන වග වාර්තා කරනු ලබන එක් එක් කාලසීමාව අවසානයේ කරනු ලබන ඇගයීමකි.

### වගකීම් අවදානම

රක්ෂකයා විසින් ස්ථාපනය කරනු ලබන තාක්ෂණික සංචිත සහ ඔප්පුහිමියාගේ වගකීම්, දැනට බලපවත්වන ඔප්පු සම්බන්ධ අනාගත හිමිකම් සහ වියදම් සඳහා ප්‍රමාණවත් වේවි ද යන අවදානම.

### දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර

මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කෙරෙන ගිවිසුම ද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළැඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

### අලාභ අනුපාතය

ඉපැයූ වාරික සඳහා දරනු ලබන හිමිකම් අනුපාතය. රක්ෂණකරුවෙකුගේ මිල ගණන් රක්ෂණ ගිවිසුම් විසින් ගනු ලබන අවදානම් සමඟ කොතෙක් දුරට හොඳින් ගැලපෙන්නේ ද යන්න පිළිබඳව දර්ශකයක් සපයයි. (අදාළ අර්ථ දැක්වීම් දරන ලද හිමිකම්, ප්‍රාරක්ෂණ වාර්ෂික පදනම)

### වෙළඳපල අවදානම

රක්ෂකයාගේ වත්කම්වල වෙළඳපල වටිනාකම අඩුවීමේ අවදානම

### කල්පිරීම

දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව

### මරණ අනුපාතය

මුළු ජනගහනයට හෝ විශේෂිත වයස් කණ්ඩායමකට මරණ අනුපාතය. එය ගෝලීය වශයෙන් අනුපාත සංඛ්‍යාවන් ලෙසින් ප්‍රකාශිත අතර මරණ අනුපාත වගුවල දක්වා ඇත.

### ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය

රක්ෂකයන් විසින් ශුද්ධ ආදායම් (අදාළ ප්‍රතිරක්ෂණයෙන් අඩු කළ පසු) සම්බන්ධ ශුද්ධ අලාභ වියදම් නිරූපණය කිරීමට උපයෝගී කර ගනු ලබන සූත්‍රයකි.

# පාරිභාෂික ශබ්ද මාලාව

### ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \times 100$$

ජීවිත නොවන ශුද්ධ අලාභ අනුපාතය සමඟ ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි. මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේ දී ආයෝජන අදායම් සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්} \times 100}{\text{ඉපැයූ ශුද්ධ වාරිකය}} + \frac{\text{වියදම්} \times 100}{\text{ඉපැයූ ශුද්ධ වාරිකය}}$$

### ශුද්ධ ඉපැයූ වාරික - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

ප්‍රතිරක්ෂණ වාරික සහ නොඉපැයූ වාරිකවල වැඩිවීම සහ අඩුවීම සඳහා ගළපන ලද දළ ලිඛිත වාරික ආදායම.

### ශුද්ධ වියදම් අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

ජීවිත නොවන ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා :- කොමිස්, බදු, සේවක පරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

### සහභාගීත්වය රහිත ඔප්පුව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර

ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතුවල දී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

### එක්වරක් පමණක් ලැබෙන අතිරික්තය

2016 ජනවාරි 01 දිනට අවදානම් පාදක ප්‍රාග්ධන රීතිය යටතේ දළ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු රක්ෂණ වගකීම් වලට වඩා 2015 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු ඔප්පු වගකීම්වල අතිරික්තය

(ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට දළ වාරික තක්සේරුවට වෙනස්වීම නිසා ඇති වූ අතිරික්තය)

### එක්වරක් පමණක් ලැබෙන අතිරික්තය මාරුකිරීම

ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට දළ වාරික තක්සේරුවේ සිට වෙනස්වීම නිසා ඇති වූ අතිරික්තය කොටස්හිමියන්ගේ අරමුදලට මාරුකිරීම.

### මෙහෙයුම් ලාභය

ආයෝජන ආදායම, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය.

### මෙහෙයුම් අවදානම

මූල්‍යමය අලාභයන්ට හේතුවන අභ්‍යන්තර පද්ධතිවල, සේවක මණ්ඩලයේ කාර්ය පටිපාටි හෝ පාලනයන්හි ප්‍රමාණවත් නොවන බව හෝ බව අසාර්ථකවීම නිසා පැන නගින අවදානම.

මෙහෙයුම් අවදානමට භාරකාරිත්ව අවදානම ද ඇතුළත් වේ.

### ඔප්පුව

රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියවිල්ලකි.

### ඔප්පු හිමියා

රක්ෂණකරු සමඟ අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරුවන තැනැත්තා.

### ඔප්පු ණය

ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරන අගය ඇපයට තබමින් ඔප්පු හිමියකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොලී අය කරනු ලැබේ.

### ප්‍රාථමික රක්ෂකයා

රක්ෂණ වාරිකයක් වෙනුවෙන් අවදානම් බාර ගනු ලබන්නා වූ ද රක්ෂණ ඔප්පු හිමියා සමඟ සෘජු ගිවිසුම්ගත සම්බන්ධතාවක් පවත්වාගනු ලබන්නා වූ ද, රක්ෂණ සමාගම් (තනි පුද්ගලයන්, ආයතන හෝ සංවිධාන)

### ප්‍රතිරක්ෂණය

එක් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිෂ්ඨාවක් සමඟ අනෙකුත් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු) එළැඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝ මුළුමණින්ම හානිපූරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවකි.

### ප්‍රතිරක්ෂණ කොමිස්

ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල් භාරගනු ලබන ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාර ගැනීම.

### භාර ගනු ලබන ප්‍රතිරක්ෂණ

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් පිළිගැනීම.

### භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම.

### ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්

ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂකයකුගෙන් ප්‍රාථමික රක්ෂිතයා ලද හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

### රඳවා ගැනීම

භාරගනු ලැබූ අවදානමින් රක්ෂණකරු / ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන / පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය හිණුම වෙනුවෙන් රඳවාගත් ආදායම.

### ප්‍රතිපවරාදීම

ප්‍රතිරක්ෂකයා එහි ඇති අවදානම වෙනත් ප්‍රතිරක්ෂකයෙකු වෙත පැවරීම සිදුකරන ගණුදෙනුවකි.

### නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR)

නියමිත අවදානම් ප්‍රාග්ධනය යනු 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව තක්සේරු කරනු ලබන සහ නිශ්චය කරනු ලබන අවදානම් ප්‍රාග්ධන ගාස්තුවේ මුළු මුදල.

# පාරිභාෂික ශබ්ද මාලාව

නියමිත අවදානම් ප්‍රාග්ධනය සාමාන්‍ය සහ දීර්ඝකාලීන රක්ෂණය සඳහා වෙන් වෙන්ව ගණනය කරන අතර,රක්ෂණය සහ කොටස් හිමියන්ගේ අරමුදල යන දෙකම ඇතුළත් වේ.

(අ) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා

RCR = {(√ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + වෙළඳපල අවදානම් ප්‍රාග්ධන ගාස්තුව)$^2$ + වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව$^2$ + මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව$^2$) සහ

(ආ) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

RCR = උපරිම {(SVCC,.4- √ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව+සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව+ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව+වෙළඳපල අවදානම් ප්‍රාග්ධන අයකිරීම)$^2$+ වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව$^2$+ මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව$^2$)

### ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය)

රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම් වලට අදාල තාක්ෂණික ප්‍රතිපාදන අවශ්‍යතාව සැපිරීමට රක්ෂණකරුවකු විසින් වෙන් කළ යුතු නිර්බාධීය වත්කම් නිර්ණයට අමතරව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26(1) වගන්තිය යටතේ ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති ප්‍රකාරව අර්ථ දක්වා ඇති රක්ෂණකරුවකු විසින් සැපිරිය යුතු පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවමය සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාත අවමයහි අවශ්‍යතාවන්.

### අතිරික්ත මාරුකිරීම

ජීවගණකඥගේ නිර්දේශය මත පදනම්ව ඔප්පු වගකීම් ඉක්මවා යන අතිරේක වත්කම් ප්‍රමාණය ජීවිත අරමුදලින් කොටස් හිමියන්ගේ අරමුදලට මාරුකිරීම

### පවාරණ අගය

ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේ දී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල වේ. පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මකව පැවතිය යුතුය.

### පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (SVCC)

සියලු රක්ෂණ ගිවිසුම් සමගාමීව පවාරණය වී ඇතිවිට, අත්‍යන්ත හානිකර වාතාවරණයක් පිළිබඳ පවත්නා අවදානම

### කාලීන රක්ෂණය

කිසියම් කාල පරිච්ඡේදයක් සඳහා හෝ නිශ්චිත වසර කාලසීමාවකට, ආවරණය සපයා දෙන ජීවිත රක්ෂණ ඔප්පු වර්ගයයි. ඔප්පුවෙහි සඳහන් කර ඇති කාලසීමාව තුළ රක්ෂණකරු මියයාමක දී, ඔප්පුව සක්‍රීව පවතින්නේ නම් හෝ බලාත්මකව පවතී නම්, මරණ ප්‍රතිලාභය ගෙවනු ලැබේ.

### තාක්ෂණික ප්‍රතිපාදන

ස්වකීය රක්ෂණ බැඳියාවන් ඉටුකිරීමට සහ ඔප්පු හිමියන්ගේ සහ ප්‍රතිලාභීන්ගේ අදාල ආයු කාලය තුළ සියලුම වගකීම් නිරාකරණය කිරීමට, ඔප්පුවල පරිපාලන කටයුතු සඳහා, ප්‍රතිරක්ෂණය සඳහා සහ ඉතිරිව ඇති අවදානම් ආවරණය කිරීම සඳහා වන වියදම්ද වෙනුවෙන් රක්ෂණකරුවෙක් විසින් වෙන්කරනු ලබන මුදල් ප්‍රමාණය වේ.

### පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනය

ක්‍රියාත්මකව පවතින විට සහ වසා නිම කිරීමේ දී යන අවස්ථා දෙකෙහි සියලු අවස්ථාවන්හි දී රකෂණකරුවෙකුගේ අලාභ ආවරණය කිරීම සඳහා පූර්ණ වශයෙන් පවතින ස්ථිර ප්‍රාග්ධනය.

### දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය

පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනයේ සමහරක් අන්තර්ග්‍රහණ ලක්ෂණ මෙහි නොමැති වුව ද, ක්‍රියාත්මකව පවතින විට සහ වසා නිම කිරීමේ දී කිසියම් අලාභ අවශෝෂණයක් සපයා දෙන ප්‍රාග්ධනය

### පවත්නා මුළු ප්‍රාග්ධනය (TAC)

පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනය සහ දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය එකතු කර, 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය) නීති ප්‍රකාරව, කිසියම් නියමිත අඩුකිරීම් සිදුකිරීමෙන් පවත්නා මුළු ප්‍රාග්ධනය නිර්ණය කරනු ලබයි.

### ප්‍රාරක්ෂණ ලාභය

ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මඟින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

### නොඉපැයූ වාරිකය

ගෙවීමට නියමිත ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍රයේ දිනයෙන් අනතුරුව එළැඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

### නොඉපැයූ වාරික සංචිතය

දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේ දී උද්ගත විය හැකි හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරමුණු සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

### කල් ඉකුත් නොවූ ආදායම් සංචිතය

ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම් පෑම්, වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මවා යන ප්‍රමාණය

### සර්වත්‍ර ආයුකාලය

ආයෝජන ඉතිරිකිරීම් සංරචකය අඩු වාරික සහිත කාලීන ජීවිත රක්ෂණය වැනි ස්ථිර ජීවිත රක්ෂණය. බොහොමයක් සර්වත්‍ර ජීවිත රක්ෂණ ඔප්පුවල නම්‍යශීලී වාරික විකල්පයන් අඩංගු වේ. තවද, සමහරක් තනි වාරිකයක් (එක්වර ගෙවන තනි වාරිකය) හෝ ස්ථිර වාරික (නියමිත ස්ථිර වාරික) අවශ්‍ය කෙරේ.

### පූර්ණ ජීවිත රක්ෂණය

පූර්ණ ජීවිත රක්ෂණය, රක්ෂණය වූ තැනැත්තාගේ ජීවිතය සඳහා ආවරණය සපයයි. මරණ ප්‍රතිලාභයක් ලබාදීමට අමතරව, මුදල් වටිනාකම ක්‍රමයෙන් එක්රැස්වන ඉතිරිකිරීම් සංරචකයක් ද පූර්ණ ජීවිත රක්ෂණයෙහි අන්තර්ගත වේ. මෙම ඔප්පු ස්ථිර හෝ සාම්ප්‍රදායික ජීවිත රක්ෂණ ලෙසින් ද හඳුන්වනු ලබයි.

# පොදු තොරතුරු

## කාර්යාල ලිපිනය

11 වන මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ircsl.gov.lk
වෙබ් අඩවිය : www.ircsl.gov.lk

## නෛතික ස්වභාවය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදි.

## මණ්ඩලයේ අරමුණ සහ වගකීම්

ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

## ගිණුම් වර්ෂය

දෙසැම්බර් 31 දක්වා

## විගණකවරු

විගණකාධිපති

## බැංකුකරුවන්

ලංකා බැංකුව

## විගණන කමිටුව

ඩී.ආර්. දේසප්‍රිය මහතා
ආචාර්ය ඒ. ඒ. ෂබීර් ගුලාම්හුසේන් මහතා
ජෙරම් බෝලින් මහතා

11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9 | ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ircsl.gov.lk | වෙබ් අඩවිය : www.ircsl.gov.lk